# නොපිරිහෙන මග

**සංස්කාරක:-**

## පූජ්‍ය නිකපිටියේ ගුණරතන හිමි

## ධර්මදානය පිණිසයි

ශ්‍රී බු: ව: 2562 වූ වෙසක් මස අව විසේනිය නම් පීතිය ලත් බුධදින

ව: ව: 2019-04-24

# හැඳින්වීම

**"අභිත්‍ථරෙථ කල්‍යාණෙ - පාපා චිත්තං නිවාරයෙ,**
**දන්‍ධං හි කරොතො පුඤ්ඤං - පාපස්මිං රමතෙ මනො'ති"**

**(ධම්මපදය පාප වර්‍ගය)**

දන සීල භාවනා ආදී සුචරිත ධර්‍මයෙහි යුහුසුලු වන්නේය. කාය දුශ්චරිතාදී අකුසල කර්‍මයන්ගෙන් සිත වළක්වන්නේය. දනාදී කුසල් කෙරෙමි ද, නොකෙරෙමි ද යනාදී වශයෙන් පසුබටව කරන්නහු ගේ (කුසල් කල් දමන්නහුගේ) සිත පවෙහි ඇලෙයි.

බුදුරජාණන් වහන්සේ වැඩ සිටි දවස සැවැත්නුවර චූල ඒකසාටක නම් බ්‍රාහ්මණයෙක් විය. එතුමාට හා එම භාර්‍යාව යන දෙදෙනාට ම උඩුකය වසාගැනීමට එකම වස්ත්‍රයක් තිබූ බැවින් ඔහුට **ඒකසාටක බ්‍රාහ්මණ** යැයි නමක් විය. එක් ධර්‍මදේශනා සමයක දෙදෙනාටම එක්ව යා නොහැකි බැවින් බැමිණිය දහවල් ගොස් බණ අසා පැමිණියා ය. රාත්‍රියෙහි බණ ඇසීමට බ්‍රාහ්මණයා ගියේ ය. තථාගතයන් වහන්සේ මධුර ස්වරයෙන් ධර්‍ම දේශනා කරන විට ඔහු ප්‍රීතියෙන් පිනාගොස් වෙන පූජා කළයුතු දෙයක් නැති හෙයින් උඩුකය වසන සළුව පූජා කිරීමට සිතුන නමුත් තමන්ටත් භාර්‍යාවටත් උඩුකය වැසීමට ඇති එකම වස්ත්‍රය පූජා කිරීමෙහි දෙස් දක දෙවතාවක් ම පසුභටව වී මට අවස්ථා දෙකකදී ම වස්ත්‍රය පරිත්‍යාග චේතනාව සමගම ලෝභ සිත පැමිණ එය වැළැක්විනි. මෙසේ ලෝභය වැඩී ගියේ නම් සතර අපා දුකින් ගැලවීමට බැරි ය, යැයි සිතා තෙවන වර එම වස්ත්‍රය නවා බුදු පාමුල තබා පූජා කොට ප්‍රීතියට පැමිණ **මම දිනුවා, මම දිනුවා** යැයි කෑ ගැසුවේ ය. බණ අසමින් සිටි කොසොල් රජතුමා ඒ කරුණ විමසා මොහු කළේ දුෂ්කර වැඩක් යැයි සිතා වස්ත්‍ර යුග්ම දෙකක් දුන්නේ ය. ඔහු ඒවා ද භාග්‍යවතුන් වහන්සේට ම පිදුවේ ය. මෙලෙස නැවත වස්ත්‍ර සතරක්, අටක්, සොළොසක්, දෙතිසක් දක්වා රජතුමා දුන්නේ ය. එයින් දෙකක් තබාගෙන තිසක් පූජා කළේ ය. පසු ව ඔහු රජ මාළිගයට කැඳවා කහවනු ලක්‍ෂයක් වටිනා පලස් දෙකක් දුන්නේ ය. ඔහු ඒවායෙන් එකක් භාග්‍යවතුන් වහන්සේට ද, එකක් මහා සංඝයාට ද පූජා කළේ ය. එය දනගත් රජතුමා අලි ඇතුන් රථ ආදී සෑම දෙයකින් ම සතර බැගින් සබ්බ චතුෂ්ක නම් පරිත්‍යාගයක් කළේ ය. භික්‍ෂූන් වහන්සේලා මෙම කාරණය දම් සභා මණ්ඩපයෙහි දී කථා කරමින් සිටින විට භාග්‍යවතුන් වහන්සේ එතැනට වැඩ එම බ්‍රාහ්මණ

තුමා මධ්‍යම යාමයෙහි එම සළුව පිදුවේ නම් සියලු දෙයින් අට බැගින් වස්තු ලබන බව ද, මුල් අවස්ථාවෙහි ම පූජා කළේ නම් සෑම දෙයින් ම සොළොස බැගින් ලබන බව ද වදාර එය නිමිති කරගෙන ඉහත ගාථාවෙන් ධර්‍ම දේශනා කළ සේක.

තව ද අතීතයෙහි අප මහ බෝසතාණන් වහන්සේ පාරමී පුරණ කල්හි **කුද්දලසමාගමය, මූගපක්ඛසමාගමය, චූළසුසෝමසමාගමය, අයොඝරපණ්ඩිතසමාගමය, හත්ථිපාලසමාගමය** යන මහා සමාගමයන්හි දී එක්ව කුසල් වැඩූවන්ගෙන් පමා වී කුසල් කළ සත් දෙනෙකුන්ට එක්වම නිවන් ලැබීමට නොහැකි වූහ. ඒ පිරිස පසුව මේ ලක්දිව ඉපිද පැවිදිව රහත් වූහ. **පථවිචාලක ධම්මගුත්තත්ථ තෙරණුවො, කටකන්ධකාරවාසී ඵුස්සදෙව තෙරණුවෝ, උපරිමණ්ඩලවාසී මහාසංඝරක්ඛිත තෙරණුවෝ, මලයරටවාසී මහාදෙව තෙරණුවෝ, අභයගිරිවාසී මහාදෙව තෙරණුවෝ, ගාමන්තපබ්භාරවාසී මහාසිව තෙරණුවෝ, කාළවල්ලිමණ්ඩපවාසී මහානාග තෙරණුවෝ** ඒ සත් නම ය. එබැවින් පමා වී කරන කුසලයන්හි බලය දුර්වලය. එය ස්වර්‍ග මෝක්ෂ දෙකට ම බලපාන්නේ ය.

වර්‍තමානයෙහි ද ගිහි පැවිදි බොහෝ දෙනා කරන බොහෝ කුසල් මෙබඳුය. එයින් ශාසන ප්‍රතිපත්ති ධර්‍මය ද බොහෝ හීන වී ඇත. මෙසේ කුසල් කිරීමට යන සෑම විටම පමාව නිසා අකුසල් වැඩී නෛර්‍යාණික සද්ධර්‍මයෙන් ගත යුතු ප්‍රයෝජනය හීන වන්නේ ය. එයින් වත්මන් ප්‍රජාවට මෙන්ම අනාගතයෙහි උපදින බොහෝ දෙනාගේ සුගති මග ද නිවන් මග ද වැසී යන්නේ ය. එබැවින් මේ කරුණ විශේෂයෙන් සිහිකට යුත්තක් වන්නේ ය.

පූර්‍වයෙහි පටන් සම්බුදු සසුන් ප්‍රතිපත්තිය පිරිහීමට පත් සෑම විටක ම උදාර අදහස් ඇති ගිහි පැවිදි බොහෝ සත්පුරුෂයෝ නැවත නැවත සසුන් පිළිවෙතට ජීවය දී නිවන් මඟ පිළිවෙත් සරු කර ගත්හ. ඒ අතරට මෑත ඉතිහාසයෙහි **අති පූජනීය වාරියපොල සුමංගල මහා ස්වාමින් වහන්සේ, අති පූජනීය මිගෙට්ටුවත්තේ ගුණානන්ද ස්වාමින් වහන්සේ, අති පූජනීය හික්කඩුවේ ශ්‍රී සුමංගල මහා ස්වාමින් වහන්සේ, අති පූජනීය බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය ස්වාමින් වහන්සේ, අති පූජනීය රාජකීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශාභිධාන මහෝත්තමයන් වහන්සේ, අති පූජනීය අග්ගමහා පණ්ඩිත මඩිහේ පඤ්ඤාසීහ මහා ස්වාමින් වහන්සේ, අති පූජනීය මාහෝ සුමේධ මහා ස්වාමින් වහන්සේ, ත්‍රිපිටකධරාචාර්‍ය මහෝපාධ්‍ය මහා කර්‍මස්ථානාචාර්‍ය පූජනීය නා උයනේ අරියධම්ම මහා ස්වාමින්**

**වහන්සේ, අති පූජනීය ගංගොඩවිල සෝම ස්වාමින් වහන්සේ** වැනි ශ්‍රේෂ්ඨ උතුමන් වහන්සේලා ද, **ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමා** වැනි ජාතික වීරවරයන් ද සසුන් කෙත ආලෝකවත් කළ මහ බෝසතාණන් වහන්සේලා වෙති. මෙලෙස සම්බුදු සසුන් ප්‍රතිපත්තිය නඟා සිටුවීමට ඇප කැප වූ යතිවරයන් වහන්සේලා අතර අපවත් වී වදාළ **ත්‍රිපිටකධරාචාර්ය මහෝපාධ්‍යා පරම පූජනීය නා උයනේ අරියධම්ම** මහා ස්වාමින් වහන්සේගේ **80** වන ජන්ම දිනය හා අපවත් වී වදාළ **අති පූජනීය ගංගොඩවිල සෝම ස්වාමින් වහන්සේගේ 70** වන ජන්ම දිනය ව්‍යඃ වඃ **2019 - 04 - 24** දිනට යෙදී ඇත. ඒ නිමිත්තෙන් පුණ්‍යානුමෝදනා කිරීමට ද, පිරිහීගෙන යන සම්බුදු සසුන් පිළිවෙත ශක්තිමත් කොට බෞද්ධ ජනයා නඟා සිටුවීමට ද ශාසනමාමක සත්පුරුෂ මඬුල්ලක් එක්ව **"අරියවංශ වැඩමුළුව"** නමින් මහත් පුණ්‍ය මහෝත්සවයක් **2019 - 04 - 24** දින අනුරාධපුර ස්වර්ණමාලි මහ සෑ රදුන් අභියස දී සිදු කරනු ලබති. ඒ සඳහා අපරිහානිය ධර්ම පිළිබඳ ව ධර්ම ග්‍රන්ථයක් කර දෙන මෙන් කළ ආරාධනයෙන් විශේෂ ධර්ම විවරණයක් **"නොපිරිහෙන මග"** නමින් ධර්ම පුස්ථකයක් වශයෙන් මෙසේ පිදෙනු ලැබේ. මේ අගනා කෘතිය කිරීමට ගත් මහත් උත්සාහය සම්බුදු සසුන තව බොහෝ කලක් නිරුපද්‍රිත ව ලොව පැවැත්ම පිණිස ම හේතු වේවා! යි ඉමහත් ශාසන ගෞරවයෙන් ප්‍රාර්ථනා කරමි. සම්බුදු සසුන ආලෝකවත් කොට අපවත් වී වදාළ සංඝ පීතෘන් වහන්සේලාට ද, අනෙකුත් බෞද්ධ වීරවරයන්ට ද මතු සියලු ධර්ම ප්‍රාර්ථනා ජය ගෙන ප්‍රාර්ථනීය බෝධියෙන් නිවන සුව ලබන්නට හේතු වාසනා වෙත්වා. මෙම සත් ක්‍රියාව සිදු කරන සියලු දෙනාට ද සුවසේ ම සියලු ධර්ම ප්‍රාර්ථනා සමෘද්ධිමත් කරගෙන නිවන් සුව ලබන්නට හේතු වේවා. සදේවක ලෝකවාසී සියලු සත්වයන්ට ද සුව සේ පාරමී සපුරා නිවන් සුව ලබන්නට ම හේතු වේවා. මෙම ධර්ම ග්‍රන්ථය මුද්‍රණය සඳහා දයකත්වය දැරූ සැමට ද මුද්‍රණය කර දුන් මුද්‍රණාලයාධිපති තුමා ප්‍රධාන කාර්ය මණ්ඩලයේ සැමට ද සුවසේ ම නිවන් සුව ලබන්නට හේතු වේවා.

මෙයට
නිකපිටියේ ගුණරතන හිමි,
නා උයන ආරණ්‍ය සේනාසනය,
පන්සියගම, මැල්සිරිපුර.

# පෙරවදන

අප තිලෝගුරු ශාන්ති නායක සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් ලෝක සත්වයා වෙත හිත, සුව, නිවන පිණිස සූත්‍ර විනය අභිධර්ම වශයෙන් දේශනා කරන ලද ධර්මයන් අතරින් විනය, අභිවිනය දේශනා කොට ඇත්තේ භික්ෂු භික්ෂුණී සික්ඛමානා සාමණේර සාමණේරී යන පඤ්ච සහ ධාර්මිකයන් සඳහා ය. උපාසක උපාසිකා යන ගෘහස්ථ බෞද්ධයින්ට ද අපරාජිත ව දියුණුවෙන් දියුණුවට පැමිණීමේ ඒකායන මාර්ගය දීඝ නිකායෙහි සාමඤ්ඤ ඵල සූත්‍රය, අංගුත්තර නිකායෙහි අභිසන්ද සූත්‍රය ආදී බොහෝ දේශනාවන් ඉතිරි නැතිව සර්ව සම්පූර්ණව මහා කරුණාවෙන් දේශනා කොට වදළේ දෙලොව ජය ගෙන උතුම් නිවනින් සැනසීම පිණිස ය.

ගරු කටයුතු ස්වාමීන් වහන්සේලාටත්, බෞද්ධ අබෞද්ධ ගෘහස්ථ පින්වතුන්ටත් එක සේ ප්‍රයෝජනවත් වන ලෙස **"නොපිරිහෙන මග"** නමින් තිසරණ සමාදනය, සීල සමාදනය එයින් ලැබෙන ආනිශංස ද පරිහානියට පත් නොවී අපරාජිත ව ජීවිතය නිවැරදි ලෙස ධර්මානුකූලව සකස් කර ගැනීම ආදී වූ විශේෂිත ධර්ම කරුණු ත්‍රිපිටක ධර්මය තුළින් ම මනා ලෙස එක්තැන් කොට මනහර දහම් පොතක් වශයෙන් ඉදිරිපත් කෙරේ.

සම්බුද්ධ ශාසනයේ චිර පැවැත්ම සහ භික්ෂු ගුණාංග දියුණුවට පමුණුවා ගැනීම පිණිස චිත්ත සන්තානයේ ඇති දුර්ගුණ දුරු කොට උතුම් ගුණ දියුණුවට කැමති විය යුතු ය. ඒ සඳහා අපරිහානිය ධර්ම දියුණු කර ගැනීම වටී. ගෘහස්ථ පින්වතුන්ට ද වර්තමානයේ කෙසේ ජීවත් විය යුතු ද, බුද්ධ ශාසනය කෙසේ පිහිට කොට ගත යුතු ද යන කරුණු මෙම මාහැඟි දහම් පොතෙහි විශේෂිත ලෙස සඳහන් කර ඇත. එබැවින් පැවිදි ගිහි සැම දෙනාම ශ්‍රද්ධාවෙන් යුතුව මෙම පොත පරිශීලනය කොට දෙලොව ජය ගන්නා ලෙස මෛත්‍රියෙන් ඉල්ලා සිටිමි.

නිවැරදි ශ්‍රී සද්ධර්මය අසන්නට කියවන්නට ලැබෙන්නේ සත්පුරුෂයන් ඇසුරු කිරීමෙන්ම ය. නිවැරදි ලෙස යෝනිසෝ මනසිකාරයෙන් ධර්මානුධර්ම ප්‍රතිපදාවන් දියුණු කර ගැනීමෙන් නිවන් මග සකසා ගත හැකි වේ. වර්තමානයෙහි බොහෝ දෙනාට අර්ථයෙන් ධර්මයෙන් දේශන, ලේඛන මාර්ගයෙන් ධර්මය බෙද දෙමින් ඉතා වටිනා ශාසනික මෙහෙවරක නියැලී සිටින මෙම දහම් පොතෙහි සම්පාදක

පූජ්‍ය නිකපිටියේ ගුණරතන ස්වාමීන් වහන්සේට රත්නත්‍රය සතු සූවිසි මහා ගුණ බලයෙන් අප සැමගේ ආශිර්වාදයෙන් තවත් මෙවැනි වූ ශාසනික කටයුතු ඉෂ්ට සිද්ධ කර ගැනීමට ධර්මඥනය, භාවනාඥනය සත සහස්‍ර ගුණයෙන් වැඩේවා! ප්‍රාර්ථනීය බෝධියකින් සුවසේ ම නිර්වාණ ධාතුව සාක්ෂාත් වේවා!

මෙම උතුම් දහම් පොත මුද්‍රණය සඳහා බරපැන දරන්නා වූ පින්වත් සැම දෙනාට ද, මුද්‍රණය කර දෙන්නා වූ මුද්‍රණාලයාධිපතිතුමා ප්‍රධාන කාර්‍ය මණ්ඩලයේ සැමට ද සදේවක ලෝකවාසී සියලු සත්ව ප්‍රජාවට ද උතුම් වූ නිර්වාණ ධාතුව සුව සේ ශාක්ෂාත් වෙත්වා!

**සම්බුදු සසුන  බොහෝ කල් ලොව නිර්මලව පවතීවා!**

මෙයට මෙතැති
අඟුල්ගමුවේ අරියනන්ද ස්ථවිර,
නා උයන ආරණ්‍ය සේනාසනය,
පන්සියගම මැල්සිරිපුර.

# පටුන

හැඳින්වීම.......................................................................................... 2

පෙරවදන ..............................................................................................5

❄ රත්නත්‍රය නමස්කාරය ........................................................................11

❄ අපණ්ණක ප්‍රතිපදාව ...........................................................................12

❄ ජීවක සූත්‍රය ..................................................................................... 27

❄ සූත්‍ර නිදානය.................................................................................... 27

❄ ප්‍රථම ධර්ම සංගායනාව.......................................................................28

☸ ආනන්ද තෙරුන් රහත් වීම...............................................................35

☸ විනය සංගායනා කිරීම.....................................................................36

☸ ධර්මය සංගායනා කිරීම ...................................................................37

☸ ධර්ම විනය බෙදා දැක්වීම ................................................................39

❄ ජීවක සූත්‍ර සංගායනාව..................................................................... 43

☸ නිසි බුද්ධෝපස්ථායෙකු නොවීම ....................................................... 44

☸ නිත්‍ය උපස්ථායෙකු පත් කර ගැනීම.................................................. 45

☸ ප්‍රතික්ෂේප සතර ............................................................................. 46

☸ ආයාචනා සතර ................................................................................ 47

☸ ජීවක වෛද්‍යාචාර්යතුමාගේ උත්පත්ති කථාව .................................... 54

☸ ජීවකම්බවන පූජාව ........................................................................55

❄ සරණාගමනය ...................................................................................57

☸ ලෝකෝත්තර සරණගමනය ...............................................................58

☸ ලෞකික සරණගමනය.....................................................................58

⌘ අත්තසන්නීයාතන සරණාගමනය .....................................................59

⌘ තත්පරායන සරණාගමනය...............................................................59

⌘ ශිෂ්‍යභාවෝපගමන සරණාගමනය ......................................................59

⌘ පණිපාත සරණාගමනය ....................................................................60

❄ උපාසකත්වය ....................................................................................61

❄ පඤ්ච සීලය ....................................................................................65

☸ ප්‍රාණඝාතය ....................................................................................65

⌘ ප්‍රාණඝාත අකුශලය කෙසේ සිදු වේ ද? ..........................................67

⌘ ප්‍රාණඝාත කර්මය පිළිබඳ ව දත යුතු වෙනත් කරුණු ......................70

⌘ ප්‍රාණඝාත කර්මයෙහි අල්ප සාවද්‍ය මහා සාවද්‍ය භාවය ................71

⌘ ප්‍රාණඝාත කර්මයෙහි විපාක ..........................................................72

⌘ ප්‍රාණඝාතයෙන් වැළකීමේ ආනිශංස ..............................................72

☸ අදත්තාදානය ....................................................................................73

⌘ පස් විසි අවහාරය ..........................................................................74

⌘ අදත්තාදානයෙහි අල්ප සාවද්‍ය මහා සාවද්‍ය භාවය ......................79

⌘ අදත්තාදාන කර්මයෙහි විපාක ........................................................80

☸ කාමමිථ්‍යාචාරය ................................................................................81

⌘ දස ස්ත්‍රීන් ......................................................................................82

⌘ දස භාර්යාවන් ..................................................................................83

⌘ කාමමිථ්‍යාචාරයෙහි අල්ප සාවද්‍ය මහා සාවද්‍ය භාවය ..................84

⌘ කාමමිථ්‍යාචාරයෙහි විපාක ............................................................84

☸ මුසාවාදය ........................................................................................86

⌘ මුසාවාදයෙහි අල්ප සාවද්‍ය මහා සාවද්‍ය භාවය ..........................87

⌘ මුසාවාදයෙහි විපාක ......................................................................88

☸ සුරා පානය ........................................................................................90

⌘ සුරා පානයෙහි ආදීනව ....................................................................91

☸ පන්සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස ..............................................95

⌘ සත්ව ඝාතනයෙන් වැළකීමෙන් ලැබෙන ආනිශංස ..........................95

⌘ සොරකමෙන් වැළකීමෙන් ලැබෙන ආනිශංස ..................................96

⌘ කාමමිථ්‍යාචාරයෙන් වැළකීමෙන් ලැබෙන ආනිශංස ......................96

⌘ **මුසාවාදයෙන් වැළකීමෙන් ලැබෙන ආනිශංස** ....97

⌘ **සුරා පානයෙන් වැළකීමෙන් ලැබෙන ආනිශංස** ....98

❄ **අපරිහානිය ධර්‍ම** .... 102

☸ සාරන්දද අපරිහානිය සූත්‍රය .... 102

❄ **රාජ සප්ත අපරිහානිය ධර්‍ම** ....107

❄ **භික්ෂූන් පිළිබඳ අපරිහානිය ධර්‍ම** .... 118

☸ ප්‍රථම අපරිහානිය ධර්‍ම සත ....119

☸ දෙවන අපරිහානිය ධර්‍ම සත ....127

☸ තෙවන අපරිහානිය ධර්‍ම සත .... 131

☸ සිවුවන අපරිහානිය ධර්‍ම සත ....137

☸ පස්වන අපරිහානිය ධර්‍ම සත .... 142

☸ සයවන අපරිහානිය ධර්‍ම සය ....145

❄ **මහා ආයර්‍යවංස ප්‍රතිපදාව** .... 151

☸ ආයර්‍යවංස සූත්‍ර පාලිය.... 151

☸ අරියවංස සූත්‍රයෙහි අර්‍ථ විවරණය ....153

❄ **ඉතරීතර චීවර සන්තෝසය** .... 161

☸ චීවරය....164

☸ චීවර ක්ෂේත්‍රය....165

☸ පාංශුකූලික ....166

☸ විසි වැදෑරුම් චීවර සන්තෝස....168

☸ චීවර ප්‍රතිසංයුත්ත ධූතාංග .... 171

❄ **ඉතරීතර පිණ්ඩපාත සන්තෝසය** ....175

☸ පිණ්ඩපාතය....177

☸ පිණ්ඩපාත ක්ෂේත්‍රය ....178

☸ පිණ්ඩපාත සංතෝෂය ....179

☸ පිණ්ඩපාත ප්‍රතිසංයුත්ත ධූතාංග....182

❄ **ඉතරීතර සේනාසන සන්තෝසය**......184

☸ සෙනාසනය......185

☸ සෙනාසනක්ෂේත්‍රය......188

☸ සේනාසන සන්තොසය......188

☸ සේනාසන ප්‍රතිසංයුක්ත ධුතාංග......190

❄ **භාවනාරාමතාවය**......193

☸ නෙක්ඛම්ම පාළියෙහි එන භාවනා පද තිස්හත......194

☸ දසුත්තර සූත්‍රය අනුව භාවනා පද......198

☸ සතිපට්ඨාන සූත්‍රය අනුව භාවනා පද......201

☸ නිද්දේසපාළිය අනුව භාවනා පද......202

☸ සමථ භාවනාව......206

☸ විදර්ශනා භාවනාව......207

❄ **සප්ත විශුද්ධිය**......209

☸ සීල විශුද්ධිය......210

☸ චිත්ත විශුද්ධිය......210

☸ දිට්ඨි විශුද්ධිය......210

☸ කංඛාවිතරණ විශුද්ධිය......210

☸ මග්ගාමග්ග ඤාණදස්සන විශුද්ධිය......211

☸ ප්‍රතිපදාඤාණදස්සන විශුද්ධිය......211

☸ ඤාණදස්සන විශුද්ධිය......211

# ❄ රත්නත්‍රය නමස්කාරය

**යො කප්පකොටීහිපි අප්පමෙය්‍යං**
**කාලං කරොන්තො අතිදුක්කරානි,**
**ඛෙදං ගතො ලොකහිතාය නාථො**
**නමො මහාකාරුණිකස්ස තස්ස.**

ලෝක නායක වූ යම් සර්වඥයන් වහන්සේ නමක් කල්ප කෝටි ගණන් පමණ නො කළ හැකි කාලයක් මුළුල්ලෙහි දනාදී පාරමිතා පුරමින් අතිශය දුෂ්කර ක්‍රියා කරමින් සත්ව ලෝකයට හිත පිණිස කායික පරිශ්‍රමයට පැමිණියේ ද, මහා කාරුණික ලෝක නායක වූ සර්වඥයන් වහන්සේට මාගේ නමස්කාරය වේවා.

**අසම්බුධං බුද්ධනිසෙවිතං යං**
**භවාභවං ගච්ඡති ජීවලොකො,**
**නමො අවිජ්ජාදිකිලෙසජාලං**
**විද්ධංසිනො ධම්මවරස්ස තස්ස.**

බුදුරජාණන් වහන්සේ විසින් නිති සේවනය කරන ලද යම් සපර්යාප්තික නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මයක් අවබෝධ නො කිරීම හේතු කොට, සත්ත්ව ලෝකය කුදු මහත් භවයෙන් භවයට යේ ද, අවිද්‍යාදී ක්ලේශ සමූහය නසන සුලු වූ උතුම් සද්ධර්මයට මාගේ නමස්කාරය වේවා.

**ගුණෙහි යො සීලසමාධිපඤ්ඤා**
**විමුත්තිඤාණප්පභූතීහි යුත්තො,**
**ඛෙත්තං ජනානං කුසලත්ථිකානං**
**තමරියසඞ්ඝ සිරසා නමාමි.**

සීල සමාධි ප්‍රඥා විමුක්තිඥාණා දී ගුණයන්ගෙන් යම් ආර්‍ය්‍ය සමූහයක් යුක්ත වූයේ ද, පින් කැමති ජනයන් හට කෙතක් වැනි වූ ඒ ආර්‍ය්‍ය සංඝයා මස්තකයෙන් වඳිමි.

**ධම්මකාමො භවං හොති - ධම්මදෙස්සී පරාභවො"**

"ගුණ දහමින් දියුණු වෙන්නා වූ වැඩෙන්නා වූ නො පිරිහෙන්නා වූ පුරුෂ තෙමේ දස කුසල දහම්හි යෙදීමට කැමති වෙයි. සතුටු වෙයි. එය අසයි. පිළිපදියි. එය ම ප්‍රාර්ථනා කරයි. ඔහු ගේ එම පිළිවෙත දැක ද, අසා ද දැන ගත යුතු බැවින් එය පහසුවෙන් දත හැකි වේ. අනික් තැනැත්තා එම යහපත් ධර්මයන්ට ද්වේෂ කරයි. නොකැමැති වෙයි. නො අසයි. නො පිළිපදියි. එම කුසල ධර්ම ප්‍රාර්ථනා නොකරයි. ඔහු ගේ එම පිළිවෙත දැක ද, අසා ද දැනගත යුතු බැවින් එය ද පහසුවෙන් දත හැකි වේ.

මෙලොව දියුණුව පරලොව සුගතිය ශාන්ත නිවන පිණිස හේතුවන ඒකාන්ත නිවැරදි ප්‍රතිපදව අපණ්ණක ප්‍රතිපදව නම් වේ.

# ❄ අපණ්ණක ප්‍රතිපදව

එක් සමයක භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ අනාථපිණ්ඩික සිටුතුමා විසින් සාදවා පූජා කරන ලද ජේතවන මහා විහාරයෙහි වැඩ සිටින විටෙක අනාථපිණ්ඩික සිටුතුමා තමන්ගේ යහළු වූ පන්සියයක් තීර්ථක ශ්‍රාවකයන් කැඳවාගෙන බොහෝ සුවඳ මල්, සුවඳ විලවුන්, තෙල්, මී පැණි, හකුරු, හඳිනා වස්ත්‍ර ආදිය ගෙන්වාගෙන ජේතවනාරාමයට ගොස් බුදු රජාණන් වහන්සේට නමස්කාර කොට සුවඳ මල් දම් පූජා කොට බෙහෙත් හා වස්ත්‍ර භික්ෂු සංඝයාට පිළිගන්වා හිඳීමේ දෝෂ සය හැර එකත් පසෙක හිඳගත්හ. ඒ අන්‍ය තීර්ථකයෝ ද බුදු රජාණන් වහන්සේ වැඳ පුන් සඳ මඬලක් බඳු වූ භාග්‍යවතුන් වහන්සේ වහන්සේගේ සශ්‍රීක වූ මුහුණ ද, දෙතිසක් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් හා අසූවක් අනු ව්‍යඤ්ජන ලක්ෂණයන්ගෙන් සැදුම් ලත් ව්‍යාමප්‍රභා කේතුමාලාලංකාරයෙන් විරාජමානව බැබළෙන බඹයක් පමණ වූ බ්‍රහ්ම ශරීරය ද, යුගල යුගලව කරකැවී විහිදෙන බුද්ධ රශ්මි මාලා බලා අනාථපිණ්ඩික මහ සිටාණන් සමීපයෙහි හුන්නාහු ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ රත් ගල් තලාවක හිඳ නාද පවත්වන කේසර

සිංහ රාජයෙකු මෙන් ද, ගෙරවුම් සහිත වූ වැසි වලාකුළක් මෙන් ද, ආකාශ ගංගාව පහළට ගලා බස්නාක් මෙන් ද, රුවන් දමක් ගොතන්නාක් මෙන් ද අෂ්ටාංග සමන්වාගත බ්‍රහ්ම ස්වර විහිදුවා මධුර වූ විසිතුරු ධර්මයක් දේශනා කොට වදාළ සේක.

තීර්ථකයෝ බුදු රජාණන් වහන්සේ කෙරෙහි පැහැද අන් තීර්ථක සරණ අතහැර බුදුරජාණන් වහන්සේ සරණ ගොස් සිටුතුමා සමග නිතිපතා ආරාමයට ගොස් බණ අසති. දන් දෙති, සිල් රකිති, පෙහෙවස් සමාදන් වෙති. භාග්‍යවතුන් වහන්සේ ටික කලක් සැවැත් පුර වැඩ හිඳ රජගහ නුවර බලා වැඩි සේක. ඉන් පසු තීර්ථකයෝ බුදු සරණ අතහැර නැවත මිසදිටු සරණ ගත්හ.

භාග්‍යවතුන් වහන්සේ රජගහ පුර සත් අට මසක් වැඩ හිඳ නැවත සැවැත් නුවර ජේතවනාරාමයටම වැඩි සේක. අනාථපිණ්ඩික සිටුතුමා ඒ මිත්‍රයන් සමග භාග්‍යවතුන් වහන්සේ වැඳීමට ආරාමයට ගොස් භාග්‍යවතුන් වහන්සේ වැඳ සුවඳ මල් ආදියෙන් පූජා කොට එම තීර්ථකයන් බුදු සරණ අතහැර මිසදිටු ගත් බව කීවේ ය. භාග්‍යවතුන් වහන්සේ අප්‍රමාණ අසංඛ්‍ය ගණන් කල්පයන්හි නිරතුරුව පුරුදු කළ වාක් සුචරිතයෙහි බලයෙන් දිව්‍ය සුගන්ධයෙන් සුවඳවත් වූ නොයෙක් සුවඳින් පිරුණු සුවඳ කරඬුවක් විවර කරන්නාක් මෙන් මුව පියුම විවර කොට මිහිරි හඬ නිකුත් කොට **"උපාසකවරුනි! ඔබ තුන් සරණ අතහැර නැවත තීර්ථක සරණ ගියාහු ද?"** අසා වදාළ සේක. ඔවුහු සත්‍යය යැයි කී කල්හි භාග්‍යවතුන් වහන්සේ **"උපාසකවරුනි! යටින් අවීචි නිරයත්, උඩින් භවාග්‍රයත්, සරසින් අප්‍රමාණ ලෝකධාතුන්හිත් සීලාදී ගුණයෙන් තථාගතයන් වහන්සේට සම කෙනෙක් නැත. ඊට වඩා වැඩි කෙනෙක් කොයින් ද?"** වදාළහ. නැවත ද මෙම කරුණ පැහැදිලි කිරීම සඳහා

**යාවතා, භික්ඛවෙ, සත්තා අපදා වා ද්විපදා වා චතුප්පදා වා බහුප්පදා වා රූපිනො වා අරූපිනො වා සඤ්ඤිනො වා අසඤ්ඤිනො වා නෙවසඤ්ඤිනාසඤ්ඤිනො වා, තථාගතො තෙසං අග්ගමක්ඛායති අරහං සම්මාසම්බුද්ධො. යෙ, භික්ඛවෙ, බුද්ධෙ පසන්නා, අග්ගෙ තෙ පසන්නා. අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති.**

**යාවතා, භික්ඛවෙ, ධම්මා සඞ්ඛතා, අරියො අට්ඨඞ්ගිකො මග්ගො තෙසං අග්ගමක්ඛායති. යෙ, භික්ඛවෙ, අරියෙ අට්ඨඞ්ගිකෙ මග්ගෙ පසන්නා, අග්ගෙ තෙ පසන්නා. අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති.**

**යාවතා, භික්ඛවෙ, ධම්මා සඞ්ඛතා වා අසඞ්ඛතා වා, විරාගො තෙසං අග්ගමක්ඛායති, යදිදං මදනිම්මදනො පිපාසවිනයො ආලයසමුග්ඝාතො වට්ටුපච්ඡෙදො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. යෙ, භික්ඛවෙ, විරාගෙ ධම්මෙ පසන්නා, අග්ගෙ තෙ පසන්නා. අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති.**

**යාවතා, භික්ඛවෙ, සඞ්ඝා වා ගණා වා, තථාගතසාවකසඞ්ඝො තෙසං අග්ගමක්ඛායති, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිසපුග්ගලා එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. යෙ, භික්ඛවෙ, සඞ්ඝෙ පසන්නා, අග්ගෙ තෙ පසන්නා. අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති. ඉමෙ ඛො, භික්ඛවෙ, චත්තාරො අග්ගප්පසාදා''ති.**

**අග්ගතො වෙ පසන්නානං - අග්ගං ධම්මං විජානතං,**
**අග්ගෙ බුද්ධෙ පසන්නානං - දක්ඛිණෙය්‍යෙ අනුත්තරෙ.**

**අග්ගෙ ධම්මෙ පසන්නානං - විරාගුපසමෙ සුඛෙ,**
**අග්ගෙ සඞ්ඝෙ පසන්නානං -පුඤ්ඤක්ඛෙත්තෙ අනුත්තරෙ.**

**අග්ගස්මිං දානං දදතං - අග්ගං පුඤ්ඤං පවඩ්ඪති,**
**අග්ගං ආයු ච වණ්ණො ච - යසො කිත්ති සුඛං බලං.**

**අග්ගස්ස දාතා මෙධාවී - අග්ගධම්මසමාහිතො,**
**දෙවභූතො මනුස්සො වා - අග්ගප්පත්තො පමොදතී'ති.**

මහණෙනි, පා නැත්තා වූ හෝ දෙපා ඇත්තා වූ හෝ සිවු පා ඇත්තා වූ හෝ බොහෝ පා ඇත්තා වූ හෝ, රූපය අත්තා වූ හෝ රූපය නැත්තා වූ හෝ, සංඥාව ඇත්තා වූ හෝ සංඥාව නැත්තා වූ හෝ,

භවාග්‍රයෙහි ඉපදුණා වූ හෝ යම් තාක් සත්ත්වයෝ ඇත්තාහු ද, අභීත් සම්‍යක් සම්බුඩ වූ තථාගතයන් වහන්සේ ඔවුන්ට අග්‍ර යැයි කියනු ලැබේ. මහණෙනි, යම් කෙනෙක් බුදුරජාණන් වහන්සේ කෙරෙහි පැහැදුණාහු වෙත් ද, ඔවුහු අග්‍ර තැන්හි පැහැදුණාහු වෙති. අග්‍ර තැන්හි පැහැදුනවුන්ට, අග්‍ර වූ විපාකය වේ.

මහණෙනි, සංඛත වූ හෝ අසංඛත වූ හෝ යම් තාක් ධර්මයෝ වෙත් ද, ඔවුන් අතුරෙන් විරාග සංඛ්‍යාත නිර්වාණය අග්‍රයයි කියනු ලැබේ. සත්විසි මදය නැති කරන, තෘෂ්ණා පිපාස සංසිඳුවන, එකසිය අට වැදෑරුම් තෘෂ්ණාව නසන, සංසාර වට්ටය සිඳින, තෘෂ්ණා ක්‍ෂය වූ, විරාග නම් වූ, නිරෝධ නම් වූ නිර්වාණය සියලු ධර්මයන්ට අග්‍ර යැයි කියනු ලැබේ. මහණෙනි, යම් කෙනෙක් අග්‍ර වූ ධර්මයෙහි පැහැදුණාහු වෙත් ද, ඔවුහු අග්‍ර තැන්හි පැහැදුණාහු වෙති. අග්‍ර තැන්හි පැහැදුණවුන්ට අග්‍ර විපාකය වේ.

මහණෙනි, යම් තාක් සමූහයෝ වෙත් ද, තථාගත ශ්‍රාවක සංඝයා ඒ සියල්ලන්ට ම අග්‍ර වෙති. ඒ ශ්‍රාවක සංඝරත්නය අතර පුරුෂ යුග සතරක් වූ, පුරුෂ පුද්ගලයන් අට දෙනෙකුන් වූ, **ආහුණෙය්‍ය** වූ දුර සිට ගෙනවිත් පූජා කරන ලද්ද පිළිගැනීමට සුදුසු ය, **පාහුණෙය්‍ය** වූ ආගන්තුක සත්කාරයට සුදුසු ය, **දක්ඛිණෙය්‍ය** වූ මෙලොව පරලොස පින් පල අදහා කරන පූජාවන්ට සුදුසු ය, **අඤ්ජලිකරණීය** වූ දෙහොත් මුදුන් තබා කරන නමස්කාරයට සුදුසු ය, **අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස** නම් වූ උසස් ප්‍රතිපදවන්ගෙන් යුක්ත බැවින් සදේවක ලෝක වාසීන්ට අනුත්තර පින් කෙත වූ භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝයා අග්‍ර යැයි කියනු ලැබේ. මහණෙනි, යම් කෙනෙක් ආර්‍ය්‍ය සංඝයා කෙරෙහි පැහැදුණාහු වෙත් ද, ඔවුහු අග්‍ර තැන්හි පැහැදුණාහු වෙති. අග්‍ර තැන්හි පැහැදුණවුන්ට වූ අග්‍ර විපාකය වේ.

අග්‍ර තැන්හි ඒකාන්තයෙන් පැහැදුණා වූ, අග්‍ර වූ චතුස්සත්‍ය ධර්මය දන්නා වූ, අග්‍ර දක්ෂිණාර්හ වූ බුදුරජාණන් වහන්සේ කෙරෙහි පැහැදුනවුන්ට ද, රාගයෙන් වෙන් වූ, සංසිඳීම් සැපය ඇති, අග්‍ර ධර්මයෙහි පැහැදුනවුන්ට ද, පුණ්‍යක්ෂෙත්‍ර වූ අග්‍ර සංඝයා කෙරෙහි පැහැදුණවුන්ට ද, අග්‍ර තැන්හි දන් දෙන්නවුන්ට අග්‍ර වූ පින් වැඩෙයි.

අග්‍ර වූ ආයු, වර්‍ණ, සැප, බල, යසස්, කීර්ති ලැබෙයි. අග්‍ර වූ ශ්‍රද්ධා දී ධර්‍මයන්ගෙන් යුක්ත වූ, අග්‍ර වූ සංඝරත්නය විෂයෙහි දන් දෙන, ප්‍රශස්ත නුවණැති පුද්ගල තෙමේ දෙවි වූයේ හෝ, මනුෂ්‍ය වූයේ හෝ, අග්‍ර සැපයට පැමිණ සතුටු වෙයි.

යන මේ ආදී සූත්‍රවලින් ප්‍රකාශිත පරිදි මෙසේ උතුම් ගුණයන්ගෙන් යුත් රත්නත්‍රය සරණ ගිය උපාසක උපාසිකාවෝ අපායෙහි උපදින්නෝ නම් නො වෙති. ඔවුහු අපාය උපතින් මිදී දෙව්ලොව ඉපිද මහත් සැප විඳිත්. එම නිසා මෙබඳු සරණ හැර අන්‍ය තීර්ථකයන් සරණ යන ඔබ විසින් අයුක්තියක් කරන ලද්දේ ය යැයි වදාළ සේක. මෙහි තෙරුවන් ප්‍රධාන වශයෙන් හා උසස් වශයෙන් සලකා සරණ යන්නවුන්ගේ අපායෙහි ඉපදීමක් නැති බව ප්‍රකට කිරීමට මෙම සූත්‍ර දැක්විය යුතු ය.

**යෙකෙචි බුද්ධං සරණං ගතාසෙ**
**න තෙ ගමිස්සන්ති අපායං,**
**පහාය මානුසං දෙහං**
**දෙවකායං පරිපූරෙස්සන්තී'ති**

යම්කිසි කෙනෙක් බුදුරජාණන් වහන්සේ සරණ ගියාහු නම් ඔහු අපායෙහි නූපදිති. මිනිස් බව හැර දෙව්ලොවට උත්පත්ති වශයෙන් යති.

**යෙකෙචි ධම්මං සරණං ගතාසෙ**
**න තෙ ගමිස්සන්ති අපායං,**
**පහාය මානුසං දෙහං**
**දෙවකායං පරිපූරෙස්සන්තී'ති**

යම්කිසි කෙනෙක් ධර්‍මය සරණ ගියාහු නම් ඔහු අපායෙහි නූපදිති. මිනිස් බව හැර දෙව්ලොවට උත්පත්ති වශයෙන් යති.

**යෙකෙචි සඞ්ඝං සරණං ගතාසෙ**
**න තෙ ගමිස්සන්ති අපායං,**
**පහාය මානුසං දෙහං**
**දෙවකායං පරිපූරෙස්සන්තී'ති**

යම්කිසි කෙනෙක් සංඝයා සරණ ගියාහු නම් ඔහු අපායෙහි නූපදිති. මිනිස් බව හැර දෙව්ලොවට උත්පත්ති වශයෙන් යති. තවද :-

**බහුං වෙ සරණං යන්ති, පබ්බතානි වනානි ච,**
**ආරාමරුක්ඛචෙත්‍යානි, මනුස්සා භයතජ්ජිතා.**

රාජ භයාදී භයින් තැති ගත් බොහෝ මිනිස්සු ඉසිගිලි වේපුල්ල ආදී පර්වතයන් ද, සුභග වන - මහා වන - ගෝසිංග වනා දී වනයන් ද, වේළුවන ජීවකම්බවනනාදී ආරාමයන් ද දේවාලයන් ද චෛත්‍යයන් ද නුග ආදී වෘක්ෂයන් ද ඒකාන්තයෙන් පිහිට කොට සලකන්නාහ.

**නෙතං ඛො සරණං ඛෙමං, නෙතං සරණමුත්තමං,**
**නෙතං සරණමාගම්ම, සබ්බදුක්ඛා පමුච්චති.**

මේ සියලු සරණයම නිර්භය නොවෙයි. මෙකී සරණයන් හේතුවෙන් එක් සත්වයෙකුදු ජාති ජරා මරණාදියෙන් නො මිදෙන බැවින් උත්තම ද නොවෙයි. එබැවින් මෙකී පර්වතාදිය සරණයට පැමිණ සියලු දුක්ඛයෙන් කිසි කලෙකවත් නොමිදෙන්නේය.

**යො ච බුද්ධඤ්ච ධම්මඤ්ච, සඞ්ඝඤ්ච සරණං ගතො,**
**චත්තාරි අරියසච්චානි, සම්මප්පඤ්ඤාය පස්සති.**

**දුක්ඛං දුක්ඛසමුප්පාදං, දුක්ඛස්ස ච අතික්කමං,**
**අරියඤ්චට්ඨඞ්ගිකං මග්ගං, දුක්ඛූපසමගාමිනං.**

යමෙක් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ ද, සද්ධර්මය ද, ආර්‍ය්‍ය සංඝයා ද සරණ ගියේ වේ ද, එයින් චතුරාර්‍ය්‍ය සත්‍යයන් මනා කොට විදර්ශනා ඥානයෙන් දක්නේ වේ ද,

ත්‍රෛභූමික වට්ට සංඛ්‍යාත දුක්ඛ සත්‍යය ය, ඒ දුක් උපදවන තෘෂ්ණා සංඛ්‍යාත සමුදය සත්‍යය ය, ඒ දුක්ඛයාගේ ඉක්මීමට කාරණ වූ නිර්වාණ සංඛ්‍යාත නිරෝධ සත්‍යය ය, එලෙස දුක්ඛ නිරෝධයට පමුණුවන දුක්ඛ නිරොධයට පමුණුවන්නා වූ අෂ්ටාංගික මාර්ග සංඛ්‍යාත මාර්ග සත්‍යය ය යන ආර්ය අෂ්ටාංගික මාර්ගයට මනා කොට පිවිසෙත්,

**එතං ඛො සරණං ඛෙමං, එතං සරණමුත්තමං,**
**එතං සරණමාගම්ම, සබ්බදුක්ඛා පමුච්චතී'ති.**

මෙලෙස රත්නත්‍රය සරණ යෑම ය, චතුරාර්ය සත්‍යයන් මනාව දැක්මය යන මේ සරණ නිර්භය ය. මේ සරණ සියලු දුකින් මිදීමට කරුණු වන හෙයින් උතුම් ය. මේ සරණයට පැමිණ සියලු සත්වයා සංසාර දුක්ඛයෙන් මිදෙන්නේ ය.

භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට දේශනා කළ ධර්මය මෙපමණක් ම නොවේ. තව ද, උපාසකවරුනි! බුද්ධානුස්සති කර්මස්ථානය ධම්මානුස්සති කර්මස්ථානය සංඝානුස්සති කර්මස්ථානය සෝවාන් මාර්ගය ලබා දෙයි. සෝවාන් ඵලය ලබා දෙයි. සකෘදගාමී මාර්ගය ලබා දෙයි. සකෘදගාමී ඵලය ලබා දෙයි. අනාගාමී මාර්ගය ලබා දෙයි. අනාගාමී ඵලය ලබා දෙයි. අර්හත් මාර්ගය ලබා දෙයි. අර්හත් ඵලය ලබා දෙයි. මේ ආදී නයින් ධර්ම දේශනා කොට මෙබඳු වූ පිහිටක් අත් හළ නුඹලා විසින් නුසුදුසු දෙයක් කරන ලදි යැයි වදාළ සේක.

තව ද බුද්ධානුස්සති ආදී කර්මස්ථාන වැඩීමෙන් සෝවාන් ආදී මාර්ග ඵල ලබා දෙන බව මෙසේ වදාළ සේක.

**එකධම්මො, භික්ඛවෙ, භාවිතො බහුලීකතො එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, කතමෙ එකධම්මො බුද්ධානුස්සති. අයං ඛො, භික්ඛවෙ, එකධම්මො භාවිතො බහුලීකතො එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තතී.ති''**

මහණෙනි, එකම ධර්‍මයක් භාවනා වශයෙන් වඩන ලද්දේ, බහුල වශයෙන් වඩන ලද්දේ ඒකාන්තයෙන් සසර කලකිරීම පිණිස, සසර නො ඇලීම පිණිස, රාගාදීන්ගේ නිරෝධය පිණිස, ක්ලේශයන්ගේ සංසිඳීම පිණිස, අනිත්‍ය දී වශයෙන් විශේෂයෙන් දැන ගැනීම පිණිස, චතුරාර්‍ය්‍ය සත්‍යය අවබෝධය පිණිස, නිර්‍වාණාවබෝධය පිණිස පවතී. කවර නම් එකම ධර්‍මයක් ද? බුද්ධානුස්මෘතිය කර්‍මස්ථානය යි. මහණෙනි, එකම ධර්‍මයක් භාවනා වශයෙන් වඩන ලද්දේ, බහුල වශයෙන් වඩන ලද්දේ ඒකාන්තයෙන් සසර කලකිරීම පිණිස, සසර නො ඇලීම පිණිස, රාගාදීන්ගේ නිරෝධය පිණිස, ක්ලේශයන්ගේ සංසිඳීම පිණිස, අනිත්‍ය දී වශයෙන් විශේෂයෙන් දැන ගැනීම පිණිස, චතුරාර්‍ය්‍ය සත්‍යය අවබෝධය පිණිස, නිර්‍වාණාවබෝධය පිණිස පවතී.

(ධම්මානුස්සති සංඝානුස්සති පිළිබඳව ද මෙසේ ම ය.)

මෙසේ භාග්‍යවතුන් වහන්සේ එම උපාසකවරුන්ට අනුශාසනා කොට නැවත ද, උපාසකවරුනි! ඇතැම් මිනිස්සු පිහිට නැති දෙය පිහිට යැයි තර්‍ක ශාස්ත්‍රාදියෙන් වරදවාගෙන අමනුෂ්‍යයන් අරක් ගත් කතරෙහි යක්‍ෂයින්ට බිලි වී විනාශයට පැමිණියහ. ප්‍රශ්න නො තකා ගැනීම පමණක් නිසැක ගැනීමයි. අවිරුද්ධව ගැනීමයි. එය ගත් මිනිස්සු එම කතරෙහි ම සුවපත් බවට පැමිණියහ යැයි වදාරා නිශ්ශබ්ද වූ සේක.

එවිට අනාථපිණ්ඩික සිට තුමා අසුනෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ ප්‍රශංසා කොට දෙහොත් මුදුනෙහි තබා මෙසේ කීවේ ය. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! දැන් මේ උපාසකවරු උතුම් බුදු සරණ අතහැර තර්‍ක ග්‍රහණය කිරීම අපට පැහැදිලි ය. පෙර යක්‍ෂාධිපතීන් ගේ ග්‍රහණයෙන් කාන්තාර මාර්‍ගයෙහි විරුද්ධ ග්‍රාහීන්ගේ විනාශයත් අවිරුද්ධ ග්‍රහිත මනුෂ්‍යයන් යහපතට පැමිණි සැටිත් අපට භවයෙන් වැසී ඇත. එය භාග්‍යවතුන් වහන්සේට පැහැදිලි ය. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! අහසෙහි පුන් සඳ මඬල මතුකොට පෙන්වන්නාක් මෙන් එම අතීත කාරණය වදරන සේක්වා යැයි ආරාධනා කළේ ය.

ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ ගෘහපතිය! මා විසින් අපරිමිත කාලයක් දස පාරමිතාවන් සම්පූර්‍ණ කොට ලෝක සත්වයන්ගේ දුක්

දුරුකිරීම පිණිස ම සියල්ල දන්නා නුවණ ලබන ලද්දේ ය. සිංහ තෙලින් රන් බඳුනක් පුරවන්නාක් මෙන් කන් යොමු කොට අසව යැයි සිටුතුමාගේ උත්සාහය ඇති කරවා වළා ගැබෙන් පුන් සඳ මඬල මතුකොට පෙන්වන්නාක් මෙන් ඒ අතීතය මතුකොට මෙසේ වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහ බෝසතාණන් වහන්සේ ගැල්වලින් බඩු ගෙන ගොස් විකුණන වෙළඳ පවුලක ඉපිද වැඩි විය පැමිණ පන්සියයක් ගැල්වලින් බඩු ගෙන ගොස් විකුණමින් ඇවිද්දේ ය. ඒ කාලයෙහි ම බරණැස් නුවර විසූ නුවණ නැති, උපායෙහි අදක්ෂ සිටු පුත්‍රයෙක් සිටියේ ය. එකල්හි මහ බෝසතාණන් වහන්සේ වෙළඳමෙහි යෑම පිණිස පන්සියයක් ගැල්වල බඩු පුරවා ගමනට සූදානම් කොට තැබී ය. ඒ අනුවණ වෙළඳ පුත්‍රයා ද ගැල් පන්සියයක බඩු පුරවා වෙළඳමෙහි යෑමට සූදානම් කොට තැබී ය. බෝසතාණන් වහන්සේ මෙසේ සිතී ය. මේ අනුවණ වෙළඳ පුත්‍රයා මා සමග යන්නේ නම් ගැල් දහසකට මග ප්‍රමාණවත් නොවේ. මිනිසුන්ට දර දිය ද, ගොනුන්ට තෘණ ද සුලබ නොවන්නේ ය. එබැවින් ඔහු හෝ මම පළමු ව යාම වටී. මෙසේ සිතා ඒ වෙළඳ පුත්‍රයා කැඳවා කරුණු පැහැදිලි කොට නුඹ පළමු ව යන්නෙහි ද, පසුව යන්නෙහි ද යැයි විමසී ය.

එවිට ඒ වෙළඳ තුමා ගමනෙහි අනුසස් මෙසේ සිතී ය. පළමු ව යන කල්හි අබලන් නො වූ මඟින් ම යන්නෙමි. ගොනුන්ට ද නොඉඳුල් තෘණ වන්නේ ය. මිනිසුන්ට ද නො ඉඳුල් පළා කොල ලැබෙන්නේ ය. නොකැළඹුණු ජලය ලැබෙන්නේ ය. කැමති පරිදි වෙළඳ බඩු මිල කළ හැකි වන්නේ ය. මෙසේ සිතා තමන් පළමු ව යන්නෙමි යැයි කීවේ ය.

මහ බොසතාණන් වහන්සේ පසුව යෑමෙහි බොහෝ ආනිශංස දිටී ය. පෙරටුව යන්නෝ මාර්ගයෙහි නො සම තැන් සම කරන්නේ ය. මම ඔවුන් ගිය මඟෙහි පහසුවෙන් යන්නෙමි. පෙරටුව ගිය ගොනුන් මෝරා ගිය තෘණ කෑ කල්හි මගේ ගොනුන් අලුත හටගත් ළා තණ කන්නෝ ය. මිනිසුන්ට ද මිහිරි පළා කොළ ලැබෙන්නේ ය. ජලය නැති

තැන්හි පෙරටුව යන්නෝ කැණීම් කොට ජලය ලබාගන්නෝ ය. අපි ඔවුන් කළ වළවල් වලින් පහසුවෙන් ජලය ලබාගන්නෙමු.

තව ද භාණ්ඩ මිල කිරීම දිවි තොර කිරීමක් වැනි ය. මම පසුව ගොස් ඔවුන් නියම කළ මිලට ම බඩු විකුණන්නෙමි යැයි මෙසේ පසුව යෑමෙහි බොහෝ ආනිශංස දක මිත්‍රය! ඉතා මැනවි, ඔබ පෙරටුව යන්න යැයි කීවේ ය. අනුවණ වෙළෙන්ද එය සතුටින් පිළිගෙන ගැල් යොදගෙන ක්‍රමයෙන් අමනුෂ්‍යයන් අධිගෘහිත කාන්තාරය සමීපයට පැමිණියේ ය.

කාන්තාරය වනාහි "**චෝර කාන්තාර, වාළ කාන්තාර, නිරුදක කාන්තාර, අමනුෂ්‍ය කාන්තාර, අප්පභක්ඛ කාන්තාර**" යැයි පස් වැදෑරුම් වේ. එහි සොරුන් විසින් මග අහුරන ලද්ද **චෝර කාන්තාර** නම් වේ. සිංහාදී දරුණු සත්වයන් විසින් මග අහුරන ලද්ද **වාළ කාන්තාර** නම් වේ. යම් තැනක බීමට හා නෑමට ජලය නැත්තේ වේ ද එය **නිරුදක කාන්තාර** නම් වේ. අමනුෂ්‍යයන් විසින් අරක් ගන්නා ලද්ද **අමනුෂ්‍ය කාන්තාර** නම් වේ. මුල් ආදී ආහාරයට සුදුසු දේ නැත්තේ වේ ද එය **අප්පභක්ඛ කාන්තාර** නම් වේ. මෙම කාන්තාරය නිරුදක හා අමනුෂ්‍ය කාන්තාරයක් විය. එම වෙළඳ පුත්‍රයා ගැල්වල මහත් සැළි තබා ජලය පුරවා සැට යොදුනක් පමණ කාන්තාර මගට පිවිසියේ ය.

ඔවුහු කාන්තාර මධ්‍යයට පිවිසි කල්හි එහි අරක් ගත් යක්‍ෂයා මොවුන් විසින් ගෙනෙන ලද ජලය ඉවත දම්මවා ඔවුන් දුබල කොට කන්නෙමි යැයි සිතා සම්පූර්ණයෙන් සුදු වූ යොවුන් ගොනුන් යොද සිත් කළු ස්ථානයක් මවා දුනු, ඊතල, පලිස් ආදී ආයුධ අතැති ව දස දෙළොස් දෙනෙකුන් පමණ අමනුෂ්‍යයන් පිරිවරා උපුල් කුමුදු මල් පැළඳ තෙත් වූ හිස කෙස් හා වස්ත්‍රවලින් යුක්ත ව අධිපතියෙකු මෙන් ඒ යානාවෙහි හිඳ මඩ තැවරුණු ගැල් සකින් යුක්ත ව ඉදිරියට ගියේ ය. ඔහුගේ පිරිවර ජනයා ද පෙරටුව හා පසුපසින් තෙත් වූ හිස කෙස් හා වස්ත්‍රවලින් යුක්ත ව උපුල් කුමුදු මල් දම් පැළඳ සුදු නෙළුම් මල් මිටි අතැති ව නෙළුම් අල කමින් දිය බිඳු හා මඩ වගුරුවමින් ගියහ.

නොපිරිහෙන මග

වෙළඳ සාත්තු නායකයෙකු නම් යම් දවසක ඉදිරි පසින් සුළං හමා යේ ද එදින යහනාවක හිඳ සේවකයින් පිරිවරා දූවිලි මඟ හරවමින් ඉදිරියෙන් යයි. යම් දිනක පසුපසින් සුළං හමයි ද ඒ අයුරින් ම පසුපසින් යයි. එදින ඉදිරි පසින් සුළං හමන බැවින් ඒ වෙළඳ නායකයා ඉදිරියෙන් ගමන් කළේ ය.

යක්ෂයා ඔහු එනු දැක තම යානය මගින් ඉවත් කොට කොහි යන්නෙහි ද යැයි පිළිසඳර කථා කළේ ය. ඒ වෙළඳ නායකයා ද මාර්ගයෙන් ඉවත්ව අන් ගැල්වලට යෑමට ඉඩ සලස්වා යක්ෂයාට මෙසේ කීවේ ය. පින්වත! අපි බරණැස් නුවර සිට එන්නෙමු. නුඹලා වනාහි උපුල් කුමුදු පැළඳ රත් සුදු නෙළුම් අතැති ව නෙළුම් අල කමින් මඩ තැවරුණු සිරුරු ඇතිව දිය බිඳු හෙළමින් එන්නාහු ය. කිම නුඹලා ආ මග වැසිව වසී ද? උපුල් ආදියෙන් සැදුම් ලත් පොකුණු ආදිය ඇත්තෙහි ද? යැයි විචාළේ ය.

යක්ෂයා ඔහුගේ බස් අසා යහළුව! ඔබ කුමක් කියන්නෙහි ද? නිල් වනරොද පෙනේ. එතැන් සිට මුළු වනයම එක සේ බැඳගෙන වසී. දිය කඳුරු පිරී පවතී. තැනින් තැන නෙළුම් ආදිය පිරුණු විල් ද ඇත යැයි මෙසේ කියා පිළිවෙළින් ගැල් යන කල්හි කොහි යන්නෙහි ද යැයි ඇසුවේ ය. අසවල් දනව්වට යන්නෙමි යැයි වෙළඳ නායකයා කීය. මේ ගැල්වල කුමන බඩු ඇත්තේ ද යැයි යක්ෂයා ඇසී ය. මේ බඩු ඇත යැයි වෙළඳ නායකයා කීවේ ය. පසුපසින් ම එන ගැල ඉතා පරව එනු දැක එහි කුමන බඩු ද යැයි ඇසී ය. එහි ජලය ඇත යැයි කී විට යක්ෂයා ඈත සිට එන නුඹලා ජලය ගෙන ඒම ඉතා හොඳ ය. එහෙත් මෙතැන් සිට ජලය රැගෙන යෑම අවශ්‍ය නොවේ, ඉදිරියෙහි ජලය සුලබ ය. සැළි බිඳ දමා ජලය ඉවත් කොට සැහැල්ලුවෙන් යනු මැනවි යැයි කියා නුඹලා යන්න අපට පමා වේය යැයි කියා නො පෙනෙන තෙක් දුර ගොස් අතුරුදහන් ව තම යක්ෂ නගරයට ගියේ ය.

ඒ නුවණ මඳ සාත්තු නායකයා ද තමාගේ අනුවණ බව නිසා යක්ෂයාගේ වචනය පිළිගෙන දිය පිරි සැළි බිඳුවා පතක් පමණවත් ජලය ඉතිරි නොකොට සියලු ජලය බැහැර කොට ගැල් යෙදවී ය. ඉදිරියෙහි ජලය බිඳක්වත් නොවී ය. ජලය නොලැබ මිනිස්සු ක්ලාන්ත වූහ. හිරු

උද වන තෙක් ගමන් කළ ගැල් කරුවෝ ගැල් මුදු වට කොට තබා ගොනුන් රිය සක්වළ බැන්දහ. ගොනුන්ට ද ජලය නොවී ය. මිනිසුන්ට ද කැඳවත් නොවී ය. දුබල වූ මිනිස්සු ඒ ඒ තැන වැටී නිද ගත්හ. රාත්‍රී කාලයෙහි යක්ෂයෝ පැමිණ සියලු ගොනුන් ද මිනිසුන් ද මරා මස් අනුභව කොට ඇට පමණක් ඉතිරි කොට ගියහ. මෙසේ නුවණ මඳ වෙළඳ නායකයෙකු නිසා ඒ සියල්ලෝ ම විනාශයට පත් වූහ. ඇට කැබලි ඒ ඒ තැන විසිරී තිබිණි. ගැල් පන්සියය භාණ්ඩ පිරවූ ලෙස ම තිබිණි.

මහ බෝසත් වෙළඳ නායකයාණෝ ද නුවණ මඳ වෙළඳ පුත්‍රයා නික්මුණු දින සිට මාස එකහමාරක් කල් ඉක්මවා ගැල් පන්සියයක් පිරිවරා සිය නුවරින් නික්ම පිළිවෙලින් කාන්තාරය අසලට පැමිණියේ ය. එහි දී දිය සැළි ජලයෙන් පුරවා බොහෝ ජලය ගෙන කඳවුරෙහි බෙර හසුරුවා මිනිසුන් රැස් කරවා මෙසේ කීහ. "**කිසිවෙකු මාගෙන් නො විමසා පතක් පමණවත් දිය පරිභෝජනය නොකළ යුතු ය. කාන්තාරයෙහි විෂ ගස් ඇත. මින් පෙර නුඹලා නොකෑ කොළ, මල්, ගෙඩි ආදී කිසිවක් මගෙන් නො විමසා පරිභෝජනය නොකළ යුතු ය.**" යැයි පිරිවර ජනයා දැනුවත් කොට කාන්තාරයට පිළිපන්නේ ය.

මහ බෝසතාණන් වහන්සේ කතර මැදට පැමිණි කල්හි එම යක්ෂයා පෙර සේම බෝසතාණන් වහන්සේ ඉදිරියෙහි පෙනී සිටියේ ය. බෝසතාණන් වහන්සේ ඔහු දුටු පමණින්ම යක්ෂයෙකු බව දැනගත්තේ ය. "**මේ කාන්තාරයකි, මෙහි ජලය නැත. ඔහු ද බිය රහිත ය, රතු වූ නෙත් ඇත්තේ ය, මොහුගේ සෙවණැල්ල ද නො පෙනේ, නිසැකවම මොහු විසින් පෙරටුව ගිය අනුවණ වෙළඳ පුත්‍රයා ජලය ඉවත් කරවා ක්ලාන්ත කොට පිරිවර සහිත ව අනුභව කරන ලද්දේ විය හැකි ය. මොහු මාගේ නැණවත් බව හා උපාය දක්ෂ භාවය නොදන්නේය යැයි සිතා තෙපි යව්, අපි වෙළෙන්දෝ වෙමු, වෙනත් දියක් නො දැක දිය බැහැර කොට ගැල් සැහැල්ලු කොට ගෙන යන්නෙමු**" යැයි කීවේ ය. යක්ෂයා මඳ දුරක් ගොස් යක්ෂ පුරයට ම ගියේ ය. යක්ෂයා ගිය පසු පිරිවර ජනයා මහ බෝසතාණන් වහන්සේට "**ආර්‍යයෙනි! මේ මිනිස්සු මේ පෙනෙන නිල් වන් වන රොදින් මතු නිබඳ ව වැසි වසින බව කියා උපුල් කුමුදු මල් මාලා පැළඳ නෙළුම්**

මල් මිටි ගෙන නෙළුම් අල කමින් දිය බිඳු වැගිරෙන සේ තෙත් වූ වස්ත්‍ර තෙත් වූ හිස කෙස් ඇතිව පැමිණියහ. එබැවින් ජලය බැහැර කොට සැහැල්ලුවෙන් ඉක්මනින් යමු" යැයි මෙසේ කීහ. මහ බොසතාණන් වහන්සේ ඔවුන්ගේ වචනය අසා ගැල් නවත්වා සියලු ම මිනිසුන් රැස් කරවා "නුඹලා මේ කතරෙහි විලක්, පොකුණක් ඇති බවක් කවදා හෝ අසා තිබේ ද?" යැයි ඇසුවේ ය. ඔවුහු නැත යැයි කීහ. එවිට බෝසතාණන් වහන්සේ "මේ නිරුදක කාන්තාරයකි. දූන් මේ නිල් වන් වන රොදින් එහා වැසි වසිති යැයි කියයි. වැසි සුළං කොතෙක් දුර හමා යේ ද?" යැයි ඇසුවේ ය. "ආයෂ්‍යයෙනි! යොදුනක් පමණ දුර හමා යයි" යැයි ඔවුහු කීහ. "කිම, නුඹලාගේ සිරුරට වැසි සුළඟක් දූනේ ද?" යැයි ඇසුවේ ය. ඔවුහු "ආයෂ්‍යයෙනි, නැත" යැයි කීහ. එවිට බෝසතාණන් වහන්සේ "වැසි වලාකුළක් කොපමණ දුර පෙනේ ද" යැයි ඇසුවේ ය. ඔවුහු "ආයෂ්‍යයෙනි, යොදුනක් පමණ දුරට පෙනෙයි" යැයි කීහ. බෝසතාණන් වහන්සේ "නුඹලා කිසිවෙකු විසින් වැසි වලාකුළක් දක්නා ලද්දේ ද?" යැයි ඇසුවේ ය. ඔවුහු "ආයෂ්‍යයෙනි, නැත" යැයි කීහ. නැවත බෝසතාණන් වහන්සේ "විදුලි එලිය කොතෙක් දුර පෙනෙයි ද?" යැයි ඇසුවේ ය. ඔවුහු "ආයෂ්‍යයෙනි, යොදුන් දෙකක් පමණ දුර ඇසෙයි" යැයි කීහ. බෝසතාණන් වහන්සේ "අකුණු හඬ කොතෙක් දුර ඇසේ ද?" යැයි ඇසුවේ ය. ඔවුහු "ආයෂ්‍යයෙනි, යොදුන් දෙකක් පමණ දුර ඇසෙයි" යැයි කීහ. බෝසතාණන් වහන්සේ "නුඹලා විසින් අකුණු හඬක් අසන ලද්දේ ද?" යැයි ඇසුවේ ය. ඔවුහු "ආයෂ්‍යයෙනි, නැත" යැයි කීහ. එවිට මහ බෝසතාණන් වහන්සේ මෙසේ කීවේ ය. "මොවුහු මිනිස්සු නො වෙති. යක්ෂයෝ ය. අපගේ ජලය බැහැර කොට දුබල කරවා මස් අනුභව කිරීමට පැමිණියෝ වන්නාහු ය. අපට පෙරටුව ගිය අනුවණ වෙළඳ පුත්‍රයා උපායෙහි දක්ෂ නොවේ. නිසැකවම මොවුන් විසින් ජලය බැහැර කොට දුබල කරවා අනුභව කරන ලද්දේ වන්නේ ය. බඩු පිරවූ ගැල් පන්සියය තිබූ පරිදි ම අද අපි දකින්නෙමු. දිය පතක්වත් අපතේ නො යවා වහ වහා ගැල් පදවමු" යැයි කියා පැදෙව් වේ ය.

එලෙස ඉදිරියට යන්නේ බඩු පුරවන ලද ගැල් පන්සියය ද, ඒ ඒ තැන විසිරුණු ගොනුන්ගේ හා මිනිසුන්ගේ ඇට කැබලි ආදිය ද දූක සියලු ම ගැල් මුදවා චක්‍රාකාරව තබවා කඳවුරු බන්දවා මිනිසුන්ට ද

ගොනුන්ට ද රාත්‍රී භෝජනය අනුභව කරවා මිනිසුන්ට මැදි වන සේ ගොනුන් හොවවා තම බල නායකයන් ගෙන කඩු ගත් අත් ඇතිව තුන් යම රැස්ව ආරක්‍ෂාව ගෙන සිටයදීම රාත්‍රිය ගෙවී ගියේ ය. පසු දින අලුයම සියලු කටයුතු නිමවා ගොනුන් කවා දුබල වූ ගැල් අතහැර ශක්තිමත් ගැල් යොදවා ගෙන ලාභ තැනට ගොස් සියලු භාණ්ඩ දෙගුණ තෙගුණ මිලට විකුණා සියලු පිරිස ගෙන ආපසු තම නගරයට ම පැමිණියේ ය.

භාග්‍යවතුන් වහන්සේ මෙම කථාව ගෙන හැර දක්වා වදරා තර්ක ඥානය ගත්තාහු පෙර ඉමහත් විනාශයට පත් වූහ. අපණ්ණක ඥනය ගත්තාහු අමනුෂ්‍යයන්ගෙන් මිදී යහතින් කැමති තැනට ගොස් තම තැනට ම ආපසු පැමිණියහ. යැයි අතීත වර්තමාන කථා දෙක ගලපා ධර්ම දේශනා කරමින් මෙසේ වදාළ සේක.

**අපණ්ණකං ඨානමෙකෙ - දුතියං ආහු තක්කිකා,**
**එතදඤ්ඤාය මෙධාවී - තං ගණ්හෙ යදපණ්ණක'න්ති.**

බෝධිසත්වාදී වූ නුවණැති ඇතැම් කෙනෙක් නිසි මඟ ගත්හ. ඇතැම් තාර්කිකයෝ සාපරාධී වූ ඒකාන්ත නොවන අසත්‍ය වූ නොමග ගත්හ. ප්‍රශස්ත බුද්ධිය ඇති තැනැත්තා මේ මග ය, මේ නොමග ය යැයි දැන නිසි මඟම ගන්නේ ය.

මෙයින් ඒකාන්තයෙන් හිත සුව එළවන බැවින් නුවණැත්තන් විසින් අනුගමනය කරන ලද ඒකාන්ත නො වරදින නිවන පිණිස පවතින හේතුව මෙය යැයි දක්වයි. එහි විස්තර වශයෙන් ත්‍රිවිධ සරණාගමනය, පඤ්ච සීලය, දස සීලය, ප්‍රාතිමෝක්‍ෂ සංවරය, ඉන්ද්‍රිය සංවරය, යහපත් දිවි පැවැත්ම, නිවැරදි සිවුපස පරිභෝජනය, චතු පාරිශුද්ධි සීලය, ආහාරයෙහි පමණ දැනීම, ජාගරියානු යෝගය (නිදි වැරීම), ධ්‍යාන වැඩීම, විදර්ශනා වැඩීම, අභිඥා ඥාණ ලැබීම, ලෝකෝත්තර මාර්ග ඵල ලැබීම යන මේ සියල්ල නිවන් මග පිළිවෙත වේ.

මේ අපණ්ණක ප්‍රතිපදාව වනාහි සියලු බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලාගේ පිළිවෙත ය. ලොවුතුරා බුදුවරයන් වහන්සේලා අපණ්ණක ප්‍රතිපදාවෙහි ම පිහිටා දැඩි වීර්‍ය්‍යයෙන් සමත්‍රිංශත් පාරමිතා ධර්‍ම පූර්‍ණය කොට බෝධි මූලයෙහි දී සම්මා සම්බුදු බව ලබති. පසේ බුදුවරයන් වහන්සේලා පසේ බුදුබවම උපදවති. බුද්ධ පුත්‍රයන් වහන්සේලා ශ්‍රාවක පාරමී ඥානය අවබෝධ කරති. මෙලෙස බුදු රජාණන් වහන්සේ ඒ උපාසකවරුන්ට ත්‍රිවිධ උසස් කුල සම්පත්තිය ද, සවැදෑරුම් කාමාවචර දිව්‍ය සම්පත්තිය ද, රූපාරූප බ්‍රහ්ම සම්පත්තිය ද ලබා දී කෙළවර රහත් මඟ ලබා දෙන සුළු අපණ්ණක ප්‍රතිපදාව ය. සතර අපායෙහි ද, පස් වැදෑරුම් වූ පහත් කුළයන්හි උපත ලබා දෙන ප්‍රතිපදාව සපණ්ණක ප්‍රතිපදාව නම් වේ. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මේ අපණ්ණක ධර්‍ම දේශනාව ගෙන හැර දක්වා තව දුරටත් චතුරාර්‍ය්‍ය සත්‍යය සොළොස් ආකාරයකින් විස්තර කොට වදාළ කල්හි ඒ පන්සියයක් උපාසකවරු සෝවාන් ඵලයෙහි පිහිටියහ.

# ❄ ජීවක සූත්‍රය

භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ රජගහ නුවර ජීවක වෛද්‍යාචාර්ය තුමා විසින් සකස් කොට පූජා කරන ලද ජීවක අඹ වනයෙහි වැඩ සිටි දිනක මෙම ජීවක සූත්‍රය ජීවක වෛද්‍යාචාර්ය තුමාට දේශනා කොට වදාළ සේක. ඒ පිළිබඳ අර්ථ විවරණය මෙසේ ය.

# ❄ සූත්‍ර නිදානය

**"එවං මෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති ජීවකම්බවනෙ".**

**"මා විසින් මෙසේ අසන ලදී. රජගහ නුවර අසල කොමාරභච්ච ජීවක වෛද්‍යාචාර්ය තුමාගේ අඹ වනයෙහි වැඩ වාසය කළ සේක".**

බුද්ධූපස්ථායක වූ ආනන්ද තෙරුන් වහන්සේ විසින් ප්‍රථම සංගායනා කාලයෙහි ධර්ම සංගායනා කරන්නා වූ ආයුෂ්මත් මහා කාශ්‍යප මහරහතන් වහන්සේ විසින් විමසන ලදුව පන්සියයක් මහරහතන් වහන්සේලා හට මෙසේ ඉදිරිපත් කළේ ය. මෙම සූත්‍ර දේශනාව අංගුත්තර නිකාය අට්ඨක නිපාතයේ ප්‍රථම පණ්ණාසකයේ තුන් වන ගෘහපති වර්ගයෙහි එන සයවන සූත්‍ර දේශනාවයි.

භාග්‍යවතුන් වහන්සේ වනාහි සියලු ධර්මයන් තමන් වහන්සේ විසින් ම අවබෝධ කරගත් සේක. ආචාර්යවරයෙකු නො මැත්තේය. ලෝක නාථ වූ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවෙහි පටන් සුභද්‍ර පරිබ්‍රාජක තුමා හික්මවීම දක්වා කළ යුතු සියලු බුද්ධ කෘත්‍යයෙන් සම්පූර්ණ කොට කුසිනාරා නුවර උපවර්තන නම් මල්ල රජ දරුවන්ගේ සල් වනයෙහි යමක ශාල වෘක්ෂයන් අතර පනවන ලද උතුම් බුද්ධාසනයෙහි නැවත නො නැඟිටිනා සෙයියාවෙන් වැඩ හිඳ වෙසක් පුර පසළොස්වක පොහෝ

දින අලුයම් වෙලෙහි අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පා වදාළ සේක.

# ❄ ප්‍රථම ධර්ම සංගායනාව

තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණය නිමිත්තෙන් රැස් වූ සත් ලක්‍ෂයක් භික්‍ෂු සංඝයා වහන්සේ අතර සංඝ ස්ථවිර වූ මහා කාශ්‍යප මහරහතන් වහන්සේ තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණයෙන් සත් වන දින පාවා නුවර සිට කුසිනාරාව වෙත වඩිමින් සිට මඳක් විවේක ගැනීම පිණිස මාර්ගයෙන් ඉවත්ව එක් වෘක්‍ෂ මූලයක වැඩ සිටි සේක. එකල්හි පාවා නුවර වැසි එක් උපාසකයෙක් බුද්ධ ශරීරයට ගෞරව දක්වා දෙවියන් විසින් ආකාශයෙහි සිට බුදු සිරුරට පූජා කරන ලද පාත්‍රයක් පමණ වූ දිව්‍යමය මදරා මලකුත් රැගෙන පාවා නුවර වෙත යමින් සිට මහා කාශ්‍යප මහරහතන් වහන්සේ වෙත පැමිණ වැඳ සිටියේ ය. එවිට තෙරුන් වහන්සේ ඒ උපාසක තුමාගෙන් "**කොහි සිට එන්නේ ද**" යැයි අසා සිටියේ ය. ඔහු කුසිනාරාවෙහි සිට ආවෙමි යැයි කීවේ ය. "**අපගේ ශාස්තෲන් වහන්සේ දන්නෙහි ද**" යැයි තෙරුන් වහන්සේ විචාළේ ය. තථාගතයන් වහන්සේ පිරිනිවී සත් දවසක් වන බව කීවේ ය. එය අසා රහතන් වහන්සේලා ද, අනාගාමී ආර්යයන් වහන්සේලා ද ධර්ම සංවේග උපදවා ගත්හ. කාම රාග ව්‍යාපාද ප්‍රහීණ නොවුණු බැවින් සෝවාන්, සකෘදගාමී ආර්යයන් වහන්සේලා ද, කල්‍යාණ පෘථග්ජන භික්‍ෂූන් වහන්සේලා ද අඬා වැලපෙන්නට වූහ.

ඒ අවස්ථාවේ සුභද්‍ර නම් මහලු පැවිද්දෙක් ඒ පිරිසෙහි සිටියේ ය. එම භික්‍ෂුව පූර්වයෙහි ආතුමා නුවර කරණවෑමියෙකු ව සිට වයස්ගත ව පැවිදි වූවෙකි. මහලු වයසේ සිටි බැවින් දරුවන් ලවා තම ගෙවත්තෙහි ම කුටියක් සාදවාගෙන එහි සිටිමින් තම දරුවන්ගේ කෙස් රැවුල් කපමින් ජීවිකාව කළේ ය. එක් චාරිකා සමයක තථාගතයන් වහන්සේ එක්දහස් දෙසිය පනසක් පමණ වූ මහත් භික්‍ෂු පිරිසක් සමග කුසිනාරා නුවර සිට ආතුමා නුවරට වැඩි සේක. එකල්හි එම භික්‍ෂුව තථාගතයන් වහන්සේ විශාල සඟ පිරිසක් සමග වඩින්නේ ය යැයි අසා

සාමණේර භාවයෙන් සිටි තම දරුවන් දෙදෙනා අමතා "**දරුවනි, නුඹලා ගොස් හිස කෙස් කැපීමට උවමනා උපකරණ රැගෙන ගෙයක් පාසා ඇවිද මිනිසුන්ගේ කෙස් රැවුල් කපා ලුණු තෙල් හා අනුභව කළ යුතු දේ රැස්කරවු. භාග්‍යවතුන් වහන්සේ ප්‍රධාන සංඝයාට බෙහෙත් කැඳ දනයක් දෙන්නෙමු**" යැයි කීවේ ය. ඒ සාමණේර පැවිද්දෝ ද එසේ කළහ. භාග්‍යවතුන් වහන්සේ වැඩි කල්හි මිනිසුන්ගේ ද අත් උදව් ඇතිව එලෙස එක්රැස් කරන ලද දෙයින් බොජ්ජ යාගුවක් (ඝන කැඳක්) සෑද වූහ. ගිතෙල්, මී පැණි, මත්ස්‍ය, මාංශ, මල් ඵල රස ආදිය ද, යම් කෑ යුතු දෙයක් වේ ද ඒ සියල්ල එහි දැම්මවීය. තව ද හකුරු යොද කරන ලද "**මධුගෝළක**" නම් කැවිලි ද පිළියෙල කරවීය. මෙයට "**අතිරස කැවුම්**" යැයි ද, "**මධුසීසක**" යැයි ද කියනු ලැබේ. මේ සියල්ල දන්නා භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සමග නගරයට පිඬු පිණිස වැඩි සේක. මිනිස්සු "**භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සමග නගරයට පිඬු පිණිස වඩියි, ඔබ කවුරුන් හට කැඳ පිළිගන්වන්නෙහි ද**" යැයි එම භික්ෂුවට කීහ. එවිට ඒ භික්ෂුව කලබල වී භාග්‍යවතුන් වහන්සේ ඉදිරියට ගොස්, "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, කැඳ පිළිගන්නා සේක්වා**" යැයි ආරාධනා කළේ ය. භාග්‍යවතුන් වහන්සේ "**මහණ, නුඹ කෙසේ කැඳ සැකසුවේ ද**" යැයි අසා ගර්හා කොට අකප්පිය සමාදනය ද, "**පූර්වයෙහි භාවිතා කළ කරණවැම් බඩු පාවිච්චි නොකළ යුතුය**" යැයි ද මෙසේ ඒ භික්ෂුව නිමිති කොට දුෂ්කට සිකපද දෙකක් පනවා දැහැමි කථාවක් කොට භික්ෂූන් අමතා මෙසේ වදළ සේක. "**මහණෙනි, අනේක කල්ප කෝටි ගණනක් භෝජනය සොයන්නවුන් සමගම මේ දීර්ඝ සංසාරයේ කල් ගත කරන ලදි. මෙය වනාහි නුඹලාට අකැප ය. මේ අධර්මයෙන් උපයා ගත් භෝජනය පරිභෝග කළවුන් අනේක වූ ආත්මභාව සිය දහස් ගණනක් අපායෙහි ම උපදින්නෙහි ය. ඉවත් වන්න, මෙය පිළි නොගන්න**" යැයි වදරා පිඬු පිණිස වැඩි සේක. එක් භික්ෂුවකුදු එය පිළි නොගත්හ. සුභද්‍ර භික්ෂුව නො සතුටුව "**මොහු සියල්ල දනිමි යි ඇවිදියි. ඉඳින් නොගනු කැමැත්තෙහි නම් එය කිය යුතු නොවන්නේ ද, මා වෙහෙසීමෙන් කරන ලද සියල්ල මොහු විසින් නසන ලද්දේ ය. මොහු මා කෙරෙහි හිතවත් බවක් නැත්තේ ය**" යැයි තථාගතයන් වහන්සේ සමග වෛරී ව සිට තථාගතයන් වහන්සේ ජීවමාන ව සිටියදී කිසිවක් කියන්නට නොහැකිව සිට පිරිනිවියේ යැයි අසා සතුටු ව අඬා වැලපෙන භික්ෂූන් අමතා මෙසේ කීවේ ය.

**"ඇවැත්නි, ශෝක නොකරවු. නො වැලපෙව්. අපි ඒ මහා ශ්‍රමණයාගෙන් සම්පූර්ණයෙන් මිදුණෝ වෙමු. ඒ මහා ශ්‍රමණයා මෙය නුඹලාට කැපය, මෙය නුඹලාට අකැප ය යනාදී ලෙස සිකපද පනවමින් අපි පීඩාවට පත් කරනු ලැබුවෝ වෙමු. දැන් අපි ඒ ගැහැටවලින් නිදහස් වූවෝ වෙමු. එබැවින් දැන් අපි යමක් කැමැත්තෙමු නම් එය කරන්නෙමු. යමක් අකැමැත්තෙමු නම් එය නො කරන්නෙමු"** යැයි මේ වචනය කීවේ ය.

මේ වචනය මහා කාශ්‍යප මහ රහතන් වහන්සේට හදවතට වැදුණු පහරක් මෙන් ද, හිසට පහත් වූ වියලි හෙනයක් මෙන් ද හැඟී ගියේය. මහත් වූ ධර්ම සංවේගයක් හට ගත්තේ ය. තෙරුන් වහන්සේ සිතන සේක් **"සත් දිනකට පෙර භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑ නමුත් අද ද ඒ බුදු සිරුර රන් පැහැයමම ය. භාග්‍යවතුන් වහන්සේ විසින් දුකසේ ගොඩනැගූ සසුනෙහි පාපී කසටක්, කටුවක් හට ගත්තේ ය. මෙවන් පාපී පුද්ගලයන්ට වැඩෙන්නට ඉඩ ලැබුණ හොත් තවත් සහායකයන් ලැබ ශාසනය පසු බස්සවන්නට හැකි වන්නේ ය. ඉදින් වනාහි මම මේ මහල්ලා ව මෙහි දී ම රෙදි කඩක් අන්දවා අළු විසුරුවා බැහැර කරන්නෙම් නම්, මිනිස්සු ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ දේහය තිබිය දී ම ශ්‍රාවකයෝ විවාද ඇති කර ගනිති යැයි අපට දෙස් පවරන්නාහුය"** යැයි සිතා නැවත ද සිතන සේක් "භාග්‍යවතුන් වහන්සේ විසින් එකට එකතු නොකළ මල් රාශියක් මෙන් ධර්මය දේශනා කරන ලදි. එහි යම් සේ වාතය වැදීමෙන් සමහර මල් විසිරී යයි. එපරිද්දෙන් මෙබඳු පවිටු පුද්ගලයන් නිසා කල් ගතවන විට විනයෙහි සිකපද එක දෙක බැගින් විනාශ වී යන්නේ ය. සූත්‍රයන්හි එකක් දෙකක් ප්‍රශ්න වාරයන් නැසී යන්නේ ය. අභිධර්මයෙහි එක දෙක වෙනස් වෙනස් වාරයන් නැසී යන්නේ ය. මෙසේ පිළිවෙලින් මුල නැසුණු කල්හි අපි පිසාචයන් හා සම වූවෝ වෙමු. එබැවින් ධර්මයත් විනයත් සංගායනා කරන්නෙමි. මෙසේ ඇති කල්හි ශක්තිමත් නූලකින් ගැට ගසන ලද මල් මාලාවක් මෙන් ධර්ම - විනය දෙක ස්ථිරව පිහිටන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ මේ සඳහා ම මට පෙර ගමන් කළ සේක. අවවාද තුනකින් උපසම්පදාව දුන් සේක. කයින් සිවුරු මාරු කළ සේක. මේ සියල්ලට වඩා අසාධාරණ වූ නවානුපූර්ව විහාර සමාපත්තීන්ගෙන් සම තැන තැබූ සේක. මෙසේ තමන් වහන්සේ හා

සම තැන්හි තැබීමෙන් අනුග්‍රහ කරන ලද මට ධර්‍ම - විනය සංගායනාව හැර අන් කිනම් මඟකින් ණය නැති බවක් වන්නේ ද, සක්විති රජෙක් තමන්ගේ සන්නාහයත් ඓශ්වර්‍ය්‍යයත් දීමෙන් ස්වකීය කුල වංශය පිහිට වූ පුතුට මෙන් භාග්‍යවතුන් වහන්සේ **"මෙතෙම මාගේ සද්ධර්‍ම වංශය පිහිටුවන්නෙක් වන්නේ ය"** යැයි දැන මේ අසාධාරණ අනුග්‍රහයෙන් මට අනුග්‍රහ කළ සේක" යැයි සිතුවේ ය. එසේම **"මා වැනි භික්ෂූන් වහන්සේලා සිටියදී මේ පාපියෙකුට සසුනෙහි දියුණු වන්නට ඉඩක් නො තැබිය යුතු ය. යම්තාක් අධර්‍මය අවිනය නො බැබළේ ද ඒ තාක් ධර්‍මයත් විනයත් පසු බසින්නේ නැත. යම් විටෙක අධර්‍මය අවිනය බැබළේ ද එවිට ධර්‍මයත් විනයත් පසු බසින්නේ ය. එබැවින් අධර්‍මවාදීන් අවිනයවාදීන් බලවත් වීමට පෙර ධර්‍මවාදීන් විනයවාදීන් දුබල වීමට පෙර ධර්‍ම - විනය දෙක සංගායනා කරන්නෙම් නම් මැනවි"** යැයි සිතා ඒ මොහොතේ කිසිවක් නොකියා කුසිනාරාව වෙත වැඩම කොට බුදු සිරුර තැන්පත් කරන ලද විසි රියන් උස සඳුන් දර සෑය වටා ප්‍රදක්ෂිණා කොට අධිෂ්ඨාන බලයෙන් බුදු සිරිපා තම නළලෙහි තබා වන්දනා කළේ ය. ඉන් පසු දේවානුභාවයෙන් ඒ චිතකය ගිනි ඇවිල ආදාහනය වූයේ ය.

පරිනිර්වාණයෙන් පසු බුදු සිරුර සත් දිනක් ඒ ආසනයෙහි ම පැවතුණේ ය. ඒ කාලය සදේවක ලෝකවාසීන් විසින් වැඳුම් පිදුම් කළහ. සත් වන දින ආදාහනය සිදුවිය. ඉන් පසු සත් දිනක් ධාතු පූජා කාලය වූහ. ඉන් පසු සර්‍වඥ ධාතු බෙදා දීමට සත් දිනක් ගත විය. මේ අවස්ථාවට සත් ලක්ෂයකට අධික භික්ෂු සංඝයා වහන්සේ රැස්ව සිටියහ. ඒ සර්‍වඥ ධාතු බෙදා දීමේ කටයුතු නිමා වූ පසුව මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ මෙවැනි භික්ෂු සන්නිපාතයක් නැවත දුර්ලභ යැයි සිතා භික්ෂු සංඝයා අමතා "ඇවැත්නි මම එක් සමයක පන්සියයක් පමණ වූ මහත් භික්ෂු පිරිසක් සමග පාවා නුවරින් නික්ම කුසිනාරාව බලා එන අතර තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණය අසා භික්ෂූන් හඬා වැලපෙන කල්හි එක් පාපියෙකු **"ඇවැත්නි නො හඬන්න නොවැළපෙන්න.... යමක් අකැමැත්තෙමු නම් එය නො කරන්නෙමු"** යැයි මෙසේ කීවේ ය. පරිනිර්වාණයට පත් තථාගතයන් වහන්සේගේ බුද්ධ ශරීරය ආදාහනය වීමටත් පෙර මේ නිර්ලජ්ජී පාප භික්ෂූන් ගේ නැඟී සිටීම විය. ධර්‍මය ශාස්තෲන් වහන්සේ සමගම නැතිව ගියේ යැයි

ද, ධර්මය ශාස්තෘවරයෙකු නැති එකක් ය යැයි ද සිතන පාපී භික්ෂූන් වහන්සේලා අලජ්ජී පක්ෂය ලැබ, කොටස්වලට බෙදී නොබෝ කලකින් ම සද්ධර්මය අතුරුදහන් කරන්නාහු ය යන මේ කාරණයක් වෙයි ද, මෙය විද්‍යමාන වන්නේ ය. යම්තාක් ධර්මය විනය පවත්නේ ද, ඒ තාක් බුද්ධ වචනය නොයික්මවා සිටින ශාස්තෘවරයෙකු ඇති එකක් වන්නේය. භාග්‍යවතුන් වහන්සේ විසින් ම "**යො වො, ආනන්‍ද, මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො, සො වො මමච්චයෙන සත්‍ථා**" යනුවෙන් "**ආනන්දය, මා විසින් යම් ධර්මයක් දේශනා කරන ලද්දේ ද, යම් විනයක් පනවන ලද්දේ ද, ඒ ධර්ම - විනය දෙක මාගේ පරිනිර්වාණයෙන් පසු නුඹලාට ශාස්තෘ වන්නේය**" යැයි මේ කාරණය වදරන ලද්දේ ම ය. එබැවින් යම් සේ මෙම ශාසනය බොහෝ කල් පැවැත්මට සුදුසු වූවක් කොට ධර්මයත් විනයත් සංගායනා කරන්නෙමු" යැයි දන්වා සිටියහ.

භික්ෂූන් වහන්සේලා "**ස්වාමීනි, එසේ නම් ස්ථවිරයන් වහන්සේම ඒ සඳහා භික්ෂූන් වහන්සේලා තෝරා ගන්නා සේක්වා**" යි කීහ. තෙරුන් වහන්සේ සියලු නවාංග ශාස්තෘ ශාසන සංඛ්‍යාත පර්යාප්ති ධර වූ නොයෙක් සිය, දහස් ගණන් පෘථග්ජන, සෝතාපන්න, සකෘදගාමී, අනාගාමී, ශුෂ්ක විදර්ශක ක්ෂීණාශ්‍රව භික්ෂූන් හැර පියා ත්‍රිපිටක බුද්ධ වචනය හා සියලු පර්යාප්ති ප්‍රභේදයන්හි පාර ප්‍රාප්ත සිවුපිළිසිඹියා පත් මහත් ආනුභාව ඇති, භාග්‍යවතුන් වහන්සේ විසින් ම අග්‍ර ස්ථානයෙහි තබන ලද ත්‍රිවිද්‍යා දී ප්‍රභේද ඇති ක්ෂීණාශ්‍රව භික්ෂූන් වහන්සේලා ම හාරසිය නවානූ නමක් තෝරා ගත්හ. කුමක් සඳහා එක නමක් අඩු කළ සේක් ද යත්? ආනන්ද තෙරුන් වහන්සේට ඉඩ සලසනු සඳහා ය. ඒ වන විට ආනන්ද තෙරණුවෝ රහත්ව නො සිටි බැවිනි. මේ ආනන්ද තෙරුන් වහන්සේ, භාග්‍යවතුන් වහන්සේ පසුපස යමින් අග්‍ර උපස්ථානය කරමින් බොහෝ ධර්ම - විනය කාරණා උගත්තේ ය. එබැවින් තෙරුන් වහන්සේ නොමැතිව ධර්ම සංගායනාව නොකළ හැකිය. ඉන් පසු අන් භික්ෂූන් වහන්සේලාගේ ඉල්ලීමෙන් ආනන්ද තෙරුන් වහන්සේ ද තෝරා ගත්හ. ඉන් පසු ස්ථවිර භික්ෂූන් වහන්සේලාට "අපි ධර්ම - විනය සංගායනාව කොතැන්හි දී කරන්නෙමු ද" යැයි මේ සිත විය. එවිට එම භික්ෂූන් වහන්සේලාට මේ අදහස වූහ.

**"රජගහ නුවර භික්‍ෂාව ලැබීමට පහසු ය. බොහෝ සෙනසුන් ද ඇත. අජාසත් රජතුමා ගේ දැහැමි ආරක්‍ෂාව ද ලැබිය හැක. එබැවින් අපි රජගහ නුවර වස් වසමින් ධර්‍මයත් විනයත් සංගායනා කරන්නෙමු, අපගේ මේ කටයුත්ත බොහෝ කල් පවත්නකි. කිසියම් විරුද්ධ පුද්ගලයෙක් සඟ මැදට පැමිණ අර්බුද ඇති කිරීමට ඉඩ ඇත. එබැවින් අන් භික්‍ෂූන් වහන්සේලා රජගහ නුවර වස් නො විසිය යුතුය. ධර්‍ම සංග්‍රාහක භික්‍ෂූන් වහන්සේලා පමණක් රජගහ නුවර වස් සමාදන් විය යුතුය"** යැයි අදහස වී ඤත්ති දුතිය කර්‍මයෙන් එලෙස සම්මත කර ගත්හ.

ඉන් පසු වස් එළඹෙන සමය ලංවන බැවින් මහා කාශ්‍යප තෙරුන් වහන්සේ, සංගායනාවට සම්මත රහතන් වහන්සේලාගෙන් අඩක් ගෙන රජගහ නුවර බලා එක් මඟකින් වැඩි සේක. අනුරුද්ධ තෙරුන් වහන්සේ ද, රහතන් වහන්සේලාගෙන් අඩක් ගෙන රජගහ නුවර බලා එක් මඟකින් වැඩි සේක. ආනන්ද තෙරුන් වහන්සේ ද, රජගහ නුවර වඩිනු කැමති ව, භාග්‍යවතුන් වහන්සේගේ පාත්‍රය හා චීවර ගෙන මහත් වූ භික්‍ෂූන් වහන්සේලා පිරිසක් පිරිවරා ගෙන සැවැත් නුවර බලා චාරිකාවෙහි වැඩි සේක. ජේතවනාරාමයට වැඩ භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටි ගඳකිළියෙහි දොර විවර කොට ඇඳ පුටු බැහැරට ගෙන ගසා දමා ගඳකිළිය හැමද මැලවුණු මල් ආදී කසල බැහැර කොට ඇඳ පුටු ඇතුළට ගෙන ගොස් සුදුසු තැන්හි තබා භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටි කල්හි මෙන් කළ යුතු සියලු වතාවත් සිදුකළ සේක. ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ පරිනිර්‍වාණයෙහි පටන් සිටීම් හිඳීම් බහුලව සිටි බැවින් සෙම් පිත් ආදී දෙස් කිපුණු ශරීරයෙන් සිටි බැවින් දෙවන දින කිරි විරේකයක් පානය කොට විහාරයෙහි ම වැඩ සිටි සේක. පසු දින සුභ මානවකයාගේ ආරාධනාවෙන් ඔහුගේ නිවසට වැඩ ඔහු විසින් විචාරන ලද පැන විසඳමින් දීඝ නිකායෙහි ඇතුළත් **"සුභ සූත්‍රය"** වදාළ සේක. අනතුරුව දෙව්රම් වෙහෙරෙහි කැඩුණු බිඳුණු තැන් පිළිසකර කරවා වස් එළඹෙන සමය ලංවන බැවින් උපකාරක එක් භික්‍ෂූන් වහන්සේ නමක් සමග රජගහ නුවරට වැඩි සේක.

එසමයෙහි වනාහි රජගහ නුවර මහා විහාර දහ අටක් වූහ. එනම් **තල් වනය, වේළුවනය, සීත වනය, මද්දකුච්ඡි මිගදය, ජීවක අම්බ වනය, මෝර නිවාපය, ලට්ඨි වනය** යන මේවා රජගහ නුවර සමීපයෙහි විය. එසේම **චෝර පපාතය, ඉසිගිලි** පර්වතය පාමුල වූ **කාලසිලාව,** වේභාර පර්වතය පාමුල වූ **සප්තපර්ණී ගුහාව, සීත**වන සොහොන් බිම සමීපයෙහි වූ **සප්තසොණ්ඩික පබ්බභාරය, ගෝතම කන්දරය, තින්දුක ගුහාව, තපෝද කන්දරය, ඉන්ද සාල ගුහාව, පිප්ඵලි ගුහාව,** ගිජ්ජකූට පර්වතයෙහි වූ **සූකර කත ලෙන** යන මේවා රජගහ නුවර වටා පිහිටි ඒවා ය. භාග්‍යවතුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු භික්ෂූන් වහන්සේලා මේ විහාර සියල්ල අත්හැර දමා ගිය බැවින් මකුළු දැල් බැඳී කොළ රොඩුවලින් ගැවසී පාලු විය. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ ද, අනුරුද්ධ තෙරුන් වහන්සේ ද සපිරිවරින් රජගහ නුවරට වැඩ අපවිත්‍ර වී පාලුවට ගොස් ඇති සෙනසුන් දැක **"භාග්‍යවතුන් වහන්සේගේ වචනයට ගරු කිරීම පිණිස ද, තීර්ථක උපවාදයෙන් මිදෙනු පිණිස ද පළමු මාසය අපවිත්‍ර සේනාසන පිරිසිදු කර කැඩුණු බිඳුණු තැන් පිළිසකර කරන්නෙමු"** යැයි මෙසේ සිතූහ.

තීර්ථකයෝ **"ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ ශ්‍රාවකයෝ ශාස්තෘන් වහන්සේ සිටි කල්හි පමණක් විහාරයන් පිළිදැගුම් කළහ. පිරිනිවි කල්හි ඒ වතාවත් අතහැරියාහුය"** යැයි මෙසේ කියන්නාහු ය. භාග්‍යවතුන් වහන්සේ විසින් විහාරයන්හි කැඩුණු බිඳුණු තැන් පිළිසකර කිරීම වර්ණනා කරන ලදි. ඇවැත්නි එබැවින් අපි වස්කාලයෙහි පළමු මස විහාර පිළිසකර කරමු, මැද මාසයෙහි රැස්ව ධර්ම - විනය සංගායනා කරන්නෙමු යැයි කතිකා කරගෙන දෙවන දින රජ මාලිගයට වැඩ අජාසත්ත රජතුමා සම්මුඛ වී විහාර පිළිසකර කිරීමට අත් උදව් අවශ්‍ය බව කීහ. රජතුමා මිනිසුන් දුන්නේ ය. තෙරුන් වහන්සේලා විහාර පිළිසකර කරවා රජතුමාට ඒ බව දන්වා නැවත ද **"මහරජ, ධර්ම සංගායනාවක් කරනු කැමැත්තෙමු"** යැයි කීහ. රජතුමා එය අසා **"ස්වාමීනි, විශ්වාස ඇත්තෝ ව කරනු මැනවි. ස්වාමින් වහන්සේලාට ධර්මචක්‍රය වේවා. මා හට ආඥා බලය වේවා. ඒ සඳහා මා විසින් කුමක් කළ යුතු ද"** යැයි අසා සිටියේ ය. **"මහරජ, ධර්මය - විනය සංගායනා කරන්නා වූ භික්ෂූන් වහන්සේලාට වැඩ හිඳීමට තැනක් කරවා ගත යුතුය"** යැයි කීහ. **"එය කොතැන්හි කළ යුතු ද"** යැයි රජතුමා ඇසුවේය.

**"වේභාර පර්වතය පාමුල වූ සප්තපර්ණි ගුහා ද්වාරයෙහි සුදුසු ය"** යැයි තෙරුන් වහන්සේලා කීහ.

එකල්හි රජතුමා, විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා විසින් මවන ලද්දක් හා සමාන වූ, මැනවින් බෙදන ලද බිත්ති ඇති, කණු ඇති, පියගැටපෙළ ඇති, නන් වැදෑරුම් මල් කම් ලිය කම්වලින් විසිතුරු කරන ලද මහා මණ්ඩපයක් කරවා, නොයෙක් මල් දම් එල්ලන ලද මනහර වියනක් කරවා, නොයෙක් රත්නයන්ගෙන් විසිතුරු වූ මැණික් ඔබ්බවන ලද මාලා කර්මයන්ගෙන් විසිතුරු වූ බිමක් එහි කරවා, බ්‍රහ්ම විමානයක් සේ සරසා, පන්සියයක් භික්ෂූන් වහන්සේලාට වැඩ හිඳීමට අනගි වූ පස තුරුණු පණවා, මණ්ඩපය මැද නැගෙනහිරට මුහුණ ලා සම්මා සම්බුදු රජාණන් වහන්සේට වැඩ හිඳීමට සුදුසු බුද්ධාසනයක් ද පනවා, එහි දකුණුපස උතුරු දෙසට මුහුණ ලා ථේරාසනයක් ද, ඇත් දළ එබ්බ වූ විසිතුරු විජිනිපතක් තබා **"ස්වාමීනි, මගේ කටයුතු නිමවන ලදී"** යැයි තෙරුන් වහන්සේලාට දන්වා සිටියේ ය.

## ☸ අනද තෙරුන් රහත් වීම

මේ වන විටත් ආනන්ද තෙරුන් වහන්සේ ශෛක්ෂව සිටි බැවින් රහතන් වහන්සේලා ආනන්ද තෙරුන් වෙත පැමිණ **"ආනන්දය, හෙට අපගේ රැස්වීම වන්නේය. නුඹ තවම ශෛක්ෂයෙකි, රැස්වීමට යැමට නුසුදුස්සෙකි. එබැවින් අප්‍රමාදී විය යුතුය"** යැයි කීහ. ආනන්ද තෙරණුවෝ ද **"හෙට රැස්වීම වන්නේය. මා විසින් ශෛක්ෂව රැස්වීමට යැම නොවටීය"** යැයි සිතා රාත්‍රියෙහි බොහෝ වේලාවක් කායගතා සති කමටහනින් යුතුව සක්මනෙහි යෙදී උත්සාහ කළ නමුත් විශේෂාධිගමයක් නොවූ බැවින්, මඳක් විවේක ගෙන නැවත උත්සාහයෙහි යෙදෙන්නෙමි යැයි සිතා, අලුයම් වෙලෙහි සක්මනින් බැස පා සෝද විහාරයට පිවිස, විඩා හරින්නෙමි යැයි ඇඳෙහි වැඩ හිඳ කොට්ටය වෙත හිස එළ වූ සේක. දෙපා පොළොවෙන් මිදුණාහ. හිස කොට්ටයට නො පැමිණියේ ය. මේ අතර රහත් වූ සේක. මෙසේ හිඳීම, සිටීම, සක්මන් කිරීම සැතපීම යන සිව් ඉරියව්වෙන් තොරව රහත් වූහ. එබැවින් **මේ බුදු සසුනෙහි සිව් ඉරියව්වෙන් තොරව යම් භික්ෂූන්**

**වහන්සේ නමක් රහත් වූයේ නම් ඒ ආනන්ද තෙරුන් වහන්සේය යැයි කිව යුතු වන්නේය.**

පසු දින ස්ථවීර තෙරුන් වහන්සේලා බත්කිස කොට පාත්‍ර චීවර තැන්පත් කොට තබා ධර්‍ම මණ්ඩපයෙහි රැස්ව තමන් වහන්සේලාට නියමිත ආසනයන්හි වැඩහුන් සේක. ආනන්ද තෙරුන් වහන්සේ ගේ ආසනය පමණක් හිස් විය. ආනන්ද තෙරුන් වහන්සේ තමන් රහත්ව වැඩි බව හඟවනු පිණිස භික්ෂූන් වහන්සේලා සමග නොවැඩියේ ය. භික්ෂූන් වහන්සේලා "**මේ ආසනය කවරෙකු සඳහා ද**" යැයි විචාළහ. "**මෙය ආනන්ද තෙරුන් වහන්සේ සඳහා**" යැයි කීහ. ආනන්ද තෙරුන් වහන්සේ ඒ මොහොතේ සිටි ආවාසයෙන් පොළොව කිමිද මණ්ඩපයෙන් මතුව තමන් වහන්සේට නියමිත ආසනයෙහි වැඩ සිටි සේක. මේ හේතුවෙන් ආනන්ද තෙරුන් වහන්සේ රහත්ව වැඩි බව සියලු භික්ෂූන් වහන්සේලා ම පිළිගත්හ.

## ☸ විනය සංගායනා කිරීම

මෙසේ ධර්‍ම සංග්‍රාහක මහා රහතන් වහන්සේලා ධර්‍ම මණ්ඩපයෙහි රැස් වූ කල්හි සංඝ ස්ථවීර වූ මහා කාශ්‍යප තෙරුන් වහන්සේ "**ඇවැත්නි, ධර්‍මය විනය දෙකෙන් කවරක් පළමු ව සංගායනා කරන්නෙමු ද**" යැයි භික්ෂු සංඝයා ඇමතූ සේක. භික්ෂූන් වහන්සේලා "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, විනය නම් බුද්ධ සාසනයාගේ ආයුෂයයි. විනය පිහිටි කල්හි ශාසනය සිටියේ වෙයි. එබැවින් පළමු ව විනය සංගායනා කරමු**" යැයි කීහ. "**කවුරුන් ප්‍රධාන කොට ගෙන විනය සංගායනා කළ යුතු ද**" යැයි කාශ්‍යප තෙරුන් වහන්සේ ඇසුවේ ය. "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, මේ උපාලි තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ විසින් ම විනයධරයන් අතර අග්‍ර ස්ථානයෙහි තබා වදාළ සේක. එබැවින් උපාලි තෙරුන් වහන්සේ ප්‍රධාන කොට ගෙන සංගායනා කරමු**" යැයි භික්ෂූන් වහන්සේලා කීහ. ඉන් පසු කාශ්‍යප තෙරුන් වහන්සේ විනය විචාරීමට "**සුණාතු මෙ, ආවුසො, සඞෙඝා. යදි සඞඝස්ස පත්තකල්ලං, අහං ආයස්මන්තං උපාලිං විනයං පුච්ඡෙය්‍යං**" යනුවෙන් තමන් වහන්සේ ම සම්මත කරගෙන

ථේරාසනයෙහි වැඩ සිටි සේක. උපාලි තෙරුන් වහන්සේ විනය විසඳීමට "**සුණාතු මෙ, භන්තෙ, සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං ආයස්මතා මහාකස්සපෙන විනයං පුට්ඨො විස්සජ්ජෙය්‍යං**" යනුවෙන් තමන් වහන්සේ ම සම්මත කරගෙන අසුනින් නැඟිට සිවුර ගැට වටු ගන්වාගෙන, වැඩිහිටි ස්ථවීර භික්ෂූන් වැඳ, විජිනිපත ගෙන ධර්මාසනයෙහි වැඩහුන් සේක. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ උපාලි තෙරුන් වහන්සේගෙන් මෙසේ විනය විචාල සේක.

"**ඇවැත්නි, උපාලිය, භාග්‍යවතුන් වහන්සේ පළමු පාරාජිකාව කොතැනක දී පනවා වදාළ සේක් ද**" යැයි ඇසීය. උපාලි තෙරුන් වහන්සේ "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, විශාලා මහනුවර දී පනවා වදාළ සේක**" යැයි විසඳුවේ ය. "**කවුරුන් අරබයා පනවා වදාළ සේක් ද**" යැයි ඇසීය. "**කලන්දක පුත්‍ර සුදින්න තෙරුන් අරබයා පනවා වදාළ සේක**" යැයි විසඳුවේ ය. "**කුමන වස්තුවෙහි පනවා වදාළ සේක් ද**" යැයි ඇසීය. "**මෛථුන ධර්ම ප්‍රතිසේවනයෙහි පනවා වදාළ සේක**" යැයි විසඳුවේ ය. ඉන් පසු සියලු දෙනා වහන්සේ ම එකතුව පළමු පාරාජිකා සිකපදය නිදාන සහිතව සන සජ්ඣායනා කළහ. මෙලෙස සෙසු ශික්ෂා පදයන් ද, භික්ෂු භික්ෂුණී උභතෝ විභංගය ද, දෙවිසි ඛන්දකයන් ද, සොළොස් පරිවාරයන් ද සහිත සියලු විනය පිටකය සංගායනා කොට උපාලි තෙරුන් වහන්සේ විජිනිපත තබා ධර්මාසනයෙන් බැස වැඩිහිටි තෙරුන් වහන්සේලා වැඳ තමාට පැමිණි අසුනෙහි වැඩහුන් සේක.

## ☸ ධර්මය සංගායනා කිරීම

විනය සංගායනාවෙන් අනතුරුව ධර්මය සංගායනා කරනු කැමති මහා කාශ්‍යප තෙරුන් වහන්සේ, භික්ෂු සංඝයා වහන්සේ අමතා "**ධර්මය සංගායනා කරන්නා වූ අප විසින් කවුරුන් ප්‍රධාන කොට ගෙන කළ යුතු ද**" යැයි අසා සිටියේ ය. භික්ෂූන් වහන්සේලා "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, මේ ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි බොහෝ ධර්මයන් ඉගෙන ගත්තෙකි. භාග්‍යවතුන් වහන්සේ විසින් කරුණු පසකින් අග්‍ර ස්ථානයෙහි තබන ලද්දෙහි ය. එබැවින් මේ ආනන්ද තෙරුන් වහන්සේ ප්‍රධාන කොට ගෙන**

**සංගායනා කරමු**" යැයි කීහ. ඉන් පසු කාශ්‍යප තෙරුන් වහන්සේ ධර්මය විචාරීමට "**සුණාතු මෙ, ආවුසො, සඞෙසා. යදි සඞසසස පත්තකල්ලං, අහං ආයසමන්තං ආනන්දං ධම්මං පුච්ජෙය්‍යං**" යනුවෙන් තමන් වහන්සේ ම සම්මත කරගෙන ථේරාසනයෙහි වැඩ සිටි සේක. ආනන්ද තෙරුන් වහන්සේ ධර්මය විසඳීමට "**සුණාතු මෙ, භන්තෙ, සඞෙසා. යදි සඞසසස පත්තකල්ලං, අහං ආයසමතා මහාකස්සපෙන ධම්මං පුට්ඨො විස්සජ්ජෙය්‍යං**" යනුවෙන් තමන් වහන්සේ ම සම්මත කරගෙන අසුනින් නැගිට සිවුර ගැට වටු ගන්වා ගෙන වැඩිහිටි ස්ථවීර භික්ෂූන් වහන්සේලා වැඳ විජිනිපත ගෙන ධර්මාසනයෙහි වැඩහුන් සේක. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ ආනන්ද තෙරුන් වහන්සේගෙන් මෙසේ ධර්මය විචාල සේක.

"**ඇවැත්නි, ආනන්දය, භාග්‍යවතුන් වහන්සේ බ්‍රහ්ම ජාල සූත්‍රය කොතැනක දී දේශනා කොට වදාළ සේක් ද**" යැයි ඇසීය. ආනන්ද තෙරුන් වහන්සේ, "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, රජගහ නුවරටත් නාලන්ද නුවරටත් අතර අම්බලට්ඨිකා රජ උයනෙහි වූ රාජාගාරයෙහිදී දේශනා කොට වදාළ සේක**" යැයි විසඳුවේ ය. "**කවුරුන් අරබයා දේශනා කොට වදාළ සේක් ද**" යැයි ඇසීය. "**ස්ථවිරයන් වහන්ස, සුප්පිය පරිබ්‍රාජකයා ද බ්‍රහ්මදත්ත මානවකයා ද අරබයා දේශනා කොට වදාළ සේක**" යැයි විසඳුවෙහි ය. මෙසේ බ්‍රහ්ම ජාල සූත්‍රයෙහි නිදානය ද විචාළහ. පුද්ගලයා ද විචාළහ. ඉන් පසු "**ඇවැත්නි, ආනන්දය, භාග්‍යවතුන් වහන්සේ සාමඤ්ඤඵල සූත්‍රය කොතැනක දී දේශනා කොට වදාළ සේක් ද**" යැයි ඇසීය. ආනන්ද තෙරුන් වහන්සේ, "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, රජගහ නුවර ජීවක අඹ වනයෙහි දී දේශනා කොට වදාළ සේක**" යැයි විසඳුවෙහි ය. "**කවුරුන් අරභයා දේශනා කොට වදාළ සේක් ද**" යැයි ඇසීය. "**වෛදේහිපුත්‍ර අජාසත්ත රජතුමා අරබයා දේශනා කොට වදාළ සේක**" යැයි විසඳුවෙහි ය. මෙසේ සාමඤ්ඤඵල සූත්‍රයෙහි නිදානය ද විචාළහ. පුද්ගලයා ද විචාළහ. මේ ක්‍රමයෙන් සියලු සූත්‍ර පිටකය ද, සියලු අභිධර්ම පිටකය ද සංගායනා කළහ. මෙසේ සංගායනා කළා වූ ධර්ම - විනය විවිධාකාරයෙන් බෙදා දැක්වූහ.

## ☸ ධර්‍ම විනය බෙදා දැක්වීම

මේ සියලු බුද්ධ වචනය **"රස වශයෙන් එක් වැදෑරුම් වේ. ධර්‍මය - විනය වශයෙන් දෙ වැදෑරුම් වේ. වචන වශයෙන් තෙවැදෑරුම් වේ. පිටක වශයෙන් ද තෙවැදෑරුම් වේ. නිකාය වශයෙන් පස් වැදෑරුම් වේ. අංග වශයෙන් නව වැදෑරුම් වේ. ධර්‍මස්කන්ධ වශයෙන් සුවාසූ දහසක් වේ".**

### බුද්ධ වචනය රස වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේ ද?

භාග්‍යවතුන් වහන්සේ අනුත්තර සම්මා සම්බෝධියට පැමිණ දම්සක් සූත්‍රය පැවැත්වීමේ පටන් පිරිනිවන් මඤ්චකය දක්වා වදාළ සියලු බුද්ධ වචනය, මහා සමුද්‍රයෙහි කොතැනින් ජලබිඳක් ගත්තේ ද එකම ලුණු රසය වන්නා සේ, දහම් පදයක් පාසා ම සත්වයන් නිවනට පමුණුවන ගුණයෙන් යුක්ත බැවින් නිවන් රසයෙන් යුක්ත ය.

### ධර්‍ම විනය වශයෙන් දෙ වැදෑරුම් වන්නේ කෙසේ ද?

කාය - වාක් සංවරය පිණිස පනවා වදාළ සියලු බුද්ධ වචනය **"විනය"** නම් වේ. සිතෙහි පවත්නා කෙලෙසුන්ගේ තදංග විෂ්කම්භන සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය පිණිස දේශනා කොට වදාළ අවශේෂ බුද්ධ වචනය **"ධර්‍ම"** නම් වේ.

### වචන වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේ ද?

බුදු බවට පැමිණ පටිච්ච සමුප්පාද හේතුඵල ධර්‍මය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මනසිකාර කිරීමෙන් ඇති වූ පහන් සංවේගය වචන බවට පෙරලී ප්‍රථමයෙන් ම බුදු මුවින් පිටවුණු :-

**"අනෙක ජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං,**
**ගහකාරකං ගවෙසන්තො - දුක්ඛා ජාති පුනප්පුනං"**

**"ගහකාරක දිට්ඨොසි - පුන ගෙහං න කාහසි,**
**සබ්බා තෙ ඵාසුකා භග්ගා - ගහකූටං විසඞ්ඛතං,**
**විසඞ්ඛාරගතං චිත්තං - තණ්හානං ඛයමජ්ඣගා"ති.**

යන මේ ගාථා දෙක ප්‍රථම බුද්ධ වචනයයි.

පරිනිර්වාණ මඤ්චකයෙහි සැතපී අවසාන වශයෙන් වදාළ **"හන්දදානි, භික්ඛවෙ, ආමන්තයාමි වො, වයධම්මා සඞ්ඛාරා, අප්පමාදෙන සම්පාදෙථ"** යන මෙය අන්තිම බුද්ධ වචනයයි. මේ අතරතුර පන්සාළිස් වසක් මුළුල්ලෙහි වදාළ සියල්ල මධ්‍යම බුද්ධ වචනයයි.

### පිටක වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේ ද?

ප්‍රථම සංගායනාවේ දී සංගායනාවට නැගුණා වූ ද, නො නැගුණා වූ ද සියල්ල එක් කොට "උභය ප්‍රාතිමෝක්ෂය, උභය විභංගය, දෙවිසි කඳුවත්, සෝළස පරිවාර" යන මේ සියල්ල **"විනය පිටකය"** නම් වේ. "දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අංගුත්තර නිකාය, ඛුද්දක නිකාය" යන මේ සියල්ල **"සූත්‍ර පිටකය"** නම් වේ. "ධම්මසංගණී, විභංග, ධාතු කථා, පුද්ගල පඤ්ඤත්ති, කථා වත්ථු, යමක, පට්ඨාන" යන ප්‍රකරණ සත **"අභිධර්ම පිටකය"** නම් වේ.

### නිකාය වශයෙන් පස් වැදෑරුම් වන්නේ කෙසේ ද?

බ්‍රහ්ම ජාල සූත්‍රයෙහි පටන් දීඝී වූ සූත්‍ර තිස්හතරක් ඇති වර්ග තුනකින් යුත් සංග්‍රහය **"දීඝනිකාය"** නම් වේ. මූලපරියාය සූත්‍රයෙහි පටන් මධ්‍යම ප්‍රමාණයෙන් යුත් සූත්‍ර එකසිය දෙපණසකින් යුක්ත වූ වර්ග පසළොසකින් යුත් සංග්‍රහය **"මජ්ඣිම නිකාය"** නම් වේ. ඔඝතරණ සූත්‍රයෙහි පටන් සත් දහස් සත්සිය දෙසැටක් සූත්‍ර ඇති සංයුත්ත පනස් හයකින් යුත් සංග්‍රහය **"සංයුත්ත නිකාය"** නම් වේ. චිත්ත පරියාදය සූත්‍රයෙහි පටන් සූත්‍ර නවදහස් පන්සිය සත් පනසකින් යුත් වර්ග එකසිය

සත් සැත්තෑවක් ඇති නිපාත එකොළොසකින් යුත් සංග්‍රහය "**අංගුත්තර නිකාය**" නම් වේ. එසේම මේ නිකාය සතරට ඇතුළත් නොවූ "ඛුද්දකපාඨ, ධම්මපද, උදාන, ඉතිවුත්තක, සුත්තනිපාත, විමානවත්ථු පෙතවත්ථු, ථෙරගාථා, ථෙරිගාථා, පටිසම්භිධා, අපදාන, ජාතක, නිද්දේස, බුද්ධවංස, චරියා පිටක" යන කුඩා ග්‍රන්ථ පසළොස ද, "විනය පිටකය හා අභිධර්‍ම පිටකය" යන දෙක ද ඇතුළත් ව මේ සියල්ල "**ඛුද්දක නිකාය**" නම් වේ. මෙසේ නිකාය වශයෙන් පස් වැදෑරුම් වේ.

## අංග වශයෙන් නව වැදෑරුම් වන්නේ කෙසේ ද?,

"සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල" යන මේ නවයයි. මෙය "**නවාංග ශාස්තෘ ශාසනය**" නම් වේ.

- "උභතෝ විභංගය, නිද්දේස, ඛන්ධක, පරිවාර" යන මේවා ද, සුත්තනිපාතයෙහි ඇතුළත් "මංගල සූත්‍රය, රතන සූත්‍රය, නාලක සූත්‍රය, තුවටක සූත්‍රය" ආදී සූත්‍ර නාමයෙන් දැක්වෙන සියලු බුද්ධ වචනය "**සුත්ත**" නම් වේ.
- සියලු ගාථා සහිත සූත්‍ර "**ගෙය්‍ය**" නම් වේ. සංයුත්ත නිකායෙහි සගාථ වර්‍ගය ද, අන් සියලු සගාථ සූත්‍රයන් ද මෙහි ඇතුළත් වේ.
- සියලු අභිධර්‍ම පිටකය ද, සියලු නිර්‍ගාථක සූත්‍රයන් ද, අන් අංග අටෙහි සංග්‍රහ නොවූ සියලු බුද්ධ වචනය ද "**වෙය්‍යාකරණ**" නම් වේ.
- "ධම්මපද, ථෙරගාථා, ථෙරිගාථා" යන මේවා ද, සුත්තනිපාතයෙහි සූත්‍ර සංඛ්‍යාවට නො ගැනෙන ගාථා වශයෙන් ඇති සියල්ල ද "**ගාථා**" නම් වේ.
- සොම්නස් සහගත සිතින් උපන් ගාථාවන්ගෙන් ප්‍රතිසංයුක්ත අසූදෙකක් සූත්‍ර "**උදාන**" නම් වේ.
- "**වුත්තඤ්හෙතං භගවතා**" ආදී ලෙස නැවත දේශනා කරන ලද එක සිය දෙළොසක් සූත්‍ර "**ඉතිවුත්තක**" නම් වේ.

- ❖ අපණ්ණක ජාතකය ආදී කරුණක් ඇති කල්හි ම දේශනා කරන ලද පන්සිය පණසක් පමණ පූර්ව බෝධිසත්ව චර්‍යාවන් "**ජාතක**" නම් වේ.

- ❖ "**චත්තාරො මෙ භික්ඛවෙ, අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දෙ**" යනාදී ලෙස පැවති සියලු ම ආශ්චර්‍ය අද්භූත ධර්මයන්ගෙන් ප්‍රතිසංයුක්ත සූත්‍ර දේශනා "**අබ්භූතධම්ම**" නම් වේ.

- ❖ "චූළවෙදල්ල සූත්‍රය, මහාවෙදල්ල සූත්‍රය, සම්මා දිට්ඨි සූත්‍රය, සක්කපඤ්හ සූත්‍රය, සංඛාරභාජනීය සූත්‍රය, මහාපුණ්ණම සූත්‍රය" ආදී සංවාද ස්වරූපයෙන් නුවණත් සතුටත් ලබමින් විචාරන ලදුව වදාළ සියලු සූත්‍ර "**වෙදල්ල**" නම් වේ.

### ⊠ ධර්මස්කන්ධ වශයෙන් සුවාසූ දහසක් වන්නේ කෙසේ ද?,

ධර්ම සංගායනාවේ දී ආනන්ද තෙරුන් වහන්සේ විසින් මෙසේ වදරණ ලද්දේ ය.

**"ද්වාසීති බුද්ධතො ගණ්හිං - ද්වෙ සහස්සානි භික්ඛුතො,**
**චතුරාසීති සහස්සානි - යෙ මෙ ධම්මා පවත්තිනො"**

"**මම, භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙයාසූදහසක් උගතිමි. සැරියුත් මුගලන් ආදී මහරහතන් වහන්සේලා සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙදහසක් උගතිමි. මෙසේ මාගේ සිතෙහි ධරන්නා වූ ධර්මය ප්‍රමාණ වශයෙන් සුවාසූ දහසකි**" යැයි වදළේ ය.

එහි එක් අනු සන්ධියක් ඇති සූත්‍රයක් එක ධර්මස්කන්ධයකි. අනු සන්ධි බොහෝ ඇති සූත්‍රයන්හි ඒ අනු සන්ධි ගණනින් ධර්මස්කන්ධ ගණන් ගත යුතුය. දෙවියන් විසින් "**කති ඡින්දෙ කති ජහෙ**" යනාදී ලෙස ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ දී ඒ ප්‍රශ්න ගාථාවක් එක ධර්මස්කන්ධයකි. එයට භාග්‍යවතුන් වහන්සේ "**පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ**" යනාදී ලෙස වදළ පිළිතුරු ගාථාව එක ධර්මස්කන්ධයකි. අභිධර්මයෙහි එක එක දුක මාතිකා, තික මාතිකාවන් බෙදීම ද, එක එක චිත්තවාර බෙදීම ද, එක එක ධර්මස්කන්ධ වේ. විනයෙහි වස්තු ඇත, මාතෘකා ඇත, පදභාජනීය ඇත,

අන්තරාපත්ති ඇත, ආපත්ති ඇත, අනාපත්ති ඇත, තිකපරිච්ඡේද ඇත. එහි එක කොට්ඨාශ එක ධර්මස්කන්ධ වේ. මෙසේ සියල්ල එකතුව ධර්මස්කන්ධ වශයෙන් සුවාසූ දහසකි.

# ❄ ජීවක සූත්‍ර සංගායනාව

පඤ්චසතික සංගායනාවේ දී මූලාසනයෙහි වැඩ සිටි මහා කාශ්‍යප මහරහතන් වහන්සේ අසන සේක් "**ආනන්දය, තථාගතයන් වහන්සේ මෙම ජීවක සූත්‍රය කොතැනක දී දේශනා කළ සේක් ද?**" ධර්මාසනයෙහි වැඩ සිටියා වූ ආනන්ද මහරහතන් වහන්සේ එය විසඳන සේක් "**ස්වාමීනි කාශ්‍යප ස්ථවිරයන් වහන්ස, රජගහ නුවර ජීවක අඹ උයනෙහි දී දේශනා කොට වදාළ සේක**" යැයි කීවේ ය. මහා කාශ්‍යප රහතන් වහන්සේ "**ආනන්දය, කවුරුන් අරභයා වදාළ සේක් ද**" යැයි ඇසුවේ ය. ආනන්ද තෙරුන් වහන්සේ "**ස්වාමීනි කාශ්‍යප ස්ථවිරන් වහන්ස, ජීවක වෛද්‍යාචාර්යතුමා අරභයා වදාළ සේක**" යැයි කීවේ ය. මහා කාශ්‍යප මහරහතන් වහන්සේ "**කුමන කරුණක් හේතුකොටගෙන වදාළ සේක් ද**" යැයි ඇසුවේ ය. ආනන්ද තෙරුන් වහන්සේ "**ස්වාමීනි ස්ථවිරයන් වහන්ස, ජීවක වෛද්‍යාචාර්යතුමා තථාගතයන් වහන්සේ වෙත ධර්ම ශ්‍රවණය කිරීම පිණිස පැමිණි විටෙක ඇසූ ප්‍රශ්නයන්ට පිළිතුරු වශයෙන් දේශනා කොට වදාළ සේක**" යැයි කීවේ ය.

බුද්ධ උපස්ථායක වූ ධර්ම භාණ්ඩාගාරික ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී ඉගෙන ගන්නා ලද මේ සූත්‍රය සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගත වූ තැන දී මහා කාරුණික වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ ගේ අධිෂ්ඨානය පරිදි මේ උතුම් සද්ධර්මය වේනෙය්‍ය ජනයාගේ ප්‍රයෝජනය පිණිස බොහෝ කලක් පැවැත්මට භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී ඉගෙන ගත් බව දක්වීමට මෙසේ ඉදිරිපත් කළේ ය. එහි පිළිවෙළ කථාව මෙසේ ය.

# ☸ නිසි බුද්ධෝපස්ථායෙකු නොවීම

ප්‍රථම බෝධිය වූ විසි වර්‍ෂය තුළ තථාගතයන් වහන්සේට නිත්‍ය උපස්ථායකයෙකු නොවී ය. ඒ කාලපරිච්ඡේදයෙහි දී "**නාගසමාල, නාගිත, උපවාන, සුනක්ඛත්ත, චුන්ද සාමණේර, සාගත, රාධ, මේඝිය**" යන තෙරුන් වහන්සේලා ද ඇතැම් විටෙක "**ආනන්ද තෙරණුවෝ**" ද උපස්ථාන කළහ.

එක් දිනක් භාග්‍යවතුන් වහන්සේ, **නාගසමාල තෙරුන් වහන්සේ** උපස්ථායක කොට දීඝ මාර්‍ගයට පිළිපන්නේ දෙමන් සන්දියකට පැමිණ, එයින් එක් මගකින් වැඩි සේක. එවිට නාගසමාල තෙරුන් වහන්සේ "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, අපි මේ මගින් වඩිමු**" යැයි කීවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ "**නැත මහණ, මා විසින් මේ මාර්‍ගයෙන් යා යුතුය**" යැයි වදාළ සේක. මෙසේ භාග්‍යවතුන් වහන්සේ තුන් වතාවක් වදාළ නමුත් නාගසමාල තෙරණුවෝ "**එසේ නම් භාග්‍යවතුන් වහන්ස, පාත්‍ර චීවර ගත මැනව**" යැයි කියා භාග්‍යවතුන් වහන්සේ ගේ පාත්‍ර චීවර බිම තබා ගියේය. පසුව භාග්‍යවතුන් වහන්සේ තම පාත්‍රචිවර ගෙන එකලාව වැඩි සේක. අන් මගින් ගිය නාගසමාල තෙරුන් වනයෙහි දී සොරුන්ට හසු වූහ. පාත්‍ර චීවර ද පැහැර ගත්හ, හිස ද පැලූහ. ඉන් පසු තෙරණුවෝ "**මට භාග්‍යවතුන් වහන්සේ හැර අන් පිහිටක් නැත**" යැයි සිතා භාග්‍යවතුන් වහන්සේ සොයා ආයේ ය. භාග්‍යවතුන් වහන්සේ මේ කිම්ද යැයි ඇසූ සේක. තෙරණුවෝ සිදු වූ සියල්ල කීවේ ය. භාග්‍යවතුන් වහන්සේ "**මහණ, ඔය කරුණ දැනගෙනම ඒ මගින් යෑම වැළකුවෙමි**" යැයි වදාළ සේක.

එසේම තවත් දිනක භාග්‍යවතුන් වහන්සේ **මේඝිය තෙරුන් වහන්සේ** උපස්ථායකයෙකු වශයෙන් කැඳවාගෙන පාචීනවංශ මුව වනයෙහි ජන්තු නම් ගමට වැඩි සේක. එහි පිඩුසිඟා ගිය මේඝිය තෙරුන් වහන්සේ අලංකාර වූ අඹ වනයක් දැක භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ මෙසේ කීවේ ය. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ගේ පාත්‍ර චීවර බාර ගන්නා සේක්වා. මම මේ වනයට ගොස් මහණ දම් පුරමි යැයි කීවේ ය. භාග්‍යවතුන් වහන්සේ

තුන් වතාවක් ම වැළකූ නමුත් ගියේ ය. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ ම තම පාත්‍ර චීවර රැගෙන එකලාවම වැඩි සේක. තෙරණුවෝ ඒ අඹ වනයට ගොස් භාවනාවට පටන් ගත්තේ ය. එහෙත් සුළු වේලාවකින් ම අකුසල විතර්කයන්ගෙන් පීඩිත ව මට භාග්‍යවතුන් වහන්සේ හැර අන් පිහිටක් නැතැයි සිතා භාග්‍යවතුන් වහන්සේ සොයා ආයේ ය. භාග්‍යවතුන් වහන්සේ "**මේඝිය, මම ඔය කරුණ දැනගෙනම ඒ ගමන වැළකුයෙමි**" යැයි වදාළ සේක.

## ☸ නිත්‍ය උපස්ථායෙකු පත් කර ගැනීම

පසු කළෙක බුද්ධත්වයෙන් විසිවන වර්ෂයෙහි දී සැවැත්නුවර ජේතවනාරාමයට වැඩියා වූ භාග්‍යවතුන් වහන්සේ, අග්‍ර ශ්‍රාවක, අසූ මහා ශ්‍රාවක මහරහතන් වහන්සේලා ප්‍රධාන විශාල භික්ෂූන් වහන්සේලා පිරිසක් පිරිවරා උතුම් බුද්ධාසනයෙහි වැඩ හිඳිමින්, මෙසේ වදාළ සේක. "**මහණෙනි, මම දැන් වයෝවෘධයෙමි. මට උපස්ථානයට පැමිණෙන ඇතැම් භික්ෂූන් වහන්සේලා මේ මගින් යමු යැයි කී විට, නැත භාග්‍යවතුන් වහන්ස, මේ මගින් යමු යැයි කියා මගේ පාත්‍ර - චීවර බිම දමා යති. එබැවින් මා හට නිත්‍ය උපස්ථායකයෙකු සම්මත කෙරේවා**" යැයි භික්ෂු සංඝයාට පැවරූ සේක. එවිට මහා සංඝයා හට මහත් සංවේගයක් ඇතිවූහ.

එවේලෙහි සැරියුත් මහරහතන් වහන්සේ නැගිට චීවරය ගැට වටු කොට පොරවා ගෙන භාග්‍යවතුන් වහන්සේට අභිවාදනය කොට "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ ම ප්‍රාර්ථනා කරගෙන ඒකාසංඛ්‍යය කල්ප ලක්ෂයක් පෙරුම්දම් පිරුවෙමි. මා වැනි වූ මහත් ප්‍රඥාවන්තයෙකු උපස්ථානයට සුදුසු නොවන්නෙහි ද? මම භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරමි**" යැයි කිවේය.

භාග්‍යවතුන් වහන්සේ එය අසා "**කම් නැත සාරිපුත්‍රය, නුඹ යම් දිසාවක වාසය කරන්නේ ද, ඒ දිශාව නොසිස් ය. එබැවින් ඔබගෙන් උවටැන් කරවා ගැනීමක් අවශ්‍ය නැත**" යැයි ප්‍රතික්ෂේප කළහ. මෙසේ මුගලන් මහරහතන් වහන්සේ, මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ආදී

මහරහතන් වහන්සෙලා ද, වෙන වෙනම උපස්ථානය ඉල්ලා සිටියහ. භාග්‍යවතුන් වහන්සේ ඒ සියලු දෙනා වහන්සේගේ ම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ සේක. එසේ වුව ද ආනන්ද තෙරුන් වහන්සේ නිහඬව ම සිටියේ ය. එවිට අන් භික්ෂූන් වහන්සේලා ආනන්ද තෙරුන් වහන්සේ අමතා **"ආනන්දය, ඔබ භාග්‍යවතුන් වහන්සේ වෙතින් උපස්ථායක තනතුර ඉල්වාගනුව"** යැයි කීහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ **"ඇවැත්නි, ඉල්ලා ගත් තනතුරු කෙබඳු වෙයි ද? කිම, භාග්‍යවතුන් වහන්සේ මා නොදක්නා සේක් ද, භාග්‍යවතුන් වහන්සේ කැමති වන සේක් නම් ආනන්දය, මට උපස්ථාන කරන්න"** යැයි වදාරණ සේක යැයි කිවේය. එවිට භාග්‍යවතුන් වහන්සේ **"මහණෙනි, ආනන්ද අනුන් විසින් උත්සාහ කළ යුත්තෙකු නොවේ. තමන් ම ඒ බව දැන මට උපස්ථාන කරන්නේ ය"** යැයි වදාළහ. එවිට භික්ෂූන් වහන්සේලා **"ආනන්දය, නැගී සිටින්න දස බලධාරීන් වහන්සේ ගේ උපස්ථානය ඉල්ලන්න"** යැයි කීහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ නැඟිට චීවරය ගැටවටු ගන්වා පොරවා ගෙන භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ ඇඳිළි බැඳ ප්‍රතික්ෂේප කිරීම් සතරක් ඉල්ලා සිටියේ ය.

## ☸ ප්‍රතික්ෂේප සතර

1. භාග්‍යවතුන් වහන්සේට ලැබෙන චීවර මට නොදෙන සේක්වා.
2. භාග්‍යවතුන් වහන්සේට ලැබෙන පිණ්ඩපාතය මට නොදෙන සේක්වා.
3. භාග්‍යවතුන් වහන්සේ සමග එක ගඳකිළියෙහි විසීමට මට අවසර නොදෙන සේක්වා.
4. භාග්‍යවතුන් පිළිගත් ආරාධනාවලට මා කැඳවා ගෙන නොයන සේක්වා.

**"භාග්‍යවතුන් වහන්සේ මේ ප්‍රතික්ෂේප සතර පිළිගන්නා සේක් නම් මම උපස්ථාන කරමි"** යැයි කීවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ, **"ආනන්දය, නුඹ කවර ආදීනවයක් දැක මේ ප්‍රතික්ෂේප සතර ඉල්ලන්නෙහි ද"** යැයි අසා වදාළහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ,

**"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඇතැම් කෙනෙක් ආනන්ද තෙරුන් ලාභ අපේක්ෂාවෙන් භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරන්නේ ය යැයි මේ වචනය කියන්නේ ය. එබැවින් මේ ප්‍රතික්ෂේප සතර ඉල්ලමි"** යැයි කීවේ ය. නැවත මේ ආයාචනා සතර ද ඉල්ලා සිටියේ ය.

## ☸ ආයාචනා සතර

1. මා විසින් බාර ගත් දන ආරාධනාවලට භාග්‍යවතුන් වහන්සේ වඩින සේක්වා.
2. භාග්‍යවතුන් වහන්සේ දැකීමට පිටතින් පැමිණෙන පැවිදි ගිහි ආගන්තුකයන් පමා නොවී භාග්‍යවතුන් වහන්සේ වෙත යොමු කරවීමට මට අවසරය දෙන සේක්වා.
3. ධර්මය - විනය පිළිබඳ ව සැකයක් උපන් විගස ඒ මොහොතෙහි දී ම එය විසඳ ගැනීමට භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණීමට මට අවසරය දෙන සේක්වා.
4. භාග්‍යවතුන් වහන්සේ මා නැති තැනක දී දේශනා කරන ධර්මයන් නැවත මා හට දේශනා කරන සේක්වා.

**"භාග්‍යවතුන් වහන්සේ මේ ආයාචනා සතර පිළිගන්නා සේක් නම් මම උපස්ථාන කරමි"** යැයි කීවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ **"ආනන්දය, නුඹ කුමන ආනිසංසයක් දැක මේ ආයාචනා සතර ඉල්ලන්නෙහි ද"** යැයි අසා වදාළහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ, **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, සැදැහැති සත්පුරුෂයෝ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි අවකාශ නොලැබ මා හමුවට පැමිණ, ස්වාමීනි! ආනන්ද ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සමග හෙට මාගේ ගෙයි දනට වඩින සේක්වා"** යැයි ආරාධනා කොට යයි. භාග්‍යවතුන් වහන්සේට එයට අවකාශ නැති විට ඒ සත්පුරුෂයන් භාග්‍යවතුන් වහන්සේ හමුවට පමුණුවාලීමටත් සැක දුරු කර ගැනීමටත් අවකාශ ලබති. එසේ නො ලැබුණු කල්හි **"කුමකට නම් මේ ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ ගේ උපස්ථායක වූයෙහි ද, අපට මෙපමණකුදු අනුග්‍රහයක් නැත"** යැයි දෙස් නගන්නේ ය.

තව ද භාග්‍යවතුන් වහන්සේ නැති විටෙක ඇතැම් සත්පුරුෂයෝ මා හමුවට පැමිණ **"ඇවැත්නි, මේ සූත්‍රය, මේ ජාතකය, මේ ගාථාව භාග්‍යවතුන් වහන්සේ කොතැනක දී දේශනා කළ සේක්ද"** යැයි මගෙන් ඇසුව හොත් එය කිව යුතු වන්නේය. නොහැකි වුව හොත් **"මේ ආනන්ද තෙරුන් වහන්සේ කුමකට නම් භාග්‍යවතුන් වහන්සේගේ සෙවණැල්ල මෙන් පාත්‍ර - චීවර ගෙන යමින් පසුපස ඇවිද්දෙහි ද? මෙපමණවත් දෙයක් නොදන්නෙහි ද?"** යැයි මා හට දෙස් නගන්නේ ය. එබැවින් මේ ආනිශංස දැක මා නැති තැන දෙසූ ධර්‍මයන් නැවත මා හට දේශනා කරන ලෙස ඉල්ලමි යැයි කීවේ ය. භාග්‍යවතුන් වහන්සේ එම ඉල්ලීම් අට පිළිගෙන උපස්ථායක තනතුර දුන් සේක. එතැන් පටන් ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ නිත්‍ය උපස්ථායක වූයේ ය.

මේ ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට උපස්ථායක වීමට කල්ප ලක්‍ෂයක් මුළුල්ලෙහි පුරන ලද පාරමිතා ගුණ ඇති මහෝත්තමයෙකි. මේ වරය ලත් දින පටන් ඇල් පැන් - උණු පැන් - දැහැටි සපයමින්, පිට පිරිමදිමින්, පාද පිරිමදිමින්, ගඳකිළි පිරිවෙන අමදිමින්, මේ වේලාවෙහි භාග්‍යවතුන් වහන්සේට මේ දෙය ලැබෙන්නට වටී ය, මේ වේලාවෙහි මේ දෙය කරන්නට වටී ය යැයි දවස මුළුල්ලෙහි ම බුද්ධෝපස්ථානයෙහි යෙදී සිටියේ ය. එසේම රාත්‍රී කාලයෙහි දඬු වැට පහනක් ගෙන නව වාරයක් භාග්‍යවතුන් වහන්සේ සැතපුණු ගඳකිළිය වටා ඇවිදින්නේ ය. මෙසේ කරන්නේ භාග්‍යවතුන් වහන්සේ මා ඇමතූ විටෙක මා නිදි බරව සිටියේ නම්, එවිට ප්‍රති උත්තර දීමට නොහැකි වන්නේය යැයි ඒ පහන අතින් නුමුදා ම රෑ පහන් කරන්නේ ය. මෙසේ මහත් ගුණ ඇති ආනන්ද තෙරුන් වහන්සේ මේ බුදු සසුනෙහි **"බහුශ්‍රැත භික්‍ෂූන් අතර අග්‍ර වූහ. සතිමන්ත භික්‍ෂූන් අතර අග්‍ර වූහ. ගතිමන්ත භික්‍ෂූන් අතර අග්‍ර වූහ. ධෘතිමන්ත භික්‍ෂූන් අතර අග්‍ර වූහ. බුද්ධ උපස්ථායක භික්‍ෂූන් අතර අග්‍ර වූහ"**. මෙසේ අග්‍ර ස්ථානාන්තර පසකින් පිදුම් ලැබූහ.

ඒ මේ ආනන්ද තෙරුන් වහන්සේට එක් වරකට බණවර හැටක් (ගාථා පසළොස් දහසක්) ධාරණය වන්නේය. එය දීඝ නිකාය තරම් වූ ප්‍රමාණයකි. වසර විසි පහක් ම භාග්‍යවතුන් වහන්සේ පසුපස යමින්

බොහෝ ධර්මයන් ඉගෙන ගත්තේ ය. ඒ නිසාම පඤ්චසතික සංගායනාවෙහි දී

**"ද්වාසීති බුද්ධතො ගණ්හිං - ද්වෙ සහස්සානි භික්ඛුතො,**
**චතුරාසීති සහස්සානි - යෙ මෙ ධම්මා පවත්තිනො"**

යනුවෙන් **"මම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙයාසූදහසක් උගතිමි. සැරියුත් මුගලන් ආදී මහරහතන් වහන්සේලා සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙදහසක් උගතිමි. මෙසේ මාගේ සිතෙහි ධරන්නා වූ ධර්මය ප්‍රමාණ වශයෙන් සුවාසූ දහසකි"** යැයි වදාළේ ය. මෙසේ ත්‍රිපිටක බුද්ධ වචනයෙන් බොහෝ දෑ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී ඉගෙන ගන්නා ලද මේ ආනන්ද තෙරුන් වහන්සේ එම ධර්ම සංගීතියෙහි දී **"ජීවක සූත්‍රය"** නමින් මෙසේ සංගායනාවට නැගූහ. එහි අර්ථ විවරණය මෙසේ ය.

**"එවං මෙ සුතං"** මා විසින් මෙසේ අසන ලදි. මෙය වනාහි මා විසින් අවබෝධ නොකරන ලද්දකි. ප්‍රත්‍යක්ෂ නොකරන ලද්දකි. යනුවෙන් තමන් වහන්සේ අත්හැර, මෙය මා විසින් භාග්‍යවතුන් වහන්සේ වෙතින් ම උගත්තෙමි යැයි අවධාරණය කොට දක්වන්නේය.

**"එවං"** යනුවෙන් තථාගතයන් වහන්සේ විසින් මාගේ ශාසනයෙහි බහුශ්‍රැත භික්ෂූන් අතර ද, යහපත් පැවතුම් ඇති භික්ෂූන් අතර ද, මනා සිහිය ඇති භික්ෂූන් අතර ද, ධාරණ ශක්තිය ඇති භික්ෂූන් අතර ද, උපස්ථායක භික්ෂූන් අතර ද මේ ආනන්ද තෙරුන් වහන්සේ අග්‍ර යැයි වදාළ බුද්ධ වචනයට අනුරූප වූ තමන්ගේ ධාරණ ශක්තිය දක්වමින් **"මා විසින් මෙසේ අසන ලදි. එය ද අර්ථ වශයෙන් ද ව්‍යඤ්ජන වශයෙන් ද නො අඩුය. නො වැඩිය. මෙය මෙසේ ම මිස අන් අයුරකින් නො දත යුතුය"** යැයි සත්වයන් ගේ ඇසීමේ කැමැත්ත උපදවයි.

**"මෙ"** යනු මා විසින් යනුයි. භාග්‍යවතුන් වහන්සේ යම් සේ දේශනා කළ සේක ද, එසේම මා විසින් අඩු වැඩි නොකර වෙනස් නොකර මා විසින් ම භාග්‍යවතුන් වහන්සේ වෙතින් උගත්තෙමි යනුවෙන් දක්වමින් භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය දේශනා කළ ධර්ම ශාස්තෘන් වහන්සේ වශයෙන් දක්වා තමන් ශ්‍රාවකයෙකු කොට දක්වයි.

"**සුතං**" යනු අසන ලදි යනු යි. ඒ ඇසීම වනාහි අනිකෙකු භාග්‍යවතුන් වහන්සේගෙන් අසා දැනගෙන මට කීවා නොවේ. භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී මගේ කණින් ම අවධානය යොමු කොට මනා ධර්ම ගෞරවයෙන් ම අසා දැන ගත්තෙමි යැයි දක්වයි.

එසේම මේ ආනන්ද තෙරුන් වහන්සේ වනාහි මිහිරි හඬින් ධර්ම දේශනා කරන්නා වූ බහුශ්‍රැත වූ විචිත්‍ර ධර්ම කථිකයෙකි. මේ ආනන්ද තෙරුන් වහන්සේ මෙසේ වාක් චාතුර්යයෙන් යුක්ත ව මහේශාක්‍ය මහරහතන් වහන්සේලා ඉදිරියෙහි මේ උතුම් බුද්ධ වචනය සංගායනා කරන කල්හි එය දැකීමට ශ්‍රවණය කිරීමට අප්‍රමාණ දෙවියෝ ද බ්‍රහ්මයෝ ද රැස් වූහ. ඔවුන් අතරින් ඇතැම් දෙවියන්ට මෙබඳු සැකයක් උපන්හ. "**තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් අතීත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ද ශාක්‍ය වංශිකයෙකි. මේ ආනන්ද තෙරුන් වහන්සේ ද ශාක්‍ය වංශිකයෙකි. භාග්‍යවතුන් වහන්සේ ගේ සුළු පියා වූ අමිතෝධන ශාක්‍ය රජතුමාගේ පුත්‍රයා ය. රූපයෙන් ද ස්වරයෙන් ද ශෝභමානය. භාග්‍යවතුන් වහන්සේගේ දායාදය ද ලබති. භාග්‍යවතුන් වහන්සේ ම මේ ආනන්ද තෙරුන් වහන්සේ කරුණු පසකින් අග්‍ර තැන්හි තැබූහ. ආශ්චර්ය ධර්ම සතරකින් යුක්ත වූවෙකු ද වෙති. සැමට ප්‍රියමනාප වූයේ වේ. දැන් භාග්‍යවතුන් වහන්සේ ගේ ධර්ම දායාදය ලැබ බුදු වූයේ ය**" යැයි සිතූහ. එබැවින් ආනන්ද තෙරුන් වහන්සේ දෙවියන් තුළ වූ ඒ සිත තම සිතින් දැන එසේ වූ අද්භූත වූ ගුණ සම්භාවනාව නො ඉවසන සුළු වූයේ දෙවියන්ට ඇති වූ ඒ රැවටුණු අදහස් දුරු කරමින් ශාස්තෘන් වහන්සේට ඉමහත් ගෞරවය දක්වා තමන්ගේ ශ්‍රාවක බව "**එවං මෙ සුතං**" යනුවෙන් ප්‍රතිඥා කළේ ය.

තවද "එවං මෙ සුතං" යනුවෙන් "**මා විසින් මේ ධර්මය චතු වෛශාරද්‍ය විශාරද වූ, දසබලධාරී වූ, උත්තම ස්ථානයෙහි පිහිටියා වූ, සිංහනාද සමාන නාද ඇත්තා වූ, සියලු සත්වයන්ට උත්තම වූ, ධර්මේශ්වර වූ, ධර්මරාජ වූ, ධර්මාධිපති වූ, ධර්මද්වීප වූ, ධර්මසරණ වූ, සද්ධර්ම වර චක්‍රවර්ති වූ, සම්මා සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ ගේ සම්මුඛයෙන් පිළිගන්නා ලද්දේ වෙමි. මෙහි අර්ථයෙහි හෝ ධර්මයෙහි හෝ පදයෙහි හෝ ව්‍යඤ්ජනයෙහි හෝ සැකයක් හෝ විමතියක් හෝ**

**නොකළ යුතුය**" යැයි සියලු දෙව් මිනිසුන් ගේ මේ ධර්මයෙහි අශ්‍රද්ධාව නසන සේක. ශ්‍රද්ධාව උපදන සේක.

"**එකං සමයං භගවා රාජගහෙ විහරති ජීවකස්ස කොමාරභච්චස්ස අම්බවනෙ**" එක් සමයක භාග්‍යවතුන් වහන්සේ ජීවක කෝමාරභච්ච වෛද්‍යාචාර්යතුමා විසින් සාදවා පූජා කරන ලද අඹ වනයෙහි වැඩ සිටි සේක.

මෙහි "**එකං සමයං**" යන මෙහි සංවත්සර, ඍතු, මාස පක්ෂ දින පූර්වාහ්නය, මධ්‍යාහ්නය, අපරාහ්නය ප්‍රථම යාමය, මධ්‍ය යාමය, පශ්චිම යාමය වශයෙන් කාලය දැක්වීම "**සමය**" නම් වේ. මෙහි සමය බොහෝ වේ. පූරිත පාරමිතා ගුණ ඇති මහ බෝසතාණන් වහන්සේ දසදහසක් ලෝකධාතු වැසි දිව්‍ය බ්‍රහ්මයන් ගේ ආරාධනයෙන් පඤ්ච මහා විලෝකනයන් බලා සුදුසු මව් කුසෙහි පිළිසිඳ ගැනීම "**ගර්භාවක්‍රාන්ති සමය**" නම් වේ. උයනක දී මව් කුසෙන් බිහි වීම "**ජාති සමය**" නම් වේ. එතැන් පටන් සතර පෙර නිමිති දැකීම දක්වා ගිහි ව විසීම "**සංවේග සමය**" නම් වේ. පුතෙකු උපන් දම පැවිදි රුවක් දැක මහාභිනිෂ්ක්‍රමණය කිරීම "**අභිනිෂ්ක්‍රමණ සමය**" නම් වේ. අඩුම තරමින් සත් දිනක් හෝ දුෂ්කර ක්‍රියා කිරීම "**දුෂ්කර ක්‍රියා සමය**" නම් වේ. බෝධි මූලයට වැඩ අපරාජිත පර්යංකයෙහි වැඩ හිඳිමින් මාර පරාජය කිරීම "**මාරවිජය සමය**" නම් වේ. ඒ එකම පර්යංකයෙහි වැඩ හිඳිමින් තුන් යම් රාත්‍රියෙහි පුර්වේනිවාස ඥානය, දිව්‍යශ්‍රෝත ඥානය, ආශ්‍රවක්‍ෂය ඥානය ලැබීමත් සමගම සර්වඥතාඥාන ඥාන ප්‍රතිලාභයෙන් අභිසම්බෝධියට පැමිණීම "**අභිසම්බෝධි සමය**" නම් වේ. සත් සති ගත කිරීම ද, නිරෝධ සමාපත්ති, ඵල සමාපත්ති, ධ්‍යාන සමාපත්ති සුව විඳීම "**දිට්ඨධම්ම සුඛවිහරණ සමය**" නම් වේ. බ්‍රහ්මාරාධනාවෙන් දම්සක් සූත්‍රය දෙසීමෙහි පටන් ධර්මදේශනා කිරීම "**ධර්මදේශනා සමය**" නම් වේ. සූවිසි කෝටි ලක්‍ෂ වාරයක් නවානුපූර්ව විහාර සමාපත්ති සුව විඳ එයින් නැඟී සිට අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පරිනිර්වාණයට පැමිණීම "**පරිනිර්වාණ සමය**" නම් වේ.

ඒ සමයන් අතර මෙහි "**එකං සමයං**" යනු එක් ධර්ම දෙශනා සමයක දී යනුයි. ඒ දේශනා සමය ද, "**ඤාණ කෘත්‍ය, කරුණා කෘත්‍ය**"

සමයන් අතර "**කරුණා කෘත්‍ය**" සමයකි. "**ආත්ම හිත ප්‍රතිපත්ති සමය, පරහිත ප්‍රතිපත්ති සමය**" යන ප්‍රතිපත්ති සමයන් අතර "**පරහිත ප්‍රතිපත්ති**" සමයකි. රැස් වූ විට කළ යුතු වූ "**ධර්මකථා සමය, දේශනා ප්‍රතිපත්ති සමය**" යන සමයන් අතර "**ධර්මකථා**" සමයකි. මේ සියල්ල අතරින් මෙය "**දේශනා සමයකි**".

"**භගවා**" යනු ගුණයෙන් විශිෂ්ට වූ සත්වයන්ට උත්තම වූ ලෞකික ලෝකෝත්තර සැප නිපදවන්නා වූ දාන සීලා දී පාරමී භාවයට පැමිණි කුසල් ඇති බැවින් ද, දස ක්ලේශ, අකුශල මූල, දුෂ්චරිත ආදී අනේක විධ වූ ක්ලේශයන් බිඳ හළ බැවින් ද, ආශ්චර්ය භාග්‍යා දී කීර්ති ප්‍රශංසාවට ගෞරවයට ලක්වන ගුණයෙන් යුක්ත වන බැවින් ද, අවබෝධ කළ යුතු වූ සියලු ධර්ම කුශලත්‍රිකා දී ලෙස බෙද දැක් වූ බැවින්ද "**භගවා**" නම් වන සේක.

තවද මෙහි "**එවං මෙ සුතං**" යන වචනයෙන් ඇසූ පරිදි ඉගෙන ගත් පරිදි ධර්මය දේශනා කරන්නා වූ දේශකයෝ භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම ශරීරය පමණක් ම දේශනා කරති. එබැවින් "**මේ ධර්මය වනාහි ශාස්තෲවරයෙකු නොමැති එකක් නොවේ. මේ නුඹලාගේ ශාස්තෲවරයායය**" යැයි භාග්‍යවතුන් වහන්සේ නො දැකීමෙන් රූපකයෙහි පිරිනිවීම දක්වයි. එමගින් "**මේ ආර්ය ධර්මය දේශනා කළා වූ දසබල ධාරී වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ ද, වජ්‍ර සමාන කයක් ඇත්තේ නමුදු පරිනිර්වාණයට පත් වූ සේක් නම්, එබඳු ශක්තියක් නැති අන්‍යයන් විසින් දුබල ජීවිත කෙරෙහි කුමන කරුණක් හේතුකොටගෙන ජීවිතාශාව ඉපදවිය යුත්තේ ද**" යැයි ජීවිත මදෙන් මත් වූ ජනතාව සංවේගයට පත් කරයි. ඔවුනට සද්ධර්මයෙහි උත්සාහ උපදවයි. මෙසේ "**එවං**" යන්නෙන් දේශනා සම්පත්තිය ද "**මෙ සුතං**" යන්නෙන් ශ්‍රාවක සම්පත්තිය ද "**එකං සමයං**" යන්නෙන් කාල සම්පත්තිය ද "**භගවා**" යන්නෙන් දෙශක සම්පත්තිය ද දක්වයි.

"**රාජගහෙ විහරති ජීවකස්ස කොමාරභච්චස්ස අම්බවනෙ**" රජගහ නුවර සමීපයෙහි වූ ජීවක වෛද්‍යාචාර්යතුමා විසින් සාදවා ආරාමයක් කොට පූජා කරන ලද අඹ වනයෙහි වැඩ සිටි සේක යන මෙහි "**රාජගහෙ**" යනු මෙනම් නම් ඇති නගරයයි. අතීතයෙහි මහා

මන්ධාතු මහා ගෝවින්ද ආදී මහානුභාව සම්පන්න මහා රජවරුන් ගේ ග්‍රහණයට ආධිපත්‍යයට යටත් ව පැවති බැවින් **"රජගහ"** නම් වේ. තව ද ගාලක් වටේ බැඳි ආරක්ෂක වැටක් මෙන් **පාණ්ඩව පර්වතය, වේභාර පර්වතය, ගිජ්ජකූට පර්වතය, ඉසිගිලි පර්වතය, වේපුල්ල පර්වතය,** යන මහා පර්වත රාජයන්ගෙන් වටව පවතින්නා වූ මෙය මහා නගරයක් වූ බැවින් **"රජගහ නුවර"** නම් වේ. මේ රජගහ නුවර ලොව්තුරා බුද්ධෝත්පාද කාලයන්හි දී ද, සක්විති රජවරු ලොව උපදින කාලයන්හි දී ද ජනාකීර්ණ වූ සියලු සැපතින් පිරුණු දඹදිව් තලයෙහි පවතින නගරයන් අතර අග්‍ර නගරය වේ. අන් කාලයන්හි දී යක්ෂාදීන්ගේ වාසභූමියක් වූ ජන ශූන්‍යය පාලු කැලෑ ප්‍රදේශයක් වේ. සොළොස් මහා ජනපදයන්ගෙන් ප්‍රධාන ජනපදයක් වන මගධ රට අගනුවර වූයේ මේ රජගහ පුරයයි. භාග්‍යවතුන් වහන්සේ ජීවමාන කල්හි මෙහි අටලොස් කෝටියක් ජනගහනය සිටියහ. බිම්බිසාර මහ රජතුමා රාජ්‍ය පාලකයා විය.

**"විහරති"** යනු දිව්‍ය බ්‍රහ්ම ආයර්‍ය විහරණයන්ගෙන් යම් විහරණයකින් වාසය කරයි යනුයි. එනම් සිටීම - හිඳීම - සැතපීම - ගමන් කිරීම යන සිව් ඉරියව් පවත්වමින් වාසය කිරීමයි. භාග්‍යවතුන් වහන්සේ දෙවන තුන් වන, සිව් වන සහ සතළොස් වන වස් කාලයන් මේ රජගහ පුරය ඇසුරු කොට වැඩ සිටි සේක.

**"ජීවකස්ස කොමාරභච්චස්ස අම්බවනෙ"** ජීවක වෛද්‍යාචාර්‍ය තුමාගේ අඹ වනයෙහි ය. මෙහි යම් ගෙදුරුගමක් ඇසුරු කොට සතර ඉරියව් පවත්වමින් පහසු විහරණයෙන් වාසය කිරීමට යෝග්‍ය වාසස්ථානය දැක්වීම වේ. මෙහි රජගහ නුවර දැක්වීමෙන් ගොදුරු ගම දක්වයි. ආරාමය දැක්වීමෙන් පැවිද්දට යෝග්‍ය නිවාසස්ථානය දක්වයි. තවද රජගහ නුවර දැක්වීමෙන් භාග්‍යවතුන් වහන්සේගේ ගිහි ජනයාට අනුග්‍රහ කිරීම ද, ආරාමය දැක්වීමෙන් පැවිද්දන්ට අනුග්‍රහ කිරීම ද දක්වයි. එසේම නගරය දැන්වීමෙන් සිවුපසය ලැබීමෙන් අත්ථකිලමතානුයෝගයෙන් දුරු වීම ද, ආරාමය දැක්වීමෙන් වස්තු කාම ප්‍රහාණයෙන් වෙන් වීමේ උපාය ද දක්වයි. එසේම නගරය දැක්වීමෙන් ධර්‍ම ශ්‍රවණය ද, ආරාමය දැක්වීමෙන් ඒ ධර්‍මයෙහි යෙදීම ද දක්වයි. එසේම ගොදුරු ගම දැක්වීමෙන් කරුණාවෙන් ජනයා වෙත එළඹීම ද,

ආරාමය දැක්වීමෙන් ඒ ගෘහ වාසයෙහි ආදීනව දැක ඒවායෙන් නිදහස් වීම ද දක්වයි. එසේම ගොදුරු ගම දැක්වීමෙන් සත්වයන්ට හිත සුව ඇති කිරීමේ අදහස ද, ආරාමය දැක්වීමෙන් අනුන්ට හිත සුව ඇති කිරීමෙහි නො ගැලී සිටීම ද දක්වයි. එසේම ගොදුරු ගම දැක්වීමෙන් ධාර්මික සැපය අත නො හැරීම නිමිති කොට ඇති පහසු විහරණය ද, ආරාමය දැක්වීමෙන් උත්තරිමනුෂ්‍ය ධර්මයෙහි යෙදීම නිමිති කොට ඇති පහසු විහරණය ද දක්වයි. එසේම ගොදුරු ගම දැක්වීමෙන් මිනිසුන්ට බොහෝ උපකාර බව ද, ආරාමය දැක්වීමෙන් දෙවියන්ට බොහෝ උපකාර බව ද දක්වයි. එසේම ගොදුරු ගම දැක්වීමෙන් ලෝක ජනයා අතර ඉපද ඔවුන් අතරම වැඩුණු බව ද, ආරාමය දැක්වීමෙන් ලෝකය හා නො ඇලුණු බව ද දක්වයි.

## ☸ ජීවක වෛද්‍යාචාර්යතුමාගේ උත්පත්ති කථාව

පෙර විශාලා මහනුවර ලිච්ඡවි රජ දරුවන්ගේ අඹ උයනක අඹ ගසක් යට සොළොස් හැවිරිදි වයසැති ව කුමාරිකාවක් ඕපපාතිකව උපන්නාය. ඇය **අම්බපාලී** නම් වූවා ය. පසුව ලිච්ඡවි රජවරුන් ඇය ගණිකාවක් වශයෙන් ඇසුරු කළහ. ඇය නිසා විසාලා මහ නුවර මහත් සේ දියුණුවට ගියේය. මෙය කරුණු කොට ගෙන රජගහ නුවර ද රාජ සභාවෙහි කතිකාවක් ඇති වී එය නිමිති කොට ගෙන සාලවතී නම් රූමත් කුමාරිකාවක් ගණිකාවක් වශයෙන් සම්මත කොට තැබූහ. එයින් රජගහ නුවර ද දියුණුවට පත් විය. මෙම ගණිකාවට පිරිමි දරුවෙකු ලැබුණි. ඇය තම දසියකට කථා කොට එම දරුවා රාත්‍රියෙහි ම කසල ගොඩට දමන්න යැයි අණ කළා ය. දසිය එම දරුවා කුඩයකින් රැගෙන ගොස් කසල ගොඩට දමා ගියා ය. උදෑසන අභය රාජ කුමාරයා රාජ්‍ය සේවයට බිම්බිසාර රජතුමාගේ මාලිගයට යන අතර කසල ගොඩ කපුටන් වට වී සිටිනු දැක මාවතේ යන්නෙකුට කථා කොට කුමක් දැයි බලන්නට අණ කළේ ය. ඔහු එය විමසා බලා කුඩයක දරුවෙකු සිටින බව කීවේ ය. ජීවත් ව සිටින්නේ දැයි අසා එසේ ය යැයි කී විට ගෙන්වාගෙන බලා දරු පෙම් උපදවා තම අන්තඃපුරයට යවා කිරි මව්වරුන් ලවා පෝෂණය කරවීය. කසල ගොඩ සතුන් වටකරගෙන සිටි නමුත් මහා පින් ඇති දරුවෙකු බැවින් කිසි අනතුරක් නොවූයේ

ය. එසේ ජීවත් ව සිටි බැවින් "**ජීවක**" යැයි නම් තැබුවේ ය. අභය රාජ කුමාරයා විසින් රජ කුමරෙකු වශයෙන් පෝෂණය කර වූ බැවින් "**කෝමාරභච්ච**" නම් විය. මේ නම් දෙකම එක්ව ගෙන "**ජීවක කෝමාරභච්ච**" නම් වේ. මෙම ජීවක අභය රාජ කුමාරයාට ම දාව උපන් දරුවෙකි. මෙම ජීවක අට හැවිරිදි වියෙහි දී අන් රජ කුමරුවන් සමග කෙලි සෙල්ලම් කරන විට අන් රජ කුමරුවන්ට තම මව්පියන් විසින් නොයෙක් දේ ගෙනත් දෙනු දැක තමන්ට එසේ නොවීම ගැන කල්පනා කොට අභය රාජ කුමාරයා වෙත ගොස් "**පියාණනි, මට මවක් පියෙක් නැද්ද**" යැයි ඇසුවේ ය. එවිට අභය රාජ කුමාරයා "**දරුව! නුඹේ මව නම් මම නො දනිමි, පියෙකු වශයෙන් නුඹ පෝෂණය කළෙමි**" යැයි කීවේ ය. ඉන් පසු ජීවක තෙමේ තමන් රජ පවුලෙහි සිටියත් රාජ්‍ය සම්පත් වරප්‍රසාද තමන්ට නො ලැබෙන බව සිතා දිවි පැවැත්මට කළ යුතු දෙයක් සිහි කරන්නේ පූර්ව පිනෙන් වෛද්‍ය ශාස්ත්‍රය සුදුසු යැයි වැටහී තක්ෂිලා නුවරට ගොස් වෛද්‍ය ශාස්ත්‍රය ඉගෙන සම්පූර්ණත්වයට පැමිණ අවුත් සකල ජම්බුද්වීපයෙහි අග්‍ර වෛද්‍යවරයා විය. බිම්බිසාර මහ රජතුමාගේ රාජ්‍ය වෛද්‍යවරයා ද විය.

## ☸ ජීවකම්බවන පූජාව

පසු කලෙක භාග්‍යවතුන් වහන්සේ තුන්දෙස් කිපීමෙන් ගිලන් වූ විටෙක බිම්බිසාර මහ රජතුමාගේ නියමයෙන් ජීවක වෛද්‍යාචාර්ය තුමා වේළුවනාරාමයට ගොස් භාග්‍යවතුන් වහන්සේට විරේක බෙහෙත් කොට ඒ දෝෂයන් සුව කළේ ය. පසුව පජ්ජෝත රජුගේ රෝග සුව කිරීම හේතුවෙන් එම රජතුමා විසින් තමන්ට තෑගි කොට එවන ලද උතුරු කුරු දිවයින් වැසියන් අඳින සීවෙය්‍යක වස්ත්‍ර[1] යුග්මයක් භාග්‍යවතුන් වහන්සේට පූජා කොට තථාගතයන් වහන්සේ එහි අනුමෝදනා දේශනාව කළ කල්හි සෝවාන් මාර්ග ඥානයෙහි පිහිටියේය. වේළුවනාරාමය දුර බැවින් තමන්ට පහසුවෙන් දිනකට තුන් වතාවක් බුද්ධෝපස්ථානයට යෑම පිණිස තමන්ට හිමි අලංකාරමත් අඹ උයන රාත්‍රි ස්ථාන, දිවා ස්ථාන, මණ්ඩප, සක්මන්, ලෙන්, කුටි ආදී සියල්ල

[1] මේවා උතුරු කුරු දිවයින් වැසියන් අඳින කල්ප වෘක්ෂයෙන් පහළ වන වස්ත්‍රය.

මනාව සාදවා අටලොස් රියනක් උස ඇති තඹ පැහැති පවුරකින් වට කරවා, බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නය වැඩම කරවා, තුන් සිවුරු සහිත කොට ප්‍රණීත දනයක් පිළිගන්වා, විහාරය අත පැන් වඩා භාග්‍යවතුන් වහන්සේට පූජා කළේ ය. මේ භූමිය එතැන් පටන් **"ජීවකම්බවන ආරාමය"** නම් විය.

**"අථ ඛො ජීවකො කොමාරභච්චො යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්‍වා භගවන්තං අභිවාදෙත්‍වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ජීවකො කොමාරභච්චො භගවන්තං එතදවොච."**

මෙසේ භාග්‍යවතුන් වහන්සේ ජීවක අඹ වනයෙහි වැඩ සිටින විටෙක කෝමාරභච්ච නම් වූ ජීවක වෛද්‍යාචාර්‍ය්‍යතුමා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියේ ය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට මනාකොට වැඳ, පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ හිඳීමෙහි දෝෂ හැර එකත් පසෙක ඉඳ ගත්හ. මෙය වනාහි පණ්ඩිතයන් ගේ ලක්‍ෂණයකි. පණ්ඩිතයෝ වනාහි ගරු කළ යුතු තැනකට පැමිණ වාඩිවීමේ කුසලතාවෙන් එකත් පසෙක හිඳ ගනිති. කෙසේ හිඳගත් කල්හි එකත් පසෙක හිඳගත්තේ නම් වෙයි ද? යත්

බොහෝ දුර ද නො සිට, බොහෝ ළඟ ද නො හිඳ, උඩු සුළඟෙහි ද නො හිඳ, ඉතා පහත් තැනක ද නො හිඳ, කෙලින් ම ඉදිරියෙහි ද නො හිඳ, පිටුපසින් ද නො හිඳ යන දෙස් හැර හිඳගැනීම ය. බොහෝ දුර සිටි කල්හි උස් හඬින් කථා කළ යුතු වේ. ඉතා ළඟ සිටි කල්හි ගැටීම ඇති වේ. උඩින් සිටි කල්හි ශරීර ගන්ධයෙන් බාධා ඇත් වේ. උස් තැනක සිටි කල්හි අගෞරව කළා වන්නේ ය. ඉතා ආසන්නයෙහි සිටි කල්හි දකිනු කැමැත්තේ ද ඇසින් ඇස ගැටී දැකිය යුතු වේ. ඉතා පිටුපසින් සිටි කල්හි බෙල්ල දිගු කොට හැරී දැකිය යුතු වේ. එබැවින් මේ උපාසකවරු තුන් වරක් භාග්‍යවතුන් වහන්සේ වටා ප්‍රදක්ෂිණා කොට මනාව වැඳ මේ හිඳීමේ දෙස් දුරු කොට භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි වම් පසින් ද දකුණු පසින් ද යන දෙපැත්තෙන් එක් පැත්තක මනාව හිඳගත්හ.

එකත්පසෙක හුන්නා වූ ජීවක වෛද්‍යාචාර්‍යයීතුමා භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැල කළේ ය.

**"කිත්තාවතා නු ඛො, භන්තෙ, උපාසකො හොතී'ති?"**

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, කොපමණකින් උපාසකයෙක් වෙයි ද?

**"යතො ඛො, ජීවක, බුද්ධං සරණං ගතො හොති, ධම්මං සරණං ගතො හොති, සඞ්ඝං සරණං ගතො හොති, එත්තාවතා ඛො ජීවක, උපාසකො හොතී'ති".**

ජීවකය, යම් දිනක පටන් බුදුරජාණන් වහන්සේ සරණ ගියේ වේ ද, ධර්‍මය සරණ ගියේ වේ ද, සංඝයා සරණ ගියේ වේ ද, ජීවකය, මෙපමණකින් ම උපාසක නම් වෙයි.

## ❄ සරණාගමනය

බුද්ධ ධම්ම සංඝ යන ශ්‍රේෂ්ඨ රත්නත්‍රය තමාට ඇති එකම පිහිටය යැයි අදහා ගත්තවුන් පිළිබඳ ව මෙලොව පරලොව දෙකෙහි වන්නා වූ බිය, තැති ගැනීම, අවැඩ, රෝග භය, අපා භය, වධ, බන්ධන නසාලන්නේය යනාර්‍ථයෙන් "**සරණ**" නම් වේ. බුද්ධාදී රත්නත්‍රයම සත්වයන් හිත වැඩෙහි යොදන්නේ ය. අහිතයෙන් ගලවාලන්නේය. සියලු බිය නසන්නේ ය. සසර දුකින් මුදලන්නේ ය. රැකවරණය දෙන්නේ ය. ස්වල්ප වූ ද සත්කාරය මහත් ඵල කරන්නේ ය.

රත්නත්‍රය කෙරෙහි සිත පහදවාගෙන ගෞරව කොට පිළිගැනීමෙන් නැසූ කෙලෙස් ඇති පිරිසිදු සිතින් රත්නත්‍රය මට ඇති එකම පිහිටය යැයි ශ්‍රද්ධාව පෙරටුකොට ගත් කර්‍ම ඵල විශ්වාසය නම් වූ සම්‍යක් දෘෂ්ටිමය වූ චේතනාව "**සරණගමනය**" නම් වේ.

මේ කියන ලද ශ්‍රද්ධා මූලික සිතින් යුක්ත ව රත්නත්‍රය මට ඇති එකම පිහිට යැයි අදහා ගෙන රත්නත්‍රය සේවනය කරන්නා, ඒ අනුව පිළිපදින්නා "**සරණගතයා**" නම් වේ. මේ සරණගතයාම "**උපාසකයා**" නමින්ද හඳුන්වනු ලැබේ. මෙම සරණගමනය "**ලෞකික, ලෝකෝත්තර**" වශයෙන් දෙ වැදෑරුම් වේ.

## ☸ ලෝකෝත්තර සරණගමනය

දක්නා ලද ආර්‍ය්‍ය සත්‍යය ඇති ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ සෝවාන් ආදී මාර්ග සිත් උපදිනවාත් සමගම සරණගමනය කෙලෙසන ධර්මයන් මුළුමනින් ම විනාශ කොට අරමුණු වශයෙන් නිවන අරමුණු කොට කෘත්‍යය වශයෙන් රත්නත්‍රය විෂය කොට සමෘද්ධියට පැමිණෙන්නේය. සියලු දුක්ඛයන්ගේ අවසානය මේ ලෝකෝත්තර සරණ ගැනීමෙහි ආනිශංසය වේ. සෝවාන්, සකෘදගාමී, අනාගාමී, අර්හත් යන ආර්‍ය්‍ය ඵලයෝ මෙහි විපාක ඵලයෝය. මේ ලෝකෝත්තර සරණගමනය කිසිලෙසකින් කිලුටු නොවන්නේ වේ. මෙහි කිසි භේදයක් නැත. මරණයෙන් පසු හෝ අන්‍ය ශාස්තෘවරයෙකු නො අදහන්නේ ම ය. මේ ආර්‍ය්‍ය සරණ ලැබූවකුගෙන් භවාන්තරයෙහිදී හෝ ප්‍රාණඝාතාදී කිසිඳු අකුසලයක් සිදු නොවේ. එසේම තම ජීවිත හානියක් නොකරගනියි. හංසයෙකු ජලයෙන් කිරි වෙන් කොට පානය කරන්නා සේ මේ ආර්‍ය්‍ය පුද්ගලයෙකුට නොදැන හෝ කිසි ලෙසකින් සුරාවක් නොපෙවෙත්ම ය. කිසි කලක දැන කෙලෙස් සිතකින් සිකපද බිඳීමක් නැත්තේ ම ය. ධර්ම විනය නොදැනීමෙන් ප්‍රඥප්ති වද්‍ය සිකපද බිඳීම විය හැකිය.

## ☸ ලෞකික සරණගමනය.

තෙරුවන් ගුණ අරමුණු කොට ප්‍රඥාවන්තයාගේ සිත ඒ ගුණ විශේෂයෙහි සැක නූපදවා කෙලෙස් කිලුටු අත්හරිමින් අර්ථ වශයෙන් බුද්ධාදී රත්නත්‍රයෙහි ගුණ ඇදහීම, පිළිගැනීම "**ලෞකික සරණගමනය**" නම් වේ. ශ්‍රද්ධා මූලික සම්‍යක්දෘෂ්ටියෙහි පිහිටා ගෙන දසවිධ පුණ්‍ය

ක්‍රියා වස්තූන්ගෙන් දිට්ඨිජුකම්ම නමින් කියවෙන දෘෂ්ටිය ඍජු කර ගැනීම මේ ලෞකික සරණාගමනයයි. මෙය "**අත්තසන්නීයාතන සරණාගමනය, තත්පරායන සරණාගමනය, ශිෂ්‍යභාවෝපගමන සරණාගමනය, පණිපාත සරණාගමනය**" යනුවෙන් සතර වැදෑරුම් වේ.

## ⌘ අත්තසන්නීයාතන සරණාගමනය

මාගේ ආත්මභාවය භාග්‍යවතුන් වහන්සේට පරිත්‍යාග කරමි. නව ලෝකෝත්තර ධර්මයට ද, අෂ්ටාර්‍ය පුද්ගල සංඝයාට ද මාගේ ආත්මභාවය පරිත්‍යාග කරමි. මාගේ ජීවිතය ද පරිත්‍යාග කරමි. රත්නත්‍රයට මාගේ ආත්මය ද ජීවිතය ද පරිත්‍යාග කරන ලද්දේමය. දිවි කෙළවර කොට ඇති උතුම් ම පිහිට, රැකවරණය රත්නත්‍රය යැයි ප්‍රතිඥා කොට "**බුද්ධං සරණං ගච්ඡාමි**" යනුවෙන් සමාදන් ව ගැනීම අත්තසන්නීයාතන සරණාගමනය යි.

## ⌘ තත්පරායන සරණාගමනය

මම අද පටන් රත්නත්‍රය පිහිට කොට ඇත්තෙම් වෙමි යැයි ප්‍රතිඥා කොට "**බුද්ධං සරණං ගච්ඡාමි**" යනුවෙන් සමාදන් ව ගැනීම "**තත්පරායන සරණාගමනය**" නම් වේ.

## ⌘ ශිෂ්‍යභාවෝපගමන සරණාගමනය

මම අද පටන් රත්නත්‍රයට ශිෂ්‍යයෙක් වෙමි. මෙසේ මම ශිෂ්‍යයෙකු කොට දරන සේක්වා යැයි "**බුද්ධං සරණං ගච්ඡාමි**" යනුවෙන් සමාදන් ව ගැනීම "**ශිෂ්‍යභාවෝපගමන සරණාගමනය**" නම් වේ.

## ⌘ පණිපාත සරණාගමනය

මම අද පටන් රත්නත්‍රයටම වැඳීම පිදීම ගෞරව සත්කාර සම්මානාදිය කරන්නෙමි මෙසේ මා දරාගනු මැනව යැයි "**බුද්ධං සරණං ගච්ඡාමි**" යනුවෙන් සමාදන් ව ගැනීම "**පණිපාත සරණාගමනය**" නම් වේ. මේ පණිපාත සරණාගමනය **ඥාති - භය - ආචාර්‍ය්‍ය - දක්ෂිණාර්හ** වශයෙන් සිව් වැදෑරුම් වන්නේය. එයින් බුදු රජාණන් වහන්සේ නෑයෙකි යැයි ඥාතිකම සැලකීමෙන් ද, බුදු රජාණන් වහන්සේ රාජ පූජිතය, මහානුභාව ඇත්තේ ය. එබැවින් නො වඳින්නේ නම් අනර්ථයක් විය හැකිය යැයි බිය හේතුවෙන් ද, බුදු රජාණන් වහන්සේ මාගේ ආචාර්‍ය්‍යවරයා ය. එබැවින් නො වැඳ සිටීම නුසුදුසු ය යැයි ආචාර්‍ය්‍ය වශයෙන් සැලකීමෙන් ද සරණ නො පිහිටන්නේ ය.

යමෙක් "**මෙතෙමේ ම ලොව ආර්‍ය්‍ය භාවයට පැමිණියේ ය. ලොව සියලු සත්වයන්ට උතුම් ය. අග්‍ර දක්ෂිණාර්හය**" යැයි වැඳීම පිදීම ගෞරව සත්කාර සම්මානාදිය කරන්නේ ද හෙතෙමේටම "**බුද්ධං සරණං ගච්ඡාමි**" යනුවෙන් සමාදන් ව ගැනීමෙන් සරණ පිහිටන්නේය. මෙසේ සරණ **දක්ෂිණාර්හ** භාවයෙන් ශ්‍රේෂ්ඨ වශයෙන් ගැනීමෙන් ම පිහිටන්නේ ය. **ඥාති - භය - ආචාර්‍ය්‍ය** භාවයෙන් ශ්‍රේෂ්ඨ වශයෙන් ගැනීමෙන් බිඳෙන්නේ ය.

මෙසේ රත්නත්‍රය සරණ ගිය බුද්ධ ශ්‍රාවකයෙකු අන්‍ය තීර්ථකයන් වෙත පැවිදි වූ හෝ ගිහි වූ හෝ තම ඥාතියෙකු වෙත ගොස් ඥාතිකම සලකා වැඳීමෙන් ද, රජ තෙමේ රටවැසියන් විසින් වඳිනු පුදනු ලබන්නේ ය. එබැවින් වැඳීම - පිදීම නොකළහොත් නපුරක් කරන්නට බැරි නැතැයි බිය හේතුවෙන් වැඳීම - පිදීම කිරීමෙන් ද, ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වූ වූ අන්‍ය තීර්ථකයකුට ගුරු ගෞරවයෙන් වැඳීම - පිදීමාදිය කරන්නාගේ ද සරණ නොබිඳෙන්නේය.

මේ **ලෞකික සරණගමනය** රත්නත්‍රය පිළිබඳ ගුණ නොදැනීමෙන් ද, ඒ මහත් වූ ගුණයන් පිළිබඳ ව උපදනා සැකයෙන් ද, රත්නත්‍රය පිළිබඳ ව වැරදි ආකාරයෙන් දැකීමෙන් ද කිලිටි වන්නේය. තවද මේ ලෞකික සරණගමනය **සාවද්‍ය - අනවද්‍ය** වශයෙන් දෙ

වැදැරුම් වේ. එයින් **සාවද්‍ය සරණගමනය** අන්‍ය ශාස්තෘවරයෙකු අත්තසන්නීයාතන ආදි ලෙස සරණ ගැනීමෙන් බිඳෙන්නේ ය. මෙයින් අනිෂ්ට විපාක ලැබෙන්නේ ය. **අනවද්‍ය සරණගමනය** මරණයෙන් බිඳෙන්නේ ය. මෙයින් අන්‍ය ශාස්තෘවරයන් සරණ ගැනීමක් නොවන බැවින් **අනවද්‍ය** සරණාගමනය නම් වේ.

# ❄ උපාසකත්වය

උපාසකත්වය පිළිබඳ ව දීඝ නිකායට්ඨකථා සාමඤ්ඤඵල සූත්‍ර වණ්ණනාවෙහි මෙසේ සඳහන් වේ.

**"කො උපාසකො ති = යො කොචි සරණගතො ගහට්ඨො"** තෙරුවන් සරණ ගිය ගිහි පින්වතා උපාසක නම් වේ.

**"කස්මා උපාසකො ති = රතනත්තයං උපාසනතො"** කුමක් නිසා උපාසක නම් වේ ද? රත්නත්‍රය කරා එළඹෙන බැවින් ඇසුරු කරන බැවින් උපාසකයා නම් වේ.

**"කිමස්ස සීලන්ති = පඤ්ච වෙරමණියො"** පඤ්ච දුෂ්චරිතයන්ගෙන් වැළකීම ඔහු ගේ සීලය යි.

යමෙක් බුදුන් සරණ ගියේ වේ ද, දහම් සරණ ගියේ වේ ද, සඟුන් සරණ ගියේ වේ ද, එපමණකින් හෙතෙම උපාසකයෙකු වෙයි.

**"කො ආජීවො ති = පඤ්ච මිච්ඡාවණිජ්ජා පහාය ධම්මෙන සමෙන ජීවිතකප්පනං"** සත්ව හින්සනයට යොදා ගන්නා ආයුධ වෙළඳාම, දාස බව ආදියට මනුෂ්‍යයන් විකිණීම, සූනබයන් ඇති දැඩි කරන්නා සේ මුව, ඌරු, එළුවන් වැනි සතුන් ඇති කොට මස් පිණිස විකිණීම, මත් ද්‍රව්‍ය වෙළඳාම, වස විස වෙළදාම යන අධර්ම වෙළඳාම්වලින් වැළකී ධර්මානුකූල ජීවිත පැවැත්ම ඔහුගේ ආජීවය යි.

**"කා විපත්තීති = යා තස්සෙව සීලස්ස ච ආජීවස්ස ච විපත්ති, අයමස්ස විපත්ති"**

යමෙක් සිල් නො රකියි ද, අධර්ම වෙළඳාම් කරයි ද මෙය ඔහු ගේ විපත්තිය හෙවත් පිරිහෙන මඟ වේ. එබඳු තැනැත්තා ගේ ලක්‍ෂණ මෙසේ දැක්වේ.

යමෙක් ශ්‍රද්ධාව නැත්තේ වේ ද, සිල් බිඳියි ද, කෝතුහල මංගල නම් වූ අසන දකින දේවල් ශුභ අශුභ වශයෙන් පිළිගන්නෙකු වේ ද, කෝතුහල මංගල සලකා කර්ම විපාක පිළි නොගන්නෙක් වේ ද, බුදු සසුනෙන් බැහැර දන් දීමට සුදුස්සන් සොයයි ද මෙම කරුණු පස සීල විපත්තියට හා ආජීව විපත්තියට හේතු වේ. යමෙක් මෙම කරුණු පසෙන් යුක්ත වේ ද හෙතෙම උපාසක චණ්ඩාලයෙකි. මල බැඳුණු යකඩයක් මෙන් උපාසක මලයෙකි. උපාසක හීනයෙකි.

**"කා සම්පත්තී'ති = යා චස්ස සීලසම්පදා චෙව ආජීවසම්පදා ච, සා සම්පත්ති"** යමෙක් මනාව පන්සිල් රකියි ද, පිරිසිදු ආජීවයෙන් යුක්ත වේ ද, මෙය ඔහු ගේ සම්පත්තිය හෙවත් දියුණුවන මඟ වේ. එබඳු යහපත් උපාසකයා ගේ ලක්‍ෂණ මෙසේ දැක්වේ.

යමෙක් ශ්‍රද්ධාව ඇත්තේ වේ ද, සිල්වත් වේ ද, කෝතුහල මංගලිකයෙක් නොවෙයි ද, කර්ම ඵල විශ්වාස කරන්නෙක් වේ ද, බුදු සසුනෙන් බැහැර දක්‍ෂිණාර්හයන් නො සොයයි ද හෙතෙම භික්‍ෂු - භික්‍ෂුණී - උපාසක - උපාසිකා යන සිවු පිරිසෙහි ප්‍රසාදයට පත්වන බැවින් උපාසක රත්නය නම් වේ. මෛත්‍රිය, කරුණාව, ඉවසීම, ආදී ගුණයන්ගෙන් ද, සීල සුගන්ධය, කීර්ති සුගන්ධය, ගුණ සුගන්ධය ආදියෙන් ද යුත් උපාසක තෙමේ උපාසක පදුමය නම් වේ. සුදු නෙළුම් මලක් සේ මංගල සම්මත අවස්ථාවන්හි දී පෙරමුණෙහි තබා ගන්නා බැවින් ද, සැමට ප්‍රිය මනාප වන බැවින් ද උපාසක පුණ්ඩරිකය නම් වේ.

එබඳු උපාසකයා ගේ ගුණ දසයක් මිළින්ද ප්‍රශ්නයෙහි දක්වා ඇත. ඒවා මෙසේ ය.

1. සඞ්ඝයා හා සමාන සුව දුක් ඇත්තේ ධර්මය අධිපති කොට ඇත්තේ වේ.

2. දන් දීමෙහි ඇලුණේ වේ.

3. සර්වඥ ශාසනයෙහි පිරිහීම දැක එය නගා සිටුවීමට උත්සාහ කරන්නෙකු වේ.

4. දුරු කරන ලද කෝතුහල මංගල ඇත්තේ සම්‍යක් දෘෂ්ටිය ඇත්තෙකු වේ.

5. ජීවිත හේතුවෙන්වත් සර්වඥයන් වහන්සේ හැර අනෙකෙකු තම ශාස්තෘවරයා වශයෙන් නො දක්වන්නෙකු වේ.

6. කාය කර්ම වාක් කර්ම ආරක්ෂා කරන්නෙකු වේ.

7. සමගියෙහි ඇලුණෙකු වේ.

8. ඊර්ෂ්‍යා නොකරන්නෙකු වේ.

9. අන්‍යයන් රැවටීමට නොව සත්‍යයෙහි පිහිටා ම සර්වඥ ශාසනයෙහි හැසිරෙන්නෙකු වේ.

10. බුදුන් සරණ ගිය දහම් සරණ ගිය සඟුන් සරණ ගිය කෙනෙකු වේ.

මෙහි "**උපාසක**" යනු දිවි හිමි කොට අන් ශාස්තෘවරයෙකු හෝ ධර්මයක් හෝ සරණ පිහිට වශයෙන් නො අදහන්නා වූ නො පිළිගන්නා වූ රත්නත්‍රයම සරණ පිහිට කොටගත් තැනැත්තාය. භාග්‍යවතුන් වහන්සේ මේ උපාසකයාගේ ලක්ෂණ මෙසේ වදාළ සේක.

බුද්ධ ශ්‍රාවක වූ උපාසක භාවයට පැමිණියෙකු බුද්ධ රත්නය සරණ ගියේ වෙයි ද, ධර්ම රත්නය සරණ ගියේ වේ ද, සංඝ රත්නය සරණ ගියේ වේ ද මෙපමණකින් උපාසකයෙකු වේ. ඒ උපාසක තෙමේ සුගති මග, දුගති මග, නිවන් මග මේ මේ යැයි යා යුතු නොයා යුතු මග දැන දුක් කෙළවර කිරීම පිණිස පිළිපන්නෙකු වේ. එබැවින් **සත්ව වෙළඳම, ආයුධ වෙළඳම, වස විෂ වෙළඳම, මත් ද්‍රව්‍ය වෙළඳම, වහල් වෙළඳම** යන අධර්ම වෙළඳමෙන් වැළකුණෙකු වේ. නිති පන්සිල්,

උපෝසථ සිල් සමාදන් ව පුරමින් සමථ විපස්සනා භාවනා වඩමින් සුපිරිසිදු ගුණගරුක දිවියක් ගත කරන්නෙකු වේ. යම් දිනක පටන් තෙරුවන් සරණ ගියේ වේ ද, එතැන් පටන් ඒ උපාසක තෙමේ **තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් යුක්ත වේ ද, සීලයෙන් යුක්ත වේ ද, ත්‍යාගවන්ත වේ ද, ශ්‍රමණ දර්ශනය කැමති වේ ද, ධර්ම ශ්‍රවණයට කැමති වේ ද, ඇසූ ධර්මය මතකයෙහි තබා ගනී ද, එය නැවත නැවත සිහි කරයි ද, අර්ථ වටහා ගනී ද, එහි ප්‍රතිපත්ති වශයෙන් හැසිරෙයි ද** මෙබඳු උපාසක තෙමේ තමාට හිත වැඩ කරගන්නා වූ උපාසකයෙක් වේ. එසේම අන් අය මේ ධර්මයෙහි යොදවයි ද මෙතෙමේ අනුන්ට හිත වැඩ පිණිස පිළිපන්නෙකු වේ.

**"කිත්තාවතා පන, භන්තෙ, උපාසකො සීලවා හොතී'ති?"**

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, කොපමණකින් උපාසකයා සිල්වතෙකු වේ ද?

**"යතො ඛො, ජීවක, උපාසකො පාණාතිපාතා පටිවිරතො හොති. අදින්නාදනා පටිවිරතො හොති. කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති. මුසාවාද පටිවිරතො හොති, සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති, එත්තාවතා ඛො, ජීවක, උපාසකො සීලවා හොතීති."**

ජීවකය, යම් දිනක පටන් ප්‍රාණඝාතයෙන් තොර වූයේ වෙයි ද, අදත්තාදනයෙන් තොර වූයේ වෙයි ද, කාමයෙහි වරදවා හැසිරීමෙන් තොර වූයේ වෙයි ද, බොරු කීමෙන් තොර වූයේ වෙයි ද, ප්‍රමාදයට හේතු වූ මත්පැන් පානයෙන් තොර වූයේ වෙයි ද, ජීවකය, මෙපමණකින් උපාසකයා සිල්වතෙක් වෙයි.

# ❄ පඤ්ච සීලය

ලෝකයෙහි ජීවත් වන සත්වයන් අතර තමන්ටත් අනුන්ටත් අවැඩ පිණිස පවතින සැම කල්හි ම වැරදි යැයි සම්මත ධර්ම පසක් ඇත්තේ ය. ඒවා නම් "**ප්‍රාණඝාතය, සොරකම, කාමයෙහි වරදවා හැසිරීම, බොරු කීම, සුරාපාණය**" යන පසයි. එම වැරදිවලින් වැළකීමට සම්මත ප්‍රඥප්ති ධර්ම පස "**පඤ්ච සීලය**" නම් වේ. එහි අර්ථ විභාගය මෙසේ ය.

## ☸ ප්‍රාණඝාතය

සත්වයෙකුගේ ජීවිතයක් කර්ම ශක්තියට හා පවතින ආයුෂ කාලයට අනුව පවතින්නට නොදී අනෙකෙකුගේ උපක්‍රමයකින් විනාශ කිරීම ප්‍රාණඝාතය නම් වේ. ආදර ගෞරවයෙන් තෙරුවන් සරණ ගිය බෞද්ධයා විසින් එම වරදින් වැළකීමට භාග්‍යවතුන් වහන්සේ පනවා වදාළා වූ "**පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි**" යන සික්ෂාව සමාදන් ව එහි යෙදිය යුතු ය. එහි අර්ථ විවරණය මෙසේ ය.

"**පාණාතිපාතා**" යන මෙහි "**පාණ**" යනු ලෝක ව්‍යවහාරය අනුව ජීවත් වන සත්වයා ය. පරමාර්ථ වශයෙන් ගත් කල්හි **ජීවිතේන්ද්‍රිය** නම් වේ. එය ද "**නාම ජීවිතේන්ද්‍රිය, රූප ජීවිතේන්ද්‍රිය**" යනුවෙන් දෙ වැදෑරුම් වේ. එයින් "**නාම ජීවිතේන්ද්‍රිය**" යනු භවයක් පාසා නොසිඳී පවතින සිත් පරම්පරාව ය. "**රූප ජීවිතේන්ද්‍රිය**" යනු මෙලොව පිළිසිඳගත් ද පටන් මරණාන්තය දක්වා කර්ම ශක්තිය අනුව පාලනය වන කර්මජ රූප පරම්පරාව ය. ප්‍රාණඝාතයෙහි දී ගැනෙනුයේ මේ **රූප ජීවිතෙන්ද්‍රය** ය. මෙසේ වූ ජීවිතින්ද්‍රිය හෙවත් ප්‍රාණය නැසීමේ චේතනාව "**පාණාතිපාතා**" නම් වේ.

"**වෙරමණී**" යන්නෙහි "**වෙරං මණතීති = වෙරමණී**" වෛරය දුරු කරන්නේ නුයි "**වෙරමණී**" නම් වේ. මෙයින් සත්ව ඝාතනයෙහි ආදීනව හෙවත් එහි විපාක දැක එයින් වැළකීමේ චේතනාවයි. මෙම

විරතිය "**සම්පත්තවිරති, සමාදනවිරති, සමුච්ඡෙදවිරති**" යනුවෙන් තෙවැදෑරුම් වේ. යමෙක් සිල් සමාදන් නොවී තම උපන් කුලය ගෝත්‍රය සලකා මෙවැනි පවුකම් කිරීම අපගේ කුල පරම්මරාවට නොගැළපෙයි යැයි සිතීමෙන් ද, ඇතමෙක් තම උගත්කම සැලකීමෙන් ද, ඇතමෙක් තම වයස සැලකීමෙන් ද දුසිරිත්වලින් වැළකෙති. මෙය "**සම්පත්තිවිරති**" නම් වේ. සික්ෂාපද සමාදන් ව තම ජීවිත හේතුවෙන්වත් නොබිඳ රැකීම "**සමාදනවිරති**" නම් වේ. නැවත නූපදනා ලෙස කෙලෙසුන් නැසූ ආර්‍ය්‍ය උතුමන්ට ප්‍රාණඝාතාදී සිතකුදු පහළ නොවෙත්ම ය. මෙය "**සමුච්ඡෙදවිරති**" නම් වේ. මෙහි දී **සමාදනවිරතිය** අදහස් කරන ලදි.

"**සික්ඛාපදං**" යන මෙහි සත්ව ඝාතනාදී වැරදි අතහැරීම, හික්මීම, සංවර වීම "**සික්ඛා**" නම් වේ. සීලය පරිපූර්‍ණය කිරීම නිවනට මාර්ගය වන බැවින් "**පද**" නම් වේ. මෙසේ නිස්සරණාධ්‍යාශයෙන් යුතුව ප්‍රාණඝාතයෙන් වැළකී උසස් ගුණ වැඩීම පිණිස සිල් සමාදන් වීම සියලු කුසලයන්ට මූලය වන බැවින්ද, නිර්වාණාධිගමයට උපාය මාර්ගය වන බැවින් ද "**සික්ඛාපද**" නම් වේ.

**ලාභ කීර්ති ප්‍රශංසා ධන ඥාති පරිවාර ශරීරාවයව ජීවිතාදී** කිසිඳු හේතුවක් නිසාවත් නොබිඳ සිල් රැකීම ද, යම් හේතුවකින් සිල් බිඳුණේ නම් වහාම එය සමාදන් ව ආයති සංවරයෙහි පිහිටීම ද, ක්‍රෝධය, බද්ධ වෛරය, ගුණමකු බව, උසස් ගුණවතුන් හා තමන් සම කිරීම, අන්‍යයන්ට ලැබෙන කීර්ති ප්‍රශංසා නොයිවසීම, තමන් ළඟ ඇති ගුණධර්ම හෝ පරිභෝග වස්තූන් අනුන්ට නොදීම, තම අගුණ සැඟවීම, තමා තුළ නැති ගුණ පෙන්වීම, දරදඬු බව, එකට එක කිරීම, මානය, දැඩි මානය, සත්විසි මඳය, ප්‍රමාදය යන පාප ධර්මයන්ගෙන් තොරව "**අඛණ්ඩ, අඡිද්‍ර, අසබල, අකල්මාස, භුජිස්ස, විඤ්ඤුපසත්‍ථ, අපරාමට්‍ඨ, සමාධිසංවත්තනික**" වශයෙන් ගෞරව සම්ප්‍රයුක්ත ව රැකීම "**සමාදියාමි**" නම් වේ.

මුල හෝ අග ශික්ෂාපද නොබිඳ රැකීම "**අඛණ්ඩ**" නම් වේ. මැදින් සිකපද නොබිඳ රැකීම "**අඡිද්‍ර**" නම් වේ. එක පිළිවෙළට සිකපද නොබිඳ රැකීම "**අසබල**" නම් වේ. තැනින් තැනින් සිකපද නොබිඳ

රැකීම "**අකල්මාස**" නම් වේ. ඉහත කී අංගයන්ගෙන් යුත් සීලය තෘෂ්ණා දසත්වයෙන් නිදහස් කරවන බැවින් "**භුජිස්ස**" නම් වේ. එබඳු සීලයම බුදු, පසේ බුදු, මහරහත් ආදී උතුමන්ගේ ප්‍රශංසාවට ලක්වන බැවින් "**විඤ්ඤුප්පසත්ථ**" නම් වේ. එබඳු වූ සීලය මම මගේ යැයි තණ්හා දිට්ඨි වශයෙන් නොගන්නා බැවින් "**අපරාමට්ඨ**" නම් වේ. එසේ වූ සීලය උපචාර සමාධි අර්පණා සමාධි විදර්ශනා ඥාන උපදවාලීමට සමත් බැවින් "**සමාධිසංවත්තනික**" නම් වේ.

මෙලෙස සීල විපත්තියෙහි ආදීනව හා සීල සම්පත්තියෙහි ආනිශංස සලකා මනා ගෞරවයෙන් සිල් රැකීම මෙලොව දියුණුව පරලොව සුගතිය හා ඒකාන්තයෙන් ම වැරදීමකින් තොරව නිවනින් සැනසීමට හේතු වන්නේම ය.

## ⌘ ප්‍රාණඝාත අකුශලය කෙසේ සිදු වේ ද?

අංග පසක් සම්පූර්ණ වීමෙන් ප්‍රාණඝාතය සිදු වෙයි.

1. පණ ඇති සතෙකු වීම,
2. පණ ඇති සතෙකු බව දැන ගැනීම,
3. මරනු කැමති සිත,
4. මැරීම පිණිස උපක්‍රම යෙදීම,
5. ඒ උපක්‍රමය නිසාම මැරීම යන පසයි.

මෙම අංග පසම සම්පූර්ණ නොවී ප්‍රාණඝාත අකුශලය සිදු නොවේ. සත්වයන් මරණ චේතනාවක් නැතිව ගොවිතැන් ආදී වැඩකටයුතු කිරීමෙහි දී ද, යන එන විට දී පෑගීමෙන් ද සතුන් මැරෙන නමුත් ප්‍රාණඝාතය සිදු නොවේ. මාගේ මේ ප්‍රයෝගයෙන් සත්වයෝ මැරෙත්වා යැයි සිතා කරන වැඩවල දී මැරෙන සත්වයන් ගේ ගණනින් ප්‍රාණඝාතය සිදු වෙයි. එක් සතෙකු මැරීමට කළ ප්‍රයෝගයෙන් අන් සතෙකු මැරෙයි ද, එම සතා මරණ අදහසක් නැති බැවින් ප්‍රාණඝාතය සිදු නොවේ. නො මැරීමේ අදහසින් කල ප්‍රයෝගයකින් සතෙකු මැරෙන්නේ ද, මරණ චේතනාවක් නැති බැවින් ප්‍රාණඝාතය සිදු

නොවේ. ශල්‍යකර්මාදියෙහි ද මෙසේ ම ය. නිවෙස් හා භාජනාදිය පිරිසිදු කිරීම් ආදියෙහි දී සතුන් ඇත්තේ නම් මරණ චේතනාවක් හිංසා කිරීමේ චේතනාවක් නැතිව ම එය කළ යුතු ය. යම් ක්‍රියාවක දී එයින් සතුන් මැරෙන බව දන්නේ නම් එය නොකළ යුත්තේ ම ය.

ප්‍රාණඝාතය සිදුකළ හැකි ප්‍රයෝග සයකි. එනම් "**සාහත්ථික, ආනත්තික, නිස්සග්ගිය, ථාවර, විජ්ජාමය, ඍද්ධිමය**" යන සයයි.

සතෙකු මැරීම පිණිස ගැසීම, ඇනීම, කැපීම ආදිය තමන් විසින් ම කිරීම **සාහත්ථික ප්‍රයෝග** නම් වේ.

සතෙකු මැරීම පිණිස අනෙකෙකුට අන කිරීම **ආනත්තික ප්‍රයෝග** නම් වේ. මෙය **වස්තුව, කාලය, අවකාශය, ආයුධය, ඉරියව්ව, ක්‍රියා විශේෂ** යැයි සය වැදෑරුම් වේ.

එහි **වස්තුව** යනු මරනු ලබන සත්වයා ය. යමෙක් අසවල් සත්වයා මරන්නට යැයි අණ කළ කල්හි, අණ ලැබූ තැනැත්තා විසින් නොවරදවා ම එම සතා මැරුව හොත් දෙදෙනාට ම ප්‍රාණඝාත අකුශලය සිදු වේ. අණ ලැබූ තැනැත්තා එම සතා නො මරා වෙන සතෙකු මැරුව හොත් ඔහුට පමණක් ප්‍රාණඝාත අකුශලය සිදු වේ.

**කාලය** යනු රාත්‍රී කාලය, දිවා කාලය වශයෙන් කාලය නියම කිරීමයි. අසවල් වේලාවෙහි දී මරන්නට යැයි අණ කළ කල්හි, අණ ලැබූ තැනැත්තා විසින් නොවරදවා ම එම වේලාවෙහි දී ම මැරුව හොත් දෙදෙනාට ම ප්‍රාණඝාත අකුශලය සිදු වේ. අණ ලැබූ තැනැත්තා එම වේලාවෙහි දී නො මරා වෙන වෙනත් කාලයක දී මැරුව හොත් ඔහුට පමණක් ප්‍රාණඝාත අකුශලය සිදු වේ.

**අවකාශය** යනු එම ක්‍රියාව කරන තැනය. අසවල් තැන සිටින සත්වයා මරන්නට යැයි අණ කළ කල්හි අණ ලැබූ තැනැත්තා නියමිත තැනදීම මැරුව හොත් දෙදෙනාට ම ප්‍රාණඝාත අකුශලය සිදු වේ. අණ ලැබූ තැනැත්තා එතැන දී නො මරා වෙන තැනක දී මැරුව හොත් ඔහුට පමණක් ප්‍රාණඝාත අකුශලය සිදු වේ.

**ආයුධය** යනු මැරීම සඳහා යොදා ගන්නා ආයුධයයි. අණ කරන්නා පිහියකින් ඇණ මරන්නට යැයි නියම කළ කල්හි අණ ලැබූ තැනැත්තා එලෙස ම කළ හොත් දෙදෙනාට ම ප්‍රාණඝාත අකුශලය සිදු වේ. අණ ලැබූ තැනැත්තා අන් ආයුධයකින් ඇණ මැරුව හොත් ඔහුට පමණක් ප්‍රාණඝාත අකුශලය සිදු වේ. ප්‍රාණඝාතය පිණිස ආයුධ සෑදූ කල්හි වසර දහස් ගණනක් වුව ද එම ආයුධයෙන් සතුන් මරන්නේ ද, ඒ තාක් එම ආයුධ සෑදූ තැනැත්තාට ප්‍රාණඝාත අකුශලය සිදු වේ. එබැවින් එම ආයුධ විනාශ කිරීම යහපති.

**ඉරියව්ව** යනු සත්වයා සිටින ඉරියව්වයි. නිදා සිටින විට මරන්නට යැයි අණ කළ කල්හි අණ ලැබූ තැනැත්තා නිදා සිටින සත්වයෙකු ම මැරුව හොත් දෙදෙනාට ම ප්‍රාණඝාත අකුශලය සිදු වේ. අණ ලැබූ තැනැත්තා සිටගෙන සිටින සත්වයෙක් මැරුව හොත් ඔහුට පමණක් ප්‍රාණඝාත අකුශලය සිදු වේ.

**ක්‍රියා විශේෂය** යනු මරණු සඳහා කරන උපක්‍රමයයි. වෙඩි තබා මරන්නට යැයි අණ කළ විට අණ ලැබූ තැනැත්තා එලෙස ම මැරුව හොත් දෙදෙනාට ම ප්‍රාණඝාත අකුශලය සිදු වේ. අණ ලැබූ තැනැත්තා ගලකින් ගසා මැරුව හොත් ඔහුට පමණක් ප්‍රාණඝාත අකුශලය සිදු වේ. කෙසේ හෝ මරන්නට යැයි අණ කළ විට අණ ලැබූ තැනැත්තා මොනයම් ක්‍රමයකින් හෝ මරන්නේ ද දෙදෙනාට ම ප්‍රාණඝාත අකුශලය සිදු වේ.

උගුල් අටවා තැබීම, උල් සිටවා තැබීම, තුවක්කු බැඳ තැබීම, වළවල් සාරා තැබීමාදිය **ථාවර ප්‍රයෝග** නම් වේ. අසවල් සත්වයා මැරීමට යැයි වළක් සෑරූ කල්හි එම සත්වයාම එහි වැටී මලහොත් ප්‍රාණඝාතය සිදු වේ. අන් සත්වයෙකු එයින් මලහොත් ප්‍රාණඝාතය සිදු නොවේ. එම සත්වයා මැරීමේ අදහසක් නැති බැවිනි. අසවල් සත්වයා මැරීමට යැයි නියමයක් නැතිව වළක් සාරා තැබීමෙන් කවර සත්වයෙකු හෝ වැටී මලහොත් ප්‍රාණඝාතය සිදු වේ. ඒ වළවල් ආදිය වසර දහස් ගණනක් වුව ද පවත් ද ඒ තාක් ඒවාට ගොදුරු වී මැරෙන සත්වයින්ගේ ගණනින් එම ප්‍රයෝග කළවුන්ට ප්‍රාණඝාතය සිදු වේ.

අංගම් පිඹීම, සූනියම් කිරීම, පිල්ලි යැවීමාදිය **විජ්ජාමය ප්‍රයෝග** නම් වේ.

ඇතැම් අමනුෂ්‍යාදීන්ට තම ශරීරය දක්වීමෙන් ද, බිය ගැන්වීමෙන් ද අන්‍යයන් නැසිය හැකි ඍද්ධිවිශේෂ උපතින් ම පිහිටා තිබේ. එබඳු කර්මජ ශක්තීන් **ඍද්ධිමය ප්‍රයෝග** නම් වේ.

## ⌘ ප්‍රාණඝාත කර්මය පිළිබඳ ව දත යුතු වෙනත් කරුණු

මිනිසත්බව ලැබූ යම් කෙනෙක් මනුෂ්‍ය වූම තම මව හෝ පියා හෝ රහතන් වහන්සේ නමක් හෝ මරන්නේ ද, ඔහු දෙවන ජාතියෙහි නොවරදවාම අවීචි මහ නරකයෙහි උපදවාලීමට සමත් වන ආනන්තර්‍ය්‍ය පාප කර්මය කරගත්තෙකු වේ. තම මව හෝ පියා හෝ උපතින් ම තිරිසන් වූයේ නම් හෝ පසු කලෙක තිරිසන් බවට පෙරලුනේ නම් හෝ එබඳු මව්පියන් මරණ මනුෂ්‍ය ව උපන් දරුවෙකුට ද, එසේම මනුෂ්‍ය මව්පියන්ට දාව උපන් තිරිසන් දරුවෙක් විසින් හෝ පසුව තිරිසන් බවට පෙරළුණු දරුවෙක් විසින් හෝ තම මනුෂ්‍ය ජාතික මව්පියන් මරන්නේ නම් ඔහුට ද ආනන්තර්‍ය්‍ය කර්මය සිදු නොවේ. එයින් බරපතළ ප්‍රාණඝාත අකුශලයක් පමණක් සිදු වේ.

දහවල් කාලයෙහි යම් තැනක එළුවෙකු නිදනු දැක රාත්‍රී කාලයෙහි ගොස් ඌ මරමි යැයි සිතා රාත්‍රියෙහි එතැනට ගොස් එළුවා යැයි සිතා එහි සිටි තම මව හෝ පියා හෝ මරනු ලැබුවේ නම් ඔහුට ආනන්තර්‍ය්‍ය කර්මය සිදු වේ. මැරීමේ අදහසින් කළ බැවිනි.

ඇතමෙක් දුක් විඳින සතුන් දැක ඔවුන් දුකින් මිදවීම යහපත් ය, එයින් පවක් නොවේ ය යැයි කියා මරා දමති. මොන විදිහේ දුකක් වින්දේ නමුත් ඔවුන්ට ජීවිතයට වඩා ප්‍රිය දෙයක් නැත. මරණයට බිය නොවන කිසිම සත්වයෙක් නැත. ද්වේෂ සිතකින් තොරව ප්‍රාණ වධයක් කළ නොහැක.

සිය පණ නසා ගැනීම ද බොහෝ සෙයින් ම ද්වේෂ සහගත සිතින් ම සිදුවන්නකි. එහෙත් එය ප්‍රාණඝාත කර්මයට අයත් නොවේ. එයින් අල්ප සාවද්‍ය අකුශලයක් සිදු වේ. අන් සත්වයෙකු මැරීමෙන් ම ප්‍රාණඝාතය සිදු වේ.

## ⌘ ප්‍රාණඝාත කර්මයෙහි අල්ප සාවද්‍ය මහා සාවද්‍ය භාවය

ප්‍රාණඝාත කර්ම සියල්ල එකිනෙකට සමාන නොවේ. සත්වයන් අතර මනුෂ්‍යයාගේ ගුණය මහත් බැවින් මනුෂ්‍ය ඝාතනය මහා සාවද්‍ය අකුශලයක් වේ. මනුෂ්‍ය ඝාතනයෙහි ද ආනන්තර්‍ය පාපකර්මය බලවත් ම අකුශලය වේ. ඒ අතර ද ගුණ මහන්තතාවය උසස් හෙයින් රහතුන් මැරීමෙහි අකුශලය බලවත් වේ. රහතන් වහන්සේලා අතර ද අග්‍රශ්‍රාවක, මහා ශ්‍රාවක, ප්‍රතිසම්භිධා ලාභී, ෂට් අභිඥා ලාභී, ත්‍රි විද්‍යා ලාභී, ශුෂ්ක විදර්ශකාදී රහතන් වහන්සේලාගේ ගුණ මහන්තතාවය අනුව අකුශලයෙහි බලවත් කම වෙනස් වේ. මව්පියන් අතර මවගේ ගුණය අධික හෙයින් පිතෘඝාතක අකුශලයට වඩා මාතෘ ඝාතක අකුශලය බලවත් වේ.

ඊළඟට අනාගාමී, සකෘදගාමී, සෝවාන් ආර්‍යයන් වහන්සේලාගේ වශයෙන් ගුණ මහන්තතාවය අනුව අකුශලය බලවත් වේ. ඊළඟට කල්‍යාණ පෘථග්ජන භික්ෂූන් වහන්සේලාගේ ගුණ මහන්තතාවය අනුව අකුශලය බලවත් වේ. ඊළඟට ශාසනයෙන් බැහැර පැවිද්දන්, තම ගුරුවරයන්, සිල්වත් ගුණවත් මනුෂ්‍යාදීන් ගේ වශයෙන් අකුශලය බලවත් වේ. තිරිසන් ගත සත්වයින්ගෙන් දීර්ඝායුෂ ඇති සත්වයන් හා මහත් වූ ශරීර ඇති සත්වයන් මැරීමේ අකුශලය බලවත් වේ. මැරීමට යොදන උපක්‍රමයන්ගෙන් මහත් ශරීරයක් ඇති සත්වයෙකු මැරීමට මහත් උත්සාහයක් යෙදිය යුතු වීමෙන් කර්මය මහා සාවද්‍ය වේ. ක්ලේශයන් ගේ සැටියට ද එහි අල්ප සාවද්‍ය, මහා සාවද්‍ය බව වෙනස් වේ. බලවත් කෝපයකින් ප්‍රාණඝාතය කිරීමෙන් කර්මය මහා සාවද්‍ය වේ.

## ⌘ ප්‍රාණඝාත කර්‍මයෙහි විපාක

ප්‍රතිසන්ධි විපාක, ප්‍රවෘත්ති විපාක යැයි කර්‍ම විපාක දෙ වැදෑරුම් වේ. සත්වයන් විසින් සිදුකරගනු ලබන කුසලාකුසල කර්‍මයන්ගේ ශක්තියෙන් භවයෙන් භවය ගළපමින් දිගට සංක්‍රමණය වන ජීවිත පරම්පරාවෙහි ඒ ඒ භවයෙහි පළමුවෙන් ම හටගන්නා සිත ප්‍රතිසන්ධි සිත ය. ඒ ඒ භවයෙහි සැප දුක් ලබා දෙමින් උපකාර වන ශක්තිය ප්‍රවෘත්ති විපාකයන් ය. එක කර්‍මයකින් ප්‍රතිසන්ධි විපාක ලැබෙන්නේ එක් වතාවක් පමණකි. එම කර්‍මයෙහිම ප්‍රවෘත්ති විපාක වශයෙන් ආත්මභාව සිය දහස් ගණන් වාර සැප දුක් ලබා දීමට සමත් වෙති.

ප්‍රාණඝාත කර්‍මයෙහි ප්‍රතිසන්ධි විපාක වශයෙන් සතර අපායන්ගෙන් තැනක උපදවාලයි. ප්‍රවෘත්ති විපාක වශයෙන් රෝගාදී අන්තරායන් ඇති වී අඩු ආයුෂයෙන් මරණය සිදු වෙයි. ප්‍රාණඝාත කළ තැනැත්තා අන් කුසල ශක්තියකින් සුගතියක උපන්නේ ද, විකල වූ ශරීරාංගයන් ඇතිව උපදියි. නො මනා ලෙස පිහිටි ශරීරාවයව ඇත්තෙක් වේ. අන්‍යයන්ට අප්‍රිය වූ අශෝභන වූ ශරීරාවයව ඇතියෙකු වේ. නොයෙක් විට දුකින් ශෝකයෙන් විසීමට සිදු වේ. නිශ්කාරණයෙහි බිය වන්නෙක් වේ. බිඳී යන පිරිස් ඇත්තෙක් වේ. බොහෝ සතුරන් ඇත්තෙක් වේ. සතුරන්ගෙන් හින්සාවට පීඩාවට ලක් වන්නෙක් වේ. පරෝපක්‍රමයන්ගෙන් මරණයට පැමිණෙන්නෙක් වේ.

## ⌘ ප්‍රාණඝාතයෙන් වැළකීමේ ආනිශංස

පෙර ලක්දිව එක් ගොවියෙක් **අම්බරිය විහාරවාසී පිංගිල බුද්ධරක්ඛිත තෙරුන් වහන්සේ** වෙතින් පන්සිල් සමාදන් ව ගොස් ගොවිතැනින් ජීවත් වූයේ ය. එක් දිනක් එතුමා කුඹුරෙහි වැඩට ගෙනගිය ගොනුන් නැති වී ඔවුන් සොයන්නට **උත්තර වඩ්ඪමාන පර්‍වතයට** නැංගේ ය. එහි දී පිඹුරෙකු විසින් ඔහුව වෙලා ගත්තේ ය. ගොවියා අත හොඳින් කැපෙන වෑයක් ද විය. ඔහුට පිඹුරාගේ හිස වෑයෙන් කපන්නට සිත් විය. නැවත ගරු කටයුතු තෙරුන්

වහන්සේගෙන් සමාදන් ව ගත් සීලය කුමට බිඳින්නේ ද යැයි සිතා එම අදහස අතහැර දැමීය. මෙලෙස පිඹුරා තදින් ශරීරය වෙලන විට තෙවරක්ම එම සතා මරන්නට සිත් වී තෙරුන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් සිකපද බිඳීම නුසුදුසු යැයි සිතා, එම අදහස අතහැර මේ සත්වයා මැරීමට අත ආයුධයක් ඇති බැවින් මරණ චේතනාව සිතට පැමිණෙයි. මගේ දිවි නැති වුව ද මම සීලය නො බිඳින්නෙමි යැයි සිහි කොට අත තිබූ වැය විසි කළේ ය. එකෙනෙහිම පිඹුරා ද එම උපාසක තුමා අතහැර ගියේ ය. මේ වනාහි මනාකොට සිල් රැකීමේ සාන්දෘෂ්ටික ආනිශංස යි.

## ☸ අදත්තාදනය

(මනුෂ්‍ය) වූ යම් කෙනෙකුට අයත් දෙයක් හිමිකරුවෙකු ඇති බව දැන දැනම සොර සිතින් ගැනීම "**අදත්තාදනය**" නම් වේ. මෙලොව දියුණුව පරලොව සුගතිය කෙළවර නිවන බලාපොරොත්තු වන සෑම දෙනාගේ ම එම අර්ථ සිද්ධිය මුදුන් පමුණුවා ගැනීමට සොරකම නම් වූ අකුශලය මහත් බාධාවක් වන හෙයින් එයින් වැළකීම පිණිස "**අදින්නාදනා වෙරමණී සික්ඛාපදං සමාධියාමි**" සිකපදය පනවා වදාළ සේක. එහි අර්ථ විවරණය මෙසේ ය.

"**අදින්නාදනා**" යන මෙහි "**අදින්න**" යන වචනය පාරාජික පාළියෙහි මෙසේ දැක්වේ. "**යං අදින්නං, අනිස්සට්ඨං, අපරිච්චත්තං, රක්ඛිතං, ගොපිතං, මමායිතං, පරපරිග්ගහිතං = එතං අදින්නං නාම**"

එහි වස්තු හිමියාගේ අතින් හෝ අන් තිබූ තැනින් හෝ බැහැර නොකරන ලද දෙය "**අනිස්සට්ඨ**" නම් වේ. හිමිකරුවා විසින් අයිතිය අත් නොහරින ලද දෙය "**අපරිච්චත්ත**" නම් වේ. වැට කඩුලු හෝ මුරකරුවන් යොදා හෝ ආරක්ෂා කරන ලද්ද "**රක්ඛිත**" නම් වේ. මංජූසා ආදියෙහි බහා රකින ලද දෙය "**ගොපිත**" නම් වේ. මෙය මගේ යැයි තණ්හා මමත්වයෙන් අයිතිය ප්‍රකාශ කොට තබා ගන්නා ලද දෙය "**මමායිත**" නම් වේ. වස්තු හිමියා විසින් අයිතිය අත් නොහරින ලද, රක්ෂා කරන ලද, මගේ යැයි තණ්හා මමත්වයෙන් තබා

ගන්නා ලද දෙය "**පරපරිග්ගහිත**" නම් වේ. මෙසේ වස්තු හිමියා විසින් සිතින් අත් නොහරින ලද කයින් හෝ වචනයෙන් අන් හට නොදෙන ලද නො පවරන ලද දෙය "**අදින්න**" නම් වේ.

"**ආදාන**" යනු ඉහත සඳහන් සස්වාමික දෙයක් සොර සිතින් ගැනීමයි. එසේ ගැනීම ද ආකාර විසි පහකින් කළ හැක. එය "**පස් විසි අවහාරය**" නම් වේ. ඒවා **නානා භණ්ඩ පඤ්චකය, ඒකභණ්ඩ පඤ්චකය, සාහත්ථික පඤ්චකය, පුබ්බපයොග පඤ්චකය, ථෙය්‍යාවහාර පඤ්චකය** යනුවෙන් කොටස් පහකට බෙදා ඇත.

## ⌘ පස් විසි අවහාරය

### ✠ නානා භණ්ඩ පඤ්චකය

**ආදියෙය්‍ය, හරෙය්‍ය, අවහරෙය්‍ය, ඉරියාපථං විකොපෙය්‍ය, ඨානාචාවෙය්‍ය** යනුවෙන් ප්‍රයෝග පහකි.

i. අන් සතු වස්තු දේපළ බොරු නඩු කියා අයිති කර ගැනීම **ආදියෙය්‍ය** නම් වේ.

ii. අන් සතු දෙයක් තමා විසින් ගෙන යමින් සිටියදී අතරමඟ දී සොර සිතින් හිසෙහි තබා සිටි දෙය කරට ගැනීම, එක් අතක තිබූ දෙයක් අනික් අතට මාරු කිරීම ආදී ලෙස මුලින් තිබූ තැනින් අන් තැනකට මාරු කිරීම **හරෙය්‍ය** නම් වේ. එයින් සොරකම සිද්ධ වේ.

iii. අන්‍යයන් විශ්වාසයෙන් තමන් ළඟ තැබූවක් පසුව ඉල්ලූ කල්හි "මම නො ගත්තෙමි" යැයි කියා නැවත නො දෙයි. එහෙත් සීලයට හානියක් නැත. වස්තු හිමියා ද එය බලාපොරොත්තුවෙන් සිටන තාක් එය ඔහු සතුය. නැවත තමන්ට එය නො ලැබේ ය යැයි සිතා එය අත්හරී ද, එවිට එය සොර සිත් ඇති තැනැත්තා සතු වීම ද, ඔහුගේ සීලය බිඳීම ද වෙයි. මෙය **අවහරෙය්‍ය** නම් වේ.

iv. යම් වස්තුවක් ගෙන යන්නකු දැක එය ගනු කැමති ව ගෙන යන්නහු

ලවා ම තමන් කැමති තැනට රැගෙන යාමට මාර්ගය වෙනස් කළ කල්හි වස්තු හිමියා ඒ මඟට හැරී දෙවන පියවර ඉක්මවනවාත් සමගම සොර සිත් ඇති තැනැත්තා ගේ සීලය බිඳෙයි. මෙය **ඉරියාපතං විකොපෙය්‍ය** නම් වේ.

v. අන් අය සතු වස්තුවක් තමා විසින් ම සොර සිතින් කෙසගක් පමණ හෝ තිබූ තැනින් එසවූ කල්හි සීලය බිඳෙයි. මෙය **ඨානාචාවෙය්‍ය** නම් වේ.

✠ **ඒකභණ්ඩ පඤ්චකය**

නානා භණ්ඩ පඤ්චකයට අයත් කරුණුවලට සවිඤ්ඤාණක අවිඤ්ඤාණක සියල්ල අයත් ය. ඒකභණ්ඩ පඤ්චකයෙහි දක්වා ඇත්තේ **ආදියෙය්‍ය** ආදී ප්‍රයෝග පසම සවිඤ්ඤාණක (දාස දාසීන්, අලි ඇතුන් ආදී) සත්වයන් පිළිබඳ ව ය.

✠ **සාහත්ථික පඤ්චකය**

මෙහි ද **සාහත්ථික, ආනත්තික, නිස්සග්ගිය, අත්‍ථසාධක, ධුරනික්ඛේප** යනුවෙන් ප්‍රයෝග පසකි.

i. සොර සිත් ඇතිව අන් සතු දෙයක් සියතින් ම ගැනීම **සාහත්ථික** නම් වේ.

ii. අනුන් ලවා සොරකම් කරවීම **ආනත්තික** නම් වේ.

iii. බඩුවලට බදු අය කරන තැන්වල දී රාජ්‍ය නිලධාරීන්ට නොදැනෙන්න පිටතට බඩු විසි කොට බදු නො ගෙවා යාම **නිස්සග්ගිය** නම් වේ.

iv. අසවල් භාණ්ඩය ඉඩ ලැබුණ විටෙක පැහැර ගන්න යැයි අනෙකෙකුට අණ කළ කල්හි වසර ගණනකට පසුව හෝ අණ ලැබූ තැනැත්තා එය පැහැර ගන්නේ නම් අණ කළ තැනැත්තා ගේ සීලය ඒ මොහොතෙහි දීම බිඳෙන්නේ ය. අණ ලැබූ තැනැත්තා ගේ සීලය වස්තුව පැහැර ගත් විටම බිඳෙයි. මෙය **අත්‍ථසාධක** නම්

වේ.

v. වස්තු හිමියා රවටා ගැනීම, පරෙස්සමට මෙන් ලග තැබූ දෙය නො දෙනු පිණිස කල් ගතකිරීම, තමන් විසින් ම ආපසු දීමට කියා ඉල්ලාගෙන නැවත නො දෙනු පිණිස කල් ගතකිරීම, ණය ගෙන නොදී කල් ගතකිරීම ආදියෙන් වස්තු හිමියා ගේ අපේක්‍ෂාව දුරු කොට තමන් සතුකර ගැනීම **ධුරනික්ඛේප** නම් වේ.

✠ **පුබ්බපයොග පඤ්චකය**

**පුබ්බපයොග, සහපයොග, සංවිධාවහාර, සංකෙතකම්ම, නිමිත්තකම්ම** යැයි මෙහි ප්‍රයෝග පසකි.

i. යම් වස්තුවක් සොරකම් කිරීමට අනිකෙකුට නියෝග කළ කල්හි අණ ලැබූ තැනැත්තා නොවරදවාම එය සොරකම් කරන්නේ නම් නියෝග කළ තැනැත්තා ගේ සීලය සොරකමටත් කලින් ම බිඳෙයි. මෙය **පුබ්බපයොග** නම් වේ.

ii. යමක් සියතින් ම සොරකම් කිරීමේ දී ද, ඉඩම් මැනීමාදී අවස්ථාවන්හි දී මායිම් වෙනස් කොට වැට කඩුලු බැඳීමාදියෙහි දී ද එම ක්‍රියාව අවසන් වීමත් සීලය බිඳීමත් එක විට සිදුවන බැවින් **සහපයොග** නම් වේ.

iii. පිරිසක් විසින් සොරකමක් පිණිස සංවිධාන වී ගොස් එයින් එක් අයෙක් හෝ එම වස්තුව සොරකම් කරයි නම් සියල්ලන්ගේ ම සීලය බිඳෙයි මෙය **සංවිධාවහාර** නම් වේ.

iv. අසවල් වෙලාවෙහි දී අසවල් භාණ්ඩය සොරා ගනු ව යැයි යමෙකුට අණ කළ කල්හි අණ ලැබූ තැනැත්තා ඒ කියූ කාලයෙහි දීම ඒ භාණ්ඩය සොරා ගන්නේ ම නම් අණ කළ තැනැත්තා ගේ සීලය ඒ මොහොතේ ම බිඳෙයි. මෙය **සංකෙතකම්ම** නම් වේ.

v. මම මෙසේ සඤ්ඥා කළ විට සොරා ගනු ව යැයි භාණ්ඩය ළඟට කෙනෙකු කලින් යවා එය ගැනීමට සුදුසු කාලයෙහි කියූ ලෙස කළ සඤ්ඥාවෙන් අණ ලැබූ තැනැත්තා භාණ්ඩය සොරා ගනී නම්

දෙදෙනාගේ ම සීලය එක විට බිඳෙයි. මෙය **නිමිත්තකම්ම** නම් වේ.

✠ **ථෙය්‍යාවහාර පඤ්චකය**

**ථෙය්‍යාවහාර, පසය්‍යාවහාර, පරිකප්පාවහාර, පටිච්ඡන්නාවහාර, කුසාවහාර** යැයි මෙහි ප්‍රයෝග පසකි.

i. සොර පඩි, සොර තරාදි, භාජන ආදියෙන් වඤ්චා කොට කිරුම් මිනුම් ආදිය කිරීම, ව්‍යාජ මුදල් ආදියෙන් ගනුදෙනු කිරීම, තත්වයෙන් බාල භාණ්ඩ උසස් තත්වයේ භාණ්ඩ ලෙස විකිණීමාදී කූට උපක්‍රමවලින් අන්‍යයන්ට අලාභ කිරීම **ථෙය්‍යාවහාර** නම් වේ.

ii. අන්‍යයන්ට පහර දී බිය ගන්වා වස්තුව පැහැර ගැනීම **පසය්‍යාවහාර** නම් වේ.

iii. අසවල් දෙය ඇතොත් ගණිමි යැයි යම් තැනකට (රාත්‍රියෙහි) ගොස් අත ගා බලා යමක් ගත් කල්හි අපේක්ෂා කළ දෙයම ගත්තෙහි නම් එකෙනෙහිම සීලය බිඳෙයි. අපේක්ෂා කළ දෙය යැයි රැවටී වෙනත් දෙයක් ගෙන බැහැරට ගොස් පරීක්ෂා කොට බලා කුමක් වුවත් ලැබුණු දෙය හොඳ යැයි ගත්තෙහි නම් එයින් ද සීලය බිඳෙයි. එය අනවශ්‍ය යැයි දමා ගියේ නම් සීලය රැකේ. එම භාණ්ඩය හිමිකරුට නො ලැබී විනාශ වූයේ නම් එහි වටිනාකම ගෙවිය යුතු වෙයි. නැතහොත් සීලය බිඳීම හා පාපය සිදු වෙයි. මෙය **පරිකප්පාවහාර** නම් වේ.

iv. අන්සතු වස්තුවක් දැක එය පසුව ගැනීමේ අදහසින් වැලි, පස්, කොළරොඩු ආදියකින් වසා දමා ගොස් හිමිකරුවන් විසින් සොයා බලා නො දැක ගිය කල්හි ඇවිත් ගත් කෙනෙහි සීලය බිඳෙයි. ඒවා වැල්ලෙහි හෝ කොළරොඩු ආදියෙහි යට කරන ලද්දෙහි නම් එකෙනෙහිම වරදට පැමිණෙයි. මෙය **පටිච්ඡන්නාවහාර** නම් වේ.

v. බඩු කොටස් කර බෙදන විටෙක දී නම් ලියූ කුසපත් ඒ ඒ ගොඩවල් මත දමා ඇති කල්හි අනිකෙකුට හිමි වූ දෙයක් ගනු කැමති ව තමන්ට හිමි කුසපත හෝ බඩු හෝ අන් කෙනෙකුට අයත් ගොඩකින් තබා එහි ඇති කුසපත හෝ බඩු හෝ තමාට අයත්

ගොඩෙහි දැමූ කල්හි සොරකම සිදු වේ. මෙය **කුසාවහාර** නම් වේ.

අන්සතු දේ පිළිබඳ ව අන්සතු බව දැන දැනම සොර සිතින් යුතුව කියන ලද පස් විසි අවහාරයන්ගෙන් යම් අවහාරයකින් ගැනීම **අදින්නාදානා** නම් වේ.

හිමිකරුවෙකු නැති දෙයක් සොර සිතින් ගත් කල්හි ද, හිමිකරුවෙකු ඇති දෙයක් වුව ද සොර සිතින් තොරව හිමියා කෙරෙහි විශ්වාසයෙන් ගැනීමෙන් ද, අන්සතු දෙයක් තමාගේ යන හැඟීමෙන් ගැනීමෙන් ද සොරකම සිදු නොවේ.

"**වෙරමණී**" යන්නෙහි "**වෙරං මණතීති = වෙරමණී**" වෛරය දුරු කරන්නේ නුයි "**වෙරමණී**" නම් වේ. මෙයින් සොරකමෙහි ආදීනව හෙවත් එහි විපාක දැක එයින් වැළකීමේ චේතනාවයි. "**සික්ඛාපදං**" යන මෙහි සොරකම් ආදී වැරදි අතහැරීම, හික්මීම, සංවර වීම "**සික්ඛා**" නම් වේ. සීලය පරිපූර්ණය කිරීම නිවනට මාර්ගය වන බැවින් "**පද**" නම් වේ. මෙසේ නිස්සරණාධ්‍යාශයෙන් යුතුව සොරකමෙන් වැළකී උසස් ගුණ වැඩීම පිණිස සිල් සමාදන් වීම සියලු කුසලයන්ට මූලය වන බැවින්ද, නිර්වාණාධිගමයට උපාය මාර්ගය වන බැවින් ද "**සික්ඛාපද**" නම් වේ.

**ලාභ කීර්ති ප්‍රශංසා ධන ඥාති පරිවාර ශරීරාවයව ජීවිතාදී** කිසිඳු හේතුවක් නිසාවත් නොබිඳ සිල් රැකීමෙන් ද, යම් හේතුවකින් සිල් බිඳුණේ නම් වහාම එය සමාදන් ව ආයති සංවරයෙහි පිහිටීමෙන් ද, "**අඛණ්ඩ, අඡිද්‍ර, අසබල, අකල්මාස, භුජිස්ස, විඤ්ඤුප්පසත්ථ, අපරාමට්ඨ, සමාධිසංවත්තනික**" වශයෙන් ගෞරව සම්ප්‍රයුක්ත ව රැකීම "**සමාදියාමි**" නම් වේ.

අංග සතරක් සම්පූර්ණ වීමෙන් අදත්තාදානය සිදු වේ. ඒවා මෙසේ ය.

1. අන්සතු වස්තුවක් වීමය.
2. අන්සතු වස්තුවක් බව දැනීම.
3. පැහැර ගනු කැමති සිත.

4. පැහැර ගැනීමට උපක්‍රම කිරීම.

## ⌘ අදත්තාදානයෙහි අල්ප සාවද්‍ය මහා සාවද්‍ය භාවය

මනුෂ්‍ය ජාතික සත්වයෙකුට අයත් සස්වාමික දෙයක් වීම, අනුන් අයත් දෙයක් බව දැනීම, සොර සිත, පස් විසි අවහාරයන්ගෙන් යමකින් උපක්‍රම කිරීම, එයින් ගැනීම යන අංග පස සම්පූර්ණ වීමෙන් සොරකම සිද්ධ වේ. මෙම අංග පසෙන් එකක් හෝ අඩු වූයේ නම් සොරකම සිද්ධ නොවේ. තිරිසන් ගත සත්වයන්ට අයත් දෙයක් ගැනීමෙන් ද, ප්‍රේතයන්ට අයත් දෙයක් ගැනීමෙන් ද, අස්වාමික දෙයක් ගැනීමෙන් ද, කෙනෙක් කෙරෙහි විශ්වාසයෙන් ගැනීමෙන් ද, තාවකාලික හැඟීමෙන් ගැනීමෙන් ද, පංශුකූලික චේතනාවෙන් ගැනීමෙන් ද, තමාගේ යන හැඟීමෙන් ගැනීමෙන් ද,ශාරීරික ධාතු කිපීමකින් හෝ අමනුෂ්‍ය ආරූඪයකින් උමතු වූ විටෙක ගැනීමෙන් ද සොරකම සිද්ධ නොවේ.

අඩු වටිනාකමක් ඇති දෙයක් සොරකම් කිරීම අල්ප සාවද්‍ය වේ. වැඩි වටිනාකමක් ඇති දෙයක් සොරකම් කිරීම මහා සාවද්‍ය වේ. ගුණ හීනයන්ගේ දෙයක් ගැනීම අල්ප සාවද්‍ය වේ. ගුණවතුන් සතු දෙයක් ගැනීම මහා සාවද්‍ය වේ. දුස්සීලයෙක් සතු දෙයක් ගැනීම අල්ප සාවද්‍ය වේ. සිල්වතෙකු සතු දෙයක් ගැනීම මහා සාවද්‍ය වේ. තිසරණ පන්සිල් රකින ගිහි පින්වතෙකුට අයත් දෙයක් ගැනීම ඊටත් වඩා මහා සාවද්‍ය වේ. අටසිල් දසසිල් රකින පින්වතෙකුට අයත් දෙයක් ගැනීම ඊටත් වඩා මහා සාවද්‍ය වේ. සාමණේරයන් වහන්සේ නමකට අයත් දෙයක් ගැනීම ඊටත් වඩා මහා සාවද්‍ය වේ. උපසම්පදා භික්ෂුවකට අයත් දෙයක් ගැනීම ඊටත් වඩා අතිශයින් මහා සාවද්‍ය වේ. මෙලෙස සෝවාන් ආදී ආර්‍යයන් වහන්සේලාට අයත් දෙයක් ගැනීම ඊටත් වඩා අතිශයින් මහා සාවද්‍ය වේ. මෙලෙස මෙහි විභාගය දත යුතුය. රත්නත්‍රයට අයත් දේ ගැනීම මේ සියල්ලට ම වඩා බැරෑරුම් වේ.

## ⌘ අදත්තාදන කර්මයෙහි විපාක

අන්සතු දේ සොරකම් කළ අයට මෙලොවදීම නින්ද ලබන්නට සිදු වේ. අත් පා ගල් මුගුරු ආදියෙන් පහර ලැබීමට සිදු වේ. සොරෙක් මංකොල්ල කරුවෙක් යැයි අපකීර්තියට පත් වෙයි. බරපතළ වැඩ සහිත සිර දඬුවම් විඳීමට සිදු වෙයි.

රත්නත්‍රය සතු වූ ද, මව්පිය - ගුරුවර ආදීන් සතු වූ ද, සිල්වතුන්ට-ගුණවතුන්ට අයත් වූද වස්තූන් පැහැර ගත්තවුන් හා විනාශ කළවුන් මරණින් මතු මහා රෞරව නරකයෙහි උපදියි. එහි දී අතිශයින් රුදුරු වූ ගින්නෙන් හා දුමින් ශරීරය ඇතුළත හා පිටත තවනු ලැබීමෙන් ලෝ දිය බොමින් ලෝහ ගුලි ගිලිමින් මහ හඬින් හඬමින් අපමණ දුක් විඳීමට සිදු වෙයි. එහි ආයුෂය මෙසේ ය. මනුෂ්‍ය වර්ෂ අටදහසක් (8000) නිම්මාණරති දෙවු ලොවට එක් දවසකි. එසේ වූ දින තිසක් එක් මාසයකි. එසේ වූ මාස දෙළොසක් එක් වර්ෂයකි. එසේ වූ වර්ෂ අටදහසක් එහි ආයුෂය වේ. එම දිව්‍ය ආයුෂය මනුෂ්‍ය වර්ෂවලින් ගණනය කළවිට වර්ෂ දෙසිය තිස්කෝටි හතළිස් ලක්ෂයක් (230,40,000,00) වේ. මෙම වර්ෂ දෙසිය තිස්කෝටි හතළිස් ලක්ෂය මහා රෞරව නරකයට එක් දවසකි. එසේ වූ දින තිසක් එක් මාසයකි. එසේ වූ මාස දෙළොසක් එක් වර්ෂයකි. එසේ වූ වර්ෂ අටදහසක් එහි ආයුෂය වේ.

ඉන් පසු ප්‍රේත ලෝකයෙහි ඉපිද ස්වල්ප වූද ආහාරයක් පානයක් නැතිව, වස්ත්‍ර නැතිව, වාසස්ථාන නැතිව, කිසිවකුගේ අනුකම්පාවක් පිහිටක් නැතිව, වසර දහස් ගණන් දුක් විඳීමට සිදු වෙයි.

ඉන් පසු තිරිසන් ලොව ඇත්, අස්, ගව ආදී ලෙස දහස් ගණන් වාරවල ඉපිද වස්තු හිමියන්ට මෙහෙ කරමින් දුක් විඳීමට සිදු වෙයි.

අපායෙන් නිදහස්ව මිනිසත් බව ලැබූ කල්හිද ඇට නහර මතු වූ කුණු තැවරුණු ශරීරයෙන් යුතුව උකුණු ආදී සත්වයන්ගෙන් පිරුණු හිස් ඇතිව නොයෙක් රෝග ආබාධ ඇතිව ඉරීගිය කිලිටි වූ වස්ත්‍ර ඇතිව ශෝකයෙන් පීඩිත ව විසීමට සිදු වේ. ගිය තැන ගැරහුම් ලබමින්

අනුන්ගේ ගෙවල්වල බැල මෙහෙවර කරමින් නින්ද ලබමින් තැන තැන සිඟා කමින් විසීමට සිදු වෙයි. ධනය ඉපයීමට කොතෙක් වෙහෙසුනද බලාපොරොත්තු ඉටු නොවෙයි. යන්තමින් හෝ යමක් උපයා ගත්තේ නමුත් ඒවා ගින්නෙන් දැවෙයි. දියේ ගසාගෙන යයි. සොර සතුරන් පැහැර ගනියි. නොකළ වැරදිවලට හසුව වරදකරු වී එම වස්තුව රාජසන්තක වෙයි. උපදවා ගත් ධන ධාන්‍ය වැඩිකලක් නො රැඳී අස්ථාන ගත වෙයි. නිතරම පාහේ නැත නැත යැයි කියමින් තැව තැවී සිටීමට සිදු වෙයි. අදත්තාදනය අප්‍රමාණ දුක් ගෙන දෙන සාපරාධී ක්‍රියාවක් වේ. එබැවින් මෙහි ආදීනව හා විපාකයන්හි බරපතලකම සලකා සොර සිතක්වත් නූපදනා ලෙස සිත සංවර කර ගැනීමට අධිෂ්ඨාන කරගත යුතුය.

## ☸ කාමමිථ්‍යාචාරය

**කාම** යනු මනස ප්‍රිය කරන්නා වූ රූප,ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, සැප ඇතිරිලි, පොරෝනා, දස-දසින්, ඇත්, අස්, ගව, මහිෂ, එළු, බැටළු, කෙත්, වතු, රන්, රිදී, ගම්, නියම්ගම්, රාජධානි ආදී වස්තූන්ට ඇති කැමැත්තය. එය **වස්තු කාම, ක්ලේශ කාම** යනුවෙන් දෙ වැදෑරුම් වේ. එයින් මනසට ප්‍රිය වූ රූප,ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශයන් **වස්තු කාම** නම් වේ. ඒ කාම වස්තූන් කෙරෙහි ඇති කැමැත්ත රාගය ආශාව ගිජු බව **ක්ලේශ කාම** නම් වේ.

**කාමෙසුමිච්ඡාචාරා** යන මෙහි **කාමෙසු** යන්නෙන් මෛථුන ධර්මය අදහස් කරන ලදි. **මිච්ඡාචාරා** ඒකාන්ත නින්දිත වූ ලාමක වූ පහත් හැසිරීමයි. මෙම වචන දෙක එක් වූ කල්හි **කාමෙසුමිච්ඡාචාරා** නම් වේ. එයින් අසද්ධර්ම සේවන අදහසින් මනුෂ්‍ය ගතිය ඉක්මවා සම්බන්ධකම් නො පැවැත්විය යුතු අය සමග සංසර්ගයෙහි යෙදීමේ සිතින් සිදු කරන ලාමක හැසිරීම කියවේ.

මෙහි පුරුෂයන් විසින් ඇලුම් නොකළ යුතු ස්ත්‍රීන් **දස ස්ත්‍රීන්** හා **දස භාර්යාවන්** වශයෙන් විසි දෙනෙක් කියන ලදි.

# ⌘ දස ස්ත්‍රීන්

1. **මාතුරක්ඛිතා** = මව විසින් කොතැනකවත් යාමට නොදී ආරක්ෂා කරන, අන්‍යයන්ට නො පෙනෙන ලෙස සඟවා රකින, ස්ව කැමැත්තට අනුව කටයුතු කිරීමට නොදී පාලනය කරන, මෙය මෙසේ කරව- මෙය මෙසේ නොකරව යැයි තම වසඟයෙහි පවත්වන මව විසින් රකින ස්ත්‍රිය යි.
2. **පිතුරක්ඛිතා** = එලෙස ම පියා විසින් රකින ස්ත්‍රිය යි.
3. **මාතුපිතුරක්ඛිතා** = එලෙස මව්පිය දෙදෙනා විසින් ම රකිනා ස්ත්‍රිය යි.
4. **භාතුරක්ඛිතා** = එලෙස සොහොයුරා විසින් රකින ස්ත්‍රිය යි.
5. **භගිනිරක්ඛිතා** = එලෙස සොහොයුරිය විසින් රකින ස්ත්‍රිය යි.
6. **ඤාතිරක්ඛිතා** = එලෙස ම ඥාතීන් විසින් රකින ස්ත්‍රිය යි.
7. **ගොත්තරක්ඛිතා** = එලෙස තමා උපන් කුල ගෝත්‍ර සම්ප්‍රදය අනුව රැකෙන ස්ත්‍රිය යි.
8. **ධම්මරක්ඛිතා** = පණ්ඩරංග පරිබ්බාජකයන් මෙන් එක් ශාස්තෘ කෙනෙකුන් වෙත පැවිදි වූවන් විසින් හෝ මාලාකාරා දී එක් පිරිසකට අයත් වූවන් විසින් හෝ ආගමික සම්ප්‍රදායන් අනුව රැකෙන ස්ත්‍රිය යි.
9. **සාරක්ඛා** = පුරුෂයෙකු විසින් මැය මගේ යැයි මව්කුසේ වසන කල පටන් වෙන් කරගනු ලැබූ ස්ත්‍රිය හා මැය මගේ යැයි මල් මාලා දැමීමෙන් අයත් කරගනු ලැබූ ස්ත්‍රිය යි. එතැන් පටන් ඇය සස්වාමික ය.
10. **සපරිදණ්ඩා** = රජවරු විසින් මැය ඇසුරු කරන්නාට මෙපමණ දඩ යැයි සෙස්සන්ට තහනම් කරනු ලැබූ ස්ත්‍රිය යි.

## ⌘ දස භාර්‍යාවන්

1. **ධනක්කීතා** = මිලයට ගනු ලැබූ භාර්‍යාව යි.
2. **ඡන්‍දවාසිනී** = සිය කැමැත්තෙන් පුරුෂයෙකු හට භාර්‍යාව වන තැනැත්තිය යි.
3. **භොගවාසිනී** = ගෘහ උපකරණ දී භාර්‍යාව බවට පත්කරගත්පසුව භාර්‍යාව ස්ත්‍රිය යි.
4. **පටවාසිනී** = අඳින පොරෝනා වස්ත්‍ර මාත්‍රයක් ලැබී භාර්‍යාව බවට පත් දිළිඳු ස්ත්‍රිය යි.
5. **ඔදපත්තකිනී** = දිය බඳුනේ අත් බහා ඒකී භාවයට පත් භාර්‍යාව යි.
6. **ඔභතචුම්භටා** = දර දිය ඇදීමට හිසෙහි බැඳි දරණුව ඉවත් කොට භාර්‍යාව බවට පත්කරගත් ස්ත්‍රිය යි.
7. **දාසී ච භරියා** = දාසියක් ව සිට භාර්‍යාව බවට පත්කරගත් ස්ත්‍රිය යි. යි.
8. **කම්මකාරී ච භරියා** = කුලියට වැඩ කරමින් සිට භාර්‍යාව බවට පත් ස්ත්‍රිය යි.
9. **ධජාහටා** = ධජ ඔසවා සේනාවත් සමග ගොස් බලහත්කාරයෙන් පැහැර ගෙනවිත් භාර්‍යාව බවට පත් ස්ත්‍රිය යි.
10. **මුහුත්තිකා** = තාවකාලිකව සංවාසයට ගනු ලැබූ ස්ත්‍රිය යි.

මෙම දස ස්ත්‍රීන් හා දස භාර්‍යාවන් කරා යන පුරුෂයාට කාමමිථ්‍යාචාරය සිද්ධ වේ. එසේම දස ස්ත්‍රීන්ගෙන් සාරක්ඛා සපරිදණ්ඩා යන දෙදෙනාට ද, දස භාර්‍යාවන්ට ද යන දොළොස් දෙනාට පර පුරුෂයන් කරා යාමෙන් කාමමිථ්‍යාචාරය සිද්ධ වේ. එසේම අස්වාමික ස්ත්‍රීන් වෙත යන පුරුෂයන්ට කාමමිථ්‍යාචාරය වේ. එහෙත් එම ස්ත්‍රියට කාමමිථ්‍යාචාරය නොවේ.

අංග සතරක් සම්පූර්ණ වීමෙන් කාමමිථ්‍යාචාරය සිද්ධ වේ. එනම්:-

1. සේවනය නොකළ යුතු ස්ත්‍රියක් වීම.
2. සේවන සිත ඇතිවීම.
3. සේවනයට උත්සාහ කිරීම.
4. ආස්වාද සිතින් එය ඉවසීම යන සතරයි.

අනුන් විසින් බලහත්කාරයෙන් සිදු කරවන විටක වුව ද එය ඉවසුවේ නම් වරදට හසු වේ. නො ඉවසුවේ නම් වරදට හසු නොවේ. මෙය ප්‍රාණඝාතාදිය මෙන් අනුන් ලවා නොකළ හැකිය. තම කායික ස්පර්ශයෙන් ආස්වාදය විඳින්නාට ම සිද්ධ වේ.

## ⌘ කාමමිථ්‍යාචාරයෙහි අල්ප සාවද්‍ය මහා සාවද්‍ය භාවය

සීලාදී ගුණ විරහිත ස්ත්‍රී පුරුෂයන් ගේ කාමමිථ්‍යාචාරය අල්ප සාවද්‍ය වේ. එහි ද බලහත්කාරයෙන් යෙදීමෙන් මහා සාවද්‍ය වේ. සීල ගුණ සම්පන්නයන් කෙරෙහි වරදවා පිළිපැදීමෙන් මහා සාවද්‍ය වේ. දෙදෙනාගේ ම කැමැත්ත ඇති කල්හි අල්ප සාවද්‍ය වේ. එසේම ක්ලේශයන් ගේ හා උපක්‍රමයන්ගේ බලය අඩු වීමෙන් අල්ප සාවද්‍ය වේ. අධික වීමෙන් මහා සාවද්‍ය වේ.

## ⌘ කාමමිථ්‍යාචාරයෙහි විපාක

කාමමිථ්‍යාචාරයෙහි යෙදෙන්නවුන් කෙලෙස් පිපාසය සන්සිඳවාගත නොහැකි කාම ආතුරයන් බවට පත් වේ. එය බලවත් වීමෙන් මව් පිය, දූ දරු, ගුරු ශිෂ්‍ය බාල මහලු ආදී වැටහීමක් තැනක් නොතැනක් නො වැටහෙයි. ඔවුහු මෙලොව දී ම නින්දවට ගර්හාවට හස්ත පාද දඬු මුගුරු ප්‍රහාරයන්ට ලක් වෙයි. සිරේ විලංගුවේ වැටීමට සිදු වෙයි. මරණින් මතු නරකයෙහි ඉපිද අපමණ දුක් විඳීමට සිදු වෙයි.

විශේෂයෙන් කාමමිථ්‍යාචාරයෙහි යෙදුනවුන් කටු ඉඹුල් වන නරකයෙහි උපදිති. එහි යොදුන් හැටක් පමණ දිග පළල වූ යොදුන් ගණන් උස් වූ සොළොස් අඟල් පමණ දික් වූ තියුණු කටු ඇති කටු ඉඹුල් ගස්වලින් පිරුණු වනයකි. කාමමිථ්‍යාචාරයෙහි යෙදුණු ස්ත්‍රී පුරුෂයන් එහි උපන් විට යමපල්ලන් විසින් දික් වූ තියුණු කටු ඇති දඬුවලින් පහර දී ලේ ගලන ශරීරයන්ගෙන් යුක්ත ව කටු ඉඹුල් ගස්වල නංවති. ඔවුන් ගසේ නඟින විට ඒ කටු පහළට හැරෙයි. අධික ලෙස දරාගත නොහැකි දුකින් පීඩිත වූ ඒ ස්ත්‍රී පුරුෂ වූ නිරිසතුන් ගසේ උඩට නැඟ කෑ ගසති. බිම සිටින නිරි සතුන්ට ඒ හඬ මිහිරි හඬින් කියන ගීත මෙන් ඇසෙයි. එයින් මුසපත් ව රාගයෙන් දැවෙමින් ගස උඩ සිටින ස්ත්‍රී පුරුෂයන් සොයා කටු ඇමිණෙමින් එම ගස්වල නගියි. එවිට උඩ සිටින සත්වයින් ගසේ අනෙක් පසින් බසියි. එවිට එම කටු උඩු අතට හැරෙයි. එම කටු ඇමිණී කය විනිවිද යෑමෙන් අපමණ දුකට පත් වෙයි. මෙලෙස අනේක කෝටි වර්ෂ ශත සහස්‍රයක් විපාක අවසන් වන තුරු දුක් විඳියි.

එහි ආයුෂය ගෙවී ගිය පසු ප්‍රේත ව ඉපිද ඉතා විශාල අණ්ඩ කෝෂ ඇතිව දුකසේ ඒවා කර පිට තබා එහා මෙහා ඇවිදිමින් වසර දහස් ගණන් දුක් විඳීමට සිදු වේ. ඉන් පසු තිරිසන් ව ඉපිද ආත්ම දහස් ග නන් වාරවල දී බීජෝත්පාටනාදී දුක්වලට පත් වේ. මෙසේ මහත් වූ විපාක අපාගත ව විඳ අවසන් ව එහි ශේෂ විපාක වශයෙන් ආත්ම දහස් ගණන් වාර නපුංසක ව උපදී. ආත්ම දහස් ගණන් වාර ස්ත්‍රී පුරුෂ නිමිති හරිහැටි නො පිහිටමින් පණ්ඩකව උපදී. ආත්ම දහස් ගණන් වාර ස්ත්‍රී පුරුෂ නිමිති දෙකම ඇතිව උභතෝ බ්‍යඤ්ජනකව උපදී. පුරුෂයන් ස්ත්‍රී ව උපදී. ස්ත්‍රීන්ට ස්ත්‍රීභාවයෙන් නො මිදෙයි. විරූපී ශරීර ඇත්තන් වේ. බොහෝ සතුරන් ඇත්තෝ වේ. ලිංගාශ්‍රිත හා අනේක විධ රෝගීහු වෙති.

# ☸ මුසාවාදය

**මුසාඃ**- යනු, සිදු නොවූ අසත්‍ය වූ දෙයයි. **වාදඃ**- යනු, එසේ සිදු නොවූ අසත්‍ය වූ දෙය සිදු වූ සත්‍ය වූ දෙයක් වශයෙන් හැඟවීමයි. **මුසාවාදඃ**- යනු අනුන් රවටන අදහස ඇතිව කීමට ප්‍රථමයෙන් ද, කියන කල්හි ද මුසාවක් කියන්නෙමි යැයි දැන දැනම සිදු වේ. අට ආකාරයකින් මුසාවාදය සිදු වේ. ඒවා මෙසේ ය.

**අදිට්ඨං දිට්ඨං මෙති :**- දුටු දෙය නුදුටුවෙමි යැයි ද, **දිට්ඨං අදිට්ඨං මෙති:**- නුදුටු දෙය දුටුවෙමි යැයි ද, **අස්සුතං සුතං මෙති :**- නො ඇසූ දෙය ඇසුවෙමි යැයි ද, **සුතං අස්සුතං මෙති :**- ඇසූ දෙය නො ඇසුවෙමි යැයි ද, **අමුතං මුතං මෙති :**- ගඳ සුවඳ විඳිදෙය නො වින්දෙමි යැයි ද, රසවිඳි දෙය නො වින්දෙමි යැයි ද, කයෙන් විඳි ස්පර්ශ විඳිදෙය නොවින්දෙමි යැයි ද, **මුතං අමුතං මෙති :**- නො විඳිදෙය වින්දෙමි යැයි ද, නො විඳි රස වින්දෙමි යැයි ද, නො විඳි ස්පර්ශ වින්දෙමි යැයි ද, **අවිඤ්ඤාතං විඤ්ඤාතං මෙති :**- සිදු නොවූ දෙය සිදු වූයේ යැයි ද, **විඤ්ඤාතං අවිඤ්ඤාතං මෙති :**- සිදු වූ දෙය සිදු නොවූයේ යැයි ද මෙසේ අසත්‍ය දෙය සත්‍ය දෙයක් ලෙස ද, සත්‍ය දෙය අසත්‍ය දෙයක් ලෙස ද කීමෙන් හෝ ලිවීමෙන් හෝ හස්ත විකාරාදියකින් හෝ හැඟවීම යි. අංග සතරක් සම්පූර්ණ වීමෙන් මුසාවාදය සිදු වේ. එනම්:-

1. කියන කරුණ මුසාවක් වීම,
2. අනුන් රවටන අදහස,
3. වචනයෙන් හෝ ලිවීමෙන් හෝ හස්ත විකාරාදියකින් උත්සාහ කිරීම,
4. අසන තැනැත්තා එය පිළිගැනීම ය.

කියන දෙය බොරුවක් වුව ද, නො දන්න භාෂාවකින් කීමෙන් ද, කලබල වීමකින් හෝ නො සිතා යමක් කියන විටෙක දී මුසාවක් කියවුණු කල්හි ද එයින් මුසාවාද කර්මය සිදු නොවේ. යමක් කී කල්හි අසන්නා එය තේරුම් නො ගැනීමෙන් ද මුසාවාද සිදු නොවේ. ඉටු

කිරීමේ අදහසින් යමක් කිරීමට පොරොන්දු වී එය කිරීමට නොහැකි වීමෙන් ද මුසාවාදය සිදු නොවේ. සිදු නොකරන අදහසින් ම බාර ගත්තහුට එකෙනෙහි ම මුසාවාදය සිදු වේ. ඒ දෙය පසුව කරන ලද්දේ නමුත් වරදින් නො මිදෙයි. එසේම අනුන් ලවා බොරු කියවීමේ දී කියන කියවන දෙදෙනා ම බොරු කීමේ චේතනාව ඇත හොත් දෙදෙනාට ම පාපය සිද්ධ වේ. වෙළදම් කිරීමාදියෙහි දී අසත්‍ය දේවල් දැන්වීම් පල කිරීමාදී ක්‍රමවලින් ඉදිරිපත් කිරීමෙන් ඒවා පවතිනා තාක් කියවා බලා රැවටෙන අයගේ ගණනින් ඒවා කළවුන්ට මුසාවාදය අකුසල කර්ම රැස් වේ.

## ⌘ මුසාවාදයෙහි අල්ප සාවද්‍ය මහා සාවද්‍ය භාවය.

තමා සතුව දීමට තරම් දෙයක් නැති විට නොදෙන අදහසින් බොරු කීම අල්ප සාවද්‍ය වේ. දීමට ප්‍රණීත දෙයක් ඇති විට නොදෙන අදහසින් බොරු කීම මහා සාවද්‍ය වේ. එසේම සත ගණනක් වැනි කුඩා දෙයක් වෙනුවෙන් බොරු කීම අල්ප සාවද්‍ය වේ. සැලකිය යුතු වටිනාකමක් ඇති දෙයක් වෙනුවෙන් බොරු කීම මහා සාවද්‍ය වේ. අගය කළ නොහැකි මහත් වටිනාකම් ඇති දේ වෙනුවෙන් බොරු කීම අතිශයින් ම මහා සාවද්‍ය වේ. අවම වූ සීලයෙන් ගුණයෙන් යුක්ත වූවන් බොරු කියා රැවටීම අල්ප සාවද්‍ය වේ. තිසරණ ගත උපාසකයා ගේ පටන් සීලයෙන් ගුණයෙන් උසස් වූවන් බොරු කියා රැවටීම මහා සාවද්‍ය වේ. ක්‍රීඩා පිණිස අනුන් රවටන අදහසින් කරන කියන දේ වලින් අල්ප සාවද්‍ය කර්ම රැස් වේ. අන්‍යයන් රැවටීමට කරන ප්‍රයෝගයන්හි දී සිතෙහි කෙලෙසුන් අඩුව යෙදුණු කල්හි කර්මය අල්ප සාවද්‍ය වේ. වැඩියෙන් යෙදීම අනුව එහි මහා සාවද්‍ය භාවය වැඩි වේ.

## ⌘ මුසාවාදයෙහි විපාක

බොරු කියන්නා මෙලොවදීම නින්දවට අපහාසයට පිළිකුලට ලක් වේ. අන්‍යයන්ගෙන් පහර කෑමට ද රාජ දණ්ඩනාදී දඬුවම් විඳීමට ද සිදු වේ. තම මව්පිය ගුරුවර ඥාත්‍යාදීන්ගේ ද අන්‍යයන්ගේ ද අවිශ්වාසයට ලක් වන්නෙක් වේ.

මරණින් මතු අවීචි මහ නරකයෙහි ඉපිද අප්‍රමාණ කාලයක් අනේක විධ දුක් විඳීමට සිදු වේ. එහි ඇති අධික තේජසින් යුත් ගින්නෙන් අතරක් නෑර පිලිස්සෙයි. යමපල්ල විසින් ගිනි ගෙන දිලිසෙන අවි ආයුධ උල් ආදියෙන් අනිමින් කපමින් කොටමින් ඉරමින් අතරක් නෑර අප්‍රමාණ දුක් දෙති. නලයක අබ පිරෙව්වා සේ අබ රේණුවක් තරම් දෙයක් බිමට නො වැටෙන ලෙස සත්වයන්ගෙන් පිරී පවතී. එහෙත් එක් සත්වයෙකුට දුක් විඳින තව සතෙක් නො පෙණෙයි. මෙහි උපන් සත්වයන් අනේක කෝටි වර්ෂ ශත සහස්‍රයක් පැසෙති. බොහෝ කලකට පසු නරකයෙහි නැගෙනහිර දිසාවේ දොරටුව විවෘතව වෙයි. එය දුටු නිරි සතුන් ඒ විඳින දුකෙන් ගැලවෙනු කැමති ව එහි දුවත්. ඒ යන අතර දී යමපල්ල විසින් ගිනි ගෙන දිලිසෙන අවි ආයුධ උල් ආදියෙන් අනිමින් කපමින් කොටමින් ඉරමින් අප්‍රමාණ දුක් දෙති. දොරටුව වෙත ළඟා වෙනවිට අපගේ වර්ෂ දහසක කාලයක් ගත වෙයි. ළංවත් ම දොර වැසෙයි. තවත් බොහෝ කලකට පසු දකුණු දෙස,... බටහිර දෙස,... උතුරු දෙස දොරටුව විවෘත වෙයි. එය දුටු නිරි සතුන් ඒ විඳින දුකෙන් ගැලවෙනු කැමති ව එහි දුවත්. ඒ යන අතර දී යමපල්ල විසින් ගිනි ගෙන දිලිසෙන අවි ආයුධ උල් ආදියෙන් අනිමින් කපමින් කොටමින් ඉරමින් අප්‍රමාණ දුක් දෙති. දොරටුව වෙත ළඟා වෙනවිට අපගේ වර්ෂ දහසක කාලයක් ගත වෙයි. ළංවත් ම දොර වැසෙයි. මෙසේ රැවටෙමින් බොහෝ කල් දුක් විඳිති. මෙපමණ කල් දුක්ම විඳි නමුත් බඩගිනි පිපාසා නිවා ගැනීමට බත් ඇටයක් තරම් අහරක් වත් දිය බිඳක් තරම් වත් පානයක් ලැබී නැත. මෙසේ බඩගිනි පිපාසා දුකින් යුක්ත ව රුදුරු වූ අප්‍රමාණ දුක් විඳින නිරිසතුන් වෙත යමපල්ල පැමිණ නුඹට අවශ්‍ය මොනවා දැයි අසයි. නිරිසතා "ස්වාමීනි, මට බඩගිනියි. අහරක් ලැබෙන්නේ නම් හොඳයි කියයි." එවිට යමපල්ලන් ගිනි ගෙන දිලිසෙන ලෝහ ගුලි රැගෙන එයි. තමන්ට ලෝහ

ගුලි ගිල්ලවන්නට සූදනම් වන බව දන නිරිසතා කට පියා දත්වලින් තද කරගනී. කට අරින්නට කී විට නො අරියි. එවිට යමපල්ලන් නිරිසතා දැඩිව අල්ලාගෙන අඬු ආදියෙන් බලෙන් කට විවර කොට ලෝහගුලි ගිල්ලවයි. එයින් නිරිසතු ගේ කටත් ද ගෙන උගුරත් ද ගෙන පපුවත් ද ගෙන බඩවැල් ආදී සියල්ල ද ගෙන ගොස් අදෝ මාර්ගයෙන් පිටව යයි. මෙසේ තවත් බොහෝ කලකට පසු යමපල්ල නුඹට අවශ්‍ය මොනවා දැයි අසයි. එවිට නිරිසතු "ස්වාමීනි මට පිපාසයි. බීමට පානයක් ලැබෙයි නම් හොඳය යැයි කියයි." එවිට යමපල්ලන් ගිනි ගෙන දිලිසෙන ලෝදිය රැගෙන එයි. තමන්ට ලෝදිය පොවන්නට සූදනම් වන බව දන නිරිසතා කට පියා දත්වලින් තද කරගනී. කට අරින්නට කී විට නො අරියි. එවිට යමපල්ලන් නිරිසතා දැඩිව අල්ලාගෙන අඬු ආදියෙන් බලෙන් කට විවර කොට ලෝදිය පොවයි. එයින් නිරිසතු ගේ කටත් ද ගෙන උගුරත් ද ගෙන පපුවත් ද ගෙන බඩවැල් ආදී සියල්ල ද ගෙන ගොස් අදෝ මාර්ගයෙන් පිටව යයි." මෙලෙස මුසාවාදය හේතුවෙන් නරකයෙහි වැටී අප්‍රමාණ දුක් විඳීමට සිදු වේ.

ඉන් පසු ප්‍රේත ව ඉපිද අනේක වර්ෂ ශත සහස්‍රයෙහි අප්‍රමාණ දුක් විඳීමට සිදු වේ. එයින් ච්‍යුතව තිරිසන් ව ඉපිද අප්‍රමාණ කාලයක් දුක් විඳීමට සිදු වේ.

මෙසේ මහත් වූ විපාක වාර අපාගත ව විඳ එයින් ච්‍යුතව මිනිසත් බව ලැබූ කල්හි එම අකුසලයන්ගේ ශේෂ විපාක වශයෙන් සිය දහස් ගණන් ජාතිවල දී නොකළ වැරදිවලට හසුව නින්ද අපහාසයන්ට ලක් වේ. දඬුවම් විඳීමට සිදු වේ. අනුවණයන් වේ. දුප්පතුන් වේ. ගොත ගසමින් කථා කරන්නන් වේ. ගොළුවන් වේ. කට ගඳ ගසන්නන් වේ. අශෝභන දත් ඇත්තන් වේ. මුඛ රෝග, දත් රෝග ඇත්තන් වේ. කල් නො පවත්නා දත් ඇත්තන් වේ. විරූප වූ ශරීර වර්ණය ඇත්තන් වේ. නිවෙසක හෝ ගමක හෝ රැකියා ආයතනයක හෝ රටක හෝ නායකත්වයට පත්වූයෙ නමුත් අන්‍යයන් ඔහුගේ කීම නො අසයි. ඔහු අබිබවා යති. දරුවන් නො ලබන්නන් වේ. උපදින්නේ නම් ගැහැනු දරුවන් උපදිති. ඔවුහු ද අකීකරු දරුවෝ වෙති.

# ☸ සුරා පානය

**සුරාඃ-** යනු, පිටි ආදියෙන් සාද පෙරා ගන්නා ලද මද්‍ය වර්‍ගයෝය. ඒවා **පිට්ඨසුරා, පූවසුරා, ඕදනීයසුරා, කිණ්ණපක්ඛිත්තසුරා, සම්භාරසංයුත්තසුරා** යැයි වර්‍ග පසක් වෙති.

පිටි භාජනයක දමා ප්‍රමාණවත් ලෙස ජලය වත් කොට කලතා පසුව පෙරා ගන්නා ලද්ද **පිට්ඨසුරා** නම් වේ. **පූව** යනු කැවුම් ආදී කැවිලි වර්‍ගයන්ට නමකි. එබඳු කැවිලි වර්‍ග භාජනයක දමා ප්‍රමාණවත් ලෙස ජලය වත් කොට කලතා පසුව පෙරා ගන්නා ලද්ද **පූවසුරා** නම් වේ. **ඕදන** යනු බත් ය. බත් හා ධාන්‍ය වර්‍ගවලින් පෙර සේම පෙරා ගන්නා ලද්ද **ඕදනීයසුරා** නම් වේ. සුරා බීජ හෙවත් මණ්ඩි බහා පෙරා ගන්නා ලද්ද **කිණ්ණපක්ඛිත්තසුරා** නම් වේ. මයිල මල්, අබ ආදී නොයෙක් දේ මිශ්‍ර කොට කලතා පැසුණු පසු පෙරා ගන්නා ලද්ද **සම්භාරසංයුත්තසුරා** නම් වේ.

පල් කරන ලද දෙයින් සකසන ලද ආශ්‍රව වර්‍ග **මේරය** නම් වේ. එය **පුප්ඵාසව, ඵලාසව, මධ්වාසව, ගුලාසව, සම්භාරසංයුත්ත** යැයි පඤ්ච විධ වේ. මී තෙල් පොල් මල් ආදී මල් වර්‍ගවල යුෂ ගෙන කිහිප දවසක් පල් කොට එයින් ගත් සාරය **පුප්ඵාසව** නම් වේ. වැළ වරකා ආදී පළ වර්‍ගවල යුෂ පල් කොට එයින් ගත් සාරය **ඵලාසව** නම් වේ. මිදි යුෂ ආදිය ගෙන පල් කොට එයින් ගන්නා ලද්ද හා මී පැණි ආදියෙන් කරන ලද්ද **මධ්වාසව** නම් වේ. උක් පැණිවලින් හා හකුරු ආදියෙන් කරන ලද්ද **ගුලාසව** නම් වේ. අරළු බුලු නෙල්ලි කුළුබඩු ආදී බොහෝ දෑ මිශ්‍ර ව ගෙන දියෙහි කලතා පල් කොට එයින් ගත් සාරය **සම්භාරසංයුත්ත** නම් වේ. මෙම ආශ්‍රව නාමයට අයත් වර්‍ග පැසෙනු පිණිස සැළියෙහි බහාලූ තැන් පටන් පානය කිරීම සුරා පානයට අයත් වේ.

මේ කියන ලද සුරා හා මේරය යන දෙකම පානය කළවුන් මත් කරවන බැවින් **මජ්ජ** නම් වේ. තවද වර්‍තමානයෙහි ඇති අරක්කු වර්‍ග, දුම්වැටි වශයෙන් පානය කරන කංස වැනි දෑ ද මත් වීමට හේතුවන ආහාර වර්‍ග ද **මජ්ජ** සංඛ්‍යාවෙන් ගැනෙයි. ආස්වාදයක් විඳීමේ

චේතනාවෙන් පානය කරන බැවින් කුසල සිත පිරිහී ගොස් අකුසල් සිත බලවත් ව සසරෙහි පමා කරවන බැවින් **පමාදට්ඨානා** නම් වේ. මෙසේ මදයට හා ප්‍රමාදයට හේතුවන දෙයින් වැළකීම **වෙරමණී** නම් වේ.

සුරාව හා මේරය ස්වල්පයක් පානය කිරීම අල්ප සාවද්‍ය වේ. වැඩියෙන් පානය කිරීම මහා සාවද්‍ය වේ. කාය බලය ලැබීමට මහත් කොට පානය කොට ගම් පැහැරීම් ආදිය කරන්නාට අතිශයින් බලවත් වූ මහා සාවද්‍ය කර්‍ම රැස් වේ.

## ⌘ සුරා පානයෙහි ආදීනව

සුරා පානය වනාහි මෙලොව පරලොව නසන්නා වූ මහත් අනර්‍ථකර ක්‍රියාවකි. සුරාවෙන් මත් වූ විට උන්මත්තකයන් මෙන් වෙයි. ස්වකීය සිත කය පාලනය කර ගැනීමට නොහැකි වෙයි. මව්පියන් වැඩිහිටියන් නො හඳුනන පිරිස් ඉදිරියෙහි නො හොබිනා ලෙස හැසිරෙන හිරි ඔත්තප්ප ගුණ නැත්තෙක් වේ.

බුදුරජාණන් වහන්සේ වැඩ සිටි දවස කොසැඹෑ නුවර සාගත නම් පඤ්ච අභිඥා ලාභී කීර්තිමත් තෙරුන් වහන්සේ නමක් සිටියේ ය. ඒ කාල පරිච්ඡේදයෙහි අම්බතිත්ත නම් ජටිලයා ගේ අසපුවෙහි ඍද්ධිමත් දරුණු නාගයෙක් සිටියේ ය. තෙරුන් වහන්සේ වැඩ එම නාගයා තම ඍද්ධි බලයෙන් දමනය කළේ ය. එයින් සතුටු වූ මිනිස්සු තෙරුන් වහන්සේට මඟ දිගට ම රැඳී සිට කාපොතිකා නම් සුරාවක් පූජා කළහ. ඒ වන විට සුරාව පිළිබඳ සිකපද පනවා නො තිබුණු බැවින්ද පානය කිරීමෙන් වන හානි නොදත් බැවින්ද තෙරණුවෝ මිනිසුන් කෙරෙහි මෛත්‍රියෙන් ඒවා පානය කළේ ය. එයින් මත් වී ටික දුරක් ගොස් නගර ද්වාරයෙහි වැටුණේ ය. භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් පිරිවරා වඩින විට මත්ව වැටී සිටි තෙරුන් දැක භික්ෂූන් අමතා සාගත තෙරුන් ඔසවා ගෙන එන ලෙස වදාළහ. භික්ෂූහු තෙරුන් ඔසවා ගෙන විත් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි භාග්‍යවතුන් වහන්සේ දෙසට හිස සිටින සේ බිම තැබූහ. තෙරණුවෝ සිහි විකල් ව කැරකී

භාග්‍යවතුන් වහන්සේ දෙසට පා සිටින සේ සිටියේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා "මහණෙනි, මේ සාගත භික්ෂුව තථාගතයන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් යහපත් පැවැත්මෙන් සිටියෙහි ද?"යි අසා වදාළ සේක. "එසේ ය ස්වාමීනි" යැයි භික්ෂූහු පිළිවදන් දුන්හ. "දැනුත් සාගත තෙරුන් එසේම ද?" යැයි අසා වදාළ සේක. "නැත ස්වාමීනි" යැයි භික්ෂූහු පිළිවදන් දුන්හ. "මහණෙනි මේ සාගත තෙරුන් අම්බතිත්ථයෙහි නාගයත් සමග සංග්‍රාමයක් කොට පැමිණියේ නොවේ ද?" යැයි අසා වදාළ සේක. "එසේය ස්වාමීනි" භික්ෂූහු පිළිවදන් දුන්හ. "සාගත තෙරුන්ට දැනුත් එසේ කළ හැකි ද?"යි අසා වදාළ සේක. "නොහැකිය ස්වාමීනි" භික්ෂූහු පිළිවදන් දුන්හ. මහණෙනි මෙය නොගැළපෙන දෙයකි යැයි එහි ආදීනව දක්වා භික්ෂූන්ට සුරා පානයෙන් වැළකීමට සිකපදයක් පනවා වදාළ සේක.

සුරාවට පුරුදු වූවන් ඒ වෙනුවෙන් ධනය විනාශ කරයි. අඹු දරුවන්ට පහර දෙයි. දුටු දුටුවන් සමග කලහ කරයි. භාණ්ඩ උපකරණ විනාශ කරයි. මහා ධනවතුන් ව සිට දිළින්දන් බවට පත් වේ. ඉන් පසු සොරුන්, මං කොල්ලකරුවන්, ගෙවල් බිඳින්නන් බවට පත් වේ. ඒවාට වරදකරුවන් වී දඬුවමට ලක් වේ. සිර ගෙවල්වල දුකසේ විසීමට සිදු වේ. නොයෙක් රෝග ව්‍යසනයන්ට ගොදුරු වී අකාලයෙහි මිය යාමට සිදු වේ. විකෘති සිතින් මියගොස් නරකයෙහි උපදිති. එහි අනේක වර්ෂ කෝටි ශත සහස්‍රයක් පැසී ඉන් ච්‍යුතව ප්‍රේත ව උපදිති. එහි ද බොහෝ කලක් දුක් විඳ එයින් ච්‍යුතව තිරිසන් ව උපදිති. එහි දී ද බොහෝ කලක් දුක් විඳ මනුලොව උපදින විට මන්ද බුද්ධිකයන්ව උපදිති. උමතු බවට ද පත් වේ. නොයෙක් ජාතිවල විරූප වූ ශරීර ඇත්තන් වේ.

**"කිත්තාවතා පන, භන්තෙ, උපාසකො අත්තහිතාය පටිපන්නො හොති, නො පරහිතායාති?"**

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, කොපමණකින් උපාසකයා අන්‍යයාගේ හිත වැඩ පිණිස නොව තමාගේ හිත වැඩ පිණිස පිළිපන්නේ වෙයි ද?

**"යතො බො, ජීවක, උපාසකො අත්තනාව සද්ධාසම්පන්නො හොති, නො පරං සද්ධාසම්පදාය සමාදපෙති...පෙ.... අත්තනාව අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති, නො පරං ධම්මානුධම්මපටිපත්තියා සමාදපෙති. එත්තාවතා බො, ජීවක, උපාසකො අත්තහිතාය පටිපන්නො හොති, නො පරහිතායාති".**

ජීවකය, යම් දිනක පටන් උපාසකයා තමා පමණක් ශ්‍රද්ධා සම්පත්තියෙන් යුක්ත වූයේ වෙයි ද, අන්‍යයා ශ්‍රද්ධා සම්පත්තියෙහි නො යොදවයි ද, තමා පමණක් ශීල සම්පත්තියෙන් යුක්ත වූයේ වෙයි ද, අන්‍යයා ශීල සම්පත්තියෙහි නො යොදවයි ද, තමා පමණක් ත්‍යාග සම්පත්තියෙන් යුක්ත වූයේ වෙයි ද, අන්‍යයා ත්‍යාග සම්පත්තියෙහි නො යොදවයි ද, තමා පමණක් භික්ෂූන් දැකීමට කැමති වෙයි ද, අන්‍යයා භික්ෂූන් දැකීමෙහි නො යොදවයි ද, තමා පමණක් සද්ධර්මය ඇසීමට කැමති වෙයි ද, අන්‍යයා සද්ධර්මය ඇසීමෙහි නො යොදවයි ද, තමා පමණක් ඇසූ ධර්මයන් ධාරණය කර ගැනීමට කැමති වෙයි ද, අන්‍යයා ධර්මය දරා ගැනීමෙහි නො යොදවයි ද, තමා පමණක් දරා ගත් ධර්මයන්ගේ අර්ථ මෙනෙහි කරන්නේ (පරීක්ෂා කරන්නේ) වෙයි ද, අන්‍යයන් ධර්මයෙහි අර්ථ පරීක්ෂණයෙහි නො යොදවයි ද, තමා පමණක් ධර්මයෙහි අර්ථ දැන, ධර්මය දැන, ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි පිළිපන්නේ වෙයි ද, අන්‍යයා ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි නො යොදවයි ද, ජීවකය, මෙපමණකින් උපාසකයා පර වැඩ පිණිස නොව තමා හිත වැඩ පිණිස පිළිපන්නේ වෙයි.

**"කිත්තාවතා පන, භන්තෙ, උපාසකො අත්තහිතාය ච පටිපන්නො හොති පරහිතාය චාති?"**

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, කොපමණකින් වනාහි උපාසකයා තමහට වැඩ පිණිස පිළිපන්නෙකු වෙයි ද, පර වැඩ පිණිස පිළිපන්නෙකු වෙයි ද,

**"යතො බො, ජීවක, උපාසකො අත්තනා ච සද්ධාසම්පන්නො හොති, පරඤ්ච සද්ධාසම්පදාය සමාදපෙති, අත්තනා ච සීලසම්පන්නො හොති, පරඤ්ච සීලසම්පදාය සමාදපෙති, අත්තනා ච චාගසම්පන්නො**

**හොති, පරඤ්ච චාගසම්පදාය සමාදපෙති, අත්තනා ච භික්ඛූනං දස්සනකාමො හොති, පරඤ්ච භික්ඛූනං දස්සනෙ සමාදපෙති, අත්තනා ච සද්ධම්මං සොතුකාමො හොති, පරඤ්ච සද්ධම්මස්සවනෙ සමාදපෙති, අත්තනා ච සුතානං ධම්මානං ධාරණජාතිකො හොති, පරඤ්ච ධම්මධාරණාය සමාදපෙති, අත්තනා ච සුතානං ධම්මානං අත්ථූපපරික්ඛිතා හොති, පරඤ්ච අත්ථූපපරික්ඛාය සමාදපෙති, අත්තනා ච අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති, පරඤ්ච ධම්මානුධම්මපටිපත්තියා සමාදපෙති. එත්තාවතා ඛො, ජීවක, උපාසකො අත්තහිතාය ච පටිපන්නො හොති පරහිතාය චාති."**

ජීවකය, යම් දිනක පටන් තෙමේ ශ්‍රද්ධා සම්පත්තියෙන් යුක්ත වූයේ වෙයි ද, අන්‍යයන් ශ්‍රද්ධා සම්පත්තියෙහි යොදවයි ද, තෙමේ ශීල සම්පත්තියෙන් යුක්ත වූයේ වෙයි ද, අන්‍යයන් ශීල සම්පත්තියෙහි යොදවයි ද, තෙමේ ත්‍යාග සම්පත්තියෙන් යුක්ත වූයේ වෙයි ද, අන්‍යයන් ත්‍යාග සම්පත්තියෙහි යොදවයි ද, තෙමේ භික්ෂූන් දැකීමෙහි යෙදුණේ වෙයි ද, අන්‍යයන් භික්ෂූන් දැකීමෙහි යොදවයි ද, තෙමේ බණ ඇසීමෙහි යෙදුණේ වෙයි ද, අන්‍යයන් බණ ඇසීමෙහි යොදවයි ද, තෙමේ ඇසූ බණ සිත තබා ගැනීමෙහි යෙදුණේ වෙයි ද, අන්‍යයන් ඇසූ බණ සිත තබා ගැනීමෙහි යොදවයි ද, තෙමේ සිත තබා ගත් ධර්මයෙහි අර්ථ පරීක්ෂා කිරීමෙහි යෙදුණේ වෙයි ද, අන්‍යයන් සිත තබා ගත් ධර්මයෙහි අර්ථ පරීක්ෂා කිරීම පිණිස යොදවයි ද, තෙමේ අර්ථය දැන, ධර්මය දැන, ධර්මානුධර්ම ප්‍රතිපදාවෙහි (බණට අනුව පිළිපැදීමෙහි) යෙදුණේ වෙයි ද, අන්‍යයන් බණට අනුව පිළිපැදීමෙහි යොදවයි ද, ජීවකය, මෙපමණකින් උපාසකයා තමහට වැඩ පිණිස ද, පර වැඩ පිණිස ද පිළිපන්නෙකු වෙයි.

# ☸ පන්සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස

සිල් රැකීමේ ආනිශංස බොහෝ ය. සීලානිශංස එලෙස ම ලැබීමට නම් මනාකොට සිල් රැකිය යුතු වේ. උසස් ලෙස පන්සිල් රැකීමෙන් ලැබෙන ආනිශංස අනූ දෙකක් ඛුද්දකපාඨ හා ඉතිවුත්තක අට්ඨකථාවන්හි දක්වේ. ඒවා මෙසේ ය.

## ⌘ සත්ව ඝාතනයෙන් වැළකීමෙන් ලැබෙන ආනිශංස

1. ආරෝහ පරිණාහ සම්පත්තියෙන් යුක්ත වේ.
2. ජව සම්පත්තියෙන් යුක්ත වේ.
3. මනාව පොළොවෙහි පිහිටන සම වූ පතුල් ඇත්තෙකු වේ.
4. රන්වන් පාට සිරුරක් ඇත්තෙකු වේ.
5. මෘදු මොලොක් සිරුරක් ඇත්තෙකු වේ.
6. නිර්මල පිරිසිදු පැවතුම් ඇත්තෙකු වේ.
7. සූර වීර ගති ඇත්තෙකු වේ.
8. මහා බලවතෙකු වේ.
9. නො පැකිළ කිව හැකි වචන ඇත්තෙකු වේ.
10. ලෝ සතුන්ට ප්‍රිය මනාප පුද්ගලයකු වේ.
11. අන්‍යයන්ගේ දෝෂ දර්ශනයට ලක් නොවන කටයුතු ඇත්තෙකු වේ.
12. අන්‍යයන්ට කේලාම් කියා බිඳවිය නො හැකි පරිවාර සම්පත්තියක් ලැබීම.
13. බිය තැති ගැනීම් නැත්තෙකු වේ.
14. පරෝපක්‍රම වලින් විනාශ නොකළ හැකි කෙනෙකු වේ.
15. පරෝපක්‍රමයන්ගෙන් අකල් මරණයට පත් නොවන බව.
16. බොහෝ පිරිවර ඇත්තෙකු වේ.
17. සුරූපී පුද්ගලයෙකු වේ.
18. මනා සටහන් (හැඩහුරුකම) ඇත්තෙකු වේ.
19. අල්ප ආබාධ ඇත්තෙකු වේ.

20. ශෝක නොකරන්නෙකු වේ.
21. ප්‍රියයන්ගෙන් වෙන් නොවන්නෙකු වේ.
22. දීඝීායුෂ ලබන්නෙකු වේ.
23. මනාව පිහිටි අඟපසඟ ඇති බව. මේ ආදී තවත් බොහෝ ආනිශංස ලැබෙන බව කියා ඇත.

## ⌘ සොරකමෙන් වැළකීමෙන් ලැබෙන ආනිශංස

1. මහා ධනවතෙකු වේ.
2. බොහෝ ධන ධාන්‍ය ලබන්නෙකු වේ.
3. අනන්ත භෝග සම්පත් ඇත්තෙකු වේ.
4. නූපන් වස්තුව ඉපදවීමට පුණ්‍ය ශක්තිය ඇත්තෙකු වේ.
5. ඇත්තා වූ භෝග රැක ගැනීමේ වාසනාව ඇති බව.
6. කැමති වස්තූන් වහා ලබන්නෙකු වන බව.
7. ගිනි ජල ආදියෙන් විනාශ නොවන රජ සොර ආදීන්ට සාධාරණ නොවූ විනාශ කළ නො හැකි වස්තුව ඇති බව.
8. අන්‍යයන්ට නො ලැබිය හැකි ධන සම්පත් ලැබීමේ වාසනා ඇත්තෙකු බව.
9. ලෝකයෙහි උත්තම පුද්ගලයකු වන බව.
10. නැත යන වචනය අසන්නටවත් නො ලැබෙන්නකු වන බව.
11. සැප විහරණ ඇත්තෙකු වන බව ආදී තව බොහෝ ආනිශංස ලැබෙන්නේ ය.

## ⌘ කාමමිථ්‍යාචාරයෙන් වැළකීමෙන් ලැබෙන ආනිශංස

1. සතුරන් නැත්තෙකු වේ.
2. සියලු ජනයාට ම ප්‍රියයෙකු වේ.
3. ආහාර පාන ඇඳුම් පැලඳුම් ඉඳුම් හිටුම් ආදිය සුවසේ ලබන්නෙකු වේ.

4. සැප සේ නිදන්නෙකු වේ.
5. සැප සේ පිබිදෙන්නෙකු වේ.
6. අපා භය නැත්තෙකු වේ.
7. ස්ත්‍රීභාවයක් ලැබූ කලෙකවත් පණ්ඩක, නපුංසක, උභතෝ බ්‍යංජනක ආදී අභව්‍යත්වයකට පත් නොවන්නෙකු වේ.
8. ක්‍රෝධ අඩු පුද්ගලයෙකු වේ.
9. සෑම දෙයක් ම පරීක්ෂා කොට බලා කරන්නෙකු වේ.
10. උසස් වූ කායික, වාචසික, මානසික කටයුතු ඇත්තෙකු වේ.
11. සැක බිය නිසා බිම බලා නො සිටින්නෙකු වේ.
12. ඔවුනොවුන්ට ප්‍රිය වූ අඹුසැමියන් ලබන්නෙකු වේ.
13. පිරිපුන් ඉඳුරන් ඇත්තෙකු වේ.
14. පිරිපුන් දේහ ලක්ෂණ ඇත්තෙකු වේ.
15. සැක ශාංකා නැත්තෙකු වේ.
16. වෙහෙස නොවී ධනය ලබන්නෙකු වේ.
17. සුව සේ වෙසෙන්නෙකු වේ.
18. කිසි තැනකින් බිය නොවන්නෙකු වේ.
19. ප්‍රියයන්ගෙන් වෙන් නොවන්නෙකු වේ. තව ද බොහෝ ආනිශංස ලැබෙන්නේ ය.

## ⌘ මුසාවාදයෙන් වැළකීමෙන් ලැබෙන ආනිශංස

1. අතිශයින් ප්‍රසන්න ඉඳුරන් ඇත්තෙකු වේ.
2. මිහිරි කටහඬ ඇත්තෙකු වේ.
3. සමානව පිහිටි සුදු වන් දත් දෙපලක් ලබන්නෙකු වේ.
4. අශෝභන වූ මහත් ශරීර නො ලබන්නෙකු වේ.
5. අශෝභන වූ කෙට්ටු ශරීර නො ලබන්නෙකු වේ.
6. අශෝභන වූ උස ශරීර නො ලබන්නෙකු වේ.
7. අශෝභන වූ මිටි ශරීර නො ලබන්නෙකු වේ.
8. සැප දයක වූ (රූප, ශබ්ද, ගන්ධ, රස, සුව පහසුව ඇති ඇඳ පුටු

ආදිය) ස්පර්ශයන් ලබන්නෙකු වේ.

9. දුගඳ නැති මානෙල් මල් සුවඳ විහිදෙන මුඛයක් ලබන්නෙකු වේ.
10. සුවච කීකරු පිරිවර ඇත්තෙකු වේ.
11. විශ්වාස කළ යුතු වචන ඇත්තෙකු වේ.
12. නෙළුම් පෙත්තක් බඳු වූ රතු වන් මෘදු දිවක් ලබන්නෙකු වේ.
13. උඩඟු නොවන්නෙකු වේ.
14. චපල වචන හා ක්‍රියා නැත්තෙකු වේ ආදී තව බොහෝ ආනිශංස ලැබෙන්නේ ය.

## ⌘ සුරා පානයෙන් වැළකීමෙන් ලැබෙන ආනිශංස

1. අතීත අනාගත වර්තමාන යන තුන් කාලය පිළිබඳ වහා වැටහීම ඇති නුවණින් සියලු කටයුතු කළ හැකි වේ.
2. සැම කල්හි සිහිය පිහිටුවා ගෙන කටයුතු කළ හැකි වේ.
3. උමතු නොවී ඉපදෙන්නෙකු වේ.
4. ඥානවන්තයෙකු වේ.
5. අලස නො වන්නෙකු වේ.
6. ජඩ හෙවත් නො හික්මුණු ගති නැත්තෙකු වේ.
7. කෙළතොලුවෙකු නොවේ.
8. තරුණ මඳ ආදියෙන් මත් නොවන්නෙකු වේ.
9. අප්‍රමාදී ව කටයුතු කරන්නෙකු වේ.
10. මෝහයෙන් මුලා නොවන්නෙකු වේ.
11. තැති ගැනීම් නැත්තෙකු වේ.
12. එකට එක නොකරන්නෙකු වේ.
13. ඊර්ෂ්‍යා නොකරන්නෙකු වේ.
14. සත්‍යවාදියෙකු වේ.
15. කේලාම් හිස් වචන පරුෂ වචන කථා නොකරන්නෙකු වේ.
16. දිවා රෑ අලස නොවී කටයුතු කරන්නෙකු වේ.
17. කළ ගුණ දන්නෙකු වේ.

18. කළ උපකාරයන්ට ප්‍රත්‍යුපකාර කරන්නෙකු වේ.
19. මසුරු මල නැත්තෙකු වේ.
20. ත්‍යාගවන්තයෙකු වේ.
21. මහා සිල්වතෙකු වේ.
22. ඍජු වූ ගති පැවතුම් ඇත්තෙකු වේ.
23. ක්‍රෝධ නොකරන සත්පුරුෂයෙකු වේ.
24. පවු කිරීමට ලැජ්ජාශීලී වූ ගුණවතෙකු වේ.
25. පවු කිරීමට බිය ඇත්තෙකු වේ.
26. ඍජු අදහස් ඇත්තෙකු වේ.
27. මහා ප්‍රඥාවන්තයෙකු වේ.
28. මහා චිත්ත බලයක් ඇත්තෙකු වේ.
29. දශීනික අදහස් ඇත්තෙකු වේ.
30. අථානථ වැටහෙන හසළ බුද්ධිමතෙකු වේ. මේ ආදී තව බොහෝ ආනිශංස ලබන්නේ ය.

තව ද අංගුත්තර නිකාය අට්ඨක නිපාතයේ අභිසන්ද සූත්‍රයෙහි රත්නත්‍රය සරණ ගත ව පන්සිල් රැකීමෙන් සැප ගෙන දෙන ධම් අටක් බව දක්වේ. එය මෙසේ ය.

මහණෙනි, පින් ගලා එන, කුසල් ගලා එන, සැප ගෙන දෙන, ස්වගීයෙහි ඉපදීම පිණිස පවතින, ස්වගී සැප පිණිස පවතින, කැමති දේ ලබා දෙන, ප්‍රිය දේ ලබා දෙන, මනාප දෙය ලාබ දෙන, යහපත පිණිස, සැපය පිණිස හිත පිණිස පවතින ධම් අටකි.

බුදු රජාණන් වහන්සේ සරණ යාම, ධම්ය සරණ යාම, සංඝයා සරණ යාම, ප්‍රාණඝාතයෙන් වැළකීම, සොරකමෙන් වැළකීම, කාමමිථ්‍යාචාරයෙන් වැළකීම, බොරු කීමෙන් වැළකීම, සුරා පානයෙන් වැළකීම යන අටයි. මෙසේ පන්සිල් රැකීම අතීත අනාගත වතීමාන යන කාලත්‍රයෙහි ම බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලා විසින් ද, සිල්වතුන් ගුණවතුන් නැණවතුන් විසින් බැහැර නොකරන ලද ගහීා නොකරන ලද්දකි. එසේම පන්සිල් රැකීම මහා දන පසක් දීමකි.

ආර්‍ය්‍ය ශ්‍රාවකයා ප්‍රාණඝාතයෙන් වැළකුණේ වේ. මෙසේ ප්‍රාණඝාතයෙන් වැළකීම අප්‍රමාණ සත්වයන්ට ජීවිත දානය දෙයි. අවෛරය දෙයි. නිදුක් බව දෙයි. ඔහු අප්‍රමාණ සත්වයන්ට අභය දී, අවෛරය දී, නිදුක් බව දී ඒ හේතුවෙන් අප්‍රමාණ අභයට, අවෛරයට, නිදුක් බවට හිමිකරුවෙක් වෙයි. සොරකමෙන් වැළකුණේ වේ. පෙ... කාමමිථ්‍යාචාරයෙන් වැළකුණේ වේ. පෙ... බොරු කීමෙන් වැළකුණේ වේ. පෙ... සුරා පානයෙන් වැළකුණේ වේ. මෙසේ සුරා පානයෙන් වැළකීම අප්‍රමාණ සත්වයන්ට ජීවිත දානය දෙයි. අවෛරය දෙයි. නිදුක් බව දෙයි. ඔහු අප්‍රමාණ සත්වයන්ට අභය දී, අවෛරය දී, නිදුක් බව දී ඒ හේතුවෙන් අප්‍රමාණ අභයට, අවෛරයට, නිදුක් බවට හිමිකරුවෙක් වෙයි.

තව ද සිල් රැකීමෙහි අනුසස් ථෙරගාථා පාලියේ සීලව ථෙරගාථාවන්හි මෙසේ කියවෙයි.

මේ ලෝකයෙහි අභිවෘද්ධිය කැමති තැනැත්තා චාරිත්‍ර වාරිත්‍ර සීලයම රක්නේ ය. රක්නා ලද සීලය ඔහුට සකල සම්පත්තියම ගෙන දෙන්නේ ය. ප්‍රශංසාව, සතුට, දෙව්ලොව සතුටු වීම යන කරුණු තුන ප්‍රාර්ථනා කරන්නා සීලය රක්නේ ය. සීලයෙන් හික්මුණු තැනැත්තා බොහෝ මිත්‍රයන් ලබන්නේ ය. දුස්සීලයා ගේ පවුකම් නිසා මිත්‍රයන් ඔහුගෙන් ඈත් වන්නේ ය. දුසිල්වතා ඉදිරියෙහි ගර්හාව අපකීර්තිය ඇතිවෙයි. සිල්වතා ඉදිරියෙහි කීර්තිය ප්‍රශංසාව ගුණ වර්ණනාව සැම කල්හි ඇතිවෙයි. සීලය සියලු කුසලයන්ට මුල ය. ධ්‍යානා දී උත්තරි මනුෂ්‍ය ධර්මයන් ලැබීමට ඇති පිහිට ය. සීලය සමථ විදර්ශනා වැඩීමට පිහිටවන මව ය. සියලු යහපතෙහි මුල ය. සීල සංවරය දුසිරිත් සංඛ්‍යාත ජලස්කන්ධය නවත්වන වෙරළ ය. සතුටු වීමට සීලය හැර අන් දෙයක් නැත. සියලු බුදුරජාණන් වහන්සේලා නිර්වාණය නමැති සයුරට බසින තොට ය. සීලය මාර සේනාව මර්දනය කරන අසදෘශ බල සේනාව ය. කෙලෙසුන් සිඳින උතුම් ආයුධය ය. පලඳින ආභරණයන්ගෙන් උසස්ම ආභරණය ය. කෙලෙස් යුද්ධය පිණිස අද්භූත වූ සන්නාහකය ය. සීලය සසර සයුරෙන් එතර වීමට ඇති මහානුභාව සම්පන්න ඒ දණ්ඩ ය. පහල වායු තලයේ පමණක් විහිදෙන මල් සඳුන් ආදියෙහි සුවඳ අබිබවා දෙව්ලොව බඹලොව දක්වා විහිදෙන එකම සුවඳ ය. ඇඟ ගල්වන සුවඳ

අතර සීලය හා සම විලවුනක් නැත. සීලය සංසාර කාන්තාරයෙහි ගමන් කරන්නාට ගෙන යා හැකි පිළුණු නොවන නොනැසෙන ආහාරයකි. උවමනා දේ ලබා දෙන සොර සතුරන්ට පැහැර ගත නොහැකි උසස් මාර්ගෝපකරණයකි. කිසි අනතුරකට ලක් නොවන කැමති දිසාවකට යා හැකි උතුම් යානයකි. සීලයෙහි නො පිහිටි අඥනයා මෙලොව ද නින්ද ලබා මරණින් මතු අපාගත ව කනගාටු වේ. සැම තැන දුකින් වසයි. සිල් රක්නා වූ නුවණැත්තා මෙලොව ද කීර්තියට පත්ව මරණින් මතු ස්වර්ගයෙහි ඉපිද සතුටු වේ. සැම තැන්හිම සතුට ලබන්නේ ය. නොයෙක් ලෞකික සැප ද නිවන ද ලබා දෙන සීලය ද නුවණ ද උතුම් ය. සීලයත් නුවණත් ඇති නම් සියලු තැන ජය ලැබිය හැක. එබැවින් මනා ගෞරවයෙන් සිල් රැකීමෙන් ම සීල පාරමිතාව සම්පූර්ණ වන බව දැන සිල් පිරිය යුතු ය.

# ❄ අපරිහානිය ධර්ම

## ☸ සාරන්දද අපරිහානිය සූත්‍රය

එවං මෙ සුතං. එකං සමයං භගවා වෙසාලියං විහරති සාරන්දදෙ චෙතියෙ. අථ ඛො සම්බහුලා ලිච්ඡවී යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො තෙ ලිච්ඡවී භගවා එතදවොච. ''සත්ත වො, ලිච්ඡවී, අපරිහානියෙ ධම්මෙ දෙසෙස්සාමි. තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමී''ති. ''එවං, භන්තෙ''ති ඛො තෙ ලිච්ඡවී භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච.

කතමෙ ච, ලිච්ඡවී, සත්ත අපරිහානියා ධම්මා?

1. යාවකීවඤ්ච ලිච්ඡවී, වජ්ජී අභිණ්හං සන්නිපාතා භවිස්සන්ති සන්නිපාතබහුලා, වුඩ්ඪියෙව, ලිච්ඡවී, වජ්ජීනං පාටිකඞ්ඛා, නො පරිහානි.

2. යාවකීවඤ්ච ලිච්ඡවී, වජ්ජී සමග්ගා සන්නිපතිස්සන්ති, සමග්ගා වුට්ඨහිස්සන්ති, සමග්ගා වජ්ජිකරණීයානි කරිස්සන්ති, වුඩ්ඪියෙව, ලිච්ඡවී, වජ්ජීනං පාටිකඞ්ඛා, නො පරිහානි.

3. යාවකීවඤ්ච ලිච්ඡවී, වජ්ජී අපඤ්ඤත්තං න පඤ්ඤපෙස්සන්ති, පඤ්ඤත්තං න සමුච්ඡින්දිස්සන්ති, යථාපඤ්ඤත්තෙ පොරාණෙ වජ්ජිධම්මෙ සමාදාය වත්තිස්සන්ති, වුඩ්ඪියෙව, ලිච්ඡවී, වජ්ජීනං පාටිකඞ්ඛා, නො පරිහානි.

4. යාවකීවඤ්ච ලිච්ඡවී, වජ්ජී යෙ තෙ වජ්ජීනං වජ්ජිමහල්ලකා තෙ සක්කරිස්සන්ති ගරුං කරිස්සන්ති මානෙස්සන්ති පූජෙස්සන්ති, තෙසඤ්ච සොතබ්බං මඤ්ඤිස්සන්ති, වුඩ්ඪියෙව, ලිච්ඡවී, වජ්ජීනං පාටිකඞ්ඛා, නො පරිහානි.

5. **යාවකීවඤ්ච ලිච්ඡවී, වජ්ජී යා තා කුලිත්ථියො කුලකුමාරියො තා න ඔක්කස්ස පසය්හ වාසෙස්සන්ති, වුද්ධියෙව, ලිච්ඡවී, වජ්ජීනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

6. **යාවකීවඤ්ච ලිච්ඡවී, වජ්ජී යානි තානි වජ්ජීනං වජ්ජිචෙතියානි අබ්භන්තරානි චෙව බාහිරානි ච තානි සක්කරිස්සන්ති ගරුං කරිස්සන්ති මානෙස්සන්ති පූජෙස්සන්ති, තෙසඤ්ච දින්නපුබ්බං කතපුබ්බං ධම්මිකං බලිං නො පරිහාපෙස්සන්ති, වුද්ධියෙව, ලිච්ඡවී, වජ්ජීනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

7. **යාවකීවඤ්ච ලිච්ඡවී, වජ්ජීනං අරහන්තෙසු ධම්මිකා රක්ඛාවරණගුත්ති සුසංවිහිතා භවිස්සති 'කින්ති අනාගතා ච අරහන්තො විජිතං ආගච්ඡෙය්‍යුං, ආගතා ච අරහන්තො විජිතෙ ඵාසුං විහරෙය්‍යුන්ති, වුද්ධියෙව, ලිච්ඡවී, වජ්ජීනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

**යාවකීවඤ්ච ලිච්ඡවී, ඉමෙ සත්ත අපරිහානියා ධම්මා වජ්ජීසු ඨස්සන්ති ඉමෙසු ච සත්තසු අපරිහානියෙසු ධම්මෙසු වජ්ජී සන්දිස්සන්ති, වුද්ධියෙව, ලිච්ඡවී, වජ්ජීනං පාටිකඞ්ඛා, නො පරිහානී''ති.**

මහණෙනි, මා විසින් මෙසේ අසන ලදි. එක් සමයක භාග්‍යවතුන් වහන්සේ විශාලා නුවර සමීපයෙහි වූ සාරන්දද නම් චෛත්‍ය ස්ථානයෙහි වැඩවාසය කරණ සේක. එකල්හි වනාහි බොහෝ ලිච්ඡවිවරු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියහ. එසේ පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක සිටියහ. එසේ සිටියා වූ ඒ ලිච්ඡවිවරුන්ට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

තොපට සප්ත අපරිහානිය ධර්‍මයන් දේශනා කරන්නෙමි. එය අසව්. මනාකොට සිහි කරව්. දේශනා කරන්නෙමි.'' යි (වදාළ සේක.) ''එසේ ය, ස්වාමීනි,'' යි ඒ ලිච්ඡවිවරු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. ''ලිච්ඡවීනි, සප්ත අපරිහානිය ධර්‍මයෝ කවරහු ද?

1. ලිච්ඡවීනි, යම්තාක් වජ්ජීහු නිතර නිතර රැස්වෙත් ද, රැස්වීම් බහුල කොට ඇත්තෝ ද, ලිච්ඡවීනි, වජ්ජීන්ගේ අභිවෘද්ධියම බලාපොරොත්තු විය යුතුයි. පිරිහීමක් නොවේ.

2. ලිච්ඡවීනි, යම්තාක් වජ්ජීහු සමගිව රැස්වෙත් ද, සමගිව නැගිටිත් ද, සමගිව වජ්ජීන් විසින් කටයුතු දේ කෙරෙත් ද ලිච්ඡවීනි, වජ්ජීන්ගේ අභිවෘද්ධියම බලාපොරොත්තු විය යුතුයි. පිරිහීමක් නොවේ.

3. ලිච්ඡවීනි, වජ්ජීහු යම්තාක් නොපැණවූවක් නොපණවත් ද, පැනවූ දේ නොසිඳිත් ද, යම් සේ පණවන ලද පුරාණ වජ්ජි ධර්මයන් සමාදන් ව වෙසෙත් ද, ලිච්ඡවීනි, වජ්ජීන්ගේ අභිවෘද්ධියම බලාපොරොත්තු විය යුතුයි. පිරිහීමක් නොවේ.

4. ලිච්ඡවීනි, වජ්ජීහු යම්තාක් ලිච්ඡවීන්ගේ යම් ඒ මහල්ලෝ ඇත් ද, ඔවුන්ට සත්කාර කෙරෙත් ද, ගරුකාර කෙරෙත් ද, බහුමාන කෙරෙත්ද, පුදත ද, ඔවුන්ගේ ද ඇසිය යුත්තක් ඇතැයි සිතත් ද, ලිච්ඡවීනි, වජ්ජීන්ගේ අභිවෘද්ධියම බලාපොරොත්තු විය යුතුයි. පිරිහීමක් නොවේ.

5. ලිච්ඡවීනි, වජ්ජීහු යම්තාක් යම් ඒ කුලස්ත්‍රීහු කුලකුමාරීහු ඇත්ද, ඔවුන් හිංසා කොට බලහත්කාරයෙන් ගෙන වාසය නොකරවත් ද ලිච්ඡවීනි, වජ්ජීන්ගේ අභිවෘද්ධියම බලාපොරොත්තු විය යුතුයි. පිරිහීමක් නොවේ.

6. යම්තාක් ලිච්ඡවීනි, වජ්ජීහු ඔවුන්ගේ යම් ඒ අභ්‍යන්තර වූද, බාහිර වූද, වජ්ජි චෛත්‍යයෝ ඇත් ද, ඒවාට සත්කාර කෙරෙත් ද, ගරුකාර කෙරෙත් ද, බහුමාන කෙරෙත් ද, පුදත් ද, ඒවාට පෙර දුන්, පෙර කළ, පුද නොපිරිහෙළත් ද, ලිච්ඡවීනි, වජ්ජීන්ගේ අභිවෘද්ධියම බලාපොරොත්තු විය යුතුයි. පිරිහීමක් නොවේ.

7. යම්තාක් ලිච්ඡවීනි, වජ්ජීන්ගේ රහතුන් වහන්සේලා කෙරෙහි කවර හෙයකින් නො පැමිණි රහත්හු විජිතයට පැමිණියාහු ද, පැමිණි රහත්හු විජිතයෙහි පහසුවෙන් වාසය කරන්නාහුදැයි ධාර්මික

ආරක්ෂාව මනාකොට පිහිටුවන ලද්දේ වේද, ලිච්ඡවීනි, වජ්ජීන්ගේ අභිවෘද්ධියම බලාපොරොත්තු විය යුතුයි. පිරිහීමක් නොවේ.

යම් හෙයකින් ලිච්ඡවීනි, මේ සප්ත අපරිහානිය ධර්‍මයෝ වජ්ජීන් කෙරෙහි සිටිත් ද, මේ සප්ත අපරිහානිය ධර්‍මයන්හි වජ්ජීන් යෙදෙනු පෙණෙත් ද, ලිච්ඡවීනි, වජ්ජීන්ගේ අභිවෘද්ධියම බලාපොරොත්තු විය යුතුයි. පිරිහීමක් නොවේ.

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ගිජ්ජකූට නම් පර්වතයෙහි වැඩ සිටි සේක. එහි පර්‍වත පාදයෙන් බොහෝ සුවඳ බඩු මතු වෙයි. එය අසා අජාසත් රජතුමාගේ පිරිස අද යම් හෙට යම් යැයි කියමින් සූදනම් වෙද්දී ලිච්ඡවි රජවරු සමගිව සතුටු ව ගොස් සියල්ල ගනිති. අජාසත් රජතුමා පසුව අවුත් ඒ පුවත දැනගෙන කිපී යයි. ලිච්ඡවි රජවරු ද නැවතත් වර්‍ෂයක්ම එසේ කළහ. එයින් අතිශයින් ම කිපීමට පත් එකල්හි මගධ දේශයෙහි අධිපති අජාසත් රජතුමා වජ්ජි රට ලිච්ඡවි රජුන් යටත් කර ගැනීම පිණිස යනු කැමැත්තේ වේ. ඒ අජාසත් රජතෙමේ "**මම වූ කලි සමගිය හේතුවෙන් මහත් රාජ සෘද්ධියෙන් සමන්විත වූ, හස්ති ශිල්පාදියෙන් මනාකොට ශික්‍ෂණය ලැබීමෙන් මහත් ආනුභාව ඇති වජ්ජි රජුන් මුලින් සිඳලන්නෙමි, වජ්ජීන් වනසන්නෙමි, අභාවයට පමුණුවන්නෙමි**" යැයි මෙසේ යානාවන්හි හිඳීම් ආදියෙහි යුද්ධ කථාවම කියයි. ගමනට සූදනම් වවු යැයි බලකායට අණ කළේ ය. කුමක් හෙයින් ද යත්? ගංගා නම් ගඟ ආශ්‍රිත එක් පටුන් ගමකට අයත් අඩ යොදුනක ප්‍රමාණය අජාසත් රජතුමාගේ අණසක ය. අඩ යොදුනක් ලිච්ඡවි රජවරුන්ගේ අණසක ය.

ඉක්බිති අජාසත් රජතුමා මෙසේ සිතී ය. කණ්ඩායමක් සමග යුද්ධ කිරීම අපහසු ය. එක ද හිස් ප්‍රහාරයක් නොවන්නේ ය. පණ්ඩිතයෙකු සමග සාකච්ඡා කොට ම කරන්නේ නම් එය නිෂ්ඵල නොවන්නේ ය. ශාස්තෲන් වහන්සේ හා සමාන පණ්ඩිතයෙකු ලොව තවත් නැත, ශාස්තෲන් වහන්සේ ද නුදුරු විහාරයෙහි වැඩ සිටිති. මම දැන් කෙනෙකු යවා විමසන්නෙමි. ඉදින් මගේ ගමනින් අර්‍ථයක් වන්නේ නම් ශාස්තෲන් වහන්සේ නිහඬ වන සේක. එහි යාමෙන් අනර්‍ථයක් වන්නේ නම් රජුගේ එහි යාමෙන් කවර ප්‍රයෝජනයක් ද යැයි අසන

සේක. මෙසේ සිතා මගධ රට මහාමාත්‍ය වූ වස්සකාර බ්‍රාහ්මණයා අමතා මෙසේ කීයේ ය. "බ්‍රාහ්මණය, මෙහි එනු, භාග්‍යවතුන් වහන්සේ වෙත යව, ගොස් මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් හිසින් වඳුව. වැඳ, භාග්‍යවතුන් වහන්සේගේ නිරොගි බව ද, නිදුක් බව ද, සැහැල්ලු පැවතුම් ඇති බව ද, ශරීර බලය ද, පහසු විහරණය ද විචාරව. නැවත ද, "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මගධාධිපති වූ අජාසත් රජතුමා භාග්‍යවතුන් වහන්සේගේ සිරිපා හිසින් වඳී. භාග්‍යවතුන් වහන්සේගේ නිරොගි බව ද, නිදුක් බව ද, සැහැල්ලු පැවතුම් ඇති බව ද, ශරීර බලය ද, පහසු විහරණය ද, විචාරායයි" දන්වව. තවද මෙසේ කියව. "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මගධාධිපති අජාසත් රජතෙමේ වජ්ජී රට රජුන් මර්ධනය කිරීමට යනු කැමැත්තේ වේ. ඒ අජාසත් රජතුමා "මම වූ කලී මේ සා මහත් රාජර්ධියෙන් සමන්විත මේ සා මහත් ආනුභාව ඇති වජ්ජී රජුන් මුලින් සිඳලන්නෙමි, වජ්ජීන් වනසන්නෙමි, අභභවයට පමුණුවන්නෙමි" යැයි මෙසේ කියයි.

භාග්‍යවතුන් වහන්සේ තොපට යම් පරිද්දෙකින් වදරන සේක් ද, එය මනාකොට ඉගෙන මට කියව. තථාගතයන්වහන්සේලා අවැඩට හිත වූ හිස් වචනයක් නොවදරන්නහුය" යැයි කීයේය.

"එසේ ය පින්වතාණනි! යැයි මගධ මහාමාත්‍ය වස්සකාර බ්‍රාහ්මණයා අජාසත් රජහට පිළිවදන් දී යහපත් යානාවන් යොදවා යහපත් යානාවකට නැඟී රජගහ නුවරින් පිටත්ව ගොස් ගිජ්ජකූට පර්වතය යම් තැනක ද එතැනට ගියේය. යානාවෙන් යා යුතු භූමිය දක්වා යානාවෙන් ගොස් යානාවෙන් බැස, එතැන් සිට පයින් ම භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටින තැනට පැමිණියේ ය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ සමඟ සතුටු වූයේ ය. සතුටු විය යුතු වූ ද සිහි කටයුතු වූ ද කථාව නිමවා එකත්පසෙක හුන්නේ ය. එකත් පසෙක හුන්නා වූ මගධ මහාමාත්‍ය වූ වස්සකාර බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය දැනුම් දුන්නේ ය.

"පින්වත් ගෞතමයන් වහන්ස, මගධ රට රජ වූ අජාසත් රජ තෙමේ පින්වත් ගෞතමයන් වහන්සේගේ පාදයන් හිසින් වඳී. වැඳ භාග්‍යවතුන් වහන්සේ දුක් නැතිව නිරොගිව, සැහැල්ලු පැවතුම් ඇතිව,

ශරීර බල ඇතිව, සැප පහසු ඇතිව, වෙසේ දැයි" අසයි. "භවත් ගෞතමයන් වහන්ස, අජාසත් රජ තෙම වජ්ජි රට රජුන් යටත් කර ගන්නට යනු කැමැත්තේ වේ. ඒ රජ තෙමේ "මම වූ කලි මේ සා මහත් රාජර්ධියෙන් සමන්විත මේ සා මහත් ආනුභාව ඇති වජ්ජී රජුන් මුලින් සිඳලන්නෙමි, වජ්ජීන් වනසන්නෙමි, අභාවයට පමුණුවන්නෙමි" යැයි මෙසේ කියයි, යැයි කීවේ ය.

එ වේලෙහි ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට වතාවත් ලෙස පවන් සලමින් භාග්‍යවතුන් වහන්සේගේ පිටුපස සිටියේ ය, භාග්‍යවතුන් වහන්සේට සීතලක් හෝ උෂ්ණුසුමක් නැත. එවිට භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ අමතා මෙසේ අසා වදාළ සේක.

## ❄ රාජ සප්ත අපරිහානිය ධර්ම

1. ආනන්දය, වජ්ජි රජහු නිතර රැස්වන්නාහුය, රැස්වීම් බහුලව ඇත්තාහුය යන මේ කාරණය නුඹ විසින් අසන ලදද" යැයි ඇසූ සේක. එවිට ආනන්ද තෙරණුවෝ "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, වජ්ජි රජහු නිතර රැස්වීම් ඇත්තාහු ය. රැස්වීම් බහුලව ඇත්තාහු ය යන මේ කාරණය මා විසින් අසන ලදි යැයි පිළිතුරු දුන්නේ ය.

   ආනන්දය, යම්තාක් කල් වජ්ජි රජහු නිතර රැස්වීම් ඇත්තාහු රැස්වීම් බහුලව ඇත්තාහු ද, ඒ වජ්ජි රජුන්ගේ වැඩි දියුණුවම කැමැතිවිය යුතුයි. පිරිහීමක් නොවේ ය යැයි වදාළ සේක.

❖ මෙහි "**නිතර රැස්වීම**" නම් දවසට තුන් වරක් රැස්වීම හා අතරින් පතර රැස්වීමයි. "**බහුලව රැස්වීම**" නම් ඊයේ ද රැස් වූයෙමු, කලින් දවසේ ද රැස් වූයෙමු, නැවත අද කුමකට නම් රැස් වෙමු ද යැයි අවසානයකට නො පැමිණෙන බව ය.

මෙලෙස නිතර රැස් නොවන්නාහු නම් දිසා අනු දිසාවලින් පැමිණෙන පණිවිඩ නො අසත්. එයින් අසවල් ග්‍රාම සීමාව හෝ නියම්ගම් සීමාව හෝ අවුල් සහගත ය. අසවල් තැන සොරු නැඟී සිටිත් යැයි නොදනිත්. සොරු ද රජවරු ප්‍රමාද යැයි දැනගෙන ගම් නියම්ගම් පහරමින් ජනපද විනාශ කරත්. මෙසේ රජවරුන්ගේ පිරිහීම ඇති වෙයි. නිතර රැස්ව කල්හි ඒ සියල්ල අසයි. ඉක්බිති බල සේනාව යවා සතුරන් මර්ධනය කරත්. රජවරු ප්‍රමාද නැත, අපට කණ්ඩායම් වශයෙන් හැසිරෙන්නට නොහැකි ය යැයි කියා සොරු බිඳී පලා යති. මෙයින් රජවරුන්ගේ දියුණුවක් ම ඇති වෙති.

2. ආනන්දය, වජ්ජි රජහු සමගිව රැස් වෙත්ය, සමගිව නැගී සිටිත්ය, වජ්ජි රජහු සමගිව කටයුතු කෙරෙත්ය යන මේ කාරණය නුඹ විසින් අසනලදදැයි' ඇසූ සේක. "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, වජ්ජි රජහු සමගිව වෙසෙත්. සමගිව නැගී සිටිත්, වජ්ජි රජහු සමගිව කටයුතු කරත් ය යන බව මා විසින් අසන ලද්දේ ය, යැයි පිළිතුරු දුන්නේ ය.

ආනන්දය, යම්තාක් කල් වජ්ජි රජහු සමගිව රැස්වන්නාහු ද, සමගිව නැගී සිටින්නාහු ද, වජ්ජි රජහු සමගිව කටයුතු කරන්නාහු ද ආනන්දය, ඒ තාක් වජ්ජි රජුන්ගේ වැඩි දියුණුවම කැමති විය යුතු, පිරිහීමක් නම් නොවේමය" යැයි වදාළ සේක.

❖ මෙහි "**සමගිව රැස්වීම**" නම් රැස්වීමට අණ බෙරය නිකුත් වූ කල්හි, අද මට කටයුත්තක් ඇත, අද මංගල්‍යයක් ඇත කියා ප්‍රතික්ෂේප කරයි ද, සමගිව රැස් නොවෙත්. බෙර හඬ අසාම අනුභව කරන්නාහු ද, සැරසෙන්නාහු ද වස්ත්‍ර අඳින්නාහු ද, අඩක් අනුභව කර අඩක් සැරසී ඇඳුම් අඳිමින් රැස් වන්නාහු ද සමගියෙන් රැස් වූවාහු නම් වෙති.

තව ද සමගිව රැස් වන්නාහු ද, සිතාමතා කළ යුත්තක් කොට එකට ම නො නැගී සිටින්නාහු නම් සමගියෙන් නැගිට යන්නාහු නොවෙත්. මෙසේ නැගිට යන කල්හි යමෙක් පළමු ව යයි ද ඔවුන්ට මෙසේ සිතෙයි. අප විසින් බාහිර කථාවන් අසන ලදි. දැන්

විනිශ්චය කථාව නොවන්නේ ය. එකට ම නැගී සිටින්නාහු වනාහි සමගියෙන් නැගී සිටීම නම් වේ. තව ද අසවල් තැන්වල ග්‍රාම සීමාව හෝ නියම් ගම් සීමාව හෝ අවුල් සහගත ය. සොරු හෝ බලවත් ව නැගී සිටිත්ය යැයි අසා කවරෙකු ගොස් මේ සතුරු මර්ධනය කරන්නේ ද යැයි කී කල්හි මම පළමු ව යමි, මම පළමු ව යමි යැයි කියා යන්නාහු නම් සමගිව නැගී සිටීම නම් වෙති. එක් අයෙකුගේ  කටයුතු කර්මාන්ත පහත වැටෙන කල්හි ඉතිරි රජවරු දරුවන්, සහෝදරයින් ඔවුන්ගේ කර්මාන්තයන්ට පිහිට වන්නාහු ද, ආගන්තුක රජවරුන්ගෙන් අසවලාගේ ගෙට යන්න, අසවලාගේ ගෙට යන්න යැයි නොකියා සියල්ලෝ ම එකතුව උපකාර කරන්නාහු ද එක් අයෙකුගේ මංගල්‍යාදී කටයුත්තක දී හෝ අසනීපයක දී හෝ එකට යන්නාහු  ද එය සමගිව කළ යුතු දේ කරත් නම් වේ.

3. ආනන්දය, වජ්ජී රජහු නොපණවන ලද අලුත් නීති නොපණවත් ද, පණවන ලද නීති කඩ නොකරත් ද, පණවන ලද පුරාණ වජ්ජී රාජ ධර්මයන් දැඩි සේ ගෙන පිළිපදිත් ද, යන මේ කාරණය නුඹ විසින් අසන ලද්දේ ද” යැයි අසූ සේක.

ස්වාමීනි භාග්‍යවතුන්  වහන්ස, වජ්ජී රජහු නොපණවන ලද්දක් නොපණවත් ය. පණවන ලද්දක් කඩ නොකෙරෙත් ය. පණවන ලද වජ්ජී රාජ ධර්මයන් පිළිගෙන ඒ අනුව පිළිපදිත් ය, යන මේ කාරණය මා විසින් අසන ලදි” යැයි පිළිතුරු දුන්නේ ය.

ආනන්දය, යම් තාක් කල් වජ්ජී රජහු නොපණවන ලද නීති නොපණවන්නාහු ද පණවන ලද්දක් කඩ නොකරන්නාහු ද පණවන ලද වජ්ජී රාජ ධර්මයන් පිළිගෙන ඒ අනුව පවත්නාහු ද, ආනන්දය, ඒ වජ්ජී රජුන්ගේ වැඩි දියුණුව ම කැමති විය යුතු ය පිරිහීමක් නොවේ ය යැයි” වදාළ සේක.

❖ මෙහි පෙර නො පැනවූ බදු හෝ බලි හෝ දඬුවම් හෝ ගෙන්වා ගත්තාහු ද නො පැනවූ දෙය පනවත් නම් වේ. පෞරාණික පරපුරෙන් ආවා වූ දෙය ලබා නො ගත්තාහු ද පනවන ලද්ද සිඳ

දමත් නම් වේ. සොරෙකු යැයි අල්ලාගෙන පෙන්වූ කල්හි විනිශ්චය නොකොට සිඳීම් බිඳීම් ආදිය නියම කරන්නාහු ද, එය පැරණි ධර්මය අනුව පැවැත්ම නොවන්නේ ය. ඔවුන්ට කලින් නො පනවන ලද අලුතෙන් පනවන ලද බදු නිසා පීඩාවට පත් ජනයා, මොවුන්ගේ විජිතයෙහි වාසය කරන්නාහු අතිශයින් පීඩාවට පත් වූයෙමු යැයි වෙන පලාත්වලට ගොස් සොරුන් හෝ සොරුන්ගේ උදව්කාරයින් වී ජනපද පැහැර ගනිත්. තම පරපුරෙහි නො සිදී පැවත ආ පනවන ලද අයබදු ආදිය නො ගැනීමෙන් භාණ්ඩාගාරය පිරිහෙයි. ඉක්බිති ඇත් අස් බලකායන් ද, අන්තඃපුර ද, යම් සේ නිරන්තරයෙන් වැටුප් නොලබන්නාහු වීර්යයෙන් බලයෙන් පිරිහෙත්. එයින් ඔවුහු යුද්ධයට කැමති නොවෙත්. සේවය කිරීමට අකමැති වෙත්. පැරණි ධර්මයන් අනුව නො පවත්නා වූ රටෙහි මිනිස්සු අපගේ පියා පුත්‍රයා සොයුරා සොරෙකු නොවී සොරෙකු ලෙස හඳුන්වා සින්දහ, බින්දහ යැයි කිපී වෙන පලාත්වලට ගොස් සොරුන් හෝ සොර සහායකයින් වී ජනපද පැහැර ගනිත්. මෙසේ රජවරුන්ගේ පරිහානිය සිදු වේ.

නො පනවන ලද බදු ආදිය නො පනවන්නාහු ද අපගේ රජවරු ප්‍රවේණියෙන් ආවා වූ දෙය පමණක් කරත් යැයි ජනයා තුටු පහටුව ගොවිතැන, වෙළඳාම ආදී කර්මාන්තාදියෙහි යෙදෙත්. පනවන ලද නො සිදී පවත්වා ගෙන ආවා වූ අයබදු ආදිය ගැනීමෙන් භාණ්ඩාගාරය වැඩෙයි. එයින් ඇත් අස් බලකායන් ද, අන්තඃපුර ආදිය ද නිරන්තරයෙන් වැටුප් ලබන්නාහු වීර්යය බලයෙන් යුක්ත වූවාහු යුද්ධ කටයුතුවලට යනු කැමැත්තාහු වෙත්. රාජකාරිය කරනු කැමැත්තාහු වෙත්.

මෙහි කියවෙන පෞරාණික වජ්ජි ධර්මය නම් පෙර වනාහි වජ්ජි රජවරු මේ සොරෙකු යැයි ගෙනවිත් පෙන් වූ කල්හි ඒ සොරා අල්ලාගන්න යැයි නොකියා විනිශ්චයකාර මහ ඇමතියන්ට භාර දෙති. ඔවුහු විනිශ්චය කොට ඉදින් සොරෙකු නොවේ නම් මුදා හරිත්. ඉදින් සොරෙකු නම් තමා විසින් කිසිවක් නොකියා විනිශ්චයකරුවන්ට භාර දෙත්. ඔවුහු විනිශ්චය කොට ඉදින් සොරෙකු නොවේ නම් මුදා හරිත්. ඉදින් සොරෙකු නම් තමා විසින්

කිසිවක් නොකියා විනය භාර කරුවන්ට භාර දෙත්. ඔවුහු විභාග කොට ඉදින් සොරෙකු නොවේ නම් මුදා හරිත්. ඉදින් සොරෙකු නම් කුල අටකට අයත් මණ්ඩලයට භාර දෙත්. ඔවුහු ද එසේ විනිශ්චය කොට සොරෙකු නොවේ නම් මුදා හරිත්. ඉදින් සොරෙකු නම් සේනාපතිට භාර දෙත්. ඔවුහු ද එසේ කොට සොරෙකු නොවේ නම් මුදා හරිත්. ඉදින් සොරෙකු නම් යුව රජතුමාට භාර දෙත්. යුව රජු ද විනිශ්චය කොට සොරෙකු නොවේ නම් මුදා හරිත්. ඉදින් සොරෙකු නම් මහ රජුට භාර දෙත්. මහ රජතුමා නැවත විනිශ්චය කොට සොරෙකු නොවේ නම් මුදා හරිත්. ඉදින් වනාහි සොරෙකු නම් පරම්පරා පොත කියවවයි. එහි යමෙකු විසින් මෙනම් වූ වරදක් කළේ නම් ඔහුට මෙනම් දඬුවම යැයි ලියා ඇත. රජතුමා ඔහුගේ වරද ඒ හා ගලපා බලා ඊට සුදුසු දඬුවමක් කරයි. මෙලෙස පැරණි වජ්ජි ධර්මයන් අනුව පවතින්නන්ට මහජනයා උද්ඝෝෂණය නොකරත්. රජවරු පෞරාණික ව ආ කටයුතු ම කරත්. මොවුන්ගේ දෙසක් නැත. අපගේ ම වරද යැයි කියා අප්‍රමාදී ව වැඩ කරත්. මෙසේ රජවරුන්ගේ අභිවෘද්ධිය ඇති වේ.

4. ආනන්දය, වජ්ජි රජහු ඔවුන්ගේ යම් ඒ මහලු වජ්ජි රජහු වෙත් ද, ඔවුන්ට සත්කාර ගරු බුහුමන් කෙරෙත් ය, ඔවුන් හට වඳින්නාහු ය, ඔවුන්ගේ අනුශාසනාදිය ඇසිය යුතු ම යයි සිතන්නාහු ය, යන මේ කාරණය නුඹ විසින් අසන ලද්දේ ද යැයි” ඇසූ සේක.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, වජ්ජි රජහු වජ්ජි රජුන්ගේ යම් ඒ වැඩිමහලු අය වෙත් ද ඔවුන් හට සත්කාර කෙරෙත්ය, ගරු කෙරෙත්ය, බුහුමන් කෙරෙත්ය, ඔවුන් පුදත් ය, ඔවුන්ගේ අනුශාසනාදිය ඇසිය යුතු කොටම සිතත් ය.” යන මේ කාරණය මා විසින් අසන ලද්දේ ය යැයි පිළිතුරු දුන්නේ ය.

ආනන්දය, යම් තාක් කාලයක් වජ්ජි රජහු ඔවුන්ගේ ඒ වැඩිමහලු අය වෙත් ද ඔවුන්ට සත්කාර කරන්නාහු ද ගරු කරන්නාහු ද, බුහුමන් කරන්නාහු ද, ඔවුන් පුදන්නහු ද, ඔවුන්ගේ අනුශාසනාදියක් ඇසිය යුතු ලෙස ම සිතන්නාහු ද, ඒ තාක් වජ්ජි

රජුන්ගේ වැඩිදියුණුව බලාපොරොත්තු විය යුතු ය. පිරිහීමක් නොවන්නේය" යැයි වදාළ සේක.

❖ මෙහි ඔවුහු යම්කිසි සත්කාරයක් කරන්නාහු ද හොඳ දෙයක් ම කරති. ගරු බවක් පෙරටු කොට ගෙනම කරති. දිනකට දෙ තුන් වරක් මහලු රජවරුන්ට උපස්ථානයට ගොස් කාරණාකාරණාවන් දැනගනිත්. යම් කෙනෙක් මහලු රජවරුන්ට උපස්ථානයට නොයත් ද සත්කාරාදිය නොකරත් ද, අවවාද ලැබීම පිණිස උපස්ථානයට නොයත් ද, එබඳු වූවන් ඒ රජවරුන් විසින් හැර දමන ලද්දහු වෙති. එයින් ඔවුහු කෙළිලොල් බවට පත්ව රාජ්‍යයෙන් පිරිහෙත්. යමෙක් නිතර මහලු රජවරුන්ට උපස්ථානයට යත් ද ඔවුන්ට ඒ රජවරුන් විසින් මෙය කළ යුතු ය, මෙය නොකළ යුතු ය යැයි පැරණි ක්‍රම කියා දෙත්. යුද්ධය එළඹ සිටි කල්හි ද මෙසේ පිවිසිය යුතු ය, මෙසේ නතර විය යුතු ය යැයි උපාය දක්වති. එලෙස මහලු රජවරුන්ගෙන් අවවාද ලබන ඔවුහු එලෙස පිළිපදිත් ද, රාජ ප්‍රවේණිය කඩ නොකොට පවත්වති.

5. ආනන්දය, වජ්ජි රජහු විවාහ වූ යම් ඒ කුල ස්ත්‍රීහු වෙත් ද, අවිවාහක යම් ඒ කුල කුමරියෝ වෙත් ද, ඔවුන්ට බලාත්කාරකම් නොකරත්ය යන මේ කාරණය නුඹ විසින් නම් අසන ලද්දේ ද?" ඇසූ සේක.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, වජ්ජි රජවරු ඒ කුලයන් අතරට ගිය ස්ත්‍රීහු වෙත් ද, යම් ඒ අවිවාහක කුල කුමාරියෝ වෙත් ද ඔවුන් හට බලාත්කාරකම් නොකරත්ය යන මේ කාරණය මා විසින් අසන ලද්දේ ය. පිළිතුරු දුන්නේ ය.

ආනන්දය, යම් තාක් කල් ඒ වජ්ජි රජහු යම් ඒ කුල ස්ත්‍රීහු වෙත් ද, යම් ඒ අවිවාහක කුල කුමරියෝ වෙත් ද, ඔවුන්ට බලාත්කාරකම් නොකරන්නාහු ද, ආනන්දය, ඒ තාක් වජ්ජි රජුන්ගේ දියුණුවම කැමති විය යුතු ය, පිරිහීමක් නොවේ ම යයි" වදාළ සේක.

❖ මෙහි කුල කාන්තාවන් හා කුල දූවරු බලහත්කාර කමින් පැහැර ගෙන යත් ද, ඒ රට වැසියන් "අපගේ නිවසේ දරුවෝ ද මව්වරු ද කෙළ සොටු ආදිය මුවෙන් ඉවත් කර හදා වඩාගත් දූවරුන් ද මේ රජවරු බලහත්කාර කමින් ගෙන ගොස් තමන්ගේ ගෙවල්හි නතර කරවා ගෙන සිටිත්" යැයි කිපීමට පත්ව ප්‍රත්‍යන්තයට ගොස් සොරු හෝ සොර සහායකයින් වී ජනපද පැහැර ගනිත්. මෙලෙස නොකරන්නවුන් ගේ රටෙහි මිනිස්සු වැඩි මහන්සියක් නැතිව තමන්ගේ කර්මාන්ත කරන්නාහු රාජ භාණ්ඩාගාරය දියුණු කරත්. මෙලෙස මේ කාරණය දියුණුවට හා පරිහානියට කාරණා වේ.

6. ආනන්දය, වජ්ජි රජහු ඔවුන්ගේ නුවර ඇතුළත වූ හෝ නුවරින් පිටත වූ හෝ දේවාල යයි සම්මත ඒ වජ්ජි චෛත්‍යයෝ ඇත්තේ ද ඒ චෛත්‍යාදීන්ට සත්කාර කෙරෙත් ය. ගරු කෙරෙත් ය බුහුමන් කෙරෙත් ය. ඒ චෛත්‍යයන් පුදත් ය කියා ද, ඒ චෛත්‍යාදීන්ට පෙර දුන්නා වූ ද, පෙර කරණ ලද්දා වූ ද, ධාර්මික බිලි පූජා නොපිරිහෙළා කරත් ය යන මේ කරුණ නුඹ විසින් අසන ලද්දේ ද" යැයි ඇසූ සේක.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, වජ්ජි රජවරු ඔවුන්ගේ නුවර ඇතුළත තිබෙන්නා වූ ද නුවරින් පිටත පිහිටියා වූ ද ඒ සියලු ම වජ්ජි චෛත්‍යයයෝ වෙත් ද, ඒ සියල්ලට ම ඔවුන් උපකාර කෙරෙත් ය, ගරු කෙරෙත් ය, බුහුමන් කෙරෙත් ය, ඔවුහු ඒ චෛත්‍යයන්ට පුදත් ය පූර්වයෙහි දුන්නා වූ ද එසේම කරණ ලද්දා වූ ද ඒ ධාර්මික බිලි පූජා කඩ නො කොට ඉෂ්ට කෙරෙත් ය යන මේ කරුණ මා විසින් අසන ලද්දේ ය" යැයි පිළිවදන් දුන්නේ ය.

ආනන්දය, යම් තාක් මේ වජ්ජි රජහු ඔවුන්ගේ නුවර ඇතුළත හෝ එයින් පිටත පිහිටියා වූ යම් ඒ චෛත්‍යාදීන්ට නොකඩ කොට සත්කාර ගරු බුහුමන් කරත් ද පූජා කෙරෙත් ද ඒ චෛත්‍යාදීන්ට පූර්වයෙහි සිටි රජුන් විසින් දෙන ලද්දා වූ ද කරන ලද්දා වූ ධාර්මික බිලි පූජාදිය නොපිරිහෙළා කරන්නාහු ද, ආනන්දය, ඒ තාක් වජ්ජි රජුන්ගේ දියුණුවම බලාපොරොත්තු විය යුතු ය. පිරිහීමක් නොවේමය" යැයි වදාළ සේක.

❖ මේ වජ්ජී රජවරුන්ගේ රටෙහි මනහර සිතියම් කරන ලද චෛත්‍ය යන නමින් යක්ෂයන්ට පුදනු ලබන දේවාලයන් රාජ්‍ය සීමාව ඇතුළත ද පිටත ජනපදයන්හි ද ඇත්තේ වේ. පෙර රජ දරුවන් විසින් ධාර්මික ව පවත්වන ලද දෙන ලද බිල පූජා නොකරත් ද, කඩ කරත් ද ඒ හේතුවෙන් දෙවියෝ මනාකොට ආරක්‍ෂාව නොදෙති. දෙවියන්ට නූපන් දුක් ඇති කරන්නට නොහැකි වෙති. එහෙත් හටගත් කාස ශීෂී ආදී රෝගාදිය වර්ධනය කළ හැකි වෙති. මෙලෙස දේවාරක්‍ෂාව නො ලබන රට රෝග ව්‍යසන ආදිය ඇතිව දුකට පත් වේ. ඒ හේතුවෙන් යුද්ධයක් එළඹි කල්හි සහායකයෝ නොලැබ පිරිහීමට පත් වේ.

පූර්ව රජ දරුවන් අනුව ධාර්මික බිලි පූජා කඩ නොකර පැවැත්වීම හේතුවෙන් දෙවියෝ සතුටු ව ආරක්‍ෂාව මනාව සංවිධානය කරත්. දෙවියන්ට වනාහි නූපන් සැප උපදවාලිය නොහැකි වෙත්. එසේ වුව ද හටගත් කාස ශීෂාදී රෝග දුරු කර දෙති. ජනයා නිරෝගී ව සිටින විට යුද්ධයක් එළඹි කල්හි සහායකයෝ සිටිත්. මෙලෙස දැහැමි දේවාරක්‍ෂාව ලබන රට දියුණුවට පත් වේ.

7. ආනන්දය, කෙසේ නම් සිය රටට නො වැඩියා වූ රහත්හු වඩින්නාහු ද, වැඩියා වූ රහත්හු සිය රටෙහි පහසුවෙන් වසන්නාහු ද යැයි වජ්ජී රජුන් විසින් රහතුන් කෙරෙහි දැහැමි ආරක්‍ෂාව මනාව පිහිටුවන ලද යැයි නුඹ විසින් අසන ලද්දේ ද” යැයි ඇසූ සේක.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, කෙසේ නම් සිය රටට නො වැඩියා වූ රහත්හු වඩින්නාහු ද, වැඩියා වූ රහත්හු සිය රටෙහි පහසුවෙන් වසන්නාහු ද යැයි වජ්ජී රජුන් විසින් රහතුන් කෙරෙහි දැහැමි ආරක්‍ෂාව මනාව පිහිටුවන ලද්දේ ය යන මේ කාරණය මා විසින් අසන ලද්දේ ය” පිළිතුරු දුන්නේ ය.

ආනන්දය, යම් තාක් සිය රටට නො වැඩියා වූ රහත්හු වඩින්නාහු ද, වැඩියා වූ රහත්හු සිය රටෙහි පහසුවෙන් වසන්නාහු ද යැයි වජ්ජී රජුන් විසින් රහතුන් කෙරෙහි දැහැමි ආරක්‍ෂාව මනාව පිහිටුවන ලද්දේ වන්නේ ද, ආනන්දය ඒ වජ්ජී රජවරුන්ගේ

දියුණුවම කැමති විය යුත්තේ ය. පිරිහීමක් නොවේ ය" යැයි වදාළ සේක.

❖ මෙහි පැවිද්දන් කෙරෙහි දැහැමි ආරක්‍ෂාව පිහිටුවීම නම් බල සේනා සතර දිග පිහිටුවා ආයුධ ගෙන කරන ආරක්‍ෂාව නො කියන ලදි. ශ්‍රමණයන් වහන්සේලා වෙසෙන විහාර අසල වනයේ ගස් නො කැපීම, පොකුණුවල මත්ස්‍යයන් නො මැරීම ආදී වූ ශ්‍රමණයන් වහන්සේලා කැමති වන ලෙස පිළිපැදීම ධාර්මික ආරක්‍ෂාව සැලසීම නම් වේ.

එසේම නො පැමිණි රහතන් වහන්සේලාගේ පැමිණීම අකමැති වෙත් ද, ඔවුහු ශ්‍රද්ධාව නැත්තෝ වෙති. අප්‍රසන්න වූවෝ වෙති. සිය රටට රහතන් වහන්සේලා පැමිණි කල්හි පෙර ගමන් නොකරත් ද, ගොස් නො බලත් ද, පිළිසඳර කථා නොකරත් ද, පැන් නො විචාරත් ද, ධර්මය නො අසත් ද, දන් නොදෙති ද, පුණ්‍යානුමෝදනාවන්ට සවන් නොදෙති ද, වාසයට සුදුසු තැන් පිළියෙල නොකරත් ද ඔවුන් කෙරෙහි මෙලෙස නුගුණ ප්‍රකට වෙත්. "අසවල් රජු ශ්‍රද්ධා නැත්තෙකි, අප්‍රසන්නයෙකි, පැවිද්දන් පැමිණෙන කල්හි පෙර ගමන් නොකරති, ගොස් නොබලති, පිළිසඳර කථා නොකරති, පැන් නො විචාරති, ධර්මය නො අසති, දන් නොදෙති, පුණ්‍යානුමෝදනාවන්ට සවන් නොදෙති, වාසයට සුදුසු තැන් පිළියෙල නොකරති" ඒ බව අසා පැවිද්දෝ ඔහුගේ නගර දෙරටුවෙන් නොයති. ගමන් කරන්නේ නමුත් නගරයට නො පිවිසෙති. මෙලෙස නො පැමිණි රහතන් වහන්සේලාගේ නො පැමිණීම සිදු වේ.

පැමිණි රහතන් වහන්සේලාට කරදරයකින් තොරව වාසය කිරීමට නො හැකි වන බැවින් යම් පැවිද්දෙකු ඒ බව නො දැන වාසය පිණිස පැමිණියේ නමුත් රජවරුන්ගේ නුගුණ ගති පැවතුම් හේතුවෙන් කවරෙකු නම් මෙහි වාසය කරන්නෙහි ද යැයි කියා නික්ම යති. මෙලෙස නො පැමිණෙන පැවිද්දන් නො පැමිණෙන කල්හි ද, පැමිණි පැවිද්දන් දුක සේ වසන කල්හි ද ඒ දේශය පැවිද්දන්ට වාසයට නුසුදුසු දේශයක් වේ. සිල්වතුන්

ගුණවතුන්ගෙන් හිස් වන ඒ දේශයට දෙවියන්ගේ ආරක්ෂාවක් ඇති නොවේ. සම්‍යක් දෘෂ්ටික දෙවියන්ගේ ආරක්ෂාව බැල්ම නැති විට අමනුෂ්‍යයෝ ඉඩ ලබා ගනිත්. අමනුෂ්‍යයන්ගේ බලය උස්සන්න වන විට කලින් නොවූ විරූ රෝග හට ගනී. සීලවන්තයන්ගේ දැකීම, ප්‍රශ්න විචාරීම ආදී වූ පිනට හේතුවන කිසිවක් ඇති නොවේ. එම හේතුවෙන් අභිවෘද්ධියක් ඇති නොවේ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මගධ මහාමාත්‍ය වස්සකාර බ්‍රාහ්මණයා අමතා, "බ්‍රාහ්මණය, මම එක් සමයක විසාලා මහනුවර සාරන්දද නම් යක්ෂයාගේ වාසස්ථානයෙහි කළ චෛත්‍යයෙහි වාසය කළෙමි. මම එහි දී මේ වජ්ජි රජුන් හට අපරිහානිය ධර්ම සත දේශනා කළෙමි. බ්‍රාහ්මණය, යම් තාක් කල් මේ අපරිහානිය ධර්ම සත වජ්ජි රජුන් කෙරෙහි ඇත්තේ වේ ද, ඒ තාක් වජ්ජි රජුන්ගේ වැඩි දියුණුවම කැමති විය යුතු ය. පිරිහීමක් නොවේ ය යැයි වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ වජ්ජීන් කෙරෙහි අනුකම්පාවෙන් මෙසේ වදාළ කල්හි මෙයින් වජ්ජීන්ගේ විනාශයට කාරණයක් සිතාගත් වස්සකාර බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේ අමතා "භවත් ගෞතමයන් වහන්ස, ඒ එක් එක් අපරිහානිය ධර්මයකිනුදු වජ්ජි රජුන්ගේ අභිවෘද්ධියම බලාපොරොත්තු විය යුතු ය. පිරිහීමක් අපේක්ෂා නො කළ යුතු ය. ඒ අපරිහානිය ධර්ම සතෙන් ම යුක්ත වූ කල්හි කියනුම කවරේ ද? භවත් ගෞතමයන් වහන්ස, මගධාධිපති අජාසත් රජ විසින් වජ්ජි රජුන්ගේ සිත් ගැනීමකින් හෝ උනුන් බිඳුවාලීමෙන් හෝ විනා යුද්ධයකින් ගත නොහැක්කාහුම ය.

භවත් ගෞතමයන් වහන්ස දැන් අපි යම්හ. අපි බොහෝ කටයුතු ඇත්තෝ වෙමු යැයි" කීයේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ "බ්‍රාහ්මණය, යම් ගමනකට සිතුවෙහි නම් මේ එයට කාලය යැයි වදාළ සේක. ඉක්බිති වස්සකාර බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වචනය පිළිගෙන අනුමෝදන්ව හුනස්නෙන් නැගී නික්ම ගොස් අජාසත් මහ රජතුමාගේ සමීපයට ගියේ ය. රජතුමා ද "කිම ආචාරීනි! භාග්‍යවතුන් වහන්සේ කුමක් වදාළ සේක් ද?" යැයි අසා යුද්ධයකින් වජ්ජීන් අල්ලා ගත නොහැකි ය චාටු බස් කීමෙන් හෝ ඔවුනොවුන්

බිඳුවීමෙන් කළ හැකිය යැයි කී කල්හි රජතුමා මෙසේ කීයේ ය. චාටු බස් කීමෙන් අපගේ හස්තීහු ද අශ්වයෝ ද නැසෙන්නාහ. ඔවුනොවුන් බිඳුවා අල්ලා ගනිමු යැයි කියා ඒ සඳහා කුමක් කල යුතු ද යැයි රජතුමා ඇසුවේ ය.

එවිට වස්සකාර බ්‍රාහ්මණයා "එසේ නම් රජතුමනි! මම ලිච්ඡවීන්ගේ ගුණ කීම හේතුවෙන් වරද කරුවෙකු කොට රටින් නෙරපා හරින්න. එවිට මම එම උපායෙන් වජ්ජීන් බිඳුවීම පිණිස ගොස් ඔවුන් බිඳුවා ඔබට දැනුම් දෙමි. එවිට සේනා සහිතව පැමිණෙන්න" යැයි කියා විශාලාව වෙත ගියේ ය. ලිච්ඡවි රජවරු වස්සකාර බ්‍රාහ්මණයාගේ නික්ම යෑම අසා කපටි බ්‍රාහ්මණයාට ගඟින් එතෙර වන්නට ඉඩ නො දෙන්න යැයි කීහ. ඇතැම් ලිච්ඡවීහු ඔහු විසින් අපගේ ගුණ කීම හේතුවෙන් රටින් නෙරපීම හේතුවෙන් මෙහි පැමිණෙයි. එබැවින් අපි ඔහු බාර ගනිමු යැයි කියා පැමිණි කල්හි පිළිගෙන අජාසත්ත රජතුමාගේ රාජ්‍යයෙහි කුමන තනතුරක් දැරුවෙහි ද යැයි අසා විනිශ්චයකාර තනතුර යැයි කී කල්හි ඒ තනතුරම දුන්හ. ඔහු ද ටික දිනක් ඉතා හොඳින් ඒ තනතුරෙහි පිහිටා කටයුතු කර එම රජවරුන්ට ද ශිල්ප ඉගැන්වී ය. ඔහු එක් දිනක් එක් ලිච්ඡවි රජ කුමරුවෙක් පසකට කැඳවා කුඹුරක් සී සාන්නෙහි ද යැයි ඇසුවේ ය. එසේ ය, ගොනුන් දෙදෙනෙකු යොදා සාන්නෙමි යැයි රජ කුමරුවා කීවේ ය. අන් රජ කුමරුවෙක් ආචාර්‍යවරයා කුමක් කීමේ ද යැයි අසා එම කාරණය කී කල්හි විශ්වාස නොකොට "මොහු මට ඇති තතු නොකියයි" යැයි කියා ඔහු සමග භේද විය.

වස්සකාර බ්‍රාහ්මණයා තවත් දිනක තවත් ලිච්ඡවි රජ කුමරුවෙකු පසකට කැඳවා ඔබ අතිශයින් දුප්පත් නොවේ ද යැයි ඇසුවේ ය. කවරෙකු මෙසේ කීවේ ද යැයි අසා අසවල් ලිච්ඡවි කුමාරයා යැයි කීවේ ය. මෙලෙස තවත් දිනයක තවත් ලිච්ඡවි රජ කුමරුවෙකු පසකට කැඳවා ඔබ බියගුල්ලෙකු නොවේ ද යැයි ඇසුවේ ය. කවරෙකු එසේ කීවේ ද යැයි ඇසූ කල්හි අසවල් රජ කුමාරයා යැයි කීවේ ය. මෙලෙස අන් අය නොකී දෙයක් තව කෙනෙකුන්ට කියා වසර තුනකින් ඔවුනොවුන් භේද කර ඔවුන් දෙදෙනෙකු එකම නොයන ලෙසට කර "**ලිච්ඡවි මහේශාක්‍යයෝ රැස් වෙත්වා**" යැයි රැස්වීම සඳහා

බෙර හැසිරවී ය. ඔවුහු රැස් නො වූහ. ඉන් පසු දැන් විශාලාව ආක්‍රමණයට සුදුසු වේලාව යැයි අජාසත්ත රජතුමාට පණිවිඩ යැවී ය.

අජාසත් රජු සේනා සහිතව පැමිණෙන බව අසා දක්ෂ රජ කුමරුවන් රැස් වෙන ලෙස විශාලා නුවර පුරා බෙර හැසිරවූහ. ඔවුහු රැස් නො වූහ. රජු ගඟ තරණය කරන විට ද නගරයට ඇතුල් වන්නට ඉඩ නො දෙමු, ආරක්ෂක දොරවල් වසමු යැයි බෙර හැසිරවූහ. එක් අයෙකුවත් රැස් නො වූහ. අජාසත් රජු විවෘතව පැවති දොරවල් වලින් සේනා සහිතව පිවිස සියල්ලන් ම විපතට පමුණුවා ගියේ ය.

# ❄ භික්ෂූන් පිළිබඳ අපරිහානිය ධර්ම

මගධ මහාමාත්‍ය වස්සකාර බ්‍රාහ්මණයා බැහැර ගිය නොබෝ වේලාවකින් භාග්‍යවතුන් වහන්සේ ආනන්ද අනද තෙරුන් අමතා "ආනන්දය, නුඹ යන්න. රජගහ නුවර ඇසුරු කොට යම් පමණ භික්ෂූහු වාසය කෙරෙත් ද, ඒ සියලු භික්ෂූන් උපස්ථාන ශාලාවෙහි රැස් කරව" යැයි වදාළ සේක.

"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, එසේ ය" යැයි පිළිවදන් දී දුර බැහැර පිහිටි ආරාමයන්හි වෙසෙන භික්ෂූන් වහන්සේලා වෙත ඍද්ධිමතුන් යවා ද, ළඟ ආරාමයන්හි වෙසෙන භික්ෂූන් වෙත තමන් ම ගොස් දැනුම් දී, යම් පමණ භික්ෂූහු රජගහ නුවර ඇසුරු කොට වැඩ වෙසෙත් ද, ඒ සියලු භික්ෂූන් උපස්ථාන ශාලාවට රැස් කරවා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, භික්ෂු සංඝයා රැස් කරවන ලද්දේ ය. භාග්‍යවතුන් වහන්සේ දැන් යමක් සඳහා කල් දන්නා සේක් නම් ඊට සුදුසු කාලයයි සැල කළේ ය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ හුනස්නෙන් නැගී උපස්ථාන ශාලාව කරා එළඹි සේක. එළඹ පණවන ලද ආසනයෙහි වැඩ සිටි සේක. එසේ වැඩ හිඳ භික්ෂූන් අමතා, "මහණෙනි, නුඹලාට පිරිහීමට හේතු නොවන, දියුණුවට හේතු කාරණා වන සත් අපරිහානිය ධර්ම

චන්ද්‍රයන් දහසක්, සූර්‍යයන් දහසක් නැගෙන්නාක් මෙන් ද, බිත්ති සතරකින් වට වූ ගෙයක පහන් දහසක් දල්වන්නාක් මෙන් ප්‍රකට කොට කියන්නෙමි. එය මැනවින් කන් යොමු කරමින් සෝතින්ද්‍රියෙහි විසිර යාම වළක්වමින් මෙම දේශනාවට ම කන යොමු කොට ධර්ම ගෞරවයෙන් අසව්. සිතෙහි අවධානය ගැඹුරට යොදා ගනිමින් නොවිසිරුණා වූ මනා සිහියෙන් යුතුව මෙනෙහි කරව්. මනාව ධර්ම ගෞරවයෙන් අසන්නෙහි නම්, මනාකොට අර්ථ සිහි කරන්නෙහි නම් අර්ථ ව්‍යඤ්ජනයන්ගෙන් පරිපූර්ණ කොට යම් සේ ඔබට දත හැකි වන්නේ ද එලෙස දේශනා කරන්නෙමි" යැයි වදාළ සේක.

**ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, එසේ ය. මැනවින් අසන්නෙමි මැනවින් මෙනෙහි කරන්නෙමි** යැයි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය දේශනා කළ සේක.

## ☸ ප්‍රථම අපරිහානිය ධර්ම සත

1. **යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ අභිණ්හං සන්නිපාතා සන්නිපාතබහුලා භවිස්සන්ති, වුඩ්ඪියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

   මහණෙනි, යම් තාක් කල් භික්ෂූහු එක්වන්ව නිතර රැස්වන්නාහු වෙත් ද බොහෝ සෙයින් රැස්වන්නාහු වෙත් ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ අභිවෘද්ධියක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ මෙහි දී නිතර රැස් නො වීමෙන් දිසාවන්ගෙන් ලැබුණා වූ තොරතුරු ඇසීමට නො ලැබෙත්. එයින් "අසවල් විහාර සීමාව වියවුල් සහිත ය. උපෝසථ පවාරණාදී ශාසනික ගරු විනය කර්මාදිය නොකරත්. අසවල් විහාරයෙහි භික්ෂූහු වෙදකම් හා දූත කර්මාදී වූ ශාසන ධර්මයට නොගැළපෙන කටයුතු කරත්. එක් විසි අන්වේෂණයන්ගෙන් ජීවිකාව පවත්වත් යනාදී කිසිවක් නොදනිත්" ඒ හේතුවෙන් පාප භික්ෂූහු ද භික්ෂු සංඝයාගේ ප්‍රමාදය දැනගෙන කණ්ඩායම් සැදී සසුන පසු බස්සවති.

නිතර රැස්වන කල්හි ඒ ඒ පුවත් අසති. එවිට ඒ අධර්ම අවිනය කටයුතු සංසිඳවීමට භික්ෂු සංඝයා පිටත් කොට යවා ඒ විහාර සීමාව නිවැරදි කරත්. උපෝසථ පවාරණාදිය පවත්වත්. වැරදි දිවි පෙවෙත්වලින් බලවත් වූ තැන්වල ආර්ය වංශ ප්‍රතිපදාව කියවත්. විනයධරයන් ලවා පාප භික්ෂූන්ට නිග්‍රහ කරවත්. එවිට පාප භික්ෂූහු සංඝයා අප්‍රමාදය, අපට කණ්ඩායම් වශයෙන් හැසිරිය නොහැකිය යැයි කියා භේද භින්න වී පලා යත්.

2. **යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ සමග්ගා සන්නිපතිස්සන්ති, සමග්ගා වුට්ඨහිස්සන්ති, සමග්ගා සඞ්ඝකරණීයානි කරිස්සන්ති, වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, යම් තාක් භික්ෂූහු සමගිව රැස්වන්නාහු ද සමගිව නැගී සිටින්නාහු ද සමගිව සංඝයා විසින් කටයුතු වූ පොහෝ කිරීම් ආදි සංඝ කර්ම කරන්නාහු ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ මෙහි වනාහි චෛත්‍ය පිළිදැගුම් කිරීම, බෝධි ගෘහය - පොහොය ගෙය සෙවිලි කිරීමාදී වූ කටයුත්තක් සඳහා කතිකාවතක් ඇති කිරීම සඳහා සංඝයා රැස් කරලීමට ගෙඩිය නාද කළ කල්හි මට සිවුරු පිළියෙල කිරීමට ඇත, පාත්‍රය පිළිස්සීමට ඇත, අලුතෙන් පටන් ගැනීමට වැඩ කටයුත්තක් ඇත යනාදිය කියා අවුල් ඇති කරන්නාහු වෙත් ද සමගියෙන් රැස් නොවෙති.

යම් ශාසනික පොදු කටයුත්තක් ඇති කල්හි අන් සියලු කටයුතු අතහැර ඒ සඳහා මම පළමු ව යා යුතුය, මම පළමු ව යා යුතුය යැයි කියා සියලු දෙනා ම එක් වරම රැස් වන්නාහු වෙත් ද සමගියෙන් රැස් වන්නාහු නම් වෙති.

එලෙස සමගියෙන් රැස් වූයේ නමුත් සිතා මතා කළ යුත්ත කර ඒ කටයුත්ත නිමාවට පෙර තනි තනිව නැගී යන්නාහු වෙත් ද සමගියෙන් නැගී සිටීම නොවෙති. මෙලෙස පළමු ව නැගී යන

කල්හි 'අප විසින් බාහිර කථාවක් අසන ලදි, ඒ සඳහා විනිශ්චය කථාවක් වන්නේ ය, ඒ සඳහා මම පළමු ව යමි, මම පළමු ව යමි' යැයි එක්වර ම නැගී යත් ද, සමගියෙන් නැගී සිටින්නාහු නම් වෙති. තව ද අසවල් තැන අසවල් විහාර සීමාවෙහි අවුල් ඇත කියා හෝ පොහොය කිරීමාදී විනය කර්‍ම පිණිස රැස් වූ විටක අසවල් තැන භික්ෂූහු වෙදකම් ආදිය කරත්, පාප භික්ෂූහු උත්සන්න වී ඇත යැයි අසා කවරෙකු එහි ගොස් ඔවුන්ට නිග්‍රහ කරන්නෙහි ද යැයි කියූ කල්හි මම පළමු ව යමි, මම පළමු ව යමි යැයි සියල්ලන්ට ම කලින් ඒ සඳහා නැගිට යන්නාහු ද එය සමගිව නැගී සිටීම නම් වෙති.

එසේම ආගන්තුකයෙකු දැක මේ ආවාසයට යන්න, මේ ආවාසයට යන්න යැයි නොකියා සියලු ආගන්තුක වත් දැක්වීම ද, එම ආගන්තුකයාගේ දිරා ගිය පාත්‍ර සිවුරු දැක භික්ෂාචාර වතින් හෝ පාත්‍ර සිවුරු සොයන්නාහු ද, ගිලන් වූ විට ගිලන් බෙහෙත් සොයන්නාහු ද, අනාථ වූ ගිලනුන්ට මේ ආවාසයට යන්න - මේ ආවාසයට යන්න යැයි නොකියා තමන් වසන තැන වාසය කරවා ගෙන උපස්ථාන කරන්නාහු ද සමගියෙන් කටයුතු කරන්නාහු නම් වෙති.

එසේම එක් නො ගෙනිය ලද ග්‍රන්ථයක් වේ ද, ප්‍රඥාවත් භික්ෂුවකට සංග්‍රහ කොට එම භික්ෂුව ලවා විනයානුකූලව එය ලබා ගන්නේ ද සමගියෙන් කටයුතු කරන්නාහු නම් වෙති.

3. **යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ අපඤ්ඤත්තං න පඤ්ඤපෙස්සන්ති, පඤ්ඤත්තං න සමුච්ඡින්දිස්සන්ති, යථාපඤ්ඤත්තෙසු සික්ඛාපදෙසු සමාදය වත්තිස්සන්ති, වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, යම් තාක් භික්ෂූහු තථාගතයන් වහන්සේ විසින් නොපණවණ ලද්දක් නොපණවයි ද පණවන ලද ශික්ෂාවන් කඩ නොකරන්නාහු ද පණවන ලද පරිදි ම ශික්ෂා පදයන් සමාදන් ව

නොපිරිහෙළා රක්නාහු ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ මෙහි අලුත් ධර්මානුකූල නොවන කතිකාවතක් හෝ ශික්ෂා පදයක් හෝ අලුතින් නිර්මාණය කිරීම නො පැනවූ දෙයක් පැනවීම නම් වේ. (පුරාණ සන්ථත වස්තුවෙහි සැවැත් නුවර භික්ෂුව මෙනි.)

ධර්මයට විනයට විරුද්ධ සසුනක් මතුකොට දක්වීම පනවන ලද්ද සිඳ දැමීම නම් වේ. (සම්බුද්ධ පරිනිර්වාණයෙන් වර්ෂ සියයක් ගිය තැන වජ්ජිපුත්තක භික්ෂූන් විසින් දස අකැප වස්තුවක් පනවාගෙන කළ ශාසන විලෝපය මෙනි.)

ඛුද්දකානුඛුද්දක ශික්ෂාපද දැන දැන කඩ කිරීම පනවන ලද ශික්ෂා පදයන්හි සමාදන් ව නො පැවතීම නම් වේ. (අස්සජි පුනබ්බසුක භික්ෂූන් මෙනි.)

එසේ නොකිරීම නො පැනවූවක් නොපණවත්, පනවන ලද්ද නොසිඳිත්, පැන වූ ශික්ෂාවන් අනුව පවතිත් නම් වේ. (වංගන්ත පුත්‍ර උපසේන තෙරුන් මෙන් ද, කාකණ්ඩ පුත්‍ර යස තෙරුන් ද මෙනි.)

මේ පිළිබඳ ව මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ප්‍රථම ධර්ම සංගායනාවෙහි දී මෙසේ දැනුම් දුන් සේක.

"ඇවැත්නි, භික්ෂු සංඝයා මා කියන්නක් අසාවා. ගිහියන් පිළිබඳ වූ ශික්ෂාපද අපට ඇත. එබැවින් ශ්‍රමණ ශාක්‍ය පුත්‍ර භික්ෂූන්ට මෙය කැප ය, මෙය අකැප ය යැයි ගිහියෝ ද දනිති. ඉදින් අපි ඛුද්දනුඛුද්දක ශික්ෂාපද සමූහනය කරන්නෙමු නම් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ විසින් ශ්‍රාවකයන්ට ශික්ෂාපද පනවන ලද්දේ ඒ ගෞතමයන් වහන්සේ ආදහන චිතකයෙහි දුම් ඇති තෙක් පමණි. යම්තාක් මේ භික්ෂූන්ගේ ශාස්තෲන් වහන්සේ සිටි සේක් ද, ඒ තාක් ඔවුහු ශික්ෂා පදයන්හි හික්මුණෝ ය. මොවුන්ගේ ශාස්තෲන් වහන්සේ පිරිනිවි සේක් ද එහෙයින් මොවුහු ශික්ෂා පදයන්හි නො

හික්මෙති යැයි කියන්නෝ වන්නාහ. ඉදින් සංඝයාට පැමිණි කල් ඇත්තේ නම් සංඝයා නො පනවන ලද්දක් නො පනවන්නේ ය, පනවන ලද්ද නො සිඳින්නේ ය. පනවන ලද ශික්ෂා පදයන්හි ඇති ලෙසට සමාදන් ව පවතින්නේ ය. මේ සංඝයා වෙත දැනුම් දීමයි.

සංඝයා නො පනවන ලද්දක් නො පනවයි, පනවන ලද්ද නො සිඳින්නේ ය. පනවන ලද ශික්ෂාපදයන් ඇති ලෙසට සමාදන් ව පැවැත්ම රුචි වේ නම් හෙතෙම නිහඬ වන්නේ ය. එම් කෙනෙක් අකමැති වන්නේ නම් හෙතෙම කියන්නේ ය යන මේ තීරණය තබන්නා වූ මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ මෙනි. මෙසේ කිරීමෙන් සීලාදී ගුණයෙන් වැඩි දියුණුවට පැමිණේ. පරිහානියක් නොවේ.

4. **යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ යෙ තෙ භික්ඛූ ථෙරා රත්තඤ්ඤූ චිරපබ්බජිතා සඞ්ඝපිතරො සඞ්ඝපරිණායකා, තෙ සක්කරිස්සන්ති ගරුං කරිස්සන්ති මානෙස්සන්ති පූජෙස්සන්ති, තෙසඤ්ච සොතබ්බං මඤ්ඤිස්සන්ති, වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, පැවිදි වී බොහෝ කල් ඇති සංඝයාගේ පිය තනතුරෙහි සිටියා වූ, සංඝ නායක වූ ඒ ස්ථවිර භික්ෂූහු වෙත් ද, එබඳු උතුමන්ට සත්කාර ගරුකාර කරන්නාහු ද බුහුමන් කරන්නාහු ද පුදන්නාහු ද උන්වහන්සේලාගේ අනුශාසනාදිය ඇසිය යුතු ලෙස ම සිතන්නාහු ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ මෙහි ශාසනයෙහි නො නවතින ස්වභාවයෙන් ස්ථිරත්වයට පත් පැවිදි වී බොහෝ කල් ගත වූ, සීලාදී ගුණයෙන් හික්මීම අවසන් කළා වූ, අධි සීල - අධි චිත්ත - අධි ප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂා පරිපූර්ණත්වයෙන් යුත් සංඝයාගේ පිය තනතුරෙහි පිහිටියා වූ සංඝ නායක වූ රහතන් වහන්සේ අදහස් කරන ලදි.

යමෙක් එබඳු උතුමන්ට සත්කාර නො කරන්නේ ද, දිනකට දෙ තුන් වරක් අවවාද අනුශාසනා ලැබීම සඳහා උපස්ථානයට නො යන්නේ ද ඒ රහතන් වහන්සේලා එබඳු වූවන්ට අවවාද නොදෙති. පරපුරෙන් ආ කථා නොකියති. සාරවත් වූ දහම් පිළිවෙත ශික්ෂණය නොකරවති. ඔවුහු ඒ ධර්ම ලාභයෙන් වෙන් වූවාහු සීලාදී ගුණයෙන් ද, ස්කන්ධයන්ගෙන් ද, සප්ත ආර්ය ධනයෙන් ද යනාදී ගුණයන්ගෙන් පිරිහෙත්.

යම් කෙනෙක් එබඳු උතුමන්ට සත්කාරාදිය කරත් ද, උපස්ථානයට යත් ද, එබඳු වූවන්ට ඒ සංඝ පරිනායක මහ තෙරුන් වහන්සේලා "ඔබලා විසින් මෙසේ ඉදිරියට යා යුතුය යනාදී වූ අවවාද දෙත්. ප්‍රවේණි කතා කියා දෙත්. හරවත් වූ ධර්ම පරියායන්හි හික්මවත්. තෙළෙස් ධුතංගයන්ගෙන් දස කථා වස්තුන්ගෙන් අනුශාසනා කරත්." මෙලෙස අවවාදනුශාසනාවන්හි පිහිටා ඔවුහු සීලාදී ගුණයන්ගෙන් වැඩෙමින් ශ්‍රමණත්වයේ අර්ථයන්ට පැමිණෙත්.

**5. යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ උප්පන්නාය තණ්හාය පොනොභවිකාය න වසං ගච්ඡිස්සන්ති, වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, භික්ෂූහු යම් තාක් කල් නැවත ඉපදීම ඇති කරන්නා වූ උපන් තෘෂ්ණාවගේ වසඟයට නොපැමිණෙත් ද, ඒ භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ මෙහි යම් පැවිද්දෙක් සිවුපසය හේතු කොට ගෙන උපස්ථායක කුලයන් සතුටු කරවමින් ගමින් ගම හැසිරෙත් ද, ඔවුහු තෘෂ්ණාවගේ වසඟයට යති.

**6. යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ ආරඤ්ඤකෙසු සෙනාසනෙසු සාපෙක්ඛා භවිස්සන්ති, වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, භික්ෂූහු යම් තාක් කල් ආරණ්‍යයන්හි වාසයට කැමැත්තෙන් සිටින්නාහු වෙද් ද, මහණෙනි ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ මෙහි ආරණ්‍යය යනු ග්‍රාම සීමාවෙහි සිට දුනු පනසියයකින් (සැතපුමකින්) ඈත වූ වනය යි. යම් කෙනෙක් ගාමාන්තර සෙනසුනෙහි සිට ධ්‍යාන උපදවා වෙසෙයි ද, එම ධ්‍යානයෙන් නැඟී සිටි කල්හි ස්ත්‍රී පුරුෂ ළදරු ආදීන්ගේ ශබ්ද අසයි. ඒ ශබ්ද ධ්‍යාන ගුණ පිරිහීමට කාරණා වේ. යම් භික්ෂුවක් වන සෙනසුනෙහි නිදා ගෙන සිට පිබිදෙයි ද සිංහ ව්‍යාඝ්‍ර මොනර ආදීන්ගේ ශබ්ද අසයි ද ඒ ශබ්ද ධ්‍යානාදී වූ ගුණ පිරිහීමට කාරණා නොවේ. එබැවින් යම් කුසලාරම්මණයකින් ප්‍රීතිය ලැබ එයම මනාව විමසමින් කමටහන් වඩා අග්‍ර ඵලයෙහි පිහිටති. එබැවින් භාග්‍යවතුන් වහන්සේ ගාමාන්තර සෙනසුනෙහි ධ්‍යාන ලාභීව සිටින භික්ෂුවට වඩා ආරණ්‍යයෙහි නිදා ගෙන සිටින භික්ෂුව ම වර්ණනා කළ සේක. එසේ හෙයින් ආරණ්‍ය සේනාසනයන්හි අපේක්ෂා වන්නාහු ද එය අධි සීල - අධි චිත්ත - අධි ප්‍රඥා ගුණ වැඩි දියුණුවට හේතු වන බව වදාළ සේක.

7. **යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ පච්චත්තඤ්ඤෙව සතිං උපට්ඨපෙස්සන්තිකි' - න්ති අනාගතා ච පෙසලා සබ්‍රහ්මචාරී ආගච්ඡෙය්‍යුං, ආගතා ච පෙසලා සබ්‍රහ්මචාරී ඵාසු විහරෙය්‍යු'න්ති වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, භික්ෂූහු නොපැමිණියා වූ සිල්වත් සබ්‍රහ්මචාරීහු පැමිණෙන්නාහු නම් ඉතා යෙහෙක යැයි ද, පැමිණියා වූ සබ්‍රහ්මචාරීහු පහසුවෙන් වාසය කරන්නාහු නම් ඉතා යහපති යැයි තම තමන් කෙරෙහි සිහිය පිහිටුවා වාසය කෙරෙත් ද, මහණෙනි, ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ මෙහි චතු පාරිශුද්ධි සීලයෙහි මනාව පිහිටියා වූ සීලයෙන් ප්‍රිය වූ සබ්‍රහ්මචාරින් වහන්සේලාගේ පැමිණීම නො කැමති වන නේවාසිකයෝ ශ්‍රද්ධාව නැත්තෝ වෙත් ද, නො පැහැදුණෝ වෙත් ද, විහාරයට පැමිණි භික්ෂූන්ට පෙර ගමන් යාම, පාත්‍ර චීවර පිළිගැනීම, අසුන් පැනවීම, තල් පත ගැනීම ආදිය නොකරත් ද ඒ හේතුවෙන් අසවල් වෙහෙරෙහි වසන භික්ෂූහු ශ්‍රද්ධාව නැත්තෝ ය, නො පැහැදුණෝ ය, විහාරයට පිවිසෙන්නන්ට වත් පිළිවෙත් නොකරති යැයි ඔවුන්ගේ නුගුණ මතු වෙයි. එය අසා භික්ෂූහු විහාර දෙර සමීපයෙන් යන්නේ නමුත් වෙහෙරට නො පිවිසෙති. මෙසේ නො නොපැමිණියා වූ සිල්වත් සබ්‍රහ්මචාරීහු පැමිණෙන්නාහු ද, වාසය පිණිස පැමිණියා වූ සබ්‍රහ්මචාරීහු මේ නේවාසිකයෝ මේ ආකාරයෙන් කෙරෙත් නම් මෙහි කවරෙකු වසන්නේ ද යැයි සිතා නික්ම යති. මෙසේ ඒ වෙහෙර අන් භික්ෂූන් නොවන්නා වූ තැනක් වෙයි. ඒ හේතුවෙන් නේවාසිකයෝ සිල්වතුන්ගේ දැක්මක් නොලබන්නාහු සැක දුරු කරන්නෙකු හෝ සිරිත් පුරුදු කරන්නෙකු හෝ මිහිරි දහම් ඇසීමක් හෝ නොලබති. නූගත් ධර්‍මයන් ඉගෙනීමක් නොවේ. උගත් දෙය සජ්ඣායනා කිරීමක් ද නොවේ. මෙසේ ඔවුන්ගේ පරිහානිය ම වේ. අභිවෘද්ධියක් නොවේ.

යමෙක් ප්‍රියශීලී සබ්‍රහ්මචාරින් වහන්සේලාගේ පැමිණීම කැමති වෙත් ද, ඔවුහු ශ්‍රද්ධාව ඇත්තෝ වෙති. පැහැදුණෝ වෙති. පැමිණි සබ්‍රහ්මචාරින්ට පෙර ගමන් කිරීමාදිය කොට සෙනසුන් පනවා දෙති, ඔවුන් සමග පිඬු පිණිස හැසිරීමට පිවිසෙති. සැක දුරු කරති. මිහිරි දහම් කථා ඇසීම ලබති. ඒ හේතුවෙන් "අසවල් වෙහෙර වැසි භික්ෂූහු ශ්‍රද්ධාව ඇත්තෝ ය, පැහැදුණෝ ය, වත්ත සම්පන්නයෝ ය, සංග්‍රහ කරන්නෝ ය" යැයි ඔවුන්ගේ යසෝ රාවය පැන නගී. එය අසා භික්ෂූහු දුර සිට ද පැමිණෙති. ඔවුන්ට නේවාසිකයෝ වත් සපයති. සමීපයට ගොස් වැඩිමහලු ආගන්තුකයා හට වැඳ හිඳිත්. නවකතරයා මිටි අසුනක් ගෙන හිඳ මේ වෙහෙර වසන්නහු ද, නැතහොත් යන්නහු ද යැයි අසත්. යන්නෙමු යැයි කී විට සෙනසුන ගැළපෙයි, භික්ෂාව සුලබ ය ආදිය කියා යාමට ඉඩ නො දෙත්. ඉඳින් ඒ ආගන්තුකයා විනය ධරයෙකු වේ නම් ඒ තෙරුන් සමීපයෙහි විනය උගනිත්. සූත්‍රාන්තාදිය දරන්නෙකු වේ නම් ඒ

තෙරුන් සමීපයෙහි ඒ ඒ ධර්‍ම උගනිත්. ඔවුහු ඒ ආගන්තුක තෙරවරුන්ගේ අවවාදයෙහි පිහිටා සිව්පිළි සිඹියාවන් සමග රහත් බවට පැමිණෙති. ආගන්තුක තෙරුන් දින එකක් දෙකක් වසන්නෙමු යැයි සිතා පැමිණියේ වෙත් ද, නේවාසිකයන්ගේ ප්‍රිය සංවාසය හේතුවෙන් දස දෙළොස් වසක් වසන්නෙමු යැයි කියන්නෝ වෙති. ඒ හේතුවෙන් පිරිහීමක් නොවේ. අභිවෘද්ධියක් ම සිදු වේ.

"මහණෙනි, යම් තාක් කල් මේ අපරිහානිය ධර්‍ම සත භික්ෂූන් කෙරෙහි පවත්නාහු ද, භික්ෂූහු මේ අපරිහානිය ධර්‍ම සතෙහි දක්නා ලැබෙත් ද, මහණෙනි ඒ භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

## ☸ දෙවන අපරිහානිය ධර්‍ම සත

මහණෙනි, තවත් අපරිහානිය ධර්‍ම සතක් දේශනා කරන්නෙමි එය අසව්. මනාකොට සිත්හි දරා ගනිව්. කියන්නෙමි යැයි" වදාළ සේක.

එසේ ය භාග්‍යවතුන් වහන්ස, යැයි භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක,

1. **යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ න කම්මාරාමා භවිස්සන්ති න කම්මරතා න කම්මාරාමතමනුයුත්තා, වුඩ්ඪියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, භික්ෂූහු යම් තාක් උද්දේසාදිය හැර සිවුරු කිරීම් ආදි කටයුත්තෙහි පමණක්ම යෙදුණෝ නොවන්නාහු ද, මහණෙනි, ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ මෙහි චීවර පිළිබඳ ව විමසීම, චීවර සැකසීම, චීවර සැකසීම සඳහා අන්‍යයන්ට උපකාර වීම, ඉදි කටු කුලාව, පාත්‍ර ථවිකය, අංසකඩය,

බඳ පටිය, දැලි පිහිය, පාත්‍ර තබන ආධාරකය, පා වහන්, ඉදල්, කොසු ආදිය සෑදීම කර්මාරාමතාවය නම් වේ.

කෙනෙක් වනාහි මේ කටයුතු සඳහා මුළු දවසම ගත කරයි ද එබඳු කටයුතු කර්මාරාමතා නම් වේ.

යමෙක් එම කටයුතු කරන වේලාවෙහි පමණක් එම කටයුතු කරයි ද, උදෙසන වේලාවන්හි දී ඉගෙන ගනී ද, සජ්ඣායනා වේලාවෙහි සජ්ඣායනා කරයි ද, සෑ මිදුල් ආදිය අමදින වේලාවෙහි එම වත් පිළිවෙත් කරයි ද, ධර්ම මනසිකාර කරන වේලාවෙහි මනසිකාර කරයි ද එලෙස කිරීම කර්මාරාමතාවයට අයත් නොවේ.

2. **යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ න භස්සාරාමා භවිස්සන්ති න භස්සරතා න භස්සාරාමතමනුයුත්තා, වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, භික්ෂූහු යම් තාක් කල් භස්සාරාමතාවය නම් වූ ස්ත්‍රී පුරුෂ වර්ණනා ආදීකථාවන්හි, කෙළිකවට කථාවන්හි යෙදුණෝ නොවන්නාහු ද, කථාවෙහි ඇලී විසීමට කැමති නොවන්නාහු ද මහණෙනි, ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ මෙහි යමෙක් ස්ත්‍රී පුරුෂයන් පිළිබඳ වර්ණනා කරමින් රෑ දහවල් ගත කරයි ද, ඔහු දෙඩවීමෙහි අවසානයක් කරන්නෙකු නොවේ. එබඳු කථා භස්සාරාමතාවය නම් වේ.

යමෙකු එබඳු තිරශ්චීන කථාවන්හි නො යෙදෙන්නේ වේ ද, රෑ දහවල් දෙකෙහි ධර්මය කියයි ද, පැන විසඳයි ද ඔහු අල්ප කථා ඇත්තෙකු වේ. එම කථාවෙහි අවසානයක් ඇත්තේ වේ. කුමක් නිසා ද යත්? "මහණෙනි, රැස් වූවා වූ නුඹලා විසින් කළ යුතු කාරණා දෙකක් ඇත. එනම් උතුම් වූ ධර්ම කථාවක් කළ යුතු ය, එසේ නැතිනම් ආර්‍ය්‍ය තෘෂ්ණිම්භාවය නම් වූ පුරුදු කර්මස්ථානයක යෙදිය යුතු ය" යැයි වදාළ බැවිනි.

**3. යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ න නිද්දාරාමා භවිස්සන්ති න නිද්දාරතා න නිද්දාරාමතමනුයුත්තා, වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, භික්ෂූහු යම්තාක් කල් නින්දෙහි බොහෝකොට යෙදුනෝ නොවන්නාහු ද, නිද්‍රාරාමතාවෙහි ඇලී විසීමට කැමති නොවන්නාහු ද, මහණෙනි, ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ මෙහි යමෙක් යන්නේ ද, හුන්නේ ද, හොත්තේ ද ථීනමිද්ධයෙන් මඩනා ලදුව නිදා ගනී ද මෙය නිද්දාරාමතාවය නම් වේ.

යමෙකුගේ කයෙහි ගිලන් බවක් හේතුවෙන් සිත භවාංග ගත වේ ද මෙය නිද්දාරාමතාවය නොවේ.

**4. යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ න සඞ්ගණිකාරාමා භවිස්සන්ති න සඞ්ගණිකරතා න සඞ්ගණිකාරාමතමනුයුත්තා, වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, භික්ෂූහු යම්තාක් කල් ගණසංගණිකාරාමතාව යැයි කියනු ලබන බොහෝ දෙනා හා එක්ව විසීමෙහි යෙදුනෝ වන්නාහු ද, ගණසංගණිකාරාමතාවෙහි ඇලී විසීමට කැමති නොවන්නාහු ද මහණෙනි, ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

මෙහි යමෙක් පළමුවැන්නාට දෙවැන්නා, දෙවැන්නාට තෙවැන්නා, තෙවැන්නාට සිව්වැන්නා යනාදී ලෙස එකට සම්බන්ධව වාසය කරයි ද, එයින් එක අයෙකුවත් පැවිදි කෘත්‍යයෙන් විඳින සතුටක් නො ලබයි. මෙය ගණසංගණිකාරාමතාව නම් වේ. යමෙක් වනාහි සිව් ඉරියව්වෙහි දී ම එකලාව වෙසෙමින් පැවිදි කෘත්‍යයෙහි යෙදී ආස්වාදයක් ලබයි ද එය ගණසංගණිකාරාමතාව නොවේ.

**5. යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ න පාපිච්ඡා භවිස්සන්ති න පාපිකානං ඉච්ඡානං වසං ගතා, වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, භික්ෂූහු යම්තාක් කල් තමා තුළ නැත්තා වූ ගුණ ඇඟවීම් වශයෙන් කරනු ලබන ලාමක වූ පව් අදහස් ඇත්තෝ නොවන්නාහු ද, පවු ලාමක අදහස් ඇත්තෝ නොවන්නාහු ද, මහණෙනි, ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ මෙහි යමෙක් ශ්‍රද්ධාව නැතිව අන්‍යයෝ මම ශ්‍රද්ධාවන්තයෙකු ලෙස දැනගනිත්වා, අල්පශ්‍රැත ව සිට බහුශ්‍රැතයෙකු වශයෙන් මා දැනගනිත්වා, ගණසංගණිකාවෙහි යෙදී සිට අන්‍යයෝ මා විවේකකාමියෙකු ලෙස දැනගනිත්වා, කුසීත ව සිට අන්‍යයෝ මා වීය්‍යීය වන්තයෙකු ලෙස දැනගනිත්වා, සිහියෙන් තොරව සිට අන්‍යයෝ මා එළඹ සිටි සිහි ඇත්තෙකු ලෙස දැනගනිත්වා, අසමාහිත ව සිට අන්‍යයෝ මා සමාහිතයෙකු ලෙස දැනගනිත්වා, අනුවණයෙකු ව සිට අන්‍යයෝ මා නුවණැත්තෙකු ලෙස දැනගනිත්වා, කෙලෙස් අප්‍රහීණ ව සිට අන්‍යයෝ මා ක්ෂීණාශ්‍රවයෙකු ලෙස දැනගනිත්වා යැයි තමා කෙරෙහි නැති ගුණ හඟවයි ද ඔහු පාපිජ්ඡයා නම් වේ.

**6. යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ න පාපිච්ඡා භවිස්සන්ති න පාපිකානං ඉච්ඡානං වසං ගතා, වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, භික්ෂූහු යම්තාක් කල් පාප මිත්‍රයන් ඇත්තෝ නොවන්නාහු ද, පාපී සහායකයන් ඇත්තෝ නොවන්නාහු ද, පාපයන් කෙරෙහි නැමුණු අදහස් ඇත්තෝ නොවන්නාහු ද මහණෙනි, ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ යමෙකුගේ පාප මිත්‍රයෝ සිව් ඉරියව්වෙහි දීම එක්ව නතු වෙමින් පාපයට උදව් කරන්නෝ වෙත් ද, පාපයට නැඹුරු වීමෙන් යොමු වීමෙන් ඒ දෙසට බර වීමෙන් ඇලී ගැලී වෙසෙත් ද ඔවුහු පාප මිත්‍රයෝ, පාප සහායකයෝ, පාපයට නැඹුරු වූවෝ නම් වේ.

7. **යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ න ඔරමත්තකෙන විසෙසාධිගමෙන අන්තරාවොසානං ආපජ්ජිස්සන්ති, වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, භික්ෂූහු යම්තාක් කල් අභීත් ඵලයෙන් මෙහා ස්වල්ප මාත්‍ර වූ ධ්‍යානාදී ගුණයකින් තෘප්තියට නො පැමිණෙන්නාහු ද, මහණෙනි, ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ මෙහි අභීත්වයට නොපැමිණ ඒ අතර තුර සීල පාරිශුද්ධි, ධ්‍යාන, විදර්ශනා දක්වා සසුන් පිළිවෙත් සපුරා සෝවාන් මාර්ගයට හෝ නොපැමිණ නො නවතින්නෙමි යැයි වීර්‍යය කරයි ද එතෙක් භික්ෂූන්ගේ අභිවෘද්ධියම අපේක්ෂා කළ යුතු ය. පරිහානියක් නොවේ.

මහණෙනි, මේ අපරිහානිය ධර්ම සත යම්තාක් කාලයක් භික්ෂූන් කෙරෙහි පවතිත් ද, මේ සත් අපරිහානිය ධර්මයන්හි භික්ෂූන් යෙදෙනු දක්නා ලැබෙත් ද, මහණෙනි, ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

## ☸ තෙවන අපරිහානිය ධර්ම සත

මහණෙනි, තවත් අපරිහානිය ධර්ම හතක් දෙශනා කරන්නෙමි. ඒ අසව්, හොඳින් සිත්හි දරාගනිව්. කියන්නෙමි යැයි" වදළ සේක. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, එසේ ය යැයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය දේශනා කළ සේක.

1. **යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ සද්ධා භවිස්සන්ති වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, භික්ෂූහු යම්තාක් කාලයක් ශ්‍රද්ධා ඇත්තෝ වන්නාහු ද, මහණෙනි, ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ මෙහි ශ්‍රද්ධාව වනාහි ආගම ශ්‍රද්ධාව, අධිගම ශ්‍රද්ධාව, ප්‍රසාද ශ්‍රද්ධාව, ඕකප්පන ශ්‍රද්ධාව යැයි සිව් වැදෑරුම් වේ.
නියත විවරණ ලැබූ බැන් පටන් මහ බෝසතාණන් වහන්සේලාට ලොවුතුරා බුදු බව දක්වා පමුණුවන ශ්‍රද්ධාව **ආගම ශ්‍රද්ධාව** නම් වේ.

ලෝකෝත්තර මඟ ඵල නිවන අවබෝධ කළ ආර්‍ය්‍ය පුද්ගලයන්ට රත්නත්‍රය පිළිබඳ නො වෙනස් වන විශ්වාසය අධිගම ශ්‍රද්ධාව නම් වේ.

රත්නත්‍රය පිළිබඳ ඇති බැසගත් ප්‍රසාදය ප්‍රසාද ශ්‍රද්ධාව නම් වේ.

විශ්වාසයෙන් තෙරුවන් පිළිගැනීම ඕකප්පන ශ්‍රද්ධාව නම් වේ.

මෙම ශ්‍රද්ධාව ලෞකික ලෝකෝත්තර වශයෙන් දෙ වැදෑරුම් වේ.

2. **යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ හිරිමනා භවිස්සන්ති වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, භික්ෂූහු යම්තාක් කාලයක් පව්කිරීමෙහි ලජ්ජා ඇත්තෝ වන්නාහු ද මහණෙනි, ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ මෙහි පාපය පිළිකුල් කිරීම ලක්ෂණ කොට ඇති ලැජ්ජාවෙන් යුත් සිත් ඇති බව හිරිය යි.

3. **යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ ඔත්තප්පී භවිස්සන්ති, වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, භික්ෂූහු යම්තාක් කාලයක් පාපයට භය ඇත්තෝ වන්නාහු ද, මහණෙනි, ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ මෙහි අන්‍යයන් ගේ උපවාදයන්ට ලක් වේය යැයි කයින් වදනින් වැරදි කිරීමට ඇති බිය ඔත්තප්ප නම් වේ.

4. **යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ බහුස්සුතා භවිස්සන්ති, වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, භික්ෂූහු යම්තාක් කාලයක් බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තෝ වන්නාහු ද, මහණෙනි, ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ මෙහි වනාහි පර්‍යාප්ති බහුශ්‍රැත, ප්‍රතිවේධ බහුශ්‍රැත යැයි බහුශ්‍රැතයන් දෙදෙනෙක් වෙති. එහි පර්‍යාප්ති යනු ත්‍රිපිටක බුද්ධ වචනයයි. ප්‍රතිවේධ යනු සත්‍යාවබෝධයයි. මෙහි දී පර්‍යාප්ති බහුශ්‍රැතයා අදහස් කරන ලදි.

මේ පර්‍යාප්ති බහුශ්‍රැතයා ද නිස්සය මුච්චනක බහුශ්‍රැත, පරිසුපට්ඨාපක බහුශ්‍රැත, භික්ඛුනෝවාදක බහුශ්‍රැත, සබ්බත්ථක බහුශ්‍රැත යැයි සතර වැදෑරුම් වේ. එහි

I. **නිස්සය මුච්චනක බහුශ්‍රැත**

ආචාර්‍ය උපාධ්‍යා ඇසුරෙනි නිදහස් වීමට උපසම්පදාවෙන් පස් වසක් සම්පූර්ණ විය යුතු ය. ඒ සඳහා සුදුසුකම අඩුම වශයෙන් භික්ෂු භික්ෂුණී උභය මාතිකා, උභය විභංග දෙක ප්‍රගුණ කොට කටපාඩම් කළ යුතු ය. පක්ෂ දිනයන්හි ධර්ම ශ්‍රවණය කිරීම පිණිස ද, පැමිණෙන සැදැහැවතුන්ට ධර්ම දේශනා කිරීම පිණිස සූත්‍ර පිටකයෙන් සතර

බණ වරක් ද, අන්දකවින්ද සූත්‍රය - මහා රාහුලෝවාද සූත්‍රය - අම්බට්ඨ සූත්‍රය යන මෙයින් එක් කථා මාර්ගයක් උගත යුතු ය. සංඝභත්ත අනුමෝදනා පිණිස නිධිකණ්ඩ සූත්‍රය, ගෘහ ප්‍රවේෂණ මංගල අවස්ථාවන් සඳහා මංගල සූත්‍රය, මතක භත්ත අවමංගල අවස්ථාවන් සඳහා තිරෝකුඩ්ඩ සූත්‍රය ආදී තුනක් ද උගත යුතු ය. උපෝසථ පවාරණාදිය දැන ගැනීම පිණිස කර්මාකර්ම විනිශ්චය උගත යුතු ය. ශ්‍රමණ ධර්ම පූර්ණය පිණිස සමාධි වශයෙන් හෝ විදර්ශනා වශයෙන් එක් කර්මස්ථාන භාවනා මාර්ගයක් අර්හත්වය කෙළවර කොට වඩන සැටි උගත යුතු ය. මෙපමණ බහුශ්‍රැත බවක් ඇති භික්ෂුවට ආචාර්ය්‍ය උපාධ්‍යායන් වහන්සේලාගෙන් වෙන් ව කැමති දිසාවකට ගොස් තමාගේ ඓශ්චර්ය්‍යයෙන් විසිය හැකි ය. මේ නිසෙන් මිදෙන භික්ෂුව සඳහා වූ බහුශ්‍රැත භාවය යි.

## II. පරිසුපට්ඨාපක බහුශ්‍රැත

මේ සඳහා සුදුසුකම් වශයෙන් උපසම්පදාවෙන් දස වසක් සම්පූර්ණ විය යුතු ය. අන්‍යයන් සියලු විනය පිටකයෙහි හික්මවන්නට භික්ෂු භික්ෂුණී විභංග දෙක උගත යුතු ය. කටපාඩම් කළ යුතු ය. එසේ සියල්ල පාඩම් කිරීමට නොහැකි වන්නේ ද තුන් දෙනෙකුන් විසින් පාඩම් කළ හැකි වීම පිණිස කොටස් තුනකට බෙදාගෙන එයින් එක කොටසක් පාඩම් කළ යුතු ය. කර්මාකර්ම විනිශ්චය උගත යුතු ය. දෙවිසි කඳුවත් උගත යුතු ය. පිරිස නාමරූප පරිච්ඡේදයෙහි හික්මවනු පිණිස දීඝනිකාය ප්‍රගුණ කරන්නේ නම් අඩුම වශයෙන් එහි මහා වර්ගය ද, මජ්ඣිම නිකාය ප්‍රගුණ කරන්නේ නම් අඩුම වශයෙන් එහි මූල පණ්ණාසකය ද, සංයුත්ත නිකාය ප්‍රගුණ කරන්නේ නම් අඩුම වශයෙන් එහි සගාථක වර්ගය නිදාන වර්ගය ඛන්ධ වර්ගය සළායතන වර්ගය යන සතර ද, එසේ නොහැකි නම් මුල් වර්ග තුන ද, අංගුත්තර නිකාය ප්‍රගුණ කරන්නේ නම් අඩුම වශයෙන් එයින් මුලින් හෝ අගින් අඩක් ද, එසේ නොහැක්කහු තික නිපාතය තෙක් උගත යුතු ය. එසේත් නොහැකි වන්නන් විසින් චතුෂ්ක නිපාතය හෝ පඤ්චක නිපාතය යන මේ එකක් ප්‍රගුණ කළ යුතු ය. ජාතක ප්‍රගුණ කරන්නේ නම් අර්ථකථා සහිත සියල්ල උගත යුතු ය. ධම්මපදය ප්‍රගුණ කරන්නන් විසින් අර්ථකථා

සහිතව සියල්ල උගත යුතු ය. මේ කියන ලද සීමාවන්ගෙන් අඩුව නො වටී.

III. **භික්ඛුනෝවාදක බහුශ්‍රැත,**

මේ සඳහා අර්ථකථා සහිත ත්‍රිපිටකය ම උගත යුතු ය, එයින් අඩුව නො වටී.

IV. **සබ්බත්ථක බහුශ්‍රැත**

ආනන්ද තෙරුන් මෙන් සියලු දේ පිළිබඳ බහුශ්‍රැත බව ය. මෙහි මේ සබ්බත්ථක බහුශ්‍රැත බව අදහස් කරන ලදි.

5. **යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ ආරද්ධවීරියා භවිස්සන්ති, වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, භික්ෂූහු යම්තාක් කාලයක් පටන් ගත් වීර්‍ය්‍ය ඇත්තෝ වන්නාහු ද, මහණෙනි, ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ මෙහි කායික වීර්‍ය්‍යය ද, චෛතසික වීර්‍ය්‍යය ද අදහස් කරන ලදි.

කායික වීර්‍ය්‍යය යනු කායික වශයෙන් එක්තැන් වීමෙන් තොරව සිව් ඉරියව්හිම ආරම්භ වස්තු අටෙන් එකක් පවත්වා ගැනීම ය.

සිත නොයෙක් ආරම්මණයන්හි හැසිරීමට ඉඩ නොදී අෂ්ට සමාපත්තීන්ගෙන් යමක පිහිටුවා විසීම චෛතසික වීර්‍ය්‍යය යි. තව ද ගමනෙහි දී උපන් ක්ලේශය අන් ඉරියව්වකට පැමිණෙන්නට නොදී ගමනෙහි දී ම දුරු කරයි ද, සිටගෙන සිටින විට දී උපන් ක්ලේශය එම ඉරියව්වෙහි දී ම දුරු කරයි ද, හිඳින විට උපන් ක්ලේශය එම ඉරියව්වෙහි දී ම දුරු කරයි ද, නිදන විට උපන් ක්ලේශය එම ඉරියව්වෙහි දී ම දුරු කරයි ද මෙසේ උපනුපන් තැන්හිදී ම ඒ ක්ලේශයන්ට පහර දීම චෛතසික වීර්‍ය්‍යය නම් වේ.

**6. යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ උපට්ඨිතස්සතී භවිස්සන්ති, වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, භික්ෂූහු යම්තාක් කාලයක් එළඹ සිටි සිහි ඇත්තෝ වන්නාහු ද, මහණෙනි, ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ මෙහි බොහෝ කල් කළ කී දේ සිහි කරයි ද එය එළඹ සිටි සිහිය නම් වේ. මහා ගතිම්බය අභය තෙරුන් ද, දීඝභාණක අභය තෙරුන් ද, ත්‍රිපිටක චූලනාග තෙරුන් ද මෙනි.

මහා ගතිම්බය අභය තෙරුන් වනාහි උත්පත්තියෙන් පස්වෙනි දින මංගල කිරිබතෙහි හොට දමන්නා වූ කවුඩෙකු දැක හුං හුං කියා ශබ්ද කළේ ය. පසු කාලයෙහි ථේර භාවයට පැමිණීමෙන් පසු අන් භික්ෂූන් "ස්වාමීනි, කවද පටන් සිහි කළ හැකි ද යැයි ඇසූ කල්හි උත්පත්තියෙන් පස්වන දින දී කළ හැඬීමේ පටන් සිහි කළ හැකි ය" යැයි වදළේ ය.

දීඝභාණක අභය තෙරුන් උත්පත්තියෙන් නවවන දින මව දරුවා සිප ගන්නෙමි යැයි නැමුණු විට ඇයගේ කෙස් කළඹ කැඩී වැටුණේ ය. එයින් තිඹක් පමණ සමන් පිච්ච මල් දරුවාගේ ඇග මත වැටී වේදනාවට පත් විය. පසුව පැවිදි ව ථේරභාවයට පත් වූ කල්හි  අන් භික්ෂූන් "ස්වාමීනි, කවද පටන් සිහි කළ හැකි ද යැයි ඇසූ කල්හි උත්පත්තියෙන් නවවන දින පටන් සිහි කළ හැකි ය" යැයි වදළේ ය.

ත්‍රිපිටක චූලාභය තෙරුන්ගෙන් අන් භික්ෂූන් "ස්වාමීනි, කවද පටන් සිහි කළ හැකි ද යැයි ඇසූ කල්හි අනුරාධපුර නගරද්වාර සතරින් තුනක් වසා එක් දොරකින් ජනයාට පිටව යාමට සලස්වා ඔබගේ නම කුමක් ද ඔබගේ නම කුමක් ද යැයි අසා දැන සවස ඒ ජනයා එම දොරටුවෙන් ඇතුළට පිවිසෙන විට නැවත නො අසාම

සියල්ලන්ගේ නම් සිහි කළ හැකි ය යැයි වදාළේ ය. මෙලෙස සිහි කළ හැකි බව උපට්ඨිත සතිය නම් වේ.

7. **යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ පඤ්ඤවන්තො භවිස්සන්ති, වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, භික්ෂූහු යම්තාක් කාලයක් නුවණ ඇත්තෝ වෙත් ද, මහණෙනි, ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ මෙහි නුවණැති බව නම් පඤ්චස්කන්ධයෙහි උදය වය (හට ගැනීම බිඳීම) විමසා බලන විදර්ශනා ප්‍රඥාවෙන් යුක්ත වීමයි. තව ද මේ සිහිය හා ප්‍රඥාව යන පද දෙකෙන් ම විදර්ශනා වඩන භික්ෂුව ගේ විදර්ශනාවට අවශ්‍ය සම්මා සතියත් විදර්ශනා ප්‍රඥාවත් කියන ලදි.

මහණෙනි, යම්තාක් කාලයක් මේ අපරිහානිය ධර්ම හත භික්ෂූන් කෙරෙහි පවත්නාහු ද මේ අපරිහානිය ධර්ම හත කෙරෙහි භික්ෂූහු දක්නා ලැබෙත් ද, මහණෙනි, ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

## ☸ සිවුවන අපරිහානිය ධර්ම සත

මහණෙනි, වෙනත් අපරිහානිය ධර්ම හතක් දෙශනා කරන්නෙමි. ඒ ධර්ම හත අසව්, හොඳින් සිතෙහි දරාගනිව්, කියන්නෙමි යැයි" වදාළේය. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, එසේ ය යැයි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය වදාළ සේක.

1. **යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ සතිසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, යම්තාක් කල් භික්ෂූහු සති සංබොජ්ඣංගය වඩන්නාහු ද, ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ බොජ්ඣංග යන මෙහි ලෝකෝත්තර මාර්ගයට පැමිණෙන අවස්ථාවෙහි එය හා බැඳී පවත්නා වූ සතිය, ප්‍රඥාව, වීර්යය, ප්‍රීතිය, සන්සිඳීම, සමාධිය, උපේක්ෂාව යන ධර්ම සත සිතෙහි හැකිළෙන බව හෙවත් ථීනමිද්ධය, සෙලවෙන බව, රැස් කරන බව, කාමසුඛල්ලිකානුයෝගය, අත්ථකිලමතානුයෝගය, උච්ඡේද, ශාශ්වත යන මේ උපද්‍රවයන් දුරු කරමින් මනාව සත්‍යාවබෝධයට උපකාර වන බැවින් "**බෝධි**" නම් වේ. ඒ බෝධි නම් වූ ධර්ම සමූහයෙහි අංග "**බොජ්ඣංග**" නම් වේ.

මෙහි සිහියම සම්බොජ්ඣංගයක් වූයේ සති සම්බොජ්ඣංගය නම් වේ. වැටහීම සති සම්බොජ්ඣංගයෙහි ලක්ෂණය යි.

සතිසම්බොජ්ඣංගය වැඩීමට සිහිය නුවණ ඇති බව, සිහියෙන් තොර පුද්ගලයන් ඇසුරෙන් දුරු කිරීම, සිහි ඇති පුද්ගලයන් ඇසුරු කිරීම, සති සම්බෝජ්ඣංගයට නැමුණු සිත් ඇති බව යන ධර්ම සතර වැඩිදියුණු කළ යුතු ය.

2. **ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, යම්තාක් කල් භික්ෂූහු ධම්මවිචය සංබොජ්ඣංගය වඩන්නාහුද, මහණෙනි, ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ ප්‍රඥා චෛතසිකය ධම්මවිචය නම් වේ. සෙවීම ධම්මවිචය සම්බොජ්ඣංගයෙහි ලක්ෂණය යි.

ධම්මවිචය සම්බොජ්ඣංගය වැඩීමට පඤ්චස්කන්ධ, ධාතු, ආයතන ආදී ධර්මයන් පිළිබඳ ව ප්‍රශ්න විචාරන බව, ආධ්‍යාත්මික බාහිර

පිරිසුදු බව, ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් සම කර ගැනීම, නුවණ නැති පුද්ගලයන් ඇසුරු නොකිරීම, නුවණ ඇති පුද්ගලයන් ඇසුරු කිරීම, පඤ්චස්කන්ධාදී ධර්මයන්හි පැවති ප්‍රඥා ප්‍රභේදයන් සිහි කිරීම, ධම්මවිචය සම්බෝජ්ඣංගයට නැමුණු සිත් ඇති බව යන ධර්ම සත වැඩිදියුණු කළ යුතු ය.

3. **වීරියසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, යම්තාක් කල් භික්ෂූහු විරිය සංබොජ්ඣංගය වඩන්නාහු ද, මහණෙනි, ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ නැඟී සිටීම විරිය සම්බොජ්ඣංගයෙහි ලක්‍ෂණය යි.

විරිය සම්බොජ්ඣංගය වැඩීමට අපාය භය සිහි කිරීම, වීර්‍ය්‍යයෙහි ආනිශංස දැකීම, බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලාගේ ගමන් මග සිහි කිරීම, සැදැහැතියන් විසින් පුදන ප්‍රත්‍යයන්ට ගරු කිරීම, ධර්ම දායාදය සිහි කිරීම, ශාස්තෘ මහන්තතාවය සිහි කිරීම, "මම භාග්‍යවතුන් වහන්සේගේ ඖරස පුත්‍ර වූ රාහුල තෙරුන්ගේ / කුමාරයන්ගේ සොහොයුරෙකි" යනාදී ලෙස ජාති මහන්තතාවය සිහි කිරීම, සැරියුත් මුගලන් මහ රහතන් වහන්සේලා වැනි සබ්‍රහ්මචාරී (එක්ව ගුණ පුරන්නන්ගේ) ගුණ මහන්තතාවය සිහි කිරීම, අලස පුද්ගලයන් දුරු කිරීම, වීර්‍ය්‍යවන්ත පුද්ගලයන් ඇසුරු කිරීම, වීර්‍ය්‍ය සම්බොජ්ඣංගයට නැමුණු සිත් ඇති බව යන කරුණු එකොළොස දියුණු කළ යුතු ය.

4. **පීතිසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, යම්තාක් කල් භික්ෂූහු ප්‍රීති සංබොජ්ඣංගය වඩන්නාහු ද, මහණෙනි, ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ පැතිර සිටීම ප්‍රීති සම්බොජ්ඣංගයෙහි ලක්‍ෂණය වේ.

ප්‍රීති සම්බොජ්ඣංගය වැඩීමට බුදුගුණ මෙනෙහි කිරීම, දහම් ගුණ මෙනෙහි කිරීම, සඟ ගුණ මෙනෙහි කිරීම, තමාගේ සීල ගුණය මෙනෙහි කිරීම, තමාගේ ත්‍යාග ගුණය මෙනෙහි කිරීම, දේවත්වයට හේතුවන තමාගේ ශ්‍රද්ධාදී ගුණ මෙනෙහි කිරීම, තමාගේ සන්සුන් කෙලෙසුන් මෙනෙහි කිරීම, රළු පුද්ගලයන් ඇසුරු නොකිරීම, මෘදු මොලොක් පුද්ගලයන් ඇසුරු කිරීම, ප්‍රීති සම්බොජ්ඣංගයට නැමුණු සිත් ඇති බව යන කරුණු එකොළොස දියුණු කළ යුතු ය.

**5. පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, යම්තාක් කල් භික්‍ෂූහු පස්සද්ධි සංබොජ්ඣංගය වඩන්නාහුද, මහණෙනි, ඒ තාක් භික්‍ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ චිත්ත චෛතසික ධර්‍ම සන්සිඳවීම පස්සද්ධි සම්බොජ්ඣංගයෙහි ලක්‍ෂණය වේ.

පස්සද්ධි සම්බොජ්ඣංගය වැඩීමට ප්‍රණීත භෝජන වැළඳීම, කායික සුවය ලැබෙන ඍතු ගුණ සේවනය කිරීම, සැප වූ ඉරියව් සේවනය කිරීම, සැප දුක් ආදියෙහි මධ්‍යස්ථ බව පුරුදු කිරීම, නොසන්සුන් ඉරියව් ඇති පුද්ගලයන් දුරු කිරීම, සන්සුන් ඉරියව් ඇති පුද්ගලයන් ඇසුරු කිරීම, පස්සද්ධි සම්බොජ්ඣංගයට නැමුණු සිත් ඇති බව යන කරුණු සත දියුණු කළ යුතු ය.

**6. සමාධිසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, යම්තාක් කල් භික්ෂූහු සමාධි සංබොජ්ඣංගය (බොධියට අංගවූ සමාධිය) වඩන්නාහුද, මහණෙනි, ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ චිත්ත චෛතසික ධර්‍මයන්ගේ විසිර නො යාම සමාධි සම්බොජ්ඣංගයෙහි ලක්‍ෂණය වේ.

සමාධි සම්බොජ්ඣංගය වැඩීමට අභ්‍යන්තර බාහිර වස්තූන් පිරිසිදු කර ගැනීම, ශ්‍රද්ධා දී ඉඳුරන් සමව පවත්වා ගැනීම, කසිණාදී භාවනාරම්මණයන්හි නිමිති සිතට ගැනීමෙහි සමත් බව, සිතට අනුබල දීමට සුදුසු අවස්ථාවෙහි අනුබල දීම, චිත්ත වේගය අඩු කළ යුතු අවස්ථාවෙහි චිත්ත වේගය අඩු කිරීම, සිත සතුටු කළ යුතු අවස්ථාවෙහි සිත සතුටු කිරීම, සිත භාවනාරම්මණයෙහි මධ්‍යස්ථ ව පවත්නා විට සිත ගැන මධ්‍යස්ථ වීම, අසමාහිත පුද්ගලයන් දුරු කිරීම, සමාහිත පුද්ගලයන් ඇසුරු කිරීම, ධ්‍යාන මාර්‍ග ඵල ධර්‍මයන් මෙනෙහි කිරීම, සමාධි සම්බොජ්ඣංගයට නැමුණු සිත් ඇති බව යන කරුණු එකොළොස දියුණු කළ යුතු ය.

7. **උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙස්සන්ති, වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, යම්තාක් කල් භික්ෂූහු උපෙක්ඛා සංබොජ්ඣංගය වඩන්නාහුද, මහණෙනි, ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ නුවණින් සලකා බැලීම උපේක්‍ෂා සම්බොජ්ඣංගයෙහි ලක්‍ෂණය යි.

උපේක්‍ෂා සම්බොජ්ඣංගය වැඩීමට සත්වයන් කෙරෙහි මැදහත් වීම, සංස්කාරයන් කෙරෙහි මැදහත් වීම, සත්ව සංස්කාරයන් සුරතල් කරන අති ලෝභීන්ගෙන් වෙන්වීම, සත්වයන් හා සංස්කාරයන් කෙරෙහි මධ්‍යස්ථ පුද්ගලයන් ඇසුරු කිරීම, උපේක්‍ෂා සම්බොජ්ඣංගයට නැමුණු සිත් ඇති බව යන කරුණු පස දියුණු කළ යුතු ය.

මහණෙනි, යම්තාක් කල් මේ අපරිහානිය ධර්‍ම හත භික්‍ෂූන් කෙරෙහි පවත්නාහු ද, මේ අපරිහානිය ධර්‍ම හත කෙරෙහි භික්‍ෂූහු දක්නා ලැබෙත් ද, මහණෙනි, ඒ තාක් භික්‍ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

## ☸ පස්වන අපරිහානිය ධර්‍ම සත

මහණෙනි, වෙනත් අපරිහානිය ධර්‍ම හතක් දෙශනා කරන්නෙමි. ඒ ධර්‍ම හත අසව්, හොඳින් සිතෙහි දරාගනිව්, කියන්නෙමි යැයි" වදළේය. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, එසේ ය යැයි ඒ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ ධර්‍මය වදාළ සේක.

1. **යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ අනිච්චසඤ්ඤං භාවෙස්සන්ති වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

   මහණෙනි, භික්‍ෂූහු යම්තාක් අනිත්‍ය සංඥාව වඩන්නාහු ද, මහණෙනි, ඒ තාක් භික්‍ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ කාම රූප අරූප ත්‍රෛභූමික සංස්කාරයන්හි මුල අග දෙකෙළවර ඇති බැවින් ද, නිති නො පවත්නා බැවින් ද, කල් නො පවත්නා බැවින් ද, ඇසිල්ලක් ම පවත්නා බැවින් ද, නිත්‍ය නොවන බැවින් ද අනිත්‍යය යනුවෙන් අනුපස්සනා කිරීම අනිත්‍ය සඤ්ඤාව නම් වේ.

2. **අනත්තසඤ්ඤං භාවෙස්සන්ති වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

   මහණෙනි, භික්‍ෂූහු යම්තාක් අනාත්ම සංඥාව වඩන්නාහු වෙත් ද, මහණෙනි, ඒ තාක් භික්‍ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

- ❖ නිර්වාණය හා ප්‍රඥප්ති ධර්ම සියල්ලම ද, සියලු සංස්කාර ධර්මයෝ ද ආත්ම ස්වභාවයෙන් තොරය යැයි දැකීම අනාත්ම ලක්‍ෂණය යි.

**3. අසුභසඤ්ඤං භාවෙස්සන්ති වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, භික්‍ෂූහු යම්තාක් අසුභ සංඥාව වඩන්නාහු වෙත් ද, මහණෙනි, ඒ තාක් භික්‍ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

- ❖ උද්ධුමාතක, විනීලක, විපුබ්බක, විච්ඡිද්දක, වික්ඛායිතක, වික්ඛිත්තක, හතවික්ඛිත්තක, ලෝහිතක, පුලවක, අට්ඨික යන මෘත ශරීරයක් අරමුණු කොට එහි ඇති අසුභ ස්වභාවය භාවනා වශයෙන් වඩා ප්‍රථම ධ්‍යානය ලැබීම අසුභ සඤ්ඤාව වැඩීම නම් වේ.

**4. ආදීනවසඤ්ඤං භාවෙස්සන්ති වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, භික්‍ෂූහු යම්තාක් ආදීනව සංඥාව (සංස්කාරයන්ගේ දෙස් දැකීම) වඩන්නාහු වෙත් ද, මහණෙනි, ඒ තාක් භික්‍ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

- ❖ පඤ්ච උපාදානස්කන්ධයෙහි ඇති අනේක විධ ආදීනව විදර්ශනා නුවණින් දැකීම ආදීනවානුපස්සනා ඤාණය උපදවා ගැනීම ආදීනව සඤ්ඤාව නම් වේ.

**5. පහානසඤ්ඤං භාවෙස්සන්ති වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, භික්‍ෂූහු යම්තාක් ප්‍රහාණ සඤ්ඤාව (කාම විතර්ක, ව්‍යාපාද විතර්ක, විහිංසා විතර්ක ප්‍රහාණය) වඩන්නාහු වෙත් ද, මහණෙනි, ඒ

තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ සිතෙහි හටගන්නා කාම විතර්ක ව්‍යාපාද විතර්ක විහිංසා විතර්කයන්ට සිත තුළ පවතින්නට ඉඩ නොදී බැහැර කිරීම ප්‍රහාණ සඤ්ඤව නම් වේ.

**6. විරාගසඤ්ඤං භාවෙස්සන්ති වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, භික්ෂූහු යම්තාක් විරාග සංඥව (භවයෙහි නොඇලීම) වඩන්නාහු වෙත් ද, මහණෙනි, ඒ තාක් භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු ය. පිරිහීමක් කැමති නොවිය යුතු ය.

❖ සියලු සංස්කාර ධර්මයන් සන්සිඳීම, සියලු උපධීන් දුරලීම, තෘෂ්ණාව ක්ෂය කිරීම විරාග සඤ්ඤව නම් වේ. තදංග විරාගය, විෂ්කම්භන විරාගය, සමුච්ඡේද විරාගය, පටිප්පස්සද්ධි විරාගය, නිස්සරණ විරාගය යැයි විරාග පසකි. එහි :-

විදර්ශනා භාවනාව වඩන්නහුගේ සිතෙහි දිට්ඨීන්ගේ ප්‍රහාණය තදංග විරාගය යි. ප්‍රථම ධ්‍යානය වඩන්නහුගේ සිතෙහි නීවරණ පහ වීම විෂ්කම්භන විරාගය යි. සෝවාන් ආදී ලෝකෝත්තර මාර්ගයන්ගෙන් සහ මුලින් කෙලෙසුන් පහ වීම සමුච්ඡේද විරාගය යි. සෝවාන් ආදී ලෝකෝත්තර ඵලක්ෂණයෙහි ක්ලේශ බරින් මිදුණු සුවය පටිප්පස්සද්ධි විරාගය යි. සියලු කෙලෙසුන්ගෙන් නිදහස් වුණු සියලු සංස්කාරයන්ගෙන් වෙන්වුණු නිවන නිස්සරණ විරාගය යි.

**7. නිරොධසඤ්ඤං භාවෙස්සන්ති, වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

නිරොධ සංඥව (සංස්කාරයන්ගේ නැතිවීම දැකීම) වඩන්නාහු වෙත් ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ වැඩි දියුණුවක් ම කැමති විය යුතු පිරිහීමක් නොවේ ය යැයි” වදාළ සේක.

❖ නිවනෙහි ගුණ අරමුණු කොට වඩන උපසමානුස්සති භාවනාව නිරෝධ සඤ්ඤාව යි.

මහණෙනි, යම්තාක් කල් මේ හත් ආකාර අපරිහානිය ධර්මයෝ භික්ෂූන් කෙරෙහි පවත්නාහුද මේ හත් ආකාර අපරිහානිය ධර්මයන් කෙරෙහි භික්ෂූහු දක්නා ලැබෙත්ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ වැඩිදියුණුවම කැමති විය යුතුයි. පිරිහීමක් නොවේ ය යැයි" වදාළ සේක.

## ☸ සයවන අපරිහානිය ධර්ම සය

"මහණෙනි, වෙනත් අපරිහානිය ධර්ම සයක් දෙශනා කරන්නෙමි. ඒ ධර්ම සය අසව්, හොඳින් සිතෙහි දරාගනිව්, කියන්නෙමි යැයි" වදාළේය. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, එසේ ය යැයි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය වදාළ සේක.

1. **යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ මෙත්තං කායකම්මං පච්චුපට්ඨාපෙස්සන්ති සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච, වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

   මහණෙනි, යම්තාක් කල් භික්ෂූහු සබ්‍රහ්මචාරීන් වහන්සේලා කෙරෙහි ඇති තැන ද, නැති තැන ද මෛත්‍රියෙන් යුත් කාය කර්ම (කයේ පැවතුම්) ඇතිව වෙසෙන්නාහු ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ වැඩිදියුණුව කැමති විය යුතුයි. පිරිහීමක් නොවේ ය යැයි" වදාළ සේක.

❖ මෛත්‍රී සිතින් කළ යුතු කායකර්ම මෙහි කියවේ. මෙය භික්ෂූන් වහන්සේ විසින් කළ යුතු වූ කාය කර්ම හා ගිහි පින්වතුන් විසින් කළ යුතු කාය කර්ම වශයෙන් දෙ වැදෑරුම් වේ.

## භික්ෂූන් වහන්සේ විසින් කළ යුතු මෛත්‍රී කාය කර්ම

භික්ෂූන් වහන්සේ විසින් වැඩිමහලු තෙරුන් වහන්සේලා හමුවෙහි පා සේදීම, පවන් සැලීම, දී පාත්‍ර චීවර සෝද දීම, පඬු තම්බා දීම සිවුරු පඬු පෙවීම, පානීය පරිභෝජනීය පැන් එළවා තැබීම වැඩිමහලු තෙරුන් වහන්සේලාට කරගත නොහැකි වැඩ කර දීම ද, තනිව කළ නොහැකි කටයුතුවලට සහාය වීම ද, ගිලන් වූ විට උපස්ථාන කිරීම ආදී වූ නිවැරදි කටයුතු මෙත් සිතින් සම්පූර්ණ කර දීම මෛත්‍රී කායකර්ම පැවැත්වීමයි. තමාට වයසින් බාල අය සඳහා ද මෙසේ ම ය. එසේම මහාවග්ග පාලි චුල්ලවග්ග පාලි දෙවිසි ඛන්ධකයන්හි ආවා වූ සියලු ආභිසමාචාරික වත් සපිරීම මෙහි ඇතුළත් වේ.

එසේම වැඩිමහලු තෙරුන් වහන්සේලා හා අන් සබ්‍රහ්මචාරින් වහන්සේලා සමීපයෙහි නැති විට දී වැරදි ලෙස තබන ලද දූව භාණ්ඩාදිය අවමන් නොකර තමන් විසින් වැරදි ලෙස තැබූවක් මෙන් සලකා නිවැරදි තැන තැබීම ආදී කටයුතු සොයා බලා සිදු කිරීම  අසම්මුඛයෙහි මෛත්‍රී කාය කර්ම පැවැත්වීමයි.

## ගිහි පින්වතුන් විසින් කළ යුතු මෛත්‍රී කායකර්ම

චෛත්‍ය බෝධිය වන්දනාදියට හා සංඝෝපස්ථානාදියට සමගියෙන් සහභාගී වීම, ගමට පිඬු සිඟා වඩින භික්ෂූන් වහන්සේට පෙර ගමන් කිරීම, පාත්‍රය පිළිගැනීම, අසුන් පැනවීම, ගෞරව සම්ප්‍රයුක්ත ව දන් බෙදීම, පසු ගමන් කිරීමාදිය ගිහි පින්වතුන් විසින් කළ යුතු මෛත්‍රී කාය කර්ම නම් වේ.

**2. යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ මෙත්තං වචීකම්මං පච්චුපට්ඨාපෙස්සන්ති වුඩ්ඪියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, යම්තාක් කල් භික්ෂූහු සබ්‍රහ්මචාරීන් වහන්සේලා කෙරෙහි ඇති තැන ද නැති තැන ද මෛත්‍රියෙන් යුත් වචන

කියන්නාහු ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ වැඩි දියුණුව කැමති විය යුතුයි පිරිහීමක් නොවේ ය යැයි" වදාළ සේක.

**භික්ෂූන් වහන්සේ විසින් කළ යුතු මෛත්‍රී වාක්කර්ම**

වැඩිමහලු තෙරුන් වහන්සේලා හා බාල අය ඇති තැන දී මෙන්ම නැති තැන දී ද අපගේ අසවල් තෙරුන් වහන්සේ නැවත කවදා මෙහි වඩින්නෙහි ද යනාදී ලෙස සුදුසු ගෞරවය දී කථා කිරීම ද, මෛත්‍රියෙන් වත් පිළිවෙත් ආදී ආචාර පැනවීම, ධර්ම විනය ඉගැන්වීම, භාවනා කර්මස්ථාන කියා දීම, ධර්ම දේශනා කිරීමාදිය මෛත්‍රී වචී කර්ම පැවැත්වීම යි.

**ගිහි පින්වතුන් විසින් කළ යුතු මෛත්‍රී වාක්කර්ම**

චෛත්‍ය වන්දනාවට යමු, බෝධි වන්දනාවට යමු, බණ ඇසීමට යමු, මල් පහන් පූජාවට යමු, තුන් සුචරිතය සමාදන් වෙමු, සලාක දානය දෙමු, වස්සාවාසික පිරිකර පූජා කරමු, මහා සංඝයාට සිවුපස දානය දෙමු යනාදිය කීම ද, ඒ සඳහා භික්ෂු සංඝයාට ආරාධනා කරන්න, දාන සංවිධානය කරන්න, ආසන පනවන්න, පැන් පහසුව සලස්වන්න, ඉතා කැමැත්තෙන් උත්සාහයෙන් ගොස් වතාවත් කරන්න යනාදියට අණ කිරීම මෛත්‍රී වාක්කර්ම පැවැත්වීම යි.

3. **යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ මෙත්තං මනොකම්මං පච්චුපට්ඨාපෙස්සන්ති සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච, වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, යම්තාක් කල් භික්ෂූහු සබ්‍රහ්මචාරීන් වහන්සේලා කෙරෙහි ඇති තැන ද නැති තැන ද මෛත්‍රී සිත් ඇතිව සිටින්නාහු ද ඒ භික්ෂූන්ගේ වැඩිදියුණුව කැමති විය යුත්තේ ය. පිරිහීමක් නොවේ ය යැයි" වදාළ සේක.

❖ භික්ෂූන් වහන්සේ විසින් උදෑසන අවදි වී සිරුර පිළිදැගුම් කොට සෑ මළු බෝ මළු වතාවත් කොට විවේක සෙනසුනකට ගොස් මේ

විහාරයෙහි වෙසෙන භික්ෂූන් වහන්සේලා සැපවත් වෙත්වා, අවෛරී වෙත්වා, ව්‍යාපාද නැත්තෝ වෙත්වා යැයි භික්ෂු සංඝයා උදෙසා මෙත් කිරීම ද, විහාර සීමාව අවට වෙසෙන ගම් ප්‍රධානීන් ද, ගම් වාසීන් ද සැපවත් වෙත්වා, අවෛරී වෙත්වා, ව්‍යාපාද නැත්තෝ වෙත්වා යැයි ද, විහාර සීමාවට අධිගෘහිත දේවතාවෝ සැපවත් වෙත්වා, අවෛරී වෙත්වා, ව්‍යාපාද නැත්තෝ වෙත්වා යැයි ද මෙත් කිරීම මෛත්‍රී මනඃකර්‍ම පැවැත්වීම යි.

4. **යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ, යෙ තෙ ලාභා ධම්මිකා ධම්මලද්ධා අන්තමසො පත්තපරියාපන්නමත්තම්පි තථාරූපෙහි ලාභෙහි අප්පටිවිභත්තභොගී භවිස්සන්ති සීලවන්තෙහි සබ්‍රහ්මචාරීහි සාධාරණභොගී, වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, යම්තාක් කල් භික්ෂූහු යටත් පිරිසෙයින් තම පාත්‍රයට ලැබුණු ආහාර සුවල්පයේ පටන් දැහැමින් ලබන ලද ධාර්මික ලාභ වෙත් ද, සිල්වත් වූ එකට මහණ දම් පුරණ සබ්‍රහ්මචාරින් වහන්සේලා සමග සාධාරණව බෙදහද ප්‍රයෝජන ගන්නෝ වන්නාහු ද, ඒ භික්ෂූන්ගේ වැඩිදියුණුව කැමති විය යුතුයි. පිරිහීමක් නොවේ ය යැයි" වදාළ සේක.

❖ භික්ෂූන් වහන්සේට ධාර්මික ව ලැබුණු චීවරාදී පරිෂ්කාරාදිය ද, පිඬු සිඟා යෑමෙන් ලත් හැඳි දෙකක් තුනක් පමණ වූ ආහාරය ද පුද්ගල භේදයකින් තොරව ප්‍රමාණ භේදයකින් තොරව බෙද දී පරිභෝග කිරීම ද, ලාභාපේක්ෂාවකින් තොරව ගිහි පින්වතුන්ට පිරිනැමීම ද සාධාරණව බෙද හද දී වැළඳීම නම් වේ.

5. **යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ යානි තානි සීලානි අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි භුජිස්සානි විඤ්ඤූපසත්ථානි අපරාමට්ඨානි සමාධිසංවත්තනිකානි තථාරූපෙසු සීලෙසු සීලසාමඤ්ඤගතා විහරිස්සන්ති සබ්‍රහ්මචාරීහි ආවි චෙව රහො ච, වුද්ධියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, භික්ෂූහු යම්තාක් කල් කඩ නොවූ, සිදුරු නොවූ, කැලැල් නොවූ, තෘෂ්ණා දසත්වයෙන් මිදුණු, නුවණැතියන්ගේ ප්‍රසංශාව ලැබීමට සුදුසු වූ, තෘෂ්ණා දෘෂ්ටීන්ගෙන් නො බැඳුණු, සමාධිය පිණිස පවත්නා වූ යම් සීලයක් වේ ද, එබඳු සීලයෙන් යුතුව සබ්‍රහ්මචාරීන් වහන්සේලා ඇති තැන දී ද නැති තැන දී ද සම සිතින් වාසය කරන්නාහු ද ඒ භික්ෂූන්ගේ වැඩිදියුණුව කැමති විය යුතුයි. පිරිහීමක් නොවේ ය යැයි" වදාළ සේක.

❖ ලාභ කීර්ති ප්‍රශංසා ධන ඥාති පරිවාර ශරීරාවයව ජීවිතාදී කිසිඳු හේතුවක් නිසාවත් නොබිඳ සිල් රැකීම ද, යම් හේතුවකින් සිල් බිඳුණේ නම් වහාම එය සමාදන් ව ආයති සංවරයෙහි පිහිටීම ද, ක්‍රෝධය, බද්ධ වෛරය, ගුණමකු බව, උසස් ගුණවතුන් හා තමන් සම කිරීම, අන්‍යයන්ට ලැබෙන කීර්ති ප්‍රශංසා නොයිවසීම, තමන් ළඟ ඇති ගුණධර්ම හෝ පරිභෝග වස්තූන් අනුන්ට නොදීම, තම අගුණ සැඟවීම, තමා තුළ නැති ගුණ පෙන්වීම, දරදඬුබව, එකට එක කිරීම, මානය, දැඩි මානය, සත්විසි මදය, ප්‍රමාදය යන පාප ධර්මයන්ගෙන් තොරව "අඛණ්ඩ, අඡිද්‍ර, අසබල, අකල්මාස, භුජිස්ස, විඤ්ඤූපසත්ථ, අපරාමට්ඨ, සමාධිසංවත්තනික" වශයෙන් ගෞරව සම්ප්‍රයුක්ත ව සීල විපත්තියෙහි ආදීනව හා සීල සම්පත්තියෙහි ආනිශංස සලකා මනා ගෞරවයෙන් සිල් රැකීම සමාධිය පිණිස පවත්නා යම් සීලයක් ඇත්තේ ද එවැනි සීලයෙන් සමානව සබ්‍රහ්මචාරීන් වහන්සේලා සමග ඇති තැන ද නැති තැන ද වාසය කිරීම මෙහි කියන ලදි.

එහි මුල හෝ අග ශික්ෂාපද නොබිඳ රැකීම "**අඛණ්ඩ**" නම් වේ. මැදින් සිකපද නොබිඳ රැකීම "**අච්ද්‍ර**" නම් වේ. එක පිළිවෙළට සිකපද නොබිඳ රැකීම "**අසබල**" නම් වේ. තැනින් තැනින් සිකපද නොබිඳ රැකීම "**අකල්මාස**" නම් වේ. ඉහත කී අංගයන්ගෙන් යුත් සීලය තෘෂ්ණා දසත්වයෙන් නිදහස් කරවන බැවින් "**භුජිස්ස**" නම් වේ. එබඳු සීලයම බුදු පසේ බුදු මහරහත් ආදී උතුමන්ගේ ප්‍රශංසාවට ලක්වන බැවින් "**විඤ්ඤූපසත්ථ**" නම් වේ. එබඳු වූ සීලය මම මගේ යැයි තණ්හා දිට්ඨි වශයෙන් නොගන්නා බැවින් "**අපරාමට්ඨ**" නම් වේ. එසේ වූ සීලය උපචාර සමාධි අර්පණා

සමාධි විදර්ශනා ඥාන උපදවාලීමට සමත් බැවින් "**සමාධිසංවත්තනික**" නම් වේ.

**6. යාවකීවඤ්ච භික්ඛවෙ, භික්ඛූ යායං දිට්ඨි අරියා නියයානිකා, නියයාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයාය, තථාරූපාය දිට්ඨියා දිට්ඨිසාමඤ්ඤගතා විහරිස්සන්ති සබ්‍රහ්මචාරීහි ආවි චෙව රහො ච, වුඩ්ඪියෙව, භික්ඛවෙ, භික්ඛූනං පාටිකඞ්ඛා, නො පරිහානි.**

මහණෙනි, ආයාර්‍ය්‍ය වූ (නිදෙස් වූ) නෛර්‍ය්‍යාණික වූ, සම්‍යක් දෘෂ්ටියක් වේ ද, යමෙක් ඒ මනා සම්‍යක් දෘෂ්ටියෙන් යුක්ත ව දුක් නැති කිරීමට පැමිණේ ද, භික්ෂූහු යම්තාක් එසේ වූ සම්මා දෘෂ්ටියෙන් සබ්‍රහ්මචාරීන් හමුවෙහිත් නො හමුවෙහිත් සම්මා දෘෂ්ටියෙන් සමාන බවට පැමිණ වසන්නාහු වෙත් ද, මහණෙනි, ඒ තාක් භික්ෂූන්ගේ වැඩිදියුණුවම කැමති විය යුතුයි. පිරිහීමක් නොවේ ය යැයි" වදාළ සේක.

❖ සෝවාන් ආදී මාර්ගයන් සමග උපන් නෛර්‍ය්‍යානික වූ නිදෙස් වූ කියන ලෙස කරන, කරන ලෙස කියන, නාම රූප පඤ්චෝපාදනස්කන්ධ සය වැදෑරුම් වූ ද දෙළොස් වැදෑරුම් වූ ද ආයතන, පටිච්ච සමුප්පාද, සූවිසි ප්‍රත්‍යයන් පිළිබඳ ව එක හා සමාන දර්ශනයක් ඇති සම්‍යක් දර්ශනය මෙහි කියන ලදි.

මහණෙනි, යම්තාක් කල් මේ සය ආකාර අපරිහානිය ධර්මයෝ භික්ෂූන් කෙරෙහි පවත්නාහු ද මේ හත් ආකාර අපරිහානිය ධර්මයන් කෙරෙහි භික්ෂූහු දක්නා ලැබෙත්ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ වැඩි දියුණුවම කැමති විය යුතුයි. පිරිහීමක් නොවේ ය යැයි වදාළ සේක.

# ❄ මහා ආයර්‍ය්‍යවංස ප්‍රතිපදාව

## ☸ ආයර්‍ය්‍යවංස සූත්‍ර පාලිය

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි ''භික්ඛවො''ති. ''භදන්තෙ''ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච.

චත්තාරො'මෙ, භික්ඛවෙ, අරියවංසා අග්ගඤ්ඤා රත්තඤ්ඤා වංසඤ්ඤා පොරාණා අසංකිණ්ණා අසංකිණ්ණපුබ්බා, න සංකීයන්ති න සංකීයිස්සන්ති, අප්පටිකුට්ඨා සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි. කතමෙ චත්තාරො?

ඉධ, භික්ඛවෙ, භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන චීවරෙන, ඉතරීතරචීවරසන්තුට්ඨියා ච වණ්ණවාදී, න ච චීවරහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති, අලද්ධා ච චීවරං න පරිතස්සති, ලද්ධා ච චීවරං අගථිතො අමුච්ඡිතො අනජ්ඣොසන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති, තාය ච පන ඉතරීතරචීවරසන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති, නො පරං වම්භෙති. යො හි තත්‍ථ දක්ඛො අනලසො සම්පජානො පතිස්සතො, අයං වුච්චති, භික්ඛවෙ, භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො.

පුනචපරං, භික්ඛවෙ, භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන පිණ්ඩපාතෙන, ඉතරීතරපිණ්ඩපාතසන්තුට්ඨියා ච වණ්ණවාදී, න ච පිණ්ඩපාතහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති, අලද්ධා ච පිණ්ඩපාතං න පරිතස්සති, ලද්ධා ච පිණ්ඩපාතං අගධිතො අමුච්ඡිතො අනජ්ඣොසන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති, තාය ච පන ඉතරීතරපිණ්ඩපාතසන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති, නො පරං වම්භෙති. යො හි තත්‍ථ දක්ඛො අනලසො සම්පජානො පතිස්සතො, අයං වුච්චති, භික්ඛවෙ, භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො.

පුනචපරං, භික්ඛවෙ, භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන සෙනාසනෙන, ඉතරීතරසෙනාසනසන්තුට්ඨියා ච වණ්ණවාදී, න ච සෙනාසනහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති, අලද්ධා ච සෙනාසනං න පරිතස්සති, ලද්ධා ච සෙනාසනං අගධිතො අමුච්ඡිතො අනජ්ඣොසන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති, තාය ච පන ඉතරීතරසෙනාසනසන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති, නො පරං වම්භෙති. යො හි තත්ථ දක්ඛො අනලසො සම්පජානො පතිස්සතො, අයං වුච්චති, භික්ඛවෙ, භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො.

පුනචපරං, භික්ඛවෙ, භික්ඛු භාවනාරාමො හොති භාවනාරතො, පහානාරාමො හොති පහානරතො, තාය ච පන භාවනාරාමතාය භාවනාරතියා පහානාරාමතාය පහානරතියා නෙවත්තානුක්කංසෙති, නො පරං වම්භෙති. යො හි තත්ථ දක්ඛො අනලසො සම්පජානො පතිස්සතො, අයං වුච්චති, භික්ඛවෙ, භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො. ඉමෙ ඛො, භික්ඛවෙ, චත්තාරො අරියවංසා අග්ගඤ්ඤා රත්තඤ්ඤා වංසඤ්ඤා පොරාණා අසංකිණ්ණා අසංකිණ්ණපුබ්බා, න සංකීයන්ති න සංකීයිස්සන්ති, අප්පටිකුට්ඨා සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි.

ඉමෙහි ච පන, භික්ඛවෙ, චතූහි අරියවංසෙහි සමන්නාගතො භික්ඛු පුරත්ථිමාය චෙපි දිසාය විහරති ස්වෙව අරතිං සහති, න තං අරති සහති, පච්ඡිමාය චෙපි දිසාය විහරති ස්වෙව අරතිං සහති, න තං අරති සහති, උත්තරාය චෙපි දිසාය විහරති ස්වෙව අරතිං සහති, න තං අරති සහති, දක්ඛිණාය චෙපි දිසාය විහරති ස්වෙව අරතිං සහති, න තං අරති සහති. තං කිස්ස හෙතු? අරතිරතිසහො හි, භික්ඛවෙ, ධීරො''ති.

නාරති සහති ධීරං - නාරති ධීරං සහති,
ධීරොව අරතිං සහති - ධීරො හි අරතිස්සහො.

සබ්බකම්මවිහායීනං - පනුණ්ණං කො නිවාරයෙ,
නෙක්ඛං ජම්බොනදස්සෙව - කො තං නින්දිතුමරහති,
දෙවාපි නං පසංසන්ති - බ්‍රහ්මුනාපි පසංසිතො''ති.

# ☸ අරියවංස සූත්‍රයෙහි අර්ථ විවරණය

## නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

භාග්‍යවත් අතීත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ සැවැත් නුවර **අනාථපිණ්ඩික** මහ සිටුතුමා විසින් සාදවා පූජා කරන ලද **ජේතවනාරාමයෙහි** වැඩ සිටි දිනක මෙම අරියවංස සූත්‍රය අභීත්වයට පත්වීමට හේතු සම්පත් ඇති සතලිස්දහසක් පමණ මහත් භික්ෂු පිරිසක් අරහයා දේශනා කොට වදාළ සේක.

ලොවුතුරා බුදුරජාණන් වහන්සේලා ගේ සූත්‍රධර්ම දේශනා කිරීමේ හේතු පසකි. එනම් :- "**අත්තජ්ඣාසක දේසනා, පරජ්ඣාසක දේසනා, උභයජ්ඣාසක දේශනා, අට්ඨුප්පත්තික දෙසනා, පුච්ඡාවසික දේසනා**" යන ක්‍රම පසයි.

යම් සූත්‍රයක් භාග්‍යවතුන් වහන්සේ අන්‍යයන්ගේ ආරාධනාවකින් තොරව තම අදහසින්ම දේශනාකොට වදාළ සේක් ද "**ආකංඛෙය්‍ය සූත්‍රය, වත්ථ සූත්‍රය, මහා සතිපට්ඨාන සූත්‍රය, මහා සළායතනවිභංග සූත්‍රය, අරියවංශ සූත්‍රය, සම්මප්පධාන - ඉද්ධිපාද - ඉන්ද්‍රිය - බල - බොජ්ඣංග - මාර්ග**" යන සංයුත්තයන්ට අයත් සූත්‍ර සමූහයන් ද, මේ ආදී සියල්ල "**අත්තජ්ඣාසක දේසනා**" නම් වේ.

අන්‍යයන්ගේ ආරාධනාවක් ඇතිව හෝ සීල, සමාධි, ප්‍රඥා දී උසස් ගුණ දියුණු කිරීමේ අදහස් ඇතිව ධර්මශ්‍රවණය කිරීමේ කැමැත්ත ඇතියවුන්ගේ අදහස දැන දේශනාකොට වදාළ "**චූළරාහුලොවාද සූත්‍රය, මහාරාහුලොවාද සූත්‍රය, ධම්මචක්කප්පවත්තන සූත්‍රය, ධාතුවිභංග සූත්‍රය**" ආදී සූත්‍රදේශනා "**පරජ්ඣාසක දේශනා**" නම් වේ.

සිවු පිරිසට අයත් කවරෙකු හෝ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ අසනලද ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් වදාළ "**බොජ්ඣංගසංයුත්ත, දෙවතාසංයුත්ත, මාරසංයුත්ත, බ්‍රහ්මසංයුත්ත** යන සංයුත්තයන් ද **සක්කපඤ්හසූත්‍රය, චූළවෙදල්ල සූත්‍රය,**

**මහාවෙදල්ල සූත්‍රය, සාමඤ්ඤඵල සූත්‍රය, ආළවක සූත්‍රය, සූචිලොම සූත්‍රය, ඛරලොම සූත්‍රය**" ආදී පිළිතුරු දේශනා "**පුච්ඡාවසික දේශනා**" නම් වේ.

යම් අර්ථවත් කාරණයක් උපන් කල්හි එය මුල්කරගෙන දේශනාකොට වදළ "**ධම්මදායාද සූත්‍රය, චූළසීහනාද සූත්‍රය, පුත්‍රමාංශෝපම සූත්‍රය, දරුක්ඛන්ධෝපම සූත්‍රය, අග්ගික්ඛන්ධෝපම සූත්‍රය, පෙණපිණ්ඩූපම සූත්‍රය, පාරිච්ඡත්තකූපම සූත්‍රය**" ආදිය "**අට්ඨුප්පත්තික දේශනා**" නම් වේ. මේ සූත්‍ර නික්ෂේපයන්ගෙන් මෙම අරියවංශ සූත්‍රය "**පුච්ඡාවසික දේශනා**" නම් වේ. මෙම සූත්‍ර දේශනාව අත්ථජ්ඣාසක සූත්‍ර නික්ෂේපයට අයත් වූ අංගුත්තර නිකායේ පළමු පණ්ණාසකයේ උරුවේල වර්ගයෙහි එන අටවන සූත්‍ර දෙශනාවයි.

ඒ පිළිබඳ අර්ථ විවරණය මෙසේ ය.

"**එවං මෙ සුතං එකං සමයං භගවා**" යන මෙහි අර්ථ විවරණය ඉහත කියන ලද ජීවක සූත්‍රය අනුව දත යුතු ය.

"**සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ**" එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ අනාතපිණ්ඩික සිටුතුමා විසින් සාදවා පූජා කරන ලද ජේතවනාරාමයෙහි වැඩ සිටි සේක.

"**සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ**" සැවැත් නුවර සමීපයෙහි අනාථපිණ්ඩිත මහ සිටුතුමා විසින් සාදවා ආරාමයක් කොට පූජා කරන ලද ජේතවනාරාමයෙහි වැඩ සිටි සේක යන මෙහි "**සාවත්ථියං** " යනු මෙනම් නම් ඇති නගරයයි.

ස්වස්ථ ඍෂිවරයා හට වාස භූමිය වූ බැවින් මේ භූමිය "**සාවස්ථි**" නම් විය. මිනිසුන්ට අවශ්‍ය උපභෝග පරිභෝග භාණ්ඩ මෙහි ගබඩා කොට ඇති බැවින් "**සියල්ල ඇත්තේ ය**" යනාර්ථයෙන් සාවත්ථි නම් විය.

මෙසේ සියල්ල පරිපූර්ණ වූ මේ සැවැත් පුරයෙහි එන්න, කන්න, බොන්න ආදී වූ දසවිධ ශබ්දයන්ගෙන් වෙන් නොවූ ආහාර පානාදියෙන් පරිපූර්ණ වූ කොසොල් රට වැසියන්ගේ මේ අග නගරය වනාහි රම්‍ය වූ ද, දර්ශනීය වූ ද, මනෝ රමණීය වූ පුණ්‍ය භූමියක් වූයේ ය. අභිවෘධියෙන් යුක්ත වූ විපුල බවට පත් සාරවත් වූ සමෘධිමත් වූ දෙවියන්ගේ ආලකමන්දව වැනි වූ මේ සැවැත්නුවර උතුම් ය. බුද්ධ කාලයෙහි පසේනදි කොසොල් මහ රජතුමාගේ වාස භූමිය වූයේ ද මෙහි ය. පිහිටීම් වශයෙන් අචිරවතී නදී තීරයෙහි විය. මේ නදිය වක්‍රාකාරව ගලා යන බැවින් නගරයෙහි උතුරු දකුණු දෙදිසාවෙන් ම නදිය විය. බුදුරජාණන් වහන්සේගෙන් ම ධර්මය ශ්‍රවණය කොට මඟ ඵල ලැබුවෝ පන්කෝටියක් වූහ. අනාථපිණ්ඩික සිටුතුමා විශාකා මහෝපාසිකාව වැනියවුන් නිසා මේ නුවර බැබළීමට ගියේය.

"**විහරති**" යනු දිව්‍ය බ්‍රහ්ම ආර්‍ය විහරණයන්ගෙන් යම් විහරණයකින් වාසය කරයි යනුයි. එනම් ගමන්කිරීම සිටීම හිඳීම සැතපීම යන සිව් ඉරියව් පවත්වමින් වාසය කිරීමයි. භාග්‍යවතුන් වහන්සේ බුද්ධත්වයෙන් තුන් වන වර්ෂයෙහි දී මේ සැවැත් නුවරට වැඩි පළමු වතාවෙහි දී ම නව මසක් වැඩ සිටි සේක. ඉන් පසු ද හතර වන වස් කාලයෙහි ද, විසි එක් වන වස්කාලයෙහි පටන් සතළිස් හතර වන වස්කාලය අවසන් වීම දක්වා ද මෙසේ විසිපස් වසරක කාලයක් මේ සැවැත් නුවරම වැඩ සිටි සේක.

"**ජෙතවනෙ**" යනු තමාගේ සතුරු ජනයා ජයගනීනුයි "**ජේත**" නම් වේ. නොහොත් රජු තම සතුරු ජනයා දිනූ කල්හි උපන් බැවින් මේ කුමරාට "**ජේත**" යැයි නම් තැබීය. සේවනය කෙරේනුයි "**වන**" නම් වේ. නොයෙක් ආකාරයේ මල් සුවඳින් සතුටු වූ මත් වූ කොවුල් ආදී පක්ෂීන්ගේ නාදයෙනන ද මඳ පවනින් ද සෑම කල්හි ම දළු කොළවලින් ද, මල් ගෙඩි බරින් පිරී බර වී පවතින මෙය "එවු මා පරිභෝග කරවු" යැයි ආයාචනා කරන්නාක් වැනි වූ බැවින් "**වන**" නම් වේ. තවද ජීවිතය පිළිබඳ බලාපොරොත්තු ඇති කරවන බැවින් ද "**වන**" නම් වේ. මෙහි අර්ථය නම් ජීවිතය පිළිබඳ කලකිරීමක් දුකක් කනගාටුවක් ව්‍යසනයක් ඇති වූ විටෙක මේ වනයට ගිය කල්හි එහි ඇති අනේක විධ වූ සුවඳවත් වූ මලින්ද ඉදුණු පැසුණු මියුරු පලතුරු ආදියෙන් ද, ඒ මල් පැණි

පලතුරු ආදිය පරිභෝගයෙන් තෘප්තිමත් වූ මී මැසි බඹර පක්ෂීන් සිව්පාවන් වැනි සත්වයින්ගේ මිහිරි නාදයෙන් ද, කයට සුව එළවන මඳ පවනින් ද සිත් ඇදගන්නා සුළු වූ ඒ අසිරිය තුලින් මනසෙහි ඇති දුක් පීඩා අමතක වී යන්නේ වේ. එබැවින් ද මෙය **"වන"** නම් වේ. මෙය ජේත කුමාරයාට අයත් වූ ඔහු විසින් රෝපණය කරන ලද පවත්වාගෙන යන ලද්දක් බැවින් **"ජේතවන"** නම් වේ.

**"අනාථපිණ්ඩිකස්ස ආරාමෙ"** අනාථපිණ්ඩික සිටුතුමා විසින් කරවා බුද්ධ ප්‍රමුඛ වූ භික්ෂු සංඝයා වෙත පූජා කරන ලද ආරාමයෙහිය. මව්පියන් තැබූ නමින් **"සුදත්ත"** නම් වූ ඒ ගෘහපති තෙමේ සියලු කාමයෙන් යුක්ත වූ බැවින් ද, පහ වූ මසුරු මල ඇති බැවින් ද, කරුණා දී විශේෂ ගුණයන්ගෙන් යුක්ත බැවින් ද, සියලු කල්හි ම අනාථයන්ට ආහාරාදියෙන් සංග්‍රහ කළ බැවින් ද **"අනාථපිණ්ඩික"** යැයි ගෞරව නාමයක් විය. **"ආරාමං"** යනු ආරාමය යි. ප්‍රාණීහු හෝ පැවිද්දෝ සිත් අලවා වෙසෙත්නුයි **"ආරාම"** නම් වෙ. මේ ආරාමය ජනාවාසයට ඉතා ළඟ ද නොවූ ඉතා දුර ද නොවූ ධ්‍යාන භාවනා වැඩීමට ඉතාමත් යෝග්‍ය වූ දකුම්කලු භූමියකි. මෙම භූමිය ලොව පහළ වන සියලු බුදුරජාණන් වහන්සේලාගේ නිත්‍ය වාසස්ථානය වන්නේ ය. මෙම ආරාම පූජාව උදෙසා ම කල්ප ලක්ෂයක් පුරාවට පිරූ පාරමී ඇති අනාථපිණ්ඩික සිටුතුමා විසින් කහවනු අටළොස්කෝටියක් ජේත කුමාරයාට අයත් එම භූමියෙහි අතුරා එම භූමිය මිල දී ගෙන එහි කහවනු අටළොස්කෝටියක් වැයකොට හඳුන් දැවයෙන් සුවඳවත් ආරාමයක් කරවා බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයා හට පවරා දුන් බැවින් අනාථපිණ්ඩික සිටුතුමාගේ ආරාමය නම් විය. අටළොස්කෝටියක් කහවනු වැයකොට ආරාම පූජාව කළේ ය. මෙසේ අනාථපිණ්ඩික සිටුතුමා මෙම ආරාම පූජාව දක්වා කහවනු පනස්හතර කෝටියක් වැය කළේ ය. එසේම ජේත කුමාරයා විසින් මෙම ආරාම භූමියෙහි අප්‍රමාණ ධනයක් වැයකොට අලංකාරමත් ලෙස රෝපණය කරන ලද වෘක්ෂලතා, මල්, පලතුරු උයන් ආදිය එතුමාගේ පරිත්‍යාගයෝ ය. ආනන්ද තෙරුන් වහන්සේ විසින් මෙම කථාවස්තුව ඉදිරිපත් කිරීමෙන් "පුණ්‍යකාමීහු මෙසේ පින් රැස් කෙරෙති" යැයි දක්වමින් පින් කැමති අන්‍යයන් ද එසේ ම පින් කිරීමෙහි යොදවයි.

**මෙහි සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ:** යන මෙහි සැවැත්නුවර දැක්වීමෙන් ගොදුරු ගම ද ආරාමය දැක්වීමෙන් පැවිද්දට යෝග්‍ය නිවාසස්ථානය ද දක්වයි මේ පිළිබඳ අර්ථ වර්ණනාව ජීවක සූත්‍රානුසාරයෙන් දත යුතු ය.

**තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවො'ති. භදන්තෙ'ති ඛො භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච.**

එකල්හි භාග්‍යවතුන් වහන්සේ "**මහණෙනි**" යැයි භික්ෂූන් වහන්සේලාට ආමන්ත්‍රණය කළ සේක. එවිට භික්ෂූන් වහන්සේලා "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස**" යැයි පිළිතුරු දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙම "**චත්තාරො මෙ අරියවංසා**" යනුවෙන් ආරම්භ කොට මේ "**අරියවංස සූත්‍රය**" වදාළ සේක.

එහි "**තත්‍ර**" යන්නෙන් දේශනා කාලය දක්වයි. එනම් මෙම දේශනාව කරන කාලයෙහි යම් තැනක වැඩ සිටි සේක් ද එම ස්ථානය වූ ජේතවනාරාමය දැක්වීමයි. එසේ ම දම් සභා මණ්ඩපයෙහි රැස්ව සිටි භික්ෂූන් වහන්සේලාට ධර්ම ශ්‍රවණය සඳහා ආමන්ත්‍රණය කිරීම ද මෙයින් දැක්වේ. "**භගවා**" යන්නෙන් මෙම සූත්‍රය දේශනා කරන්නා වූ දේශකයන් වහන්සේ වන සම්මා සම්බුදු රජාණන් වහන්සේ දක්වයි. "**භික්ඛූ ආමන්තෙසි**" යන්නෙන් ධර්ම දේශක වූ භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි සිට අවවාද අනුශාසනා පිළිගෙන ඒ අනුව පිළිපදින්නා වූ ශ්‍රාවක පිරිස වන භික්ෂූන් වහන්සේලා ආසන්නයෙන් ම සිටින පිරිස බැවින් ද, හැම කල්හි එක්රැස් වන බැවින් ද, සිවු පිරිසෙහි ප්‍රධාන ශ්‍රාවක පිරිස බැවින් ද ඇසීමෙහි නියෝජනය කරනු පිණිස ආමන්ත්‍රණය කිරීමයි. භාග්‍යවතුන් වහන්සේ පිරිවරා සිටින භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේ කථා නොකරන කල්හි කර්මස්ථාන අරමුණක ම යෙදී සිටිති. එසේ ඇති කල්හි කරන දේශනාවට ඒ භික්ෂූන් වහන්සේලා සිත නො යොදත්. එයින් කරන දෙසුම ප්‍රයෝජනවත් නොවෙයි. එබැවින් ඒ භික්ෂූන් වහන්සේලාගේ අවධානය ඇති කරවාගෙන ධර්ම ශ්‍රවණයෙහි සිහිය උපදවා දේශනාව කරනු පිණිස ආමන්ත්‍රණය කළ සේක. "**භික්ඛවො**" යන්නෙන් එසේ කරණ ආමන්ත්‍රණය දක්වයි.

**"භදන්තෙ'ති බො භික්ඛූ භගවතො පච්චස්සොසුං"** යන්නෙන් යම් භික්ෂු පිරිසක් සඳහා භාග්‍යවතුන් වහන්සේ ආමන්ත්‍රණය කරන සේක් ද, එම භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි භාග්‍යවතුන් වහන්සේගේ දේශනය ප්‍රාර්ථනා කරන අදහසින් එම ආමන්ත්‍රණය අසා සතුටු සිත් ඇත්තාහු වෙති. එබැවින් එක් භික්ෂුන් වහන්සේ නමක් දෙනමක් නොව රැස්ව සිටි සියලු භික්ෂු සංඝයා ම **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස!"** යනුවෙන් භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ.

**"භගවා එතදවොච"** යන්නෙන් ඒ රැස්ව සිටි භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිවු පිරිස ධර්ම ශ්‍රවණයෙහි හටගත් උත්සාහ ඇතියවුන් බව දත භාග්‍යවතුන් වහන්සේ දෙසිය යුතු **අරියවංස සූත්‍ර දේශනාව** මෙසේ දේශනා කොට වදාළ සේක.

**"චත්තාරො'මෙ, භික්ඛවෙ, අරියවංසා අග්ගඤ්ඤා රත්තඤ්ඤා වංසඤ්ඤා පොරාණා අසංකිණ්ණා අසංකිණ්ණපුබ්බා, න සංකීයන්ති න සංකීයිස්සන්ති, අප්පටිකුට්ඨා සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි."**

එහි **"චත්තාරො'මෙ, භික්ඛවෙ අරියවංසා"** යන මෙහි **"භික්ඛවෙ"** යනු **"සංසාරෙ භයං ඉක්ඛතී'ති භික්ඛු"** යනාර්ථයෙන් සසර භයින් නිදහස් වීම පිණිස සසුන්ගත වූ භික්ෂුවයි. **"අරියවංසා"** යනු බුදු පසේ බුදු අග්‍ර ශ්‍රාවක මහාශ්‍රාවකාදී වූ ආර්‍ය්‍ය මහෝත්තමයන් වහන්සේලාගේ වංශයයි. මෙහි **"ආර්‍ය්‍ය"** යනු බුදු, පසේ බුදු, මහ රහතන් වහන්සේලායි. දුක්ඛය, සමුදය, නිරෝධය, මාර්ගය යන ආර්‍ය්‍ය සත්‍යයන් අවබෝධ කළ බැවින් බුද්ධාදී මහෝත්තමයන් වහන්සේලා ආර්‍ය්‍ය නම් වෙති. කෙලෙස් සතුරන් නැසූ බැවින් ද, සතර මාර්ග ඵල ධර්මයන් අවබෝධ කළ බැවින් ද, කෙලෙසුන් කෙරෙන් ඈත් වූ බැවින් ද, ලෝක සත්වයන් විසින් ලෞකික ලෝකෝත්තර සැප සිද්ධකර ගැනීමට ළංව ඇසුරුකළ යුතු බැවින් ද බුදු පසේ බුදු අග්‍ර ශ්‍රාවක මහාශ්‍රාවකාදී මහෝත්තමයන් වහන්සේලා ආර්‍ය්‍ය නම් වෙති. ප්‍රවේණිය, පරපුර වංශය නම් වේ. මෙහි **ක්ෂත්‍රිය වංශය, බ්‍රාහ්මණ වංශය, වෛශ්‍ය වංශය, ශුද්‍ර වංශය, ශ්‍රමණ වංශය, කුලවංශය, රාජ වංශය** යනුවෙන් ලොව පවත්නා වංශ සතක් ඇත්තේ ය. එසේ පවත්නා අටවැනි වංශය මේ **ආර්‍ය්‍ය වංශය**

යි. අන් වංශයන් ලොව පවත්නා සැමකල්හි විද්‍යමාන වෙති. එහෙත් මේ ආයඞ් වංශය බුදු සම්මා සම්බුදු රජාණන් වහන්සේ නමක් ලොව පහළ වූ විටක හෝ පසේ බුදුරජාණන් වහන්සේලා පහළ වූ විටක පමණක්ම විද්‍යමාන වේ. එබැවින් මේ ආයඞ් වංශය අතිශයින් දුර්ලභ වංශය වේ.

මෙම කල්පයෙන් සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයකට මත්තෙහි "**තණ්හංකරය, මේධංකරය, සරණංකරය, දීපංකර**" යන සම්මා සම්බුදු රජාණන් වහන්සේලා සතරනමක් එකම කල්පයක ලොව පහළ වූහ. ඒ කල්පයෙන් පසු මහා කල්ප අසංඛ්‍යයක් බුදුරජාණන් වහන්සේලා පහළ නොවී ශූන්‍ය කල්ප වශයෙන් ගෙවීගියහ. ඉන් පසු එක කල්පයක "**කොණ්ඩඤ්ඤ**" බුදුරජාණන් වහන්සේ පහළ වූහ. ඒ කල්පයෙන් පසු නැවත මහා කල්ප අසංඛ්‍යයක් බුදුරජාණන් වහන්සේලා පහළ නොවී ශූන්‍ය කල්ප වශයෙන් ගෙවී ගොස් ඉන් පසු එක කල්පයක "**මංගල සුමන රේවත සෝභිත**" යන සම්මා සම්බුදු රජාණන් වහන්සේලා සතරනම ලොව පහළ වූහ. ඒ කල්පයෙන් පසු නැවත මහා කල්ප අසංඛ්‍යයක් බුදුරජාණන් වහන්සේලා පහළ නොවී ශූන්‍ය කල්ප වශයෙන් ගෙවී ගොස් ඉන් පසු එක කල්පයක "**අනෝමදස්සි පදුම නාරද**" යන බුදුරජාණන් වහන්සේලා තුන්නම ලොව පහළ වූහ. ඒ කල්පයෙන් පසු නැවත මහා කල්ප අසංඛ්‍යයක් බුද්ධ ශූන්‍යව ගෙවීගිය පසු මෙයින් කල්ප ලක්‍ෂයකට පෙර එක කල්පයක "**පදුමුත්තර**" බුදුරජාණන් වහන්සේ පහළ වූහ. ඒ කල්පයෙන් පසු කල්ප සැත්තෑදහසක් බුද්ධ ශූන්‍යව ගෙවී ගොස් නැවත එක කල්පයක "**සුමේධ සුජාත**" යන සම්මා සම්බුදු රජාණන් වහන්සේලා දෙනම එකම කල්පයක ලොව පහළ වූහ. ඉන් පසු නැවත කල්ප විසිනවදහස් අටසිය අසූ දෙකක් ගෙවී ගොස් මෙයින් කල්ප එකසිය අටලොසකට පෙර "**පියදස්සි අත්ථදස්සි ධම්මදස්සි**" යන සම්මා සම්බුදු රජාණන් වහන්සේලා තුන්නම එකම කල්පයක ලොව පහළ වූහ. ඉන් පසු නැවත කල්ප විසිහතරක් බුද්ධ ශූන්‍යව ගෙවී ගොස් මෙයින් කල්ප අනූ සතරකට පෙර එක කල්පයක "**සිද්ධාර්ථ**" නම් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලොව පහළ වූහ. ඉන් පසු නැවත එක කල්පයක් බුද්ධ ශූන්‍යව ගෙවී ගොස් මෙයින් කල්ප අනූ දෙකකට පෙර එක කල්පයක "**තිස්ස, ඵුස්ස**" යන සම්මා සම්බුදු රජාණන් වහන්සේලා දෙනම ලොව

පහළ වූහ. ඊළඟ කල්පය වූ මෙයින් කල්ප අනූ එකකට පෙර "**විපස්සි**" නම් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලොව පහළ වූහ. ඉන් පසු නැවත කල්ප සැටක් බුද්ධ ශූන්‍යව ගෙවී ගොස් මෙයින් තිස් එක්වන කල්පයෙහි "**සිඛී, වෙස්සභූ**" යන සම්මා සම්බුදු රජාණන් වහන්සේලා දෙනම ලොව පහළ වූහ. ඉන් පසු නැවත කල්ප තිසක් බුද්ධ ශූන්‍යව ගෙවී ගොස් මේ මහා භද්‍ර කල්පයෙහි "**කකුසන්ද, කෝණාගමන, කාශ්‍යප, ගෞතම**" යන සම්මා සම්බුදු රජාණන් වහන්සේලා සතරනම ලොව පහළ වූහ. ඊළඟ අන්තර් කල්පයෙහි "**මෛත්‍රී**" සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලොව පහළ වන්නාහ. මෙලෙස සම්මා සම්බුදු රජාණන් වහන්සේලා ඉතා දුර්ලභව ලොව පහළ වෙති. එබඳු බුදු සසුන්වල පමණක් අග්‍රශ්‍රාවක මහා ශ්‍රාවකාදී ආර්‍ය්‍ය පුද්ගලයන් ලැබෙති. ලොව්තුරා බුදු රජාණන් වහන්සේලා ලොව පහළවන කල්පයන්හිම පසේ බුදු රජාණන් වහන්සේලා ද ලොව පහළ වෙති. අන් බුද්ධ ශූන්‍ය කල්පයන්හි පහළ නොවෙති. එබැවින් මේ ආර්‍ය්‍ය වංශය ඉතා දුර්ලභ වේ.

"**චත්තාරො'මෙ, අරියවංසා**" යනු මහණෙනි, මේ ආර්‍ය්‍යවංස සතරකි. ඊට අඩුත් නැත. වැඩි ද නැත. "**අග්ගඤ්ඤා**" ඒ මේ ආර්‍ය්‍යවංශ සතර සුවඳ හර මුල් ආදියට සඳුන්ම අග්‍ර වන්නා සේ ක්‍ෂත්‍රියාදී අන් වංශයන්ට අග්‍රයයි දත යුත්තාහ. "**රත්තඤ්ඤා**" අතීත කාලයෙහි පහළ වූ සියලු බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලා විසින් අත් නොහැර පුරුදු කරන ලද්දාහු ය. එබැවින් බොහෝ පැරණියයි දත යුත්තාහ. "**වංසඤ්ඤා**" බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලාගේ වංශයට (පරපුර) අයත් යයි දත යුත්තාහ. "**පොරාණා**" මේ ප්‍රතිපදාව අලුත හටගත්තක් නොවේ ය. පුරාතනයෙහි පටන් බුද්ධාදී උත්තම පුද්ගලයින් විසින් පුරුදු කරන ලද්දාහ. "**අසංකිණ්ණා**" **අධිසීල අධිචිත්ත අධිපඤ්ඤා** යන ත්‍රී ශික්‍ෂාවන් සම්පූර්ණ කිරීමේ උපාය මාර්ගය වන හෙයින් අත නොහරින ලද්දාහ. "**අසංකිණ්ණපුබ්බා**", අතීතයෙහි ලොව පහළ වූ බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලා විසින් ද අත් නොහරින ලද්දාහු ය. "**න සංකීයන්ති**" දැනුදු බැහැර නොකරති. "**න සංකීයිස්සන්ති**", අනාගතයෙහි ද බැහැර නොකරන්නාහ. "**අප්පටිකුට්ඨා සමණෙහි බ්‍රාහමණෙහි විඤ්ඤූහි**" ලොව විද්‍යමානව ඇති ත්‍රිලක්‍ෂණ චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්ම ස්වභාවය මනාකොට

ප්‍රත්‍යක්‍ෂ කරන නුවණින් යුත් බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලා මෙම ප්‍රතිපදාව පිළිකුල් නොකරන ලද්දාහුය. නොගරහන්නාහු ය.

**කතමෙ චත්තාරො?** ඒ ආර්‍ය්‍යවංශ ප්‍රතිපදා සතර කවරේ ද? යත්:-

1. **ඉතරීතර චීවර සංතෝෂය**
2. **ඉතරීතර පිණ්ඩපාත සංතෝෂය**
3. **ඉතරීතර සේනාසන සංතෝෂය**
4. **භාවනාරාමතාවය** යන සතරයි.

## ❄ ඉතරීතර චීවර සන්තෝසය

**ඉධ, භික්ඛවෙ, භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන චීවරෙන, ඉතරීතරචීවරසන්තුට්ඨියා ච වණ්ණවාදී, න ච චීවරහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති, අලද්ධා ච චීවරං න පරිතස්සති, ලද්ධා ච චීවරං අගථිතො අමුච්ඡිතො අනජ්ඣොසන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති, තාය ච පන ඉතරීතරචීවරසන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති, නො පරං වම්භෙති. යො හි තත්‍ථ දක්ඛො අනලසො සම්පජානො පතිස්සතො, අයං වුච්චති, භික්ඛවෙ, භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො.**

"**ඉධ, භික්ඛවෙ, භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන චීවරෙන**" මහණෙනි, මේ ශාසනයෙහි සසර භයින් නිදහස් වීම පිණිස සසුන්ගත වූ භික්ෂුව ලැබුණු යම්කිසි සිවුරකින් සතුටු වෙයි, මෙහි "**ඉතරීතරෙන චීවරෙන**" ඝන වූ හෝ සියුම් වූ හෝ, රූක්‍ෂ වූ හෝ සිනිඳු වූ හෝ, ශක්තිමත් වූ හෝ දිරාපත් වූ හෝ යම්කිසි චීවරයකි. "**සන්තුට්ඨො හොති**" යනු ඉහත කියන ලද යම් චීවරයකින් සතුටු වීමයි.

මෙහි "**යථා ලාභ සන්තෝසය, යථා බල සන්තෝසය, යථා සාරුප්‍ය සන්තෝසය**" යැයි චීවරය පිළිබඳ ව සන්තෝස තුනකි.

කාය පරිහරණයට ප්‍රමාණවත් වූ රළු වූ හෝ සැහැල්ලු වූ හෝ ලද දෙපට සිවුර, තනිපට සිවුර, අඳන සිවුර යන තුන් සිවුරෙන් සතුටු වෙයි. ඉන් වැඩියක් බලාපොරොත්තු නොවෙයි. ප්‍රණීත සිවුරු ලැබුණේ නමුත් තමන්ගේ පරිහරණයට නොගනී. මේ භික්ෂුවගේ චීවරයෙහි **යථා ලාභ සන්තෝසය** යි.

යම් ලෙසකින් ස්වභාවයෙන් ම හෝ ගිලන් කමක් නිසා හෝ වයෝවෘද්ධ නිසා හෝ ලැබුණු රළු සිවුරු - බර සිවුරු නොදැරිය හැකි වේ ද, එකල්හි අන් සභාග (ප්‍රතිපත්තියෙන් සමාන වූ) භික්ෂුවක් සමග සැහැල්ලු සිවුරුවලට මාරු කරගෙන පරිහරණය කරයි. මෙය භික්ෂුවගේ චීවරයෙහි **යථා බල සන්තෝසය** යි.

භික්ෂුව තමන්ට ලැබෙන හොඳ සිවුරු ආචාර්ය, උපාධ්‍යා තෙරුන් වහන්සේලාට පරිත්‍යාග කරයි. ගිලන් භික්ෂූන්ට හෝ දුර්වල වූ සිවුරු ඇති හෝ සිවුරු හිඟ භික්ෂූන්ට හෝ පරිත්‍යාග කරයි. තමන් රළු වූ හෝ පාංශුකූල සිවුරු හෝ පරිභෝග කරයි. මෙය භික්ෂුවගේ චීවරයෙහි **යථාසාරුප්‍ය සන්තෝසය** යි.

ලැබුණු යම්කිසි සිවුරකින් සතුටු වීමෙහි ගුණ කියන්නේ වෙයි. සිවුරු නිසා නුසුදුසු සෙවීමකට නොපැමිණෙයි. සිවුරු නොලැබීම හේතුකොටගෙන නොතැවෙයි. සිවුරු ලැබුණු කල්හි ද, එහි නො ඇලී, මුලා නොවී, එහි ඇලීමෙහි හා මුලා වීමෙහි ආදීනව දකිමින් සසර දුකින් නික්මීමේ නුවණින් යුක්ත ව පරිභෝග කරයි. ලැබුණු යම්කිසි සිවුරකින් සතුටු වීමෙන් තමන් උසස් කොට නොසිතයි. අනුන් පහත් කොට නොසිතයි. මෙසේ ඒ භික්ෂුව ලද දෙයින් සතුටු වීමෙහි දක්ෂ වූයේ, අලස නොවූයේ, මනා ලෙස නුවණින් දන එළඹ සිටි සිහියෙන් යුක්ත ව වෙසෙයි. මහණෙනි, මේ භික්ෂුව පෞරාණික වූ අග්‍ර යැයි දත දන්නා ලද ආර්ය වංශයෙහි පිහිටියේ වේ.

මහණෙනි, නැවත ද භික්ෂු තෙමේ ලැබුණු යම්කිසි පිණ්ඩපාතයකින් සතුටු වූයේ වේද, ලැබුණු යම්කිසි පිණ්ඩපාතයකින් සතුටු වීමේ ගුණ කියන්නේ වේද, පිණ්ඩපාත හේතුවෙන් නුසුදුසු සෙවීමකට නොපැමිණේ ද පිණ්ඩපාතය නොලැබීම නිසා නොතැවෙයි ද, පිණ්ඩපාතය ලැබ ද, එහි නො ඇලී, තෘෂ්ණාවෙන් මුසපත් නොවී නොගිලී ආදීනව දකිමින් සසරින් මිදීමේ නුවණින් යුක්ත ව වළඳයි ද, ඒ ලැබුණු යම්කිසි පිණ්ඩපාතයකින් සතුටු වීමෙන් තමන් උසස් කොට නොසිතයි ද, අනුන් පහත් කොට නොසිතයි ද, හෙතෙමේ ලද දෙයින් සතුටු වීමෙහි දක්‍ෂ වූයේ, අලස නොවූයේ, නුවණින් හා සිහියෙන් යුක්ත වූයේ වෙයි. මහණෙනි, මේ භික්ෂුව අග්‍රයයි දත යුතු පැරණි ආර්‍ය්‍ය වංශයෙහි සිටියේ ය.

මහණෙනි, නැවත ද භික්ෂු තෙමේ ලැබුණු යම්කිසි සෙනසුනකින් සතුටු වූයේ වේද, ලැබුණු යම්කිසි සෙනසුනකින් සතුටු වීමේ ගුණ කියන්නේ වේද, සෙනසුන් හේතුවෙන් නුසුදුසු සෙවීමකට නොපැමිණෙයි. සෙනසුනක් නොලැබීම නිසා නොතැවෙයි. සෙනසුන ලැබුණු විටදී ද එහි ලෝභ නොවී, තෘෂ්ණාවෙන් මුසපත් නොවී, නොගිලී ආදීනව දකිමින් සසරින් මිදීමේ නුවණින් පරිභෝග කරයි ද, ඒ ලැබුණු යම්කිසි සේනාසනයකින් සතුටු වීමෙන් තමන් උසස් කොට නොසිතයි ද, අනුන් පහත් කොට නොසිතයි,

තව ද ලද දෙයින් සතුටු වූම පිළිබඳ ව මෙසේ වදළ සේක. ''**නාහං, භික්ඛවෙ, අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා වා අකුසලා ධම්මා පරිහායන්ති යථයිදං, භික්ඛවෙ, සන්තුට්ඨිතා. සන්තුට්ඨස්ස, භික්ඛවෙ, අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා ච අකුසලා ධම්මා පරිහායන්ති''ති**

"මහණෙනි, යමක් හේතුකොටගෙන නූපන් කුශලධර්මයෝ උපදිත් නම්, උපන්නාවූ අකුශල ධර්මයෝ පිරිහෙත් නම්, මහණෙනි, ලද දෙයින් සතුටුවීම බඳු අනෙක් එක ධර්මයකුදු මම නොම දකිමි. මහණෙනි, ලදදෙයින් සතුටුවන්නාහට නූපන් කුශලධර්මයෝ උපදිත්. උපන්නා වූ අකුශලධර්මයෝ පිරිහෙත්.

මෙහි දී චීවරය, චීවරක්ෂේත්‍රය, පංසුකූලය, චීවර සන්තෝසය, චීවර ප්‍රතිසංයුක්ත වූ ධූතාංගයෝ යන කරුණු පස දතයුතුය. එහිඃ-

## ☸ චීවරය

චීවරය යනු? මෙනම් සිවුරු කැප යැයි සිවුරු වර්‍ග වශයෙන් දත යුතු ය. "**ඛෝම කෝසෙය්‍ය කප්පාස සාණ භංග කම්බල**" යැයි චීවර සඳහා ගනු ලබන නූල්වර්‍ග සයකි. එහි :-

- ✠ **ඛෝම :-** ඛෝම නම් පට්ට (නූල්) වලින් වියන ලද වස්ත්‍ර ය.
- ✠ **කෝසෙය්‍ය :-** පට පණු නූල්වලින් වියන ලද වස්ත්‍ර ය.
- ✠ **කප්පාස :-** කපු නූලෙන් වියන ලද වස්ත්‍ර ය.
- ✠ **සාණ :-** හණ කෙඳිවලින් වියන ලද වස්ත්‍ර ය.
- ✠ **කම්බල :-** එළු ලොම් ආදී සත්ව ලොම්වලින් වියන ලද වස්ත්‍ර ය.
- ✠ **භංග :-** මේ සියල්ලම හෝ කිහිපයක් හෝ මිශ්‍රව වියන ලද වස්ත්‍ර ය.

තව ද "**දුකුල, පත්තුන්න, සෝමාර, චීනජ, ඉද්ධිජ, දේවදින්න**" යැයි මෙම වස්ත්‍රයන්ට අනුලොම් වස්ත්‍ර ද සයක් ද ඇත්තේ ය. එහි :-

- ✠ දුකුල :- දුකුල නම් පට්ට (නූල්) වලින් කරන ලද වස්ත්‍ර
- ✠ පත්තුන්න :- එනම් පට්ට (නූල්) වලින් කරන ලද වස්ත්‍ර ය.
- ✠ සෝමාර :- එනම් පට්ට (නූල්) වලින් කරන ලද වස්ත්‍ර ය.
- ✠ චීනජ :- චීන රටෙහි පට්ට (නූල්) වලින් කරන ලද වස්ත්‍ර

✠ ඉද්ධිජ :- ඒහිභික්ෂු භාවයෙන් පැවිද්ද ලබන විට මෙන් තමාගේ පෙර පින අනුව සෘද්ධිමය වශයෙන් ලැබෙන චීවර

✠ දේවදින්න :- ජාලිනී නම් දෙව්දුව විසින් අනුරුද්ධ මහ රහතන් වහන්සේට පූජා කළ චීවර මෙන් දෙවියන් විසින් දෙන ලද වස්ත්‍ර

මේ දෙළොස වැදෑරුම් සිවුරු කැප සිවුරු ය.

කුසතණ සිවුර, වැහැරි සිවුර, පැතලි පුවරුවලින් කළ සිවුර කෙසින් හෝ ලොමින් කළ කම්බිලිය, පොතු වලින් කළ සිවුර, සමින් කළ සිවුර, බකමූණු පියාපතින් කළ සිවුර, ගසින් කළ වස්ත්‍රය, වැලින් කළ වස්ත්‍රය, ඒරක නම් තණ වලින් කළ වස්ත්‍රය, කෙසෙල් පට්ටවලින් කළ වස්ත්‍රය, හුණු පට්ටවලින් කළ වස්ත්‍රය, යන මේ ආදිය අකැප සිවුරු ය.

## ☸ චීවර ක්ෂේත්‍රය

යනු සිවුරු ලැබෙන ක්‍රමය චීවරක්ෂේත්‍රය නම් වේ. සංඝයාගෙන් හෝ සමූහයාගෙන් හෝ ඥතීන්ගෙන් හෝ මිත්‍රයන්ගෙන් හෝ තමාගේ ධනයෙන් හෝ පාංසකූලය හෝ වශයෙන් මෙසේ ලැබෙන ක්‍රම සයකි.

තව ද "**සීමාය දෙති, කතිකාය දෙති, භික්ඛාපඤ්ඤත්තියා දෙති, සඞ්ඝස්ස දෙති, උභතොසඞ්ඝස්ස දෙති, වස්සංවුත්ථසඞ්ඝස්ස දෙති, ආදිස්ස දෙති, පුග්ගලස්ස දෙති**" යනුවෙන් සිවුරු ලැබීමේ මාතෘකා අටක් වෙති. එහි:-

✠ **සීමාය දෙති:- සීමාවෙහි දෙයි**
සීමාවට රැස් වූ භික්ෂූන්ට සිවුරු සමව බෙදා දීමයි.

✠ **කතිකාය දෙති:- කතිකාවෙන් (සමාන ලාභ සම්මුතියෙන් දීම)**
බොහෝ ආවාස සමාන ලාභ ඇත්තාහු ද එවිට කතිකා කරගෙන

එක් ආවාසයකට දුන් කල්හි සියලු ආවාසයන්ට දෙන ලද්දේ වේ.

✠ **භික්ඛාපඤ්ඤත්තියා දෙති:- භික්ෂා ප්‍රඥප්තියෙන් දීම**
යම් තැනක සංඝයාට නිති සත්කාර කරනු ලැබේ ද, ඒ ආවාසයන්ට දීමයි.

✠ **සඞ්ඝස්ස දෙති:- සංඝයාට දෙයි**
හමු වූ සංඝයා විසින් බෙදා ගැනීමයි.

✠ **උභතොසඞ්ඝස්ස දෙති:- භික්ෂු භික්ෂුණී උභතෝ සංඝයාට දීම**
බොහෝ භික්ෂූහු වෙත් ද එක් භික්ෂුණියක් වේ ද ඒ භික්ෂුණියට අඩක් දිය යුතු ය. බොහෝ භික්ෂුණීහු වෙත් ද එක් භික්ෂුවක් වේ ද ඒ භික්ෂුවට අඩක් දිය යුතු ය.

✠ **වස්සංවුත්තසඞ්ඝස්ස දෙති:- වස් වැස නිමකළ සංඝයාට දෙයි**
යම් පමණ භික්ෂූහු ඒ ආවාසයෙහි වස් වැස නිමකළාහු ද, ඒ සියල්ලන්ට දීමයි.

✠ **ආදිස්ස දෙති:- නියම කොට දීම**
කැඳ බත් ආදිය හෝ සිවුරු හෝ සෙනසුන් හෝ පිළිගත්තවුන්ට අයත් වේ.

✠ **පුග්ගලස්ස දෙති:- පුද්ගලයෙකුට දීම**
මෙම චීවරයට මෙනම් භික්ෂුවට දෙමි යැයි පෞද්ගලිකව දීමයි.

## ☸ පාංශුකූලික

"**පාංශුකූල**" යන මෙහි "**පංශු**" යනු වීථි සොහොන් කසල ගොඩ ආදී තැන්හි පස් ය. "**කූල**" නම් ඉවුරක් මෙන් උස්ව තිබීම, පිළිකුල් බවට පැමිණීම යනුයි. මෙහි දී වීථි සොහොන් ආදී තැන්හි පිළිකුලට ලක්වන පස් මෙන් එබඳු තැන්හි නිරපේක්ෂකව දමන ලද වස්ත්‍ර ද **පාංශුකූල** නමින් හඳුන්වනු ලැබේ. එබඳු පාංශුකූල වස්ත්‍ර **සොසානිකං, පාපණිකං, රථියං සඞ්කාරකූටකං, සොත්ථියං, සිනානං, තිත්ථං, ගතපච්චාගතං, අග්ගිදඩ්ඪං, ගොඛායිතං උපචිකඛායිතං, උන්දූරඛායිතං, අන්තච්ඡින්නං, දසාච්ඡින්නං, ධජාහටං, ථූපං, සමණචීවරං,**

**සාමුද්දියං, ආභිසෙකියං, පන්ථිකං, වාතාහටං, ඉද්ධිමයං, දෙවදත්තියං** යනුවෙන් තෙවිස්සක් ඇත්තේ වේ. එහි:-

- ✠ **සොසානික:-** සොහොන් බිමෙන් ලද වස්ත්‍ර,
- ✠ **පාපණික:-** වෙළෙඳ සැලෙන් ඉවත ලන වස්ත්‍ර
- ✠ **රථිය:-** පින් කැමති අය පාංශුකූල පිණිස ජනේල ආදියෙන් වීථියට විසි කළ වස්ත්‍ර
- ✠ **සංකාරකූට:-** කසල ගොඩෙහි දැමූ වස්ත්‍ර
- ✠ **සොත්ථිය:-** ගැබ් මල පිස ඉවත ලන වස්ත්‍රයයි.
- ✠ **සිනාන:-** භූත වෛද්‍යවරුන් විසින් ස්නානය කොට කාලකණ්ණි වස්ත්‍රය යැයි හැර දමන ලද වස්ත්‍ර
- ✠ **තිත්ථ :-** නහන තොටෙහි හැර දමන ලද වස්ත්‍ර
- ✠ **ගතපච්චාගත:-** සොහොනට ගිය මිනිසුන් විසින් ජලස්නානය කොට හැර දැමූ වස්ත්‍ර
- ✠ **අග්ගදඩ්ඪ:-** ගින්නෙන් දැවුණු නිසා හැර දැමූ වස්ත්‍ර (මිනිසුන් එබඳු වස්ත්‍ර අසුභ යැයි නොහඳිත්)
- ✠ **ගොඛායිත:-** ගවයන් විසින් කන ලද වස්ත්‍ර
- ✠ **උපචිකාඛායිත:-** වේයන් කන ලද වස්ත්‍ර
- ✠ **උන්දුරඛායිත:-** මීයන් කන ලද වස්ත්‍ර
- ✠ **අන්තච්ඡින්න:-** කෙළවර (කොන්) සිඳුණු වස්ත්‍ර
- ✠ **දසච්ඡින්න:-** දහවලු සිඳුණු වස්ත්‍ර
- ✠ **ධජාහට:-** නැව් නගින්නන් විසින් බඳිනා ලද ධ්වජ හා යුධ කරන තැන්හි නංවන ලද ධ්වජ ය. ඔවුන් එතැනින් පිටත්ව ගිය පසු ගනු වටී.
- ✠ **ථූප:-** බලි කර්ම පිණිස තුඹස්වල බැඳි වස්ත්‍ර
- ✠ **සමණ චීවර:-** භික්ෂූන් සතු හැඳ ඉවත් කළ චීවර

✠ **සාමුද්දික:-** මුහුදු රළින් වෙරළට ගොඩ ගසන ලද වස්ත්‍ර.

✠ **ආභිසෙකිය:-** රජුන් අභිෂේක කළ තැන්හි හැර දමා ගිය වස්ත්‍ර

✠ **පථික:-** අතරමග වැටුණු වස්ත්‍ර (හිමිකරුවන් අතින් සිහි මුලාව වැටුණු වස්ත්‍ර මඳක් බලා ගත යුතු ය.)

✠ **වාතාහට:-** සුළඟෙන් ගසා ගෙන එන ලද වස්ත්‍ර (හිමියන් නොදක්නා කල්හි ගැනීම වටී)

✠ **ඉද්ධිමය:-** ඒහි භික්ෂු භාවයෙන් සෘද්ධියෙන් ලද වස්ත්‍ර

✠ **දෙවදත්තිය:-** දෙවියන් විසින් දෙන ලද වස්ත්‍ර

## ☸ විසි වැදෑරුම් චීවර සන්තෝස

**"විතක්ක සන්තෝසය, ගමන සන්තෝසය, පරියෙසන සන්තෝසය, පටිලාභ සන්තෝසය, මත්තපටිග්ගහණ සන්තෝසය, ලොලුප්පවිවජ්ජන සන්තෝසය, යථාලාභ සන්තෝසය, යථාබල සන්තෝසය, යථාසාරුප්ප සන්තෝසය, උදක සන්තෝසය, ධොවන සන්තෝසය, කරණ සන්තෝසය, පරිමාණ සන්තෝසය, සුත්ත සන්තෝසය, සිබ්බන සන්තෝසය, රජන සන්තෝසය, කප්ප සන්තෝසය, පරිභොග සන්තෝසය, සන්නිධිපරිවජ්ජන සන්තෝසය, විස්සජ්ජන සන්තෝසය"** යන සිවුර පිළිබඳ විසි වැදෑරුම් සතුටෙන් යුක්ත වීමයි.

**විතක්ක සන්තෝසය :-** චීවරයක් කර ගැනීමට බලාපොරොත්තු වන භික්ෂුව වස් තුන් මස කමටහන් වැඩීම කොට වස් පවරා (චීවර මාසය) ඒ පිළිබඳ ව සිතීම වටී. එම භික්ෂුව වස් පවාරණය කොට චීවර මාසයෙහි සිව්ර කරයි. පාංශුකූලික තෙමේ අඩමසකින්ම කරයි. මෙසේ මසක් හෝ අඩ සමක් පමණ සිවුරු ලැබීම පිළිබඳ ව සිතීම ද කිරීම ද විතක්ක සන්තෝසය නම් වේ.

**ගමනසන්තොසය** :- සිවුරු සෙවීමට යන කල්හි කොතැනින් ලබන්නෙම්ද යනාදිය නො සිතා කර්මස්ථාන සිහියෙන් ම යෑම ගමන සන්තෝසයයි.

**පරියෙසනසන්තොසය** :- සිවුර සොයන්නහු විසින් කවුරුන් සමග හෝ නො සොයා ලැජ්ජාශීලී සුපේශල භික්ෂුවක සමඟ සිවුර සෙවීම පර්යේෂණ සන්තෝසයයි.

**ප්‍රතිලාභ සන්තෝසය** :- එසේ සිවුර සොයන්නා වූ භික්ෂුව ගෙනෙනු ලබන සිවුර දුරදීම දැක මෙය සිනිඳු එකක්ය, මෙය ගොරෝසු එකක්ය යනාදිය නො සිතා සිනිදු හෝ ගොරෝසු හෝ ලැබෙන දෙයින් සතුටු වීම ප්‍රතිලාභ සන්තෝසයයි.

**මත්තපටිග්ගහන සන්තෝසය** :- මෙසේ ලැබෙන දෙය පිළිගැනීමෙහි දී දෙපට චීවරයට ප්‍රමාණය මෙපමණකි, තිනපට චීවරයට ප්‍රමාණය මෙපමණකි යැයි තමන්ට ප්‍රමාණවත් පමණින්ම සතුටු වීම මත්තපටිග්ගහණ සන්තෝසයයි.

**ලොලුප්පවිවජ්ජන සන්තොසය** :- සිවුරක් සොයන්නහුගේ "අසවලාගේ ගෘහයෙන් කැමති දෙයක් ලබන්නෙමි" යැයි නො සිතා ගෙපිළිවලින්ම යාම ලොලුප්පවිවජ්ජන සන්තොසයයි.

**යථාලාභ සන්තොසය** :- රූක්ෂ හෝ ප්‍රණීත දේ අතුරෙහි යම් කිසිවකින් යැපීමට හැකි තැනැත්තා විසින් ලැබුණු අයුරින් යැපීම යථාලාභසන්තේසයයි.

**යථාබල සන්තොසය** :- තමන්ගේ ශක්තිය දැන යමකින් යැපීමට හැකි වේද? එයින් යැපීම යථාබලසන්තෝසයයි.

**යථාසාරුප්‍ය සන්තොසය** :- කැමති දෙය අනෙකෙකුට දී තමා යම් කිසිවකින් යැපීම යථාසාරුප්ප සන්තෝසයයි.

**උදක සන්තොසය** :- කවර තැනක කැමති ජලය වේද කවර තැනක නොකැමැති ජලය වේදැයි නො සිතා සේදීමට සුදුසු දියකින් සේදීම උදක සන්තොසයයි. (පඬුවන්, මැටි මුසු, දුඹුරු වන්, කුණු වූ කොළ මුසු දිය හා කිලිටි වූ දිය දුරු කිරීම වටී.)

**ධොවන සන්තොසය** :- මොහොල් ආදියෙන් නොගසා අතින් මැඩ සේදීම ධොවන සන්තේසය නම්. එසේ පිරිසිදු නොවන දෙය කොළ තැම්බූ දියෙන් වුව ද සේදීමට වටී.

**කරණ සන්තොසය** :- මෙසේ දෙවා කරන්නහුගේ මෙය රළු ය, මෙය මෘදුය යැයි වෙන් නොකොට පොහෝනා අයුරින් ම කිරීම කරණසන්තෝසය නම්.

**පරිමාණ සන්තොසය** :- තෙමඬුලු වැසෙන පමණට පමණ දැන කිරීම පරිමාණසන්තෝසය නම්.

**සුත්ත සන්තොසය** :- සිවුරු කිරීම සඳහා කැමති නූලක් සොයන්නෙමි යැයි නොසලකා මහ මඟ හෝ දේවාල ආදී තැන්හි ඇතියක් හෝ ගෙනවුත් පාමුල හෝ තබන ලද යම්කිසි හුයක් ගෙන කිරීම සුත්තසන්තෝසය නම්.

**සිබ්බන සන්තොසය** :- සිවුරෙහි අතු මූට්ටු කරන විට අඟලක් පමණ වූ තැන සත් වරකට වැඩියෙන් නොවිද මැසිය යුතුය. සිවුර මැසීමට සහායක භික්‍ෂුවක් නැති විට ඔහුට වත් සිඳීමෙහි ඇවැත් නැත. එබඳු අවස්ථාවන්හිදී දැඟුළක් පමණ වූවෙහි සත් වරක් මැසිය යුතුය. මෙය සිබ්බන සන්තෝසය නම්.

**රජන සන්තොසය** :- පඬු පොවන්නහු විසින් අපිරිසිදු හෝ පිරිසිදු පඬු ආදිය සොයමින් නොහැසිරිය යුතුය. සෝම[1] පොතු ආදිය අතුරින් යමක් ලබයි ද එයින් පඬු පෙවිය යුතුයි. නොලබන්නහු විසින්

---

[1] වැල් වර්‍ගයක් යනුවෙන් ද, කළුකිහිරිය ගස යනුවෙන් ද හඳුන්වනු ලැබේ.

මිනිසුන් වනයෙහි පොතු ගෙන ඉවත දැමූ පඬු හෝ භික්ෂූන් විසින් ඉවත ලූ කසට හෝ ගෙන පඬු පෙවිය යුතුයි. මෙය රජන සන්තෝසයයි.

**කප්ප සන්තොසය** :- නිල්, මඩ, කළු, රන්වන් යන මේවා අතුරින් යම් පැහැයකින් ඇතු පිටක සිටින්නෙකුට හඳුනාගත හැකි ලෙසින් කප් බින්දු තැබීම කප්පසන්තෝසයයි.

**පරිභෝග සන්තොසය** :- විලි බිය වැසෙන පමණක් සලකා පරිභෝග කිරීම පරිභෝග සන්තෝසයයි.

**සන්නිධිපරිවජ්ජන සන්තොසය** :- රෙද්දක් ලැබ හුයක් (නූලක්) හෝ ඉදි කටුවක් හෝ කරන්නකු හෝ නොලබන්හු විසින් (නොමසා) තැබීම වටී. ලබන්නහු විසින් නොමසා තැබීම නොවටියි. කරන ලද සිවුර ද ඉදින් අතවැසි ආදීන්ට දෙනු කැමති වේද, ඔවුහු සමීපයෙහි නොවෙත් නම් පැමිණෙන තෙක් තැබීමට වටී. පැමිණි විට දිය යුතුය. දෙන්නට නෙහැක්කහු විසින් අධිෂ්ඨාන කළ යුතුය. අන් සිවුරක් ඇති කල්හි පච්ඡත්ථරණයද[1] අධිෂ්ඨාන කිරීම වටියි. අධිෂ්ඨාන නොකළ දෙය සන්නිධි වෙයි. මෙය සන්නිධිපරිවජ්ජන සන්තෝසයයි.

**විස්සජ්ජන සන්තොසය** :- අන්‍යයන්ට දෙන්නහු විසින් මුහුණ බලා නොදිය යුතුය. සාරාණීය ධර්මයන්හි[2] පිහිටා බෙදිය යුතුය යන මෙය විස්සජ්ජන සන්තොසයයි.

## ☸ චීවර ප්‍රතිසංයුත්ත ධුතාංග

**පාංසුකූලිකාංගය** හා **තෙචීවරිකාංගය** යැයි චීවර පිළිබඳ වූ ධුතාංග දෙකකි. ඉහත කියන ලද පංශුකූලයන්න්ගෙන් යමකින් සිවුරු කොට පරිහරණය කිරීම පංශුකූලිකංගයයි.

---

[1] ඇඳ පුටු ආදියෙහි එළන ඇතිරිල්ල

[2] වැඩිහිටි පිළිවෙළ ආදී ගරු තැන්හි සිට

**තෙචීවරිකංගය** සමාදන් වූ පසු උපසම්පන්න භික්ෂුව විසින් අධිෂ්ඨාන කරන ලද තුන් සිවුරට අමතරව රියනක් දිග හා වියතක් පළල ප්‍රමාණයට වැඩි අන් කිසි වස්ත්‍රයක් පරිහරණය නොකොට තුන් සිවුරෙන් පමණක් යැපීමයි.

මෙසේ චීවර සන්තෝස මහා අරියවංස ප්‍රතිපදව පුරනු ලබන භික්ෂුව මේ ධුතාංග දෙක ආරක්ෂා කරයි. මේවා ආරක්ෂා කරන භික්ෂුව චීවර සන්තෝස මහා අරියවංසයෙන් සතුටු වූයේ වෙයි.

"**ඉතරීතරචීවරසන්තුට්ඨියා ච වණ්ණවාදී**" යනු ලද සිවුරකින් යැපීමෙහි ගුණ කියයි. මෙය සතර වැදෑරුම් වේ.

- ඇතැම් කෙනෙක් ලද චීවරයකින් සතුටු වෙයි, එහි ගුණ කීම නොකරයි. නාලක තෙරුන් මෙනි.
- ඇතැම් කෙනෙක් ලද චීවරයකින් සතුටු නො වෙයි, එහි ගුණ කීම කරයි. උපනන්ද තෙරුන් මෙනි.
- ඇතැම් කෙනෙක් ලද චීවරයකින් සතුටු නොවෙයි, එහි ගුණ කීම ද නොකරයි. ලාලුදයි තෙරුන් මෙනි.
- ඇතැම් කෙනෙක් ලද චීවරයකින් සතුටු වෙයි, එහි ගුණ කීම කරයි. මහා කාශ්‍යප තෙරුන් මෙනි.

"**න ච චීවරහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති**" චීවර හේතුවෙන් අයුතු අන්වේෂණයන්ට නොපැමිණෙයි. මෙහි "**අනෙසන**" යනු ගිහියන් සතුටු කිරීම පිණිස ශාසනික දේවල් ගිහියන්ට දීමයි.

"**අප්පතිරූප**" ශ්‍රමණයන්ට නොගැළපෙන අයුතු වූ කටයුතුවල යෙදෙමින් වැරදි ලෙස සිවුපස ප්‍රත්‍ය සෙවීමයි. එසේ වූ අන්වේෂණ විසි එකක් වෙති. එනම් :-

1. වෙදකම් කිරීම
2. ගිහියන්ගේ පණිවුඩවලට ගෙයින් ගෙට ගමින් ගමට යෑම
3. ගිහියන් කියන වැඩ කර දීම

4. කයෙහි හටගන්නා ගෙඩි පැලීම
5. තුවාලවල ගැල්වීමට බෙහෙත් දීම
6. ළයවිරේක බෙහෙත් කිරීම
7. අධෝවිරේක බෙහෙත් කිරීම
8. නස්‍ය තෙල් දීම
9. පානය කිරීමට බෙහෙත් තෙල් දීම
10. හුණ දඬු දීම.
11. තාම්බූලාදි පත්‍ර දීමය.
12. මල් දීමය.
13. ගෙඩි වර්ග දීම
14. නහන සුනු (සබන්) දෙයි
15. දැහැටි දඬු (දත් මදින බුරුසු) දීමය.
16. මුව දෝවන පැන් දීම
17. ඇඟ ගල්වන සුණු (පියර) ආදිය දීම.
18. වණ්ණවත් මැටි දීමය.
19. තමා පහත් තැන්හි තබා ගිහියන් උසස් තැන්හි තබා කථා කිරීම.
20. ගිහියන් සතුටු කරවීමට සත්‍ය හා බොරු මිශ්‍ර කොට කථා කිරීම
21. ගිහියන්ගේ දරුවන් නැලවීම, හුරතල් කිරීම ආදියයි.

මේ ශාසනයෙහි සැබෑ භික්ෂුව මේ එක් විසි අන්වේෂණයන්ගෙන් චීවර නො සොයයි.

**"අලද්ධා ච චීවරං න පරිතස්සති"** සිවුරු නො ලැබුණේ ද, කෙසේ නම් සිවුරක් ලබන්නේ දැයි කුහකකම් නොකරයි. කුහකකම් කරන්නා තැති ගැනීමට පැමිණෙයි.

**"ලද්ධා ච චීවරං අගධිතො අමුච්ඡිතො අනජ්ඣොසන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති"** ලද චීවරයකින් සතුටු

වන භික්ෂුව මෙසේ සිවුර නො ලැබුණේ නමුත් තැති ගැනීමකට පත් නොවී දැහැමින් සෙමින් චීවර ලබයි. ලෝභාදී කෙලෙස් ගැට දුරු කොට, අධිමාත්‍ර වූ තෘෂ්ණාවෙන් මුසීාවට නොපැමිණ තෘෂ්ණාවෙන් නො වැසී නො ගැලී අනේසනයන්හි ද, ඇවතෙහි ද, තෘෂ්ණාවෙහි ද ලෝභයෙන් ගැට ගැසුණු පරිභෝගයෙහි ද ආදීනව දැක සීත දුරු කිරිම, උෂ්ණ දුරු කිරිම, මැසි මදුරු පීඩා අව් වැසි සුළං පීඩා දුරු කිරීම හා ශරීරය ආවරණය කර ගැනීම ප්‍රයෝජන වශයෙන් සලකා කවර හෝ සිවුරකින් සතුටු වෙයි.

**"තාය ච පන ඉතරීතරචීවරසන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති"** මම පාංශුකූල සිවුරු දරන්නෙක් වෙමි. මා විසින් උපසම්පද මාලකයෙහිදීම පාංසුකූලිකාංගය ගන්නා ලදි. මා සමාන කවරෙක් ඇත් දැයි තමන් උසස් කොට සැලකීම නොකරයි.

**"නො පරං වම්භෙති"** මේ අනෙක් භික්ෂූහු පාංශුකූලිකයෝ නොවෙති යැයි හෝ මොවුන්ට පාංශුකූලික මාත්‍රයක් ද නැතැයි යනුවෙන් අනුන් පහත් කොට නොතකයි.

**"යො හි තත්‍ථ දක්ඛො අනලසො"** එම භික්ෂුව චීවර සන්තෝසයෙහි ගුණ කීම් ආදියෙහි දක්ෂයෙකු ශූරයෙකු ව්‍යක්තයෙකු වෙයි. ලද දෙයින් සතුටු වීමෙහි දක්ෂ වූවෙකු, අලස නොවූවෙකු වෙයි.

**"සම්පජානො පතිස්සතො"** කෙලෙස් තවන නුවණින් හා සිහියෙන් යුක්ත වූයේ වෙයි.

**"අයං වුච්චති, භික්ඛවෙ, භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො"** මහණෙනි, මේ භික්ෂුව අග්‍රයයි දත යුතු පෞරාණික වූ ආර්‍ය්‍ය වංශයෙහි සිටියේ ය.

# ❉ ඉතරීතර පිණ්ඩපාත සන්තෝසය

**පුනචපරං, භික්ඛවෙ, භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන පිණ්ඩපාතෙන, ඉතරීතරපිණ්ඩපාතසන්තුට්ඨියා ච වණ්ණවාදී, න ච පිණ්ඩපාතහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති, අලද්ධා ච පිණ්ඩපාතං න පරිතස්සති, ලද්ධා ච පිණ්ඩපාතං අගධිතො අමුච්ඡිතො අනජ්ඣොසන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති, තාය ච පන ඉතරීතරපිණ්ඩපාතසන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති, නො පරං වම්භෙති. යො හි තත්ථ දක්ඛො අනලසො සම්පජානො පතිස්සතො, අයං වුච්චති, භික්ඛවෙ, භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො.**

"**පුනචපරං, භික්ඛවෙ, භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන පිණ්ඩපාතෙන**" නැවත ද මහණෙනි මේ ශාසනයෙහි භික්ෂුව කටුක හෝ ප්‍රණීත හෝ ලද ආහාරයකින් සතුටු වෙයි.

මෙහි "**යථා ලාභ සන්තෝසය, යථා බල සන්තෝසය, යථා සාරුප්‍ය සන්තෝසය**" යැයි පිණ්ඩපාතය පිළිබඳ ව සන්තෝස තුනකි.

භික්ෂුව කාය පරිහරණයට ප්‍රමාණවත් වූ රළු වූ හෝ සැහැල්ලු වූ හෝ ලද ආහාරයකින් සතුටු වෙයි. ඉන් වැඩියක් බලාපොරොත්තු නොවෙයි. ප්‍රණීත ආහාර ලැබුණේ නමුත් තමන්ගේ පරිහරණය පිණිස නොගනී. මේ භික්ෂුවගේ ආහාරයෙහි **යථා ලාභ සන්තෝසය** යි.

යම් ලෙසකින් ස්වභාවයෙන් ම හෝ ගිලන්කමක් නිසා හෝ ලැබුණු ආහාර අපත්‍යකර වේ ද, එකල්හි අන් සභාග (ප්‍රතිපත්තියෙන් සමාන වූ) භික්ෂුවක් සමග සැහැල්ලු, ප්‍රණීත ආහාරයකට මාර කරගෙන පරිහරණය කරයි. එයින් සතුටු වෙයි. මෙය භික්ෂුවගේ ආහාරයෙහි **යථා බල සන්තෝසය** යි.

භික්ෂුව තමන්ට ලැබෙන හොඳ ආහාර ආචාර්ය, උපාධ්‍ය තෙරුන් වහන්සේලාට අන් වැඩිහිටි භික්ෂූන්ට හෝ ගිලන් භික්ෂූන්ට හෝ අල්ප ලාභීන්ට හෝ පරිත්‍යාග කරයි. තමන් එම භික්ෂූන් වළඳ ඉතිරි වූවක් හෝ පිඩු පිණිස හැසිර හෝ ලැබුණු ආහාරයක් වළඳයි. එයින්

සතුටු වෙයි. මෙය භික්ෂුවගේ ආහාරයෙහි **යථාසාරුප්‍ය සන්තෝසය** යි.

ගිලන් බෙහෙත් ද මෙහි ම ඇතුළත් වෙයි. බෙහෙත් පිළිබඳ සන්තෝසය මෙසේ ය.

භික්ෂුව ගිලන්කමක් ඇති වූ කල්හි ප්‍රමාණවත් වූ රළු වූ හෝ ප්‍රණීත වූ හෝ බෙහෙතක් ලබයි ද එයින් සතුටු වෙයි. ඉන් වැඩියක් බලාපොරොත්තු නොවෙයි. ලැබුණේ නමුත් තමන්ගේ පරිහරණය පිණිස නොගනී. මේ භික්ෂුවගේ ගිලාන ප්‍රත්‍යය ලාභයෙහි **යථා ලාභ සන්තෝසය** යි.

යම් ලෙසකින් හකුරු අවශ්‍ය වූ විටෙක ගිතෙල් ලැබෙයි. එකල්හි අන් සභාග (ප්‍රතිපත්තියෙන් සමාන වූ) භික්ෂුවක් සමග හකුරුවලට අන් දෙයකට හෝ එම ගිතෙල් මාර කරගෙන පරිහරණය කරයි. එයින් සතුටු වෙයි. මෙය භික්ෂුවගේ ගිලාන ප්‍රත්‍ය ලාභයෙහි **යථා බල සන්තෝසය** යි.

භික්ෂුව තමන්ට ලැබෙන හොඳ ප්‍රණීත බෙහෙත් ආචාර්ය්‍ය, උපාධ්‍ය තෙරුන් වහන්සේලාට පරිත්‍යාග කරයි. අන් ගිලන් භික්ෂූන්ට හෝ අල්ප ලාභී භික්ෂූන්ට හෝ පරිත්‍යාග කරයි. තමන් අන් භික්ෂූන්ට ලැබුණු යම් බෙහෙතක් පරිභෝග කරයි. එයින් සතුටු වෙයි.

තව ද භික්ෂූන්ගේ පොදු පරිහරණයට එක් බඳුනක අරළු ගව මුත්‍රයෙහි ලා පල් කර ගන්නා ලද **පූතිමුත්ත භේසජ්ජය** ඇත්තේ වෙයි. **එක් බඳුනක චතුමධුර** ඇත්තේ වෙයි. භික්ෂුව රෝගාබාධයක් ඇති වූ විට මේ පූතිමුත්ත භේසජ්ජය බුද්ධාදී මහෝත්තමයන් වහන්සේලා විසින් වර්ණනා කරන ලද උතුම් ඖෂධයකි යැයි චතුමධුර ප්‍රතික්ෂේප කොට පූතිමුත්ත භේසජ්ජය වළඳයි ද, එම භික්ෂුව පරම සන්තෝසයෙන් යුක්ත වූයෙක් ම වෙයි. මෙය භික්ෂුවගේ ගිලානප්‍රත්‍යය භේසජ්ජයෙහි **යථාසාරුප්‍ය සන්තෝසය** යි.

මෙහි දී **පිණ්ඩපාතය, පිණ්ඩපාත සංතෝෂය, පිණ්ඩපාත ප්‍රතිසංයුත්ත ධුතාංග** යන මේ කරුණු දත යුතු ය.

## ☸ පිණ්ඩපාතය

**"පිණ්ඩපාතන්ති යංකිඤ්චි ආහාරං. යො හි කොචි ආහාරො භික්ඛුනො පිණ්ඩොලෙයන පත්තෙ පතිතත්තා ''පිණ්ඩො''ති වුච්චති. පිණ්ඩානං වා පාතො පිණ්ඩපාතො, තත්‍ථ තත්‍ථ ලද්ධානං භික්ඛානං සන්නිපාතො, සමූහොති වුත්තං හොති"**

පිණ්ඩපාතය යනු යම්කිසි ආහාරයකි. භික්ෂූන්ගේ පාත්‍රයෙහි ආහාර සෙවීම පිණිස යාමෙහි දී පතිත වෙන හෙයින් යම්කිසි ආහාරයක් පිණ්ඩපාත යැයි කියනු ලැබේ. මෙලෙස ඒ ඒ තැන්හි දී ලත් ආාහර පාත්‍රය හෝ ආහාර සමූහය පිණ්ඩපාතය නම් වේ. **"ඕදනො කුම්මාසො සත්තු මච්ඡො මංසං ඛීරං දධි සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං යාගු ඛාදනීයං සායනීයං ලෙහනීයන්ති සොළස පිණ්ඩපාතා"** යනුවෙන් පිණ්ඩපාතය සොළොස් වැදෑරුම් වේ. එහි :-

- ✠ **ඕදන:-** හැල් වී, අනෙකුත් වී වර්ග, යව (බාර්ලි), තණ හාල්, වර ධාන්‍ය, කුරක්කම්, තිරිඟු යන සත් වැදෑරුම් ධාන්‍යයෙන් පිසූ බත. ය. (හැඳි ආදියකින් බත් ගත් කල්හි නොපෑහී අඩුව පෙනෙයි ද මෙය ඕදන නම් වේ.)
- ✠ **සත්තු:-** හැල්, වී, යව ධාන්‍යවල බැදි පිටි ය.
- ✠ **කුම්මාස:-** යව කුරක්කන් සහල් තිරිඟු ආදියෙන් නිපදවන පිට්ටු ය.
- ✠ **මංස:-** අලිමස්, කොටිමස්, වලස්මස්, කලු වලස්මස්, සිංහමස්, අශ්වමස්, බලුමස්, සර්පමස්, ව්‍යාග්‍රමස්, මිනීමස් යන මස් වර්ග දසය හැර අන් සියලු මස් වර්ග කැප වේ.

- ✠ **මච්ඡ:-** දියෙහි උපදින සියලු මත්ස්‍ය වර්ගයන් ය.
- ✠ **ඛීරං :-** එළකිරි පිටිකිරි ආදී සියලු කිරි වර්ග
- ✠ **දධි :-** දීකිරි, මිදුණු කිරි.
- ✠ **සප්පි :-** ගිතෙල්, එළගිතෙල්.
- ✠ **නවනීත :-** වෙඬරු.
- ✠ **තෙල:-** තල තෙල්; තෙල්.
- ✠ **මධු :-** මී පැණි.
- ✠ **ඵාණිත :-** උක්පැණි; පැණි.
- ✠ **යාගු :-** කැඳ, හුලුකැඳ.
- ✠ **ඛාදනීය :-** කැවිලි ආදී කඩා කෑයුතු දෑ.
- ✠ **සායනීය :-** රස වින්ද යුතු දෑ.
- ✠ **ලෙහනීය :-** ලෙවියයුත්ත, (ලෙවකෑ යුත්ත)

## ☸ පිණ්ඩපාත ක්ෂේත්‍රය

පිණ්ඩපාත ක්ෂේත්‍ර යනු පිණ්ඩපාතය උපදනා ස්ථානයි. එය කෙතක් මෙන් වූ බැවින් පිණ්ඩපාත ක්ෂේත්‍රය නම් වේ. **සංඝභත්ත, උද්දේසභත්ත, නිමන්තන, සලාකභත්ත, පක්ඛික, උපොසථික, පටිපාදික, අගන්තුක භත්ත, ගමික භත්ත, ගිලාන භත්ත, ගිලානුපට්ඨාක භත්ත, ධූරභත්ත, කුටිභත්ත, වාරකභත්ත, විහාරකභත්ත** යනුවෙන් එබඳු ක්ෂේත්‍ර පසළොසක් වෙති. එහි:-

- ✠ **සංඝභත්ත:-** සංඝයාගෙන් හෝ සංඝයා උදෙසා දයක ආදීන්ගෙන් භික්ෂූන්ට ලැබෙන බත
- ✠ **උද්දේසභත්ත:-** නියම කර දෙන බත, උදෙසා දෙන බත, තුදුස් බතින් එකක්, සළාක වශයෙන් ගතයුතු බත.

| | |
|---|---|
| ✠ **නිමන්තන:-** | නිමන්ත්‍රණය කොට, පවරා පිරිනමන බත |
| ✠ **සලාකභත්ත:-** | සීට්ටු අනුව දෙන බත. |
| ✠ **පක්ඛික:-** | පක්ෂයක් පාසා දෙන බත |
| ✠ **උපොසථික:-** | පොහොයක් පාසා පිරිනමන බත |
| ✠ **පටිපාදික:-** | පෑලවිය (පොහොයට පසු දින) දෙන බත |
| ✠ **අගන්තුක භත්ත:-** | ආගන්තුක භික්ෂූන්ට දෙන දානය |
| ✠ **ගමික භත්ත:-** | ගමන් යන භික්ෂූන් උදෙසා දෙන බත |
| ✠ **ගිලාන භත්ත:-** | ගිලන් භික්ෂූන් උදෙසා දෙන බත |
| ✠ **ගිලානුපට්ඨාක භත්ත:-** | ගිලානෝපස්ථායක භික්ෂූන් උදෙසා දෙන බත |
| ✠ **ධූරභත්ත:-** | ගෘහයෙහිදී ම දිය යුතු බත |
| ✠ **කුටිභත්ත:-** | වෙන් කර ගත් කුටියක වෙසෙන භික්ෂූන් උදෙසා දෙන බත |
| ✠ **වාරකභත්ත:-** | ගම්වැසීන්ට විසින් වාරයෙන් වාරයට පිරිනමන බත |
| ✠ **විහාරකභත්ත** | අසවල් විහාරයට යැයි කියා වෙන් කර ගත් විහාරය උදෙසා පිරිනමන බත |

## ☸ පිණ්ඩපාත සංතෝෂය

පිණ්ඩපාතය පිළිබඳ ව ද "**විතක්කසන්තෝසය, ගමන සන්තොසය, පරියෙසන සන්තොසය, පටිලාභ සන්තොසය, පටිග්ගහණ සන්තොසය, මත්තපටිග්ගහණ සන්තොසය, ලොල්ලුප්පවිවජ්ජන සන්තොසය, යථාලාභ සන්තොසය, යථාබල සන්තොසය, යථාසාරුප්ප සන්තොසය, උපකාර සන්තොසය පරිමාණ සන්තොසය, පරිභෝග සන්තොසය, සන්නිධි පරිවජ්ජන සන්තෝසය, විසජ්ජන සන්තොසය**" යැයි සතුටු වීම් පසළොසක් වෙති. එහි:-

**විතක්කසන්තෝසය:-** පිණ්ඩපාතය ඉවසන්නා වූ භික්‍ෂුව මුව දෙවා විතර්ක මාලකයට පැමිණ අද මම කවර තැනක පිඬු පිණිස හැසිරෙම්දැයි විමසා බැලීම විතක්ක සන්තෝසයයි.

**ගමන සන්තොසය:-** පිඩු පිණිස හැසිරෙන්නාහු විසින් කවර තැනින් ලබන්නෙම්දැයි නො සිතා කමටහන් අත් නොහැර යෑම ගමන සන්තෝසයයි.

**පරියෙසන සන්තොසය:-** පිණ්ඩපාතය සොයන්නහු විසින් ඒ මේ දෙය නොගෙන ලැජ්ජා සහගත වූ විනිත දෙයම සෙවීම පර්යේෂණ සන්තෝසයයි.

**පටිලාභ සන්තොසය:-** දුරදීම ගෙනෙනු ලබන දෙය දැක මෙය කැමති දෙයක් ද අකැමැති දෙයක් දැයි සිතක් නො ඉපදවීම ප්‍රතිලාභ සන්තෝසයයි.

**පටිග්ගහණ සන්තොසය:-** යැපෙන පමණට යම කිසිවක් ගත යුත්තේමය. මෙය පටිග්ගහණ සන්තොසයයි.

**මත්තපටිග්ගහණ සන්තොසය:-** දෙනු ලබන දෙය බොහෝ ඇත්තේ ද, දායකයා මදක් දෙනු කැමැත්තේ ද එවිට මදක් ගත යුතුය. දෙය්‍යධර්මය බොහෝ ඇත්තේ ද, දායකයාත් බොහෝ දෙනු කැමැත්තේ ද, එවිට පමණ දැන ගත යුතුය. දෙය්‍යධර්මය ස්වල්පයක් වේ ද, දායකයා මඳක් දෙනු කැමැත්තේ ද මඳක් ගත යුතුය. දෙය්‍යධර්මය ස්වල්පයක් වේ ද, දායකයා බොහෝ දෙනු කැමැත්තේ ද පමණ දැන ගත යුතුය. පිළිගැනීමෙහි දී පමණ නොදන්නා තැනැත්තා මිනිසුන්ගේ පැහැදීම මකා දමයි. සැදැහැයෙන් දෙන දෙය පිරිහෙලයි. ශාස්තෘ ශාසනය නොකරයි. වැදූ මවගේ සිත ගැනීමට ද නොහැකි වෙයි. මෙසේ පමණ දැනම පිළිගත යුතය යන මෙය මත්තපටිග්ගහණ සන්තෝසයයි.

**ලොල්ලුප්පවිවජ්ජන සන්තොසය:-** ආඪ්‍ය (පොහොසත්) කුලයන්ටම නොගොස් ගෙපිළිවෙළින් පිඩු පිණිස යා යුතුය. මෙය ලොලුප්පවිවජ්ජන සන්තොසයයි.

**යථාලාභ සන්තොසය**:- භික්ෂුව කාය පරිහරණයට ප්‍රමාණවත් වූ රළු වූ හෝ සැහැල්ලු වූ හෝ ලද ආහාරයකින් සතුටු වෙයි. ඉන් වැඩියක් බලාපොරොත්තු නොවෙයි. ප්‍රණීත ආහාර ලැබුණේ නමුත් තමන්ගේ පරිහරණය පිණිස නොගනී. මෙය යථා ලාභ සන්තෝසය යි.

**යථාබල සන්තොසය**:- යම් ලෙසකින් ස්වභාවයෙන් ම හෝ ගිලන්කමක් නිසා හෝ ලැබුණු ආහාර අපත්‍යකර වේ ද, එකල්හි අන් සභාග[1] භික්ෂුවක් සමග සැහැල්ලු, ප්‍රණීත ආහාරයකට මාර කරගෙන පරිහරණය කරයි. එයින් සතුටු වෙයි. මෙය යථා බල සන්තෝසය යි.

**යථාසාරුප්‍ය සන්තොසය**:- භික්ෂුව තමන්ට ලැබෙන හොඳ ආහාර ආචාර්‍ය්‍ය, උපාධ්‍ය තෙරුන් වහන්සේලාට අන් වැඩිහිටි භික්ෂූන්ට හෝ ගිලන් භික්ෂූන්ට හෝ අල්ප ලාභීන්ට හෝ පරිත්‍යාග කරයි. තමන් එම භික්ෂූන් වළඳ ඉතිරි වූවක් හෝ පිඬු පිණිස හැසිර හෝ ලැබුණු ආහාරයක් වළඳයි. එයින් සතුටු වෙයි. යථාසාරුප්‍ය සන්තෝසයයි.

**උපකාර සන්තොසය**:- මෙසේ පිණ්ඩපාතය වළඳ ශ්‍රමණ ධර්‍මය ආරක්‍ෂා කර ගන්නෙමි යැයි උපකාරය දැන වැළඳීම උපකාර සන්තොසයයි.

**පරිමාණ සන්තොසය**:- පාත්‍රය ආහාරයෙන් පුරවා ගෙන දුන් දෙය නො පිළිගත යුතුය. අනුසම්පන්නයකු ඇති විට ඔහු ලවා ගෙන්වා ගත යුතු ය. එසේ නොමැති කල්හි වැඩි කොටස අස් කරවා යැපිය හැකි පමණක් ම ගත යුතුය. මෙය පරිමාණ සන්තොසයයි.

**පරිභෝග සන්තොසය**:- කුසගින්න දුරුකිරීම මෙහි නිස්සරණයි මෙසේ වැළඳීම පරිභෝග සන්තොසයයි.

**සන්නිධි පරිවජ්ජන සන්තෝසය**:- පසුව වැළඳීමට යැයි ආහාර කොටස් රැස් කොට පසෙක තබා නො වැළඳිය යුතුය. මෙය සන්නිධි පරිවජ්ජන සන්තොසයයි.

[1] සීලාදී ප්‍රතිපත්තියෙන් සමාන

**විසජ්ජන සන්තොසය**:- අන්‍යයන්ට දෙන්නහු විසින් මුහුණ බලා නොදිය යුතුය. සාරාණීය ධර්මයන්හි පිහිටා බෙදිය යුතුය යන මෙය විස්සජ්ජන සන්තොසයයි.

## ☸ පිණ්ඩපාත ප්‍රතිසංයුත්ත ධුතාංග

**පිණ්ඩපාතිකාංගය, සපදානචාරිකාංගය, ඒකාසනිකාංගය, පත්තපිණ්ඩිකාංගය, ඛලුපච්ඡාභත්තිකාංගය** යැයි පිණ්ඩපාත ප්‍රතිසංයුක්ත ධූතාංගයෝ පසක් වෙති. එහි:-

**පිණ්ඩපාතිකාංගය:**- දායකාදීන් තමන් වෙසෙන තැනට ගෙනවිත් පිරිනමන ආහාරය නො පිළිගෙන පිඬු පිණිස ගමෙහි හැසිර ලද දෙයකින් යැපීම පිණ්ඩපාතිකංගයයි.

**සපදානචාරිකාංගය:**- දුප්පත් පොහොසත් දුර ළඟ ආදී කිසි භේදයකින් තොරව එක ගෙයක් වත් අත් නොහැර පිඬු සිඟා යාම සපදානචාරිකාංගයයි.

**ඒකාසනිකාංගය:**- දවසෙහි නැවත නැවත වාර කිහිපයක් ආහාර නොගෙන වැළඳීමට වාඩි වූ ආසනයෙහිදීම අවශ්‍ය සියල්ල වළඳා නැගිටීම ඒකාසනිකාංගයයි.

**පත්තපිණ්ඩිකාංගය:**- ආහාර කෘත්‍යය කරන සියල්ල පාත්‍රයෙහි හෝ අන් එක බඳුනකම පමණක් වැළඳීම පත්තපිණ්ඩිකාංගයයි.

**ඛලුපච්ඡාභත්තිකාංගය:**- බත් පිට්ටු අග්ගලා ආදී පඤ්ච භොජනයට අයත් වන දෑ වළඳමින් සිටින විට අන් කෙනෙක් නැවත එබඳු ප්‍රධාන ආහාරයක් ගෙන අත්පසට පැමිණ බෙදීමට තැත් කිරීමෙහි දී එය ප්‍රතික්ෂේප කළහොත් මෙම ධුතාංගය සමාදන් වූ භික්ෂුවට නැවත වැළඳිය නොහැක. මෙය ඛලුපච්ඡාභත්තිකාංගයයි.

මෙසේ ඉතරීතර පිණ්ඩපාත සන්තෝස මහා අරියවංස ප්‍රතිපදව පුරනු ලබන භික්ෂුව මේ ධූතාංග පස ආරක්‍ෂා කරයි. මේවා ආරක්‍ෂා කරන භික්ෂුව පිණ්ඩපාත සන්තෝස මහා අරියවංසයෙන් සතුටු වූයේ වෙයි.

**"ඉතරීතරපිණ්ඩපාතසන්තුට්ඨියා ච වණ්ණවාදී"** යනු ලද පිණ්ඩපාතයකින් යැපීමෙහි ගුණ කියයි. මෙය සතර වැදෑරුම් වේ. චීවර කථාවෙහි කියන ලද ක්‍රමයෙන් දත යුතු ය.

**"න ච පිණ්ඩපාතහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති"** ආහාර ලබනු සඳහා එක් විසි අන්වේෂණයන්හි නො යෙදේ ද, පැවිද්දන් විසින් නොකළ යුතු දේ නොකරයි.

**"අලද්ධා ච පිණ්ඩපාතං න පරිතස්සති"** ආහාර නොලැබුණේය කියා නොතැවෙයි.

**"ලද්ධා ච පිණ්ඩපාතං අගධිතො අමුච්ඡිතො අනජ්ඣොසන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති"** ආහාර ලැබුණු කල්හි එහි නො ඇලී තණ්හාවෙන් මුළා නොවී, තණ්හාවට යට නොවී නුසුදුසු ලෙස ආහාර සෙවීමේ දෙස් දක්නේ තෘෂ්ණාවෙන් මිදෙන නුවණින් යුක්ත වූයේ ආහාර වළඳයි.

**"තාය ච පන ඉතරීතර පිණ්ඩපාත සන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති"** එලෙස ලද ආහාරයකින් සතුටු වීම හේතුවෙන් තමා උසස් කොට කථා නොකරයි.

**"නො පරං වම්භෙති"** ඒ ගුණය නැත යැයි අනුන් පහත් කොට කථා නොකරයි.

**"යො හි තත්‍ථ දක්ඛො අනලසො"** පිණ්ඩපාත සන්තෝසයේ ගුණ කීම් ආදියට දක්‍ෂ වේ ද, අනලස් වේ ද,

**"සම්පජානො පතිස්සතො"** කෙලෙස් තවන සිහියෙන් හා නුවණින් යුක්ත වෙයි.

**"අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො"** ඒ භික්ෂුව පෞරාණික වූ අග්‍ර වූ ආර්‍ය වංශයෙහි පිහිටියේ වෙයි.

# ❄ ඉතරීතර සේනාසන සන්තෝසය

**පුනචපරං, භික්ඛවෙ, භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන සෙනාසනෙන, ඉතරීතරසෙනාසනසන්තුට්ඨියා ච වණ්ණවාදී, න ච සෙනාසනහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති, අලද්ධා ච සෙනාසනං න පරිතස්සති, ලද්ධා ච සෙනාසනං අගධිතො අමුච්ඡිතො අනජ්ඣොසන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති, තාය ච පන ඉතරීතරසෙනාසනසන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති, නො පරං වම්භෙති. යො හි තත්ථ දක්ඛො අනලසො සම්පජානො පතිස්සතො, අයං වුච්චති, භික්ඛවෙ, භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො.**

**"පුනචපරං, භික්ඛවෙ, භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන සෙනාසනෙන"** නැවත ද මහණෙනි මේ ශාසනයෙහි භික්ෂුව කටුක හෝ ප්‍රණීත හෝ ලද සෙනසුනකින් සතුටු වෙයි.

මෙහි **"යථා ලාභ සන්තෝසය, යථා බල සන්තෝසය, යථා සාරුප්‍ය සන්තෝසය"** යැයි සේනාසන පිළිබඳ ව සන්තෝස තුනකි.

භික්ෂුව මනාප වූ හෝ අමනාප වූ හෝ සෙනසුනක් ලැබ එයින් සතුටු වෙයි. එයින් සිතෙහි අමනාපයක් ඇති නොකරගනී. ඉන් වැඩියක් බලාපොරොත්තු නොවෙයි. මනාප සෙනසුනක් ලැබුණේ නමුත් තමන්ගේ පරිහරණය පිණිස නොගනී. මේ භික්ෂුවගේ සේනාසනයෙහි **යථා ලාභ සන්තෝසය** යි.

යම් ලෙසකින් ස්වභාවයෙන් ම හෝ ගිලන්කමක් නිසා හෝ වයෝවෘද්ධ නිසා හෝ ලැබුණු සෙනසුන හේතුවෙන් යම් අපහසුවක් වේ ද, එකල්හි අන් සභාග (ප්‍රතිපත්තියෙන් සමාන වූ) භික්ෂුවක් සමග ගැලපෙන සෙනසුනකට මාර කරගෙන පරිහරණය කරයි. එයින් සතුටු වෙයි. මෙය භික්ෂුවගේ සේනාසනයෙහි **යථා බල සන්තෝසය** යි.

භික්ෂුව තමන්ට ලැබෙන හොඳ සෙනසුන් ආචාර්‍ය්‍ය, උපාධ්‍ය තෙරුන් වහන්සේලාට පරිත්‍යාග කරයි. ගිලන් භික්ෂූන්ට හෝ අල්ප ලාභී වූ භික්ෂූන්ට හෝ පරිත්‍යාග කරයි. තමන් කුඩා වූ හෝ රළු වූ හෝ සෙනසුනක් පරිභෝග කරයි. තව ද උතුම් සෙනසුන් නම් ප්‍රමාදයට කරුණු වූ ස්ථානයකි. එහි වාසය කරන්නහුට ථිනමිද්ධය ඇති වේ. සැපයෙහි ඇලී වසන්නහු නින්දෙන් මැඩ ගනී. පිබිදුණු කල්හි කෙලෙස් අරමුණු හට ගනී යැයි සිතා උසස් සෙනසුන් ලැබුණු විට ඒවා ප්‍රතික්ෂේප කොට වෘක්ෂමූල, අභ්‍යවකාශ ආදී තැන්හි වාසය කොට එයින් සතුටු වෙයි. මෙය භික්ෂුවගේ සේනාසනයෙහි **යථාසාරුප්‍ය සන්තෝසය** යි.

මෙහි දී **සෙනාසනය**, **සෙනාසනක්ෂේත්‍රය**, **සේනාසන සන්තොසය**, **සේනාසන ප්‍රතිසංයුක්ත ධුතාංග** දත යුතුය.

## ☸ සෙනාසනය

**සේනාසන** යනු සයනය කරන, හිඳින ආසන ඇති තැන් ය. මෙය වනාහි ඇඳ පුටු ආදියට නමකි. **ඇඳ**, **පුටුව**, **මෙට්ටය**, **කොට්ටය**, **විහාරය**, **අඩ්ඪයෝගය**, **ප්‍රාසාදය**, **සඳලුතලය**, **ගුහාව**, **අට්ටාලය**, **මිදුල**, **ලෙන**, **උණ පඳුර**, **වෘක්ෂමූලය**, **මණ්ඩපය** යැයි සේනාසන පසළොසක් වේ. යම් තැනකට භික්ෂූන් වහන්සේලා පැමිණෙත් ද ඒ සියල්ල **සේනාසන** නම් වේ.

මෙම සේනාසන **විහාර සේනාසන**, **මඤ්චපීඨ සේනාසන**, **සන්තථ සේනාසන**, **ඕකාස සේනාසන** යැයි සතර වැදෑරුම් වේ. එහි:-

- ❖ විහාරය, අඩ්ඪයෝගය, ප්‍රාසාදය, සඳලුතලය, ගුහාව යන පස **විහාර සේනාසන** නම් වේ.

- ❖ ඇඳ, පුටුව, මෙට්ටය, කොට්ටය යන සතර **මඤ්චපීඨ** සේනාසන නම් වේ.

- ❖ තල් කොළ ඇතිරිය, සම් කඩ, තෘණ ඇතිරිය, කොළ ඇතිරිය යන සතර **සන්තථ සේනාසන** නම් වේ.

- ❖ යම් තැනකට භික්ෂූන් වහන්සේලා නැවත පැමිණෙත් ද ඒ තැන් **ඕකාස සේනාසන** නම් වේ.

තව ද ලිහිණියෙකුට සමාන පැවතුම් ඇති සිව් දිසාවන්ගෙන් කැමති ඕනෑම දිසාවක ඕනෑම තැනක් භික්ෂුවගේ වාසයට සුදුසු වන්නේය. ඒ බව දැක්වීමට **ආරණ්‍ය, වෘක්ෂමූල, පර්වත, කඳුරැළි, ගිරිගුහා, සොහොන, වනලැහැබ, එළිමහන් තැන, පිදුරු ගෙය** යන සෙනසුන් නවය වදළ සේක. එහි:-

- ❖ ගමක හෝ නියම්ගමක හෝ නගරයක ඇති ඉන්ද්‍රකීලයෙන් පිටත **ආරණ්‍ය** නම් වේ. මෙය භික්ෂුණීන්ගේ වශයෙනි. භික්ෂූන්ගේ වශයෙන් ඉන්ද්‍රකීලයෙහි සිට දුණු පන්සියයකින් (සැතපුමක්) ඈත ප්‍රදේශය **ආරණ්‍ය** නම් වේ.

- ❖ මධ්‍යාහ්න කාලයෙහි හාත්පසින් බොහෝ ප්‍රදේශයක සෙවන ඇති සුළං නැති විට ඈතට කොළ වැටෙන ඝනව වැවුණු ජනයා ගැවසීමක් නැති වෙන් ව පිහිටි ගසක යට ප්‍රදේශය **වෘක්ෂමූලය** නම් වේ.

- ❖ ජනයා නො ගැවසෙන අන් කිසි බාධාවක් නැති විවේකය ඇති ගල් පර්වතය හෝ පස් කන්ද **පර්වත** නම් වේ. එහි ඇති හෙබකින් (පොකුණ) ජලය පානය කර ගත සිසිල් කරගෙන සිසිල් සුළං හමන තැනක පර්යංකයක් බැඳ හුන් කල්හි සිත එකග වේ.

- ❖ කඳු දෙකක් අතර හෝ ගල් පර්වත දෙකක් අතර එක් පැත්තක හෝ දෙපැත්තෙහි ම ජල පහරින් හැරුණා වූ විවර **කන්දර** නම් වේ. මෙයට **නිතම්බ** යැයි ද **ගං දෙණිය** යැයි ද කියනු ලැබේ. එබඳු තැන්හි රිදී පටක් වැනි වැලිතලා ඇත. උඩින් මැණික්

වියනක් වැනිව පිහිටි වන ගහනය ඇත. මැණික් කඳන් වැනිව ජලය ගලා බසී. මෙවැනි කඳුරකට ගොස් ජලය පානය කොට ගත සිසිල් කොට වැලි ගොඩ කර ඒ මත පාංශුකූල චීවරය එළා පර්‍ය්‍යංකයක් බැඳ වැඩහුන් කල්හි සිත එකඟ වේ.

- ❖ පර්‍වත දෙකක් අතර එක් පසෙක හෝ දෙපසෙහිම හෝ උමඟක් වැනිව පිහිටි විවර **ගිරි ගුහා** නම් වේ.

- ❖ යම් තැනක එක් මිනියක් හෝ දවන ලද්දේ ද එතැන් පටන් එම භූමියෙහි නැවත මිනී නො දැවුව ද **සොහොන** හෙවත් **සුසානය** නම් වේ. මෙබඳු තැන්හි සක්මන් - මඬු ආදිය තනා, ඇඳ - පුටු පනවා නො සිටිය යුතුය. විහාරයෙහි සංඝ ස්ථවිරයන්ට ද ගම් ප්‍රධානියාට ද දන්වා ජීවිතාශාව හැර රාත්‍රියෙහි සොහොනට ගොස් මැදි යම් රැය එහි කමටහන් වඩමින් ගත කොට අලුයම එයින් නික්ම යා යුතුය. (වැඩි විස්තර විශුද්ධි මාර්‍ගයෙන් බලා දත යුතුය.)

- ❖ ග්‍රාමාන්තය ඉක්මවා ගියා වූ සිංහ, ව්‍යාඝ්‍රාදී දරුණු වන සතුන් වසන, නයි - පොළොන් - පිඹුරන් වැනි උරගයන් වෙසෙන ජීවිත ආශාව අත්හැර යා යුතු වූ ගොවිතැන් ආදී කිසි කර්‍මාන්තයක් පිණිස මිනිසුන් නොයන ඈත ප්‍රදේශ **වනලැහැබ** හෙවත් **ප්‍රාන්ත සේනාසන** නම් වේ.

- ❖ විවෘත ආකාශය ඇති තැන **අභ්‍යවකාශය** හෙවත් **එළිමහන් තැන** නම් වේ. එහි සතර රියනක සිවුරු කුටියක් සාද එහි විසිය හැක.

- ❖ මහත් පිදුරු කන්දක යටින් පිදුරු ඉවත් කොට පර්‍වත ගුහාවක් වැනිව කුහර සාද හෝ වනලැහැබක් මත පිදුරු අතුරා ඇතුළත ගුහාවක් සේ සකසා එහි ඇතුළත සිටිය හැකි වේ ද මෙය **පිදුරු ගෙය** නම් වේ.

## ☸ සෙනාසනක්ෂේත්‍රය

සේනාසනක්ෂේත්‍ර යනු සේනාසන උපදනා ස්ථාන හෙවත් ලැබෙන ක්‍රමයි. එය කෙතක් මෙන් වූ බැවින් සේනාසනක්ෂේත්‍රය නම් වේ. යනු **සඞ්ඝතො වා ගණතො වා ඤාතිතො වා මිත්තතො වා අත්තනො වා ධනෙන පංසුකූලං** යනුවෙන් **සංඝයාගෙන් හෝ ගණ (සමූහ) යාගෙන් හෝ ඥාතීන්ගෙන් හෝ මිත්‍රයන්ගෙන් හෝ තමන්ගේ ධනයෙන් ලද හෝ පාංශුකූල වශයෙන්** යැයි සේනාසනක්ෂේත්‍ර සයකි.

## ☸ සේනාසන සන්තොසය

**විතක්කසන්තෝසය:-** සෙනසුනක් බලාපොරොත්තු වන භික්ෂුව ඒ පිළිබඳ ව බොහෝ කල් සිත සිතා නො සිට මසක් ඇතුළත එය ලැබෙන මගක් සිතීමයි. සෙනසුන් පිළිබඳ ධුතාංග සමාදන් වූ භික්ෂුවට එය දින පසලොසක් සිතීමයි. මෙය විතක්ක සන්තෝසයයි.

**ගමන සන්තොසය:-** සෙනසුන් කවර තැනකින් ලබන්නෙම්දැයි නො සිතා කමටහන් අත් නොහැර යෑම ගමන සන්තෝසයයි.

**පරියෙසන සන්තොසය:-** සේනාසනය සොයන්නහු විසින් දුස්සීල පාප භික්ෂූන් සමග නොගොස්, ලජ්ජී සුපේෂල ශික්ෂාකාමී භික්ෂුවක් සමග ගොස් සෙනසුන සෙවීම, පර්යේෂණ සන්තෝසයයි.

**පටිලාභ සන්තොසය:-** තමන්ට ලැබෙන සෙනසුන් භාණ්ඩාදිය දුරදීම දැක මෙය මා කැමති දෙය ය, මෙය අකැමැති දෙය ය යැයි සිතක් නො ඉපදවීම ප්‍රතිලාභ සන්තෝසයයි.

**පටිග්ගහණ සන්තොසය:-** තණ්හා දිට්ඨි මානා දී කෙලෙස් නූපදින ලෙසට ප්‍රත්‍යවේක්ෂා නුවණින් සෙනසුන (සේනාසන භාණ්ඩ) පිළිගැනීම පටිග්ගහණ සන්තොසයයි.

**මත්තපටිග්ගහණ සන්තොසය:-** සෙනසුන් භාණ්ඩ බොහෝ ඇත්තේ ද, දයකයා මදක් දෙනු කැමැත්තේ ද එවිට මදක් ගත යුතුය.

දෙය්‍යධර්මය බොහෝ ඇත්තේ ද, දායකයාත් බොහෝ දෙනු කැමැත්තේ ද, එවිට පමණ දැන ගත යුතුය. දෙය්‍යධර්මය ස්වල්පයක් වේ ද, දායකයා මඳක් දෙනු කැමැත්තේ ද මඳක් ගත යුතුය. දෙය්‍යධර්මය ස්වල්පයක් වේ ද, දායකයා බොහෝ දෙනු කැමැත්තේ ද පමණ දැන ගත යුතුය. මෙය මත්තපටිග්ගහණ සන්තෝසයයි.

**ලොල්ලුප්පවිවජ්ජන සන්තොසය:-** අසවල් දායකයා වෙත ගියේ වී නම් ඉතා හොඳ දෙයක් ලැබෙයි යැයි නො සිතා තේරීමක් නොකොට අවශ්‍ය දෙය සොයා යෑම ලොලුප්පවිවජ්ජන සන්තොසයයි.

**යථාලාභ සන්තොසය:-** ලද දෙයින් සතුටු වීම යථා ලාභ සන්තෝසය යි.

**යථාබල සන්තොසය:-** එසේ ලද සෙනසුන පරිහරණයට අපහසු වේ ද, ප්‍රතිපත්තියට යෝග්‍ය නොවේ ද එවිට අන් භික්ෂුවක් සමග සුදුසු දෙය මාර කරගෙන පරිහරණය කිරීම යථා බල සන්තෝසය යි.

**යථාසාරුප්‍ය සන්තොසය:-** භික්ෂුව තමන්ට ලැබෙන හොඳ සෙනසුන ආචාර්‍ය්‍ය, උපාධ්‍ය තෙරුන් වහන්සේලාට අන් වැඩිහිටි භික්ෂූන්ට හෝ ගිලන් භික්ෂූන්ට හෝ අල්ප ලාභීන්ට හෝ පරිත්‍යාග කරයි. තමන් එම භික්ෂූන් පරිභෝග කළ එකක් පරිහරණය කර සතුටු වීම යථාසාරුප්‍ය සන්තෝසයයි.

**උපකාර සන්තොසය:-** එම සෙනසුන පරිහරණය කිරීමෙහි දී සීල සමාධි ප්‍රඥා වැඩීමට ලැබෙන උපකාරය දැන ප්‍රත්‍යවේක්ෂා නුවණින් පරිහරණය කිරීම උපකාර සන්තොසයයි.

**පරිමාණ සන්තොසය:-** ඇඳ පුටු ආදිය බොහෝ ඇත්තේ නමුත් තමන්ට අවශ්‍ය එකක් තෝරාගෙන පරිහරණය කිරීම පරිමාණ සන්තොසයයි.

**පරිභෝග සන්තොසය:-** තමන්ට ලැබෙන දෙය අන්‍යයන්ටත් බෙදා දෙමින් පරිභෝග කරන වාරයක් පාසා ම ප්‍රත්‍යවේක්ෂා නුවණින් යුතුව පිරිසිදු සිතින් පරිහරණය කිරීම පරිභෝග සන්තොසය නමි.

**සන්නිධි පරිවජ්ජන සන්තෝසය:**- තමාට ලැබෙන සෙනසුන් භාණ්ඩ රැස් කොට තබා නොගෙන සුදුසු ලෙස අන්‍යයන්ටත් බෙදා දී පරිහරණය කිරීම සන්නිධි පරිවජ්ජන සන්තොසය නම්.

**විසජ්ජන සන්තොසය:**- අන්‍යයන්ට දෙන්නහු විසින් මුහුණ හිත අහිත භේදයකින් තොරව සාරාණීය ධර්මයෙහි පිහිටා බෙදිය යුතුය යන මෙය විස්සජ්ජන සන්තොසයයි.

## ☸ සේනාසන ප්‍රතිසංයුක්ත ධුතාංග

**අරඤ්ඤිකංගය, රුක්ඛමූලිකංගය, අබ්භොකාසිකංගය, සොසානිකංගය, යථා සන්ථතිකංගය** යැයි සේනාසන ප්‍රතිසංයුකත වූ ධූතාංගයෝ පසක් වෙති.

**අරඤ්ඤිකංගය:**- ගමක හෝ නියම්ගමක හෝ නගරයක ඇති ඉන්ද්‍රකීලයෙන් පිටත **ආරණ්‍ය** නම් වේ. මෙය භික්ෂුණීන්ගේ වශයෙනි. භික්ෂූන්ගේ වශයෙන් ඉන්ද්‍රකීලයෙහි සිට දුණු පන්සියයකින් (සැතපුමක්) ඈත ප්‍රදේශය **ආරණ්‍ය** නම් වේ. එබඳු වූ ආරණ්‍ය සෙනසුන්හි විසීම අරඤ්ඤිකංගයයි.

**රුක්ඛමූලිකංගය:**- මධ්‍යාහ්න කාලයෙහි හාත්පසින් බොහෝ ප්‍රදේශයක සෙවන ඇති සුළං නැති විට ඈතට කොළ වැටෙන ඝනව වැවුණු ජනයා ගැවසීමක් නැති වෙන් ව පිහිටි ගසක යට ප්‍රදේශය **වෘක්ෂමූලය** නම් වේ. එබඳු වූ වෘක්ෂමූලයන්හි විසීම රුක්ඛමූලිකංගයයි.

**අබ්භොසිකංගය:**- විවෘත ආකාශය ඇති තැන **අභ්‍යවකාශය** හෙවත් **එළිමහන් තැන අභ්‍යවකාශය** නම් වේ. එහි සතර රියනක සිවුරු කුටියක් සාදා එහි විසිය හැක. එබඳු එළිමහන් තැන්හි විසීම අබ්භෝකාසිකංගයයි.

**සොසානිකංගය:**- යම් තැනක එක් මිනියක් හෝ දවන ලද්දේ ද එතැන් පටන් එම භූමියෙහි නැවත මිනී නොදැවුව ද **සොහොන**

හෙවත් **සුසානය** නම් වේ. මෙබඳු තැන්හි සක්මන් - මඩු ආදිය තනා, ඇඳ - පුටු පනවා නොසිටිය යුතුය. විහාරයෙහි සංඝ ස්ථවිරයන්ට ද ගම් ප්‍රධානියාට ද දන්වා ජීවිතාශාව හැර රාත්‍රියෙහි සොහොනට ගොස් මැදි යම් රැය එහි කමටහන් වඩමින් ගත කොට අළුයම එයින් නික්ම යා යුතුය. එබඳු තැන්හි විසීම සොසානිකංගයයි. (වැඩි විස්තර විශුද්ධි මාර්ගයෙන් බලා දත යුතුය.)

**යථාසන්ථිකංගය:**- තමන්ට සංඝයාගෙන් හෝ දයකාදීන්ගෙන් ලැබෙන සෙනසුන පහසුකම් ඇත්තේ හෝ නැත්තේ වේද? එය තමන්ගේ කර්‍ම ශක්තිය අනුව ලැබුණු එකක් යැයි සිතා සතුටින් පිළිගෙන පරිභෝග කිරීම යථාසන්තිකංගයයි.

මෙසේ සේනාසන සන්තෝස මහා අරියවංස ප්‍රතිපදව පුරනු ලබන භික්‍ෂුව මේ ධුතාංග පස ආරක්‍ෂා කරයි. මේවා ආරක්‍ෂා කරන භික්‍ෂුව සේනාසන සන්තෝස මහා අරියවංසයෙන් සතුටු වූයේ වෙයි. නේසජ්ජිකංගය භාවනාරාමතා අරියවංශ ප්‍රතිපදවෙහි ඇතුළත් වේ.

**"පඤ්ච සෙනාසනෙ වුත්තා - පඤ්ච ආහාරනිස්සිතා,**
**එකො වීරියසංයුත්තො - ද්වෙ ච චීවරනිස්සිතා"**

ධුතාංග තෙලෙසෙන් පසක් සේනාසන මහා ආර්‍යවංශ ප්‍රතිපදව සම්බන්ධයෙන් කියන ලදි. පසක් පිණ්ඩපාත මහා අරියවංශ ප්‍රතිපදව සම්බන්ධයෙන් කියන ලදි. එකක් වීර්‍යය සමඟ භාවනාරාමතා මහා ආර්‍යවංශ ප්‍රතිපදව සම්බන්ධයෙන් කියන ලදි. දෙකක් චීවර මහා ආර්‍යවංශ ප්‍රතිපදව සම්බන්ධයෙන් කියන ලදි. මෙසේ ධුතාංග තෙලෙසම මෙම මහා ආර්‍යවංශ ප්‍රතිපදව සමග යෙදී ඇත්තේ වේ.

**"ඉතරීතරසෙනාසනසන්තුට්ඨියා ච වණ්ණවාදී"** ලද සේනාසනයකින් සතුටු වීමේ ගුණ කියයි. මෙය ද චීවර සන්තෝසයෙහි කියූ ලෙස සතර වැදෑරුම් වේ.

**"න ච සෙනාසනහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති"** සේනාසන ලබනු සඳහා එක් විසි අන්වේෂණයන්හි නො යෙදේ ද, පැවිද්දන් විසින් නොකළ යුතු දේ නොකරයි.

**"අලද්ධා ච සෙනාසනං න පරිතස්සති"** සේනාසන නොලැබුණේය කියා නොතැවෙයි.

**"ලද්ධා ච සෙනාසනං අගධිතො අමුච්ඡිතො අනජ්ඣොසනෙනා ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති"** සේනාසන ලැබුණු කල්හි එහි නොයැලී තණ්හාවෙන් මුළා නොවී තණ්හාවට යට නොවී නුසුදුසු ලෙස සේනාසන සෙවීමේ දෙස් දක්නේ තෘෂ්ණාවෙන් මිදෙන නුවණින් යුක්ත වූයේ ආහාර වළඳයි.

**"තාය ච පන ඉතරීතරසෙනාසන සන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති"** එලෙස ලද සේනාසනයකින් සතුටු වීම හේතුවෙන් තමා උසස් කොට කථා නොකරයි.

**"නො පරං වම්භෙති"** ඒ ගුණය නැත යැයි අනුන් පහත් කොට කථා නොකරයි.

**"යො හි තත්ථ දක්ඛො අනලසො"** සේනාසන සන්තෝසයේ ගුණ කීම් ආදියට දක්ෂ වේ ද, අනලස් වෙයි.

**"සම්පජානො පතිස්සතො"** කෙලෙස් තවන සිහියෙන් හා නුවණින් යුක්ත වෙයි.

**"අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො"** ඒ භික්ෂුව පෞරාණික වූ අග්‍ර වූ ආර්‍ය්‍ය වංශයෙහි පිහිටියේ වෙයි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ පොළව පතුරුවන්නාක් මෙන් ද, සයුරු කුස පුරවන්නාක් මෙන් ද, අහස පළල් කරන්නාක් මෙන් ද, පළමු ව ඉතරීතර චීවරසන්තොස මහා ආර්‍ය්‍යවංශ ප්‍රතිපදව වදාළ සේක.

දෙවැනි ව සඳ ඔසවන්නාක් මෙන් ඉතරීතර පිණ්ඩපාත සන්තොස මහා ආයර්‍ය්වංශ ප්‍රතිපදව වදළ සේක. තෙවනුව මහමෙර උගුල්වන්නාක් මෙන් ඉතරීතර සේනාසන සන්තොස මහා ආයර්‍ය්වංශ ප්‍රතිපදව වදළ සේක. ඉන් පසු නැවත දහසක් නයින් යුක්ත වූ සතර වැනි භාවනාරාමතා මහා ආයර්‍ය්වංශ ප්‍රතිපදව දේශනා කිරීමට "**පුන ච පරං භික්ඛවෙ භික්ඛු භාවනාරමො හොති**" යනුවෙන් දේශනාව ඇරඹූ සේක.

# ❄ භාවනාරාමතාවය

**පුනචපරං, භික්ඛවෙ, භික්ඛු භාවනාරාමො හොති භාවනාරතො, පහානාරාමො හොති පහානරතො, තාය ච පන භාවනාරාමතාය භාවනාරතියා පහානාරාමතාය පහානරතියා නෙවත්තානුක්කංසෙති, නො පරං වම්භෙති. යො හි තත්‍ථ දක්ඛො අනලසො සම්පජානො පතිස්සතො, අයං වුච්චති, භික්ඛවෙ, භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො.**

"**පුනචපරං භික්ඛවෙ, භික්ඛු භාවනාරාමො හොති.** නැවත ද මහණෙනි මේ ශාසනයෙහි භික්‍ෂුව භාවනාවට සතුටු වෙයි.

"**භාවනාරතො**" භාවනාවෙහි ඇලී වාසය කරයි.

"**පහානාරාමො හොති**" **තදංග ප්‍රහාණ, විශ්කම්භණ ප්‍රහාණ සමුච්ඡේද ප්‍රහාණ, පටිප්පස්සද්ධි ප්‍රහාණ, නිස්සරණ ප්‍රහාණ** යන පස් වැදෑරුම් ලෙස ක්ලේශ ප්‍රහාණයෙහි යෙදී සතුටු වෙයි.

"**පහානරතො**" ක්ලේශ ප්‍රහාණයෙහි ඇලී වෙසෙයි.

මෙහි දී භික්‍ෂුව සතිපට්ඨාන සතර, සම්‍යක්ප්‍රධාන සතර, ඍද්ධිපාද සතර, ඉන්ද්‍රිය ධර්‍ම පස, බල ධර්‍ම පස, බොධ්‍යංග සත, අනුපස්සනා සත, මහා විපස්සනා අටලොස, බෝධිපාක්‍ෂික ධර්‍ම

සත්තිස, ආරම්මණ විභක්ති තිස් අට වඩමින් එයින් සතුටු වෙයි. එසේම කාමච්ඡන්දදි කෙලෙසුන් දුරලමින් එයින් සතුටු වෙයි.

මේ සතර ආර්‍ය්‍යවංශයන්හි ප්‍රථමයෙන් තෙළෙස් ධුථාංගයන්හි පිහිටීමෙන් සිව්පස ප්‍රත්‍ය සන්තෝස වශයෙන් සියලු විනය පිටකය කියන ලද්දේ වෙයි. භාවනාරාමතාවෙන් ඉතිරි සූත්‍ර අභිධර්‍ම පිටක දෙක කියන ලද්දේ වෙයි. එහි දී පටිසම්භිධාමග්ග පාලියෙහි නෙක්ඛම්ම පාළිය අනුව ද, දීඝනිකායෙහි දසුත්තර සූත්‍රය අනුව ද, මජ්ඣිමනිකායෙහි සතිපට්ඨාන සූත්‍රය අනුව ද, අභිධර්‍ම පිටකයෙහි විපස්සනා කථා විවරණය අනුව ද විවරණය දත යුතු වේ. එය සංක්‍ෂේපයෙන් මෙසේ ය.

## ☸ නෙක්ඛම්ම පාළියෙහි එන භාවනා පද තිස්හත

1. **"නෙක්ඛම්මං භාවෙන්තො රමතී, කාමච්ඡන්දං පජහන්තො රමති"** කාමච්ඡන්දයට ප්‍රතිපක්‍ෂ භාවනා වඩමින් සතුටු වෙයි. කාමච්ඡන්දය දුරලමින් සතුටු වෙයි.

2. **"අබ්‍යාපාදං භාවෙන්තො රමතී, බ්‍යාපාදං පජහන්තො රමති"** මෛත්‍රිය වඩමින් සතුටු වෙයි. ව්‍යාපදය දුරලමින් සතුටු වෙයි.

3. **"ආලොකසඤ්ඤං භාවෙන්තො රමතී, ථිනමිද්ධං පජහන්තො රමති"** ආලෝක සංඥව වඩමින් සතුටු වෙයි. ථිනමිද්ධය දුරලමින් සතුටු වෙයි.

4. **"අවික්ඛෙපං භාවෙන්තො රමතී, උද්ධච්චං පජහන්තො රමති"** අවික්‍ෂේපය (සමාධිය) වඩමින් සතුටු වෙයි. උද්ධච්චය දුරලමින් සතුටු වෙයි.

5. **"ධම්මවවත්ථානං භාවෙන්තො රමතී, විචිකිච්ඡං පජහන්තො රමති"** ධර්‍මව්‍යවස්ථානය (ධර්‍මවිනය පිළිබඳ අවබෝධය) වඩමින් සතුටු වෙයි. විචිකිච්ඡාව දුරලමින් සතුටු වෙයි.

6. **"ඤාණං භාවෙන්තො රමතී, අවිජ්ජං පජහන්තො රමති"** අෂ්ටසමාපත්ති, හා අටළොස් විපස්සනාවන් පිළිබඳ ඥාණය වඩමින් සතුටු වෙයි. අවිද්‍යාව දුරලමින් සතුටු වෙයි.

7. **"පාමොජ්ජං භාවෙන්තො රමතී, අරතිං පජහන්තො රමති"** ප්‍රමෝදය වඩමින් සතුටු වෙයි. අරතිය දුරලමින් සතුටු වෙයි.

8. **"පඨමජ්ඣානං භාවෙන්තො රමතී, පඤ්චනීවරණෙ පජහන්තො රමති"** ප්‍රථම ධ්‍යානය වඩමින් සතුටු වෙයි. පඤ්ච නීවරණයන් දුරලමින් සතුටු වෙයි.

9. **"දුතියජ්ඣානං භාවෙන්තො රමතී, විතක්කවිචාරෙ පජහන්තො රමති"** දුතිය ධ්‍යානය වඩමින් සතුටු වෙයි. විතක්ක විචාරයන් දුරලමින් සතුටු වෙයි.

10. **"තතියජ්ඣානං භාවෙන්තො රමතී, පීතිං පජහන්තො රමති"** තතිය ධ්‍යානය වඩමින් සතුටු වෙයි. ප්‍රීතිය දුරලමින් සතුටු වෙයි.

11. **"චතුත්ථජ්ඣානං භාවෙන්තො රමතී, සුඛදුක්ඛෙ පජහන්තො රමති"** චතුර්ථ ධ්‍යානය වඩමින් සතුටු වෙයි. සුඛ දුක්ඛයන් දුරලමින් සතුටු වෙයි.

12. **"ආකාසානඤ්චායතනසමාපත්තිං භාවෙන්තො රමති, රූපසඤ්ඤං පටිඝසඤ්ඤං නානත්තසඤ්ඤං පජහන්තො රමති"** ආකාසනඤ්චායතනය වඩමින් සතුටු වෙයි. රූප සංඥාව ප්‍රතිඝ සංඥාව නානත්ත සංඥාව දුරලමින් සතුටු වෙයි.

13. **"විඤ්ඤාණඤ්චායතනසමාපත්තිං භාවෙන්තො රමති, ආකාසසඤ්ඤං පජහන්තො රමති"** විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය වඩමින් සතුටු වෙයි. ආකාශ සංඥාව දුරලමින් සතුටු වෙයි.

14. **"ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිං භාවෙන්තො රමති, විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං පජහන්තො රමති"** ආකිඤ්චඤ්ඤායතනය වඩමින් සතුටු වෙයි. විඤ්ඤාණන්චායතන සංඥාව දුරලමින් සතුටු වෙයි.

15. **"නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං භාවෙන්තො රමති, ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං පජහන්තො රමති"**

නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය වඩමින් සතුටු වෙයි. ආකිඤ්චඤ්ඤායතන සංඥාව දුරලමින් සතුටු වෙයි.

16. **"අනිච්චානුපස්සනං භාවෙන්තො රමති, නිච්චසඤ්ඤං පජහන්තො රමති"** අනිච්චානුපස්සනාව වඩමින් සතුටු වෙයි. නිත්‍යසංඥාව දුරලමින් සතුටු වෙයි.

17. **"දුක්ඛානුපස්සනං භාවෙන්තො රමති, සුඛසඤ්ඤං පජහන්තො රමති"** දුක්ඛානුපස්සනාව වඩමින් සතුටු වෙයි. සුඛ සංඥාව දුරලමින් සතුටු වෙයි.

18. **"අනත්තානුපස්සනං භාවෙන්තො රමති, අත්තසඤ්ඤං පජහන්තො රමති"** අනත්තානුපස්සනාව වඩමින් සතුටු වෙයි. ආත්ම සංඥාව දුරලමින් සතුටු වෙයි.

19. **"නිබ්බිදානුපස්සනං භාවෙන්තො රමති, නන්දිං පජහන්තො රමති"** නිබ්බිදානුපස්සනාව (සංවේගය) වඩමින් සතුටු වෙයි. නන්දිය (සප්‍රීතික තෘෂ්ණාව) දුරලමින් සතුටු වෙයි.

20. **"විරාගානුපස්සනං භාවෙන්තො රමති, රාගං පජහන්තො රමති"** විරාගානුපස්සනාව (නො ඇලීම) වඩමින් සතුටු වෙයි. රාගය (ඇලීම) දුරලමින් සතුටු වෙයි.

21. **"නිරොධානුපස්සනං භාවෙන්තො රමති, සමුදයං පජහන්තො රමති"** නිරෝධානුපස්සනාව (කෙලෙසුන් නැසීමේ නුවණ) වඩමින් සතුටු වෙයි. සමුදය (සංස්කාර හටගැනීමේ හේතුව) දුරලමින් සතුටු වෙයි.

22. **"පටිනිස්සග්ගානුපස්සනං භාවෙන්තො රමති, ආදානං පජහන්තො රමති"** පටිනිස්සග්ගානුපස්සනාව වඩමින් සතුටු වෙයි. ආදානය (මම මගේ යැයි දැඩිව ගැනීම) දුරලමින් සතුටු වෙයි.

23. **"ඛයානුපස්සනං භාවෙන්තො රමති, ඝනසඤ්ඤං පජහන්තො රමති"** ඛයානුපස්සනාව (නාමරූප සංස්කාරයන් ගෙවිගෙවී යන බව අවබෝධය) වඩමින් සතුටු වෙයි. සන්තති, සමූහ, ආරම්මණ, කිච්ච යන සතරවිධ ඝන සංඥාව දුරලමින් සතුටු වෙයි.

24. **"වයානුපස්සනං භාවෙන්තො රමති, අයූහනං පජහන්තො රමති"** වයානුපස්සනාව (සංස්කාරයන්ගේ විනාශය පිළිබඳ අවබෝධය)

වඩමින් සතුටු වෙයි. ආයූහනය (සංස්කාරයන් රැස්කිරීමේ ආශාව) දුරලමින් සතුටු වෙයි.

25. **"විපරිනාමානුපස්සනං භාවෙනෙතා රමති, ධුවසඤ්ඤං පජහනෙතා රමති"** විපරිණාමපස්සනාව වඩමින් සතුටු වෙයි. ධුව සංඥව (සංස්කාරයන් ස්ථිර, සදාකාලික යැයි පිළිගැනීම) දුරලමින් සතුටු වෙයි.

26. **"අනිමිත්තානුපස්සනං භාවෙනෙතා රමති, නිමිත්තසඤ්ඤං පජහනෙතා රමති"** අනිමිත්තානුපස්සනාව (අනිත්‍ය සඤ්ඤව) වඩමින් සතුටු වෙයි. නිමිත්ත සඤ්ඤව (නිත්‍ය යැයි පිළිගත් මෝහය) දුරලමින් සතුටු වෙයි.

27. **"අප්පණිහිතානුපස්සනං භාවෙනෙතා රමති, පණිධිං පජහනෙතා රමති"** අප්පණිහිතානුපස්සනා (දුක්ඛ සඤ්ඤව) වඩමින් සතුටු වෙයි. ප්‍රණිධිය (තෘෂ්ණා සහගත ප්‍රාර්ථනා) දුරලමින් සතුටු වෙයි.

28. **"සුඤ්ඤතානුපස්සනං භාවෙනෙතා රමති, අභිනිවෙසං පජහනෙතා රමති"** සුඤ්ඤතානුපස්සනාව (අනාත්ම සඤ්ඤව) වඩමින් සතුටු වෙයි. අභිනිවේශය (ආත්ම දෘෂ්ටිය) දුරලමින් සතුටු වෙයි.

29. **"අධිපඤ්ඤධම්මවිපස්සනං භාවෙනෙතා රමති, සාරාදනාභිනිවෙසං පජහනෙතා රමති"** අධිපඤ්ඤධම්ම විපස්සනාව (අනිත්‍ය දුක්ඛ, අනාත්ම ත්‍රිලක්ෂණ විදශීනාව) වඩමින් සතුටු වෙයි. සාරාදනාභිනිවෙසය (නිත්‍යසාර සුඛසාර ආත්මසාර වශයෙන් පිළිගැනෙන මෝහය) දුරලමින් සතුටු වෙයි.

30. **"යථාභූතඤාණදස්සනං භාවෙනෙතා රමති, සම්මොහාභිනිවෙසනං පජහනෙතා රමති"** යථාභූතඥනදස්සනය (නාමරූප සංස්කාරයන්ගේ හේතු-ඵල සම්බන්ධව දක්නා විදශීනාව) වඩමින් සතුටු වෙයි. සම්මෙහාභිනිවෙසය (අධික මුලාව) දුරලමින් සතුටු වෙයි.

31. **"අදීනවානුපස්සනං භාවෙනෙතා රමති, ආලයාභිනිවෙසනං පජහනෙතා රමති"** ආදිනවානුපස්සනාව (සංස්කාරයන්ගේ ආදීනව

දක්නා විදර්ශනාව) වඩමින් සතුටු වෙයි. ආලයාභිනිවෙසය (දැඩි ඇල්ම) දුරලමින් සතුටු වෙයි.

32. "**පටිසඞ්ඛානුපස්සනං භාවෙන්තො රමති, අප්පටිසඞ්ඛං පජහන්තො රමති**" පටිසංඛානුපස්සනාව (ඉතා උසස් ලෙස වැඩුණු ත්‍රිලක්ෂණය පිළිබඳ නුවණ) වඩමින් සතුටු වෙයි. අප්පටිසංඛය (මෝහය) දුරලමින් සතුටු වෙයි.

33. "**විවට්ටානුපස්සනං භාවෙන්තො රමති, සංයොගාභිනිවෙසං පජහන්තො රමති**" විවට්ටානුපස්සනාව (සංස්කාරයන්ට පිටුපා නිවන දෙසට හැරීමේ විදර්ශනාව) වඩමින් සතුටු වෙයි. සංයොගාභිනිවෙසය (සියලු බැඳීම්) දුරලමින් සතුටු වෙයි.

34. "**සොතාපත්තිමග්ගං භාවෙන්තො රමති, දිට්ඨෙකට්ඨෙ කිලෙසෙ පජහන්තො රමති**" සොතාපත්ති මාර්ගය වඩමින් සතුටු වෙයි. සක්කායදිට්ඨි ආදී කෙලෙස් දුරලමින් සතුටු වෙයි.

35. "**සකදාගාමිමග්ගං භාවෙන්තො රමති, ඔළාරිකෙ කිලෙසෙ පජහන්තො රමති**" සකදාගාමි මාර්ගය වඩමින් සතුටු වෙයි. ඖලාරික ක්ලේශයන් (කාමරාග, ව්‍යාපාද) දුරලමින් සතුටු වෙයි.

36. "**සොඅනාගාමිමග්ගං භාවෙන්තො රමති, අනුසහගතෙ කිලෙසෙ පජහන්තො රමති**" අනාගාමී මාර්ගය වඩමින් සතුටු වෙයි. කාම භවයට අයත් සියලු කෙලෙස් දුරලමින් සතුටු වෙයි.

37. "**අරහත්තමග්ගං භාවෙන්තො රමති, සබ්බකිලෙසෙ පජහන්තො රමති**" අරහත් මාර්ගය වඩමින් සතුටු වෙයි. කාම රූප අරූප සියලු භවයන්ට අයත් සියලු කෙලෙසුන් දුරලමින් සතුටු වෙයි.

## ☸ දසුත්තර සූත්‍රය අනුව භාවනා පද

1. "**එකං ධම්මං භාවෙන්තො රමති, එකං ධම්මං පජහන්තො රමති**" එක් ධර්මයක් වඩමින් සතුටු වෙයි. එක් ධර්මයක් දුරු කරමින් සතුටු වෙයි. මෙහි වැඩිය යුතු එක ධර්මය නම් **කායගතා සතියයි**. දුරු කළ යුතු එක ධර්මය නම් **අස්මි මානයයි**.

2. "**ද්වෙධම්මෙ භාවෙන්තො රමති, ද්වෙධම්මෙ පජහන්තො රමති**" ධර්ම දෙකක් වඩමින් සතුටු වෙයි. ධර්ම දෙකක් දුරු කරමින් සතුටු වෙයි. මෙහි වැඩිය යුතු ධර්ම දෙක නම් **සමථ විදර්ශනා** භාවනා දෙකය.

   දුරු කළ යුතු ධර්ම දෙක නම් **අවිද්‍යාව සහ තෘෂ්ණාවයි.**

3. "**තයො ධම්මෙ භාවෙන්තො රමති, තයො ධම්මෙ පජහන්තො රමති**" ධර්ම තුනක් වඩමින් සතුටු වෙයි. ධර්ම තුනක් දුරු කරමින් සතුටු වෙයි. මෙහි වැඩිය යුතු ධර්ම තුන නම් **සවිතක්ක සවිචාර සමාධි, අවිතක්ක විචාරමත්ත සමාධි, අවිතක්ක අවිචාර සමාධි** යන සමාධි තුන ය.

   දුරු කළ යුතු ධර්ම තුන නම් **කාම තණ්හා, භව තණ්හා විභව තණ්හා** යන තණ්හා තුන ය.

4. "**චත්තාරො ධම්මෙ භාවෙන්තො රමති, චත්තාරො ධම්මෙ පජහන්තො රමති**" ධර්ම සතරක් වඩමින් සතුටු වෙයි. ධර්ම සතරක් දුරු කරමින් සතුටු වෙයි. මෙහි වැඩිය යුතු ධර්ම සතර නම් **කායානුපස්සනා සතිපට්ඨානය, වේදනානුපස්සනා සතිපට්ඨානය, චිත්තානුපස්සනා සතිපට්ඨානය, ධම්මානුපස්සනා සතිපට්ඨානය** යන සතිපට්ඨාන සතරය.

   දුරු කළ යුතු ධර්ම සතර නම් **කාම ඕඝ, භව ඕඝ දිට්ඨි ඕඝ අවිද්‍යා ඕඝ** යන සතර ඕඝයයි.

5. "**පඤ්චධම්මෙ භාවෙන්තො රමති, පඤ්චධම්මෙ පජහන්තො රමති**" ධර්ම පසක් වඩමින් සතුටු වෙයි. ධර්ම පසක් දුරු කරමින් සතුටු වෙයි. මෙහි වැඩිය යුතු ධර්ම පස නම් **ප්‍රීති ඵරණතා, සුඛඵරණතා, චෙතොඵරණතා, ආලොකඵරණතා, පච්චවෙක්ඛන නිමිත්ත** යන අංග පසෙන් යුත් සම්මා සමාධියයි.

   දුරු කළ යුතු ධර්ම පස නම් **කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්චකුක්කුච්ච, විචිකිච්ඡා** යන නීවරණ පසයි.

6. "**ඡ ධම්මෙ භාවෙන්තො රමති, ඡ ධම්මෙ පජහන්තො රමති**" ධර්ම සයක් වඩමින් සතුටු වෙයි. ධර්ම සයක් දුරු කරමින් සතුටු වෙයි. මෙහි වැඩිය යුතු ධර්ම සය නම් **බුද්ධානුස්සති, ධම්මානුස්සති, සංඝානුස්සති, සීලානුස්සති, ත්‍යාගානුස්සති, දේවතානුස්සති** යන අනුස්සති භාවනා සයයි.

දුරු කළ යුතු ධර්ම සය නම් **රූප තණ්හා, ශබ්ද තණ්හා, ගන්ධ තණ්හා, රස තණ්හා, පොට්ඨබ්බ තණ්හා, ධම්ම තණ්හා** යන තණ්හා සයයි.

7. "**සත්තධම්මෙ භාවෙන්තො රමති, සත්තධම්මෙ පජහන්තො රමති**" ධර්ම සතක් වඩමින් සතුටු වෙයි. ධර්ම සතක් දුරු කරමින් සතුටු වෙයි. මෙහි වැඩිය යුතු ධර්ම සත නම් **සති සම්බොජ්ඣංගය, ධම්මවිචය සම්බොජ්ඣංගය, විරිය සම්බොජ්ඣංගය, ප්‍රීති සම්බොජ්ඣංගය, පස්සද්ධි සම්බොජ්ඣංගය, සමාධි සම්බොජ්ඣංගය, උපේක්ෂා සම්බොජ්ඣංගය** යන සම්බොජ්ඣංග සත ය.

දුරු කළ යුතු ධර්ම සත නම් **කාමරාගානුසය, පටිඝානුසය, විචිකිච්ඡානුසය, මානානුසය, දිට්ඨානුසය, භවරාගානුසය, අවිද්‍යානුසය** යන අනුසය ධර්ම සත ය.

8. "**අට්ඨධම්මෙ භාවෙන්තො රමති, අට්ඨධම්මෙ පජහන්තො රමති**" ධර්ම අටක් වඩමින් සතුටු වෙයි. ධර්ම අටක් දුරු කරමින් සතුටු වෙයි. මෙහි වැඩිය යුතු ධර්ම අට නම් **සම්මාදිට්ඨි, සම්මා සංකප්ප, සම්මාවාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි** යන මාර්ගාංග අට ය.

දුරු කළ යුතු ධර්ම අට නම් **මිථ්‍යා දෘෂ්ටි, මිථ්‍යා සංකප්ප, මිථ්‍යා වාචා, මිථ්‍යා කම්මන්ත, මිථ්‍යා ආජීව, මිත්‍යා වායාම, මිථ්‍යා සති, මිථ්‍යා සමාධි** යන මිථ්‍යාදෘෂ්ටි අට ය.

9. "**නවධම්මෙ භාවෙන්තො රමති, නවධම්මෙ පජහන්තො රමති**" ධර්ම නවයක් වඩමින් සතුටු වෙයි. ධර්ම නවයක් දුරු කරමින් සතුටු වෙයි. මෙහි වැඩිය යුතු ධර්ම නවය නම් **ශීල විසුද්ධි ප්‍රධානි අංගය,**

චිත්තවිසුද්ධි ප්‍රධානි අංගය, දෘෂ්ටි විශුද්ධි ප්‍රධානි අංගය, කංඛාවිතරණ විශුද්ධි ප්‍රධානි අංගය, මාර්ගාමාර්ගඥානදර්ශනවිශුද්ධි ප්‍රධානි අංගය, ප්‍රතිපදඥානදර්ශනවිශුද්ධි ප්‍රධානි අංගය, ඥානදර්ශනවිසුද්ධි ප්‍රධානි අංගය, ප්‍රඥාවිසුද්ධි ප්‍රධානි අංගය යන ප්‍රධානි අංග නවය ය.

දුරු කළ යුතු ධර්ම නවය නම් **තෘෂ්ණාව නිසා සෙවීම වන්නේය. සෙවීම නිසා ලාභය වන්නේය. ලාභය නිසා විනිශ්චය වන්නේය. විනිශ්චය නිසා ඡන්දරාගය (ඇල්ම) වන්නේය. ඡන්ද රාගය නිසා අනුභවය වන්නේය. අනුභවය නිසා පරිග්‍රහණය (අයිතිකර ගැනීම) වන්නේය. පරිග්‍රහණය නිසා මසුරු බව වන්නේය. මසුරු බව නිසා ආරක්ෂා කිරීම වන්නේය. ආරක්ෂා කිරීම නිසා දඬු ගැනුම්, ආයුධ ගැනුම් කෝලාහල විවාද කේලාම් බොරුකීම්ද නොයෙක් ලාමක අකුශල කර්මයෝද වෙත්** ය යන නානත්ත ධර්ම නවයයි.

10. **"දසධම්මෙ භාවෙන්තො රමති, දසධම්මෙ පජහන්තො රමති"** ධර්ම දසයක් වඩමින් සතුටු වෙයි. ධර්ම දසයක් දුරු කරමින් සතුටු වෙයි. මෙහි වැඩිය යුතු ධර්ම දසය නම් **පඨවි කසිණය, ආපො කසිණය, තෙජො කසිණය, වායො කසිණය, නීල කසිණය, පීත කසිණය, ලොහිත කසිණය, ඔදාත කසිණය** යන ප්‍රධානි දස කසිණයි.

දුරු කළ යුතු ධර්ම දසය නම් **මිථ්‍යා දෘෂ්ටි, මිථ්‍යා සංකප්ප, මිථ්‍යා වාචා, මිථ්‍යා කම්මන්ත, මිථ්‍යා ආජීව, මිත්‍යා වායාම, මිථ්‍යා සති, මිථ්‍යා සමාධි, මිථ්‍යා ඤාණ, මිථ්‍යා විමුත්ති** යන මිච්ඡත්ත ධර්ම දසයයි.

# ☸ සතිපට්ඨාන සූත්‍රය අනුව භාවනා පද

කායානුපස්සනාවෙහි එන **ආනාපානපබ්බය, ඉරියාපථපබ්බය, සම්පජඤ්ඤපබ්බය, පටිකූලමනසිකාරපබ්බය, ධාතුමනසිකාරපබ්බය, නවසිවථිකපබ්බය** යන චුද්දසාකාර කායානුපස්සනාව ද, **වෙදනානුපස්සනාව** ද, **චිත්තානුපස්සනාව** ද, ධම්මානුපස්සනාවෙහි එන **නීවරණපබ්බය ඛන්ධපබ්බය ආයතනපබ්බය බොජ්ඣඞ්ගපබ්බය**

**සච්චපබ්බය** යන පස් වැදෑරුම් ධම්මානුපස්සනාව ද යන මේ එක් විසි කර්මස්ථාන වැඩිය යුතු ය. දීර්ඝ වන බැවින් විස්තර නොදක්වන ලදි.

## ☸ නිද්දේසපාළිය අනුව භාවනා පද

උපාදානස්කන්ධ පඤ්චකය පිළිබඳ ව නියමම අවබෝධයක් ඇතිකර ගැනීම සඳහා එම ස්කන්ධයන් අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ත්‍රිලක්ෂණයට නංවා බැලිය යුතු ය. ඒ පිළිබඳ ව පුළුල් අවබෝධයක් ඇතිකර ගැනීම සඳහා අනිත්‍ය ලක්ෂණය දස ආකාරයකින් ද, දුක්ඛ ලක්ෂණය විසිපද් ආකාරයකින් ද, අනාත්ම ලක්ෂණය පස් ආකාරයකින් ද වශයෙන් සතළිස් ආකාරයකින් විවරණය කොට දක්වා ඇත. එය **චත්තාළිසාකාර මහා විපස්සනාව** නම් වේ. මෙහි දී රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන මේ පසම මෙම සතළිස් ආකාරයට නංවා වෙන වෙනම බැලිය යුතු ය. එහි සතළිස් ආකාර පද විවරණය මෙසේ ය.

### ✵ දස ආකාර අනිත්‍ය ලක්ෂණයන්

**සකල සංස්කාර ධර්මයන් වනාහි……**

| | | |
|---|---|---|
| 1. | **අනිච්චතො :-** | වෙනස් වන බැවින්, ඉපිද නිරුද්ධ වන බැවින් අනිත්‍යය. |
| 2. | **පලොකතො :-** | කැඩී බිඳී පළුදු වී යන බැවින් අනිත්‍යය |
| 3. | **චලතො :-** | නිතර කම්පා වන, චලනය වන බැවින් අනිත්‍යය. |
| 4. | **පභඞ්ගුතො :-** | ක්ෂණිකව කැඩී බිඳී කුඩු වී විනාශ වී යන බැවින් අනිත්‍යය. |
| 5. | **අද්ධුවතො :-** | ස්ථිර බවක් නැති බැවින් අනිත්‍යය. |
| 6. | **විපරිණාම ධම්මතො :-** | වෙනස් වන, දුකට ම පෙරළෙන බැවින් අනිත්‍යය. |

7. **අසාරකතො :-** හරයක් සාරයක් නැති බැවින් අනිත්‍යයි

8. **විභවතො :-** නිත්‍යාදී උසස් ගතියකට නොයන බැවින් අනිත්‍යය.

9. **මරණ ධම්මතො :-** මැරෙන ස්වභාවය ඇති බැවින් අනිත්‍යය.

10. **සංඛතතො :-** හේතු ප්‍රත්‍යයන්ගෙන්ම හටගත් බැවින් අනිත්‍යය.

### ✵ පස්විසි ආකාර දුක්ඛ ලක්ෂණයන්

**සකල සංස්කාර ධර්මයන් වනාහි......**

1. **දුක්ඛතො :-** නිතර දුකින් පෙළෙන නිසා, දුකට ම වස්තු වන නිසා දුකය

2. **රොගතො :-** පිළියම් කළ යුතු, රිදවන රෝගයක් වැනි බැවින් දුකය

3. **අඝතො :-** නොයෙක් විපත්ති උපදවන බැවින් දුකය

4. **ගණ්ඩතො :-** සැරව ගලන ගඩුවක් වැනි බැවින් දුකය

5. **සල්ලතො :-** ශරීරයේ ඇනී දුක් ඇති කරන විෂ උලක් වැනි බැවින් දුකය

6. **ආබාධතො :-** පිහිට පැතිය යුතු ලෙඩක් වැනි බැවින් දුකය

7. **උපද්දවතො :-** නිරපේක්ෂකව නොයෙක් අනතුරු සිදු කරන බැවින් දුකය

| | |
|---|---|
| 8. **භයතො :-** | බය උපදවන ස්ථානයක් වැනි බැවින් දුකය |
| 9. **ඊතිතො :-** | වසංගතයක් වැනි බැවින් දුකය |
| 10. **උපසග්ගතො :-** | භයානක අනතුරක්, විපතක් වැනි බැවින් දුකය |
| 11. **අතාණතො :-** | ආරක්‍ෂා කළ නොහැකි බැවින් දුකය |
| 12. **අලෙණතො :-** | කිසිවකුගේ පිහිටාධාරයක් නැති බැවින් දුකය |
| 13. **අසරණතො :-** | අනිකෙකුගෙන් සරණක්, පිහිටක් නැති බැවින් දුකය |
| 14. **වධකතො :-** | මිතුරකු සේ පැමිණ වධ පමුණුවන වධකයකු වැනි නිසා දුකය |
| 15. **අඝමූලතො :-** | සියලු අකුසලයන්ට හා එහි විපාකයන්ට මුල් වන නිසා දුකය |
| 16. **ආදීනවතො :-** | නිතර බැගෑපත්වන දුප්පතෙකු වැනි බැවින් දුකය |
| 17. **සාසවතො :-** | කාමාදී ආශ්‍රවයන්ට ගොදුරු වන බැවින් දුකය |
| 18. **මාරාමිසතො :-** | ක්ලේශ මාරයාට හසුවන ගොදුරක් වැනි බැවින් දුකය |
| 19. **ජාති ධම්මතො :-** | ඉපදීම ස්වභාව කොට ඇති බැවින් දුකය |
| 20. **ජරා ධම්මතො :-** | දිරීම ස්වභාව කොට ඇති බැවින් දුකය |
| 21. **ව්‍යාධි ධම්මතො :-** | ලෙඩවීම ස්වභාව කොට ඇති බැවින් දුකය |
| 22. **සෝක ධම්මතො :-** | ශෝක කිරීම ස්වභාව කොට ඇති බැවින් දුකය |

23. **පරිදේව ධම්මතො** :- හැඬීමට වැළපීමට හේතු වන බැවින් දුකය

24. **උපායාස ධම්මතො** :- සිත කය දැවීමට, වෙහෙසීමට පමුණුවන බැවින් දුකය

25. **සංකිලේසික ධම්මතො**:-කෙලෙසුන්ගෙන් දැඩිව කිලිටි වන බැවින් දුකය

**✵ පස් ආකාර වූ අනාත්ම ලක්‍ෂණයන්**

**සියලු ධර්‍මතාවයන් වනාහි......**

1. **අනත්තතො** :- ආත්මභාවයකින් තොර බැවින් අනාත්මය
2. **සුඤ්ඤතො** :- ස්ථිරව පවතින කිසිවක් නැති බැවින් (හිස් බැවින්) අනාත්මය
3. **පරතො** :- අන්සතු දෙයක් වැනි බැවින් අනාත්මය
4. **රිත්තතො** :- ගත යුතු හරයක් නැතිව හිස් බැවින් අනාත්මය
5. **තුච්ඡතො** :- ඵලයක් නැති නො වටිනා දෙයක් බැවින් අනාත්මය

මෙම උත්තරීතර ප්‍රතිපදව සම්පූර්‍ණ කිරීමෙන් ම සියලු සංසාර දුක් අවසන් කොට නිර්‍වාණාවබෝධය කළයුතු වේ. ඒ සඳහා පිළිවෙලින් සමථ විදර්‍ශනා භාවනා වැඩිය යුතු ය.

# ☸ සමථ භාවනාව

බුදු දහමේ භාවනාව ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදනු ලැබේ. එනම් "**සමථ භාවනාව හා විදර්ශනා භාවනාව**" යි. සමථ භාවනාව යනු, චිත්ත - චෛතසිකයන් විසිරෙන්නට නොදී එක අරමුණක තැබීමට කරනු ලබන භාවනාව යි. එනම් කුසල් සිත් පිළිබඳ එකඟතාවය ඇති කර ගැනීම යි.

සමථ භාවනාව වැඩීම සඳහා අරමුණු හතළිහක් දේශනා කර ඇත. ඒවා සම සතළිස් කර්මස්ථාන නම් වේ. එනම් :-

## ✠ දස කසිණ

පඨවි කසිණය, ආපෝ කසිණය, තේජෝ කසිණය, වායෝ කසිණය, නීල කසිණය, පීත කසිණය, ලෝහිත කසිණය, ඕදාත කසිණය, ආලෝක කසිණය, ආකාශ කසිණය යන දසයයි.

## ✠ දස අසුභය

උද්ධුමාතක අසුභය, විනීලක අසුභය, විපුබ්බක අසුභය, විච්ඡිද්දක අසුභය, වික්ඛායිතක අසුභය, වික්ඛිත්තක අසුභය, හතවික්ඛිත්තක අසුභය, ලෝහිතක අසුභය, පුලවක අසුභය, අට්ඨික අසුභය යන දසයයි.

## ✠ දස අනුස්සති

බුද්ධානුස්සති, ධම්මානුස්සති, සංඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දේවතානුස්සති, උපසමානුස්සති, මරණානුස්සති, කායගතාසති, ආනාපාන සති යන දසයයි.

### ✠ සතර බ්‍රහ්ම විහරණ

මෛත්තා කරුණා මුදිතා උපේක්‍ෂා යන සතරයි.

### ✠ සතර ආරූප්‍ය

ආකාසානඤ්චායතනය, විඤ්ඤාණානඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නේවසඤ්ඤානාසඤ්ඤායතනය යන සතරයි.

### ✠ ආහාරයේ පටික්කූල සඤ්ඤාව

ශරීරයේ යැපීමට ගන්නා කබලිංකාර ආහාරයේ පිළිකුල් බව සිහි කිරීම.

### ✠ චතු ධාතු වවත්ථානය

ජීව, අජීව සියල්ල පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන ධාතු කොටස් හතරකට බෙදා බැලීම.

මෙම භාවනා වැඩීම පිළිබඳ විස්තර විශුද්ධි මාර්ගය ආදී ග්‍රන්ථයන් බලා දත යුතු ය.

## ☸ විදර්ශනා භාවනාව

**"විදර්ශනාව"** යනු, සම්මුතිය බිඳ, සෑම අරමුණකම ඇති සියලු සංස්කාරයන්ගේම නාම රූප, ස්කන්ධ, ආයතන, ධාතු, ඉන්ද්‍රිය, සත්‍ය, පටිච්ච සමුප්පාද ආදී පරමාර්ථ ධර්මයන් හා ඒවායේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ලක්‍ෂණත්‍රය ද විවිධාකාරයෙන් විශේෂාකාරයෙන්, දකින ප්‍රඥා භාවනාව යි.

නාම, රූප - හේතු, ඵල ධර්මයන් හෙවත් දුක්ඛ, සමුදයයි කියනු ලබන සකල සංස්කාර ධර්මයන්ම අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ලක්ෂණත්‍රය අනුව දකිමින් කරන භාවනාව විදර්ශනාව යි. විදර්ශනා භාවනාව වැඩීම තුලින් සත්ත්ව සන්තානගත ලෝභ, ද්වේෂ, මෝහාදී කෙලෙස් ධර්මයන් තුනී වී, දුරු වී, ශ්‍රද්ධා, සති, සමාධි, ප්‍රඥා ආදී ගුණ ධර්මයන් දියුණු වනු ඇත. නාම රූපයන්ගේ වෙන් වෙන් වූ ලක්ෂණ සහ ඒවායේ අනිත්‍යාදී ලක්ෂණත්‍රය ද දැකගත හැකි විශේෂිත වූ නුවණක් මේ තුළින් මතුවන අතර කෙලෙසුන් ප්‍රහාණය කොට ලොවුතුරු මග - ඵල - නිවන් සුව අවබෝධය ද මේ විදර්ශනා භාවනාව මගින් සිදුවනු ඇත.

තවද **විදර්ශනාව යනු, විශේෂයෙන් දැකීමයි**. විවිධ අයුරින් දැකීමයි. සාමාන්‍ය ලෝකයා විසින් දක්නා දැකීමෙන් ඔබ්බට ගොස්, ඇත්ත ඇති සැටියෙන් දැකීමයි. ගස්, ගල්, කඳු, ඉර, හඳ, තාරකා, පුටුව, පිඟාන, මේසය, ගෙය, රථය ආදී ලෙස සාමාන්‍ය මසැසින් දැකීම **දර්ශනය** යි. ඒවා ත්‍රිලක්ෂණාකාරව ඇත්ත ඇති සැටියට දැකීම **විදර්ශනාවයි.** එනම්, සැබෑ ලෙස සත්‍ය වශයෙන් ම මනසින් දැක ගැනීමයි. ඒ සඳහා කරන වැඩ පිළිවෙල විදර්ශනා භාවනාවයි. එය මාර්ග-ඵල-නිවන අවබෝධය දක්වා ම විහිදී යන දීර්ඝ වැඩ පිළිවෙලක් වන අතර පිළිවෙලටම මනා ඉවසීමෙන් යුතුව අඛණ්ඩව කරගෙන යා යුතුය.

සමථ භාවනාවන් තුළින් ධ්‍යාන, අභිඥා උපදවා ගත් අය මරණින් මතු බඹලොව උපදින්නේ ය. නමුත් එපමණකින් ම ඔවුන් සසර දුක ඉක්මවා නැත. දුර්ලභ බුද්ධෝත්පාද කාලයක දී, නිරෝගී මිනිස් ජීවිතයක් ලබාගැනීම, පැවිද්ද, සද්ධර්ම ශ්‍රවණය, සත්පුරුෂ උතුමන්ගේ ඇසුර ලබා ගැනීම, ලොව පරම දුර්ලභ කාරණාවන් ය. වර්තමාන කාලයේ මේ සියල්ල පවතින බැවින් නිවන් දෙරටුව විවර වී ඇත. සංසාර දුකින් මිදීමේ එකම මග විදර්ශනා භාවනාව වැඩීමයි. එය දුක් ගිනි නිවන, කෙලෙස් මළ වියලන දහම් උපදේශයකි. විදර්ශනා භාවනා සැපතට වඩා සැපතක් මුළු තුන් ලෝකයේ ම තවත් නැත. ප්‍රඥාව වඩන ප්‍රධාන මාර්ගය ද විදර්ශනා භාවනාවයි. එමගින් යථාභූත ඥාණය ද උපදවා ගත හැකිය.

ධ්‍යාන සමාපත්ති උපදවා ලබන්නා වූ බ්‍රහ්ම සම්පත් තුළින් සිදු වන්නේ ද තාවකාලික කෙලෙස් යටපත් කිරීමකි. මාර්ග ඵල ලබා නිවන් අවබෝධ කර ගැනීම මගින් යළි නූපදනා පරිදි, සදාකාලිකව ම කෙලෙසුන් දුරු කිරීම සිදු වේ. ඒ සඳහා විදර්ශනා භාවනාවම කළ යුතුයි. සම්බුදු සසුනකින් ලැබෙන එකම පරමෝත්කෘෂ්ට වාසනා මහිමය නම් මෙවන් විදර්ශනා භාවනාවක් මගින් මනස නිර්වාණ ප්‍රත්‍යක්‍ෂයට පමුණුවන සාංසාරික විමුක්තිය සලසා ගැනීමය.

විදර්ශනාව වනාහි භාවනා වශයෙන් එකකි. වඩන ආකාර වශයෙන් තුනකි. එනම්, "**අනිච්චානුපස්සනාව, දුක්ඛානුපස්සනාව, අනත්තානුපස්සනාව**" යනුවෙනි. මෙම අනුපස්සනා භාවනා තුන "**ත්‍රිලක්‍ෂණ භාවනාව** "යනුවෙන් ද "**සම්මර්ශන විදර්ශනාව** " යනුවෙන් ද හැඳින්වේ. සත්‍යාවබෝධය තුළින් ලොවුතුරු මග ඵල නිවන දක්වා ම විහිදී පවතින මේ පරම දුර්ලභ අති ගම්භීර උතුම් විදර්ශනා භාවනාව වඩන්නා වූ යෝගීන් වහන්සේ විසින් එම සියලුම කටයුතු ඉතාමත් ගෞරව පෙරදැරිව කළ යුතුය. රත්නත්‍රයම විෂයෙහි මහත් ශ්‍රද්ධාවක් තිබිය යුතුය. ගුරු උතුමන් වහන්සේලාගේ උපදේශ ගෞරවයෙන් පිළිපැදිය යුතුය. මෙම විදර්ශනා භාවනාවෙන් තොර නිවනක් නැත. එබැවින් හිස ගිනි ගත්තෙකු ඒ ගිනි නිවන්නට උත්සුක වන්නා සේ, හැඳිවත ගිනි ගත්තෙකු ඒ ගිනි නිවනට උත්සුක වන්නා සසර දුකින් අත මිදීමට උත්සාහවත් විය යුතු බව බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ සේක.

# ❄ සප්ත විශුද්ධිය

බුදු, පසේ බුදු, මහ රහත් යන කවර බෝධියකින් වුව ද නිවනට පැමිණීම පිණිස **සීල විශුද්ධිය, චිත්ත විශුද්ධිය, දිට්ඨි විශුද්ධිය, කංකාවිතරණ විශුද්ධිය, මග්ගාමග්ග ඤාණදස්සන විශුද්ධිය, ප්‍රතිපදාඤාණදස්සන විශුද්ධිය, ඤාණදස්සන විශුද්ධිය** යන මේ සප්ත විශුද්ධිය සම්පූර්ණ කළ යුතු ය. එහි සාරාංශයක් මෙසේ ය.

## ☸ සීල විශුද්ධිය

රක්නා වූ සීලයෙන් පිරිසිදු වූ යෝගාවචරයන්ට පමණක් චිත්ත විශුද්ධියෙන් සුද්ධ විය හැක. ගිහි, සාමණේර, උපසම්පද ආදී වශයෙන් පවත්නා "**සතර සංවර සීලය**" සම්පූර්ණ කිරීම මෙයින් සිදු වේ.

## ☸ චිත්ත විශුද්ධිය

මෙහි දී අවම උපචාර සමාධිය ද, මධ්‍යම රූපාවචර චතුර්ථ ධ්‍යානය ද, උපරිම උපචාර සහිත අෂ්ට සමාපත්තිය ද, චිත්ත විශුද්ධියයි. සිතෙහි නීවරණ බලපෑම ඉවත් කිරීම මෙහි දී සිදු වේ.

## ☸ දිට්ඨි විශුද්ධිය

නාම ධර්ම හා රූප ධර්ම වෙන වෙනම පිරිසිඳ දැන ගැනීම හෙවත් "**නාමරූප පරිච්ඡේද ඤාණය**" දිට්ඨි විශුද්ධියයි. මෙහි දී අටවිසි රූප හා තෙපණස් නාමයන් ගැන මනා අවබෝධයක් ඇති වේ. සැබවින්ම නාම රූපයන් මිස සත්වයෙක්, පුද්ගලයෙක් නැති බව භාවනාමය ඤාණය තුළින් මෙහි දී පිරිසිදුව වටහා ගැනීම මෙයින් සිදු වේ.

## ☸ කංඛාවිතරණ විශුද්ධිය

"**ප්‍රත්‍ය පරිග්‍රහ ඤාණය**" හෙවත් හේතු-ඵල පිළිබඳ මනා අවබෝධයක් ලැබීම මෙහි දී සිදු වේ. ඒ සඳහා පඤ්චස්කන්ධ ක්‍රමය හා පටිච්ච සමුත්පාද ක්‍රමය භාවනාවට නැගිය යුතු ය. නාම රූප පරපුර වනාහි හේතු-ඵල මගින් දිගට, නො සිඳී පැවතීම නිසා සිදුවන සම්මුති පුද්ගල ක්‍රියාකාරීත්වය ප්‍රත්‍ය පරිග්‍රහ ඤාණය තුළින් මනා සේ වටහා ගැනීමෙන් ත්‍රෛකාලික වූත් ආධ්‍යාත්මික බාහිර වූත් සියලු සැක සංකා දුරු කිරීම මෙම කඞ්ඛාවිතරණ විශුද්ධියෙන් සිදු වේ.

## ☸ මග්ගාමග්ග ඤාණදස්සන විශුද්ධිය

නිවනට යන පැමිණෙන මාර්ගය මෙය ය, නොමග මෙය ය යනුවෙන් නිවැරදිව මග නොමග දැන ගැනීම මෙහි දී සිදු වේ. රූප ධර්ම අටවිස්ස, නාම ධර්ම තෙපණස හා පටිච්ච සමුත්පාද ක්‍රම යන මේවායේ උදය-වය බැලීමෙන් "මාර්ගය - අමාර්ගය" මනාව හඳුනා ගැනීම මෙම මග්ගාමග්ග ඤාණ දස්සන විශුද්ධියෙන් සිදු වේ.

## ☸ ප්‍රතිපදාඤාණදස්සන විශුද්ධිය

ප්‍රතිපදා - ප්‍රතිපත්ති නම් වූ නියම තැනට පැමිණීම පිළිබඳ නුවණ පහළ වීම මේ තුළින් සිදු වේ. මෙය අනුමාන වශයෙන් නොව, ඇසින් දකින්නා සේ ප්‍රත්‍යක්ෂ ව ලබන දැනුමකි. සංස්කාරයන්ගේ බිඳීම මනා සේ සම්මර්ශනය කිරීම තුළින් උපක්ලේශයන් දුරු කොට බලවත් වූ උදය-වය ඤාණය හා භංගාදී සෙසු විදර්ශනා ඤාණ මෙහි දී පහළ වේ.

## ☸ ඤාණදස්සන විශුද්ධිය

සංඛාරුපෙක්ෂා ඤාණය, අනුලෝම ඤාණය, ගෝත්‍රභූ ඤාණය යන ඤාණයන්ට අනතුරුව "**මාර්ග-ඵල ඤාණයන්**" ද මේ අවස්ථාවේ දී පහළ වේ.

**"සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො**
**චිත්තං පඤ්ඤඤ්ච භාවයං,**
**ආතාපි නිපකො භික්ඛු**
**සො ඉමං විජටයෙ ජටං"**

ත්‍රි හේතුක කුසල සිතකින් උපන්නා වූ ඥානවන්ත පුද්ගලයකු විසින් චතු පාරිශුද්ධි සීලයෙහි පිහිටාගෙන, මේ වත් පිළිවෙත් කරන කාලය ය - මේ ධර්ම ශ්‍රවණය කරන කාලය ය - මේ ධර්ම විනය පිළිබඳ ව ප්‍රශ්න විචාරන වේලාවය - මේ කමටහන් වඩන වේලාවය යනාදී ලෙස සියලු කටයුතු සකස් කොට කරන පාරිහාර්ය ප්‍රඥාව ඇතිව

කෙලෙස් තවන වීර්‍යයෙන් යුතුව ඇතිව සමාධි භාවනා වඩන්නේ ද, එලෙස සමාධියෙන් පරිභාවිත මෘදු කර්මණ්‍යතාවයෙන් යුත් ශක්තිමත් සිතින් යුතුව විදර්ශනා ප්‍රඥාව වඩන්නේ ද එම යෝගාවචරයා තෘෂ්ණාවෙන් ගැට ගැසී සසර බැඳී පවත්නා කෙලෙස් අවුල (සෝවාන් ආදී මාර්ග ඥාණයන්ට පැමිණ) ලිහා දමන්නේ ය.

මෙසේ අධිසීල ශික්ෂාව, අධිචිත්ත ශික්ෂාව, අධිපඤ්ඤ ශික්ෂාව සම්පූර්ණ කොට කෙලෙසුන් දුරු කොට නිර්වාණාවබෝධය කළ යුතු ය. ඒ සඳහා කියන ලද ආකාරයෙන් චතු පාරිශුද්ධි සීලයෙහි පිහිටා සමථ විදර්ශනා භාවනා වැඩිය යුතු ය.

"**තාය ච පන භාවනාරාමතාය භාවනාරතියා පහානාරාමතාය පහානරතියා නෙවත්තානුක්කංසෙති**" අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් විදර්ශනා භාවනාව කරන්නා වූ මගේ අද මේ සැට වැනි හෝ සැත්තෑ වැනි වර්ෂයයි. මා වැනි වූ කවරෙක් ඇත් දැයි මෙසේ තමා උසස් කොට දැක්වීම නොකරයි

"**නො පරං වම්භෙති**" අනිත්‍යය දුක්ඛයයි. විදර්ශනා මත්‍රයකුදු නැත. කිම මොවුහු අත්හල කමටහන් ඇතිව හැසිරෙත් යැයි මෙසේ අනුන් පහත් කොට තැකීම නොකරයි.

"**යො හි තත්‍ථ දක්ඛො**" භාවනාවෙහි ගුණ කීම් ආදියට දක්ෂයෙකු ශූරයෙකු ව්‍යක්තයෙකු වෙයි.

"**අනලසො**" සමථ විදර්ශනා භාවනා වැඩීමට අලස නොවූවෙකු වෙයි.

**සම්පජානො පතිස්සතො**" කෙලෙස් තවන නුවණින් හා සිහියෙන් යුක්ත වූයේ වෙයි.

"**අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො**" ඒ භික්ෂුව පෞරාණික වූ අග්‍ර වූ ආර්‍ය වංශයෙහි පිහිටියේ වේ.

**"ඉමෙ ඛො, භික්ඛවෙ, චත්තාරො අරියවංසා"** මහණෙනි, මේ සතර ආර්‍යවංශයෝ ආර්‍යතන්තිහූය, ආර්‍ය ප්‍රවේණිහුය, ආර්‍ය මාර්ගයෝ ය, ආර්‍ය මං පෙත් ය යනුයි.

**"අග්ගඤ්ඤා රත්තඤ්ඤා වංසඤ්ඤා පොරාණා අසංකිණ්ණා අසංකිණ්ණපුබ්බා, න සංකීයන්ති න සංකීයිස්සන්ති, අප්පටිකුට්ඨා සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි"** ඒ මේ ආර්‍යවංශ සතර සුවඳ හර මුල් ආදියට සඳුන්ම අග්‍ර වන්නා සේ ක්ෂත්‍රියාදී අන් වංශයන්ට අග්‍රයයි දත යුත්තාහ. අතීත කාලයෙහි පහළ වූ සියලු බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලා විසින් අත් නොහැර පුරුදු කරන ලද්දහු ය. එබැවින් බොහෝ පැරණියයි දත යුත්තාහ. බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලාගේ වංශයට (පරපුර) අයත් යයි දත යුත්තාහ. මේ ප්‍රතිපදාව අලුත හටගත්තක් නොවේ ය. පුරාතනයෙහි පටන් බුද්ධාදී උත්තම පුද්ගලයින් විසින් පුරුදු කරන ලද්දහ. **අධිසීල අධිචිත්ත අධිපඤ්ඤා** යන ත්‍රී ශික්ෂාවන් සම්පූර්ණ කිරීමේ උපාය මාර්ගය වන හෙයින් අත නොහරින ලද්දහ. අතීතයෙහි ලොව පහළ වූ බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලා විසින් ද අත් නොහරින ලද්දහු ය. දැනුදු බැහැර නොකරති. අනාගතයෙහි ද බැහැර නොකරන්නාහ. ලොව විද්‍යමානව ඇති ත්‍රිලක්ෂණ චතුරාර්‍ය සත්‍ය ධර්ම ස්වභාවය මනාකොට ප්‍රත්‍යක්ෂ කරන නුවණින් යුත් බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලා මෙම ප්‍රතිපදාව පිළිකුල් නොකරන ලද්දහුය. නොගරහන්නාහු ය.

භාග්‍යවතුන් වහන්සේ සූත්‍රාන්තය හරවා දන් මහා අරියවංසය සපුරන්නා වූ භික්ෂුව වාසය කරන දිශාව දක්වන සේක් **"ඉමෙහි ච පන, භික්ඛවෙ, චතූහි අරියවංසෙහි සමන්නාගතො භික්ඛු පුරත්ථිමාය චෙපි දිසාය විහරති සොව අරතිං සහති"** යනාදිය පැවසූ සේක. එහි අර්ථය මෙසේ ය.

**"ඉමෙහි ච පන, භික්ඛවෙ, චතූහි අරියවංසෙහි සමන්නාගතො භික්ඛු පුරත්ථිමාය චෙපි දිසාය විහරති"** මහණෙනි, මේ සතර ආර්‍යවංශ ප්‍රතිපදාවෙන් සමන්වාගත වූ භික්ෂුව පෙරදිග දිසාවෙහි වෙසෙයි නම් හෙතෙම අනභිරතිය මැඩගෙන සිටියි ද,

**"සොච අරතිං සහති"** හෙතෙම මෙසේ නොකමැත්ත, නොසතුට, උකටලී බව ඉවසයි. මැඩ පවත්වයි.

**"න තං අරති සහති"** විවේකි සෙනසුන්හි අධිකුසල ධර්මයන් වැඩීමට යම්බඳු වූ නො ඇල්මක් නම් වේ ද එම නොඇලීම එම භික්‍ෂුව මැඩලිමට යටපත් කිරීමට අසමත් වෙයි.

**පච්ඡිමාය චෙපි දිසාය විහරති සොච අරතිං සහති, න තං අරති සහති,** මහණෙනි, මේ සතර ආර්‍යවංශ ප්‍රතිපදාවෙන් සමන්වාගත වූ භික්‍ෂුව බටහිර දිසාවෙහි වෙසෙයි නම් හෙතෙම අනභිරතිය මැඩගෙන සිටියි ද, හෙතෙම මෙසේ නොකමැත්ත, නොසතුට, උකටලී බව ඉවසයි. මැඩ පවත්වයි. විවේකි සෙනසුන්හි අධිකුසල ධර්මයන් වැඩීමට යම්බඳු වූ නො ඇල්මක් නම් වේ ද එම නො ඇලීම එම භික්‍ෂුව මැඩලිමට යටපත් කිරීමට අසමත් වෙයි.

**උත්තරාය චෙපි දිසාය විහරති සොච අරතිං සහති, න තං අරති සහති,** මහණෙනි, මේ සතර ආර්‍යවංශ ප්‍රතිපදාවෙන් සමන්වාගත වූ භික්‍ෂුව උතුරු දිසාවෙහි වෙසෙයි නම් හෙතෙම අනභිරතිය මැඩගෙන සිටියි ද, හෙතෙම මෙසේ නොකමැත්ත, නොසතුට, උකටලී බව ඉවසයි. මැඩ පවත්වයි. විවේකි සෙනසුන්හි අධිකුසල ධර්මයන් වැඩීමට යම්බඳු වූ නො ඇල්මක් නම් වේ ද එම නොඇලීම එම භික්‍ෂුව මැඩලිමට යටපත් කිරීමට අසමත් වෙයි.

**දක්ඛිණාය චෙපි දිසාය විහරති සොච අරතිං සහති, න තං අරති සහති.** මහණෙනි, මේ සතර ආර්‍යවංශ ප්‍රතිපදාවෙන් සමන්වාගත වූ භික්‍ෂුව දකුණු දිසාවෙහි වෙසෙයි නම් හෙතෙම අනභිරතිය මැඩගෙන සිටියි ද, හෙතෙම මෙසේ නොකමැත්ත, නොසතුට, උකටලී බව ඉවසයි. මැඩ පවත්වයි. විවේකි සෙනසුන්හි අධිකුසල ධර්මයන් වැඩීමට යම්බඳු වූ නොඇල්මක් නම් වේ ද එම නොඇලීම එම භික්‍ෂුව මැඩලිමට යටපත් කිරීමට අසමත් වෙයි.

**තං කිස්ස හෙතු?** ඊට හේතු කවරේ ද? යත්:-

**අරතිරතිසහො හි, භික්ඛවෙ, ධීරො'ති"** ප්‍රාඥ තෙමේ, අරතිය ද, පඤ්ච කාම ගුණයන්හි ඇලීම ද, යටපත් කිරීමට, මැඩලීමට සමත් වෙයි.

දැන් ගාථාවන්ගෙන් එම අර්ථය කුළුගන්වන සේක් **"නාරති"** ආදිය වදාළ සේක.

| | |
|---|---|
| **නාරති සහති ධීරං** | - **නාරති ධීරං සහති,** |
| **ධීරොව අරතිං සහති** | - **ධීරො හි අරතිස්සහො.** |

අරති තොමෝ වීර්‍යවන්තයා අභිභවනය නොකරයි ද, යම් හෙයකින් එම අරතිය ධීරසංහතියක් (ධෛර්‍යයවන්තයන් මැඩලන්නක්) නොවේ ද? වීර්‍යයවන්තයන් යටපත් කරන්නට මැඩලන්නට නොහැක්කේ වේ ද, අරතිය මැඩලන බැවින් ම හෙතෙම වීර්‍යයවන්තයෙකු නම් වේ. එබැවින් අරතිය මැඩලයි.

| | |
|---|---|
| **සබ්බකම්මවිහායීනං** | - **පනුණ්ණං කො නිවාරයෙ,** |
| **නෙක්ඛං ජම්බොනදස්සෙව** | - **කො තං නින්දිතුමරහති,** |
| **දෙවාපි නං පසංසන්ති** | - **බ්‍රහ්මුනාපි පසංසිතො''ති.** |

සියලු ත්‍රෛභූමික කර්ම අතහැර පිරිසිඳ සිටියේ ද, කෙලෙස් දුරු කොට සිටියෙකු කවර නම් රාගයක් හෝ ද්වේෂයක් හෝ වළක්වන්නේ ද, දඹරන් ගිල්වන ලද රන් නිෂ්කයක් මෙන් කවරෙක් නම් ගැරහිය යුතු දෙසින් මිඳුණු එම පුද්ගලයාට ගැරහීමට සුදුසු වේ ද? මහා බ්‍රහ්මයා විසිනුදු එම පුද්ගල තෙමේ පසන්නා ලද්දේමය.

**"දෙසනාපරියොසානෙ චත්තාලීස භික්ඛුසහස්සානි අරහත්තෙ පතිට්ඨහිංසු"** සූත්‍ර දේශනාව කෙළවර සතළිස් දහසක් භික්ෂූන් වහන්සේලා අර්හත්වයෙහි පිහිටිය හ.

**නිමි**